බොහොම සංතෝෂයි. පාසල් 100ක පරිඝණක විද්‍යාව පුහුණු කිරීම ගැන. නමුත් එයින් පාසල් කීයකටද මේ පරිඝණක විද්‍යාව ඉගැන්වීම සඳහා හරියට පහසුකම් සපයා තිබෙන්නේ කියා මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. එය තමයි වැදගත්ම ප්‍රශ්නය. තමුන්නාන්සේ වෙනම පරීක්ෂණයක් කර බලන්න, ඒ ළමයින්ගෙන් විස්තර සොයා බලන්න. ඒ ගුරුවරුන්ගෙන් විස්තර සොයා බලන්න, මේ විෂයය නියමාකාර විධියට ඉගැන්වීම සඳහා පාසල් කීයකට පහසුකම් සපයා තිබෙනවාද කියා. යම්කිසි විෂයයක් උගන්වනවා නම් ඒ විෂයය ඒ ළමයින්ට නියම ආකාරයෙන් ඉගෙන ගන්නටත්, ගුරුවරුන්ට ඒ විෂයය නියම ආකාරයෙන් උගන්වන්නටත් පහසුකම් සලස්වන්නට ඕනෑ. ඒකයි මගේ තර්කය. ගරු නියෝජ්‍ය ඇමතිතුමා වැඩිදුර යන්නට ඕනෑ නැහැ. පළමුවෙන්ම කොළඹ නගරයේ තිබෙන පාසල් ගැන පරීක්ෂණයක් කරන්න. ඒ පාසල්වලින් කීදෙනකු ඒ විෂයය ඉගෙන ගන්නවාද, ඒ අයට කොපමණ පහසුකම් සලසා තිබෙනවාද කියා. කරුණාකර ඒ ගැන සොයා බලන ලෙස මම එතුමාගෙන් ඉල්ලන්නට කැමතියි.

ඊළඟට ලංකාවේ පාසල්වල ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන කියන්නට කැමතියි ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කරන්නට දැන් තමුන්නාන්සේලා විශාල අවධානයක් යොමු කර තිබෙනවා. නොයෙක් ගම්බද පාසල්වල තවමත් මේ කටයුත්ත හරියාකාර කරන්නට ගුරු මහත්වරු නැහැ. පසුගිය දවස්වල ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳව වැඩ සටහනකට සහභාගි වන්නට බ්‍රයන් ස්පිටල් කියා මහත්මයෙක් ලංකාවට පැමිණ සිටියා. 1985 නොවම්බර් 27 වැනි බදාදා " දිවයින " පත්‍රයේ මේ ගැන අතිරේකයක් පළ කර තිබෙනවා. ඒ මහතා සම්මුඛ සාකච්ඡාවකදී කියා තිබෙනවා, ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන. මොකක්ද ඒ මහතා කියා තිබෙන්නේ ? මේ රටේ පාසල් මට්ටමින් ඉංග්‍රීසි උගන්වනවා නම් එය ආරම්භ කළ යුත්තේ ඉතාම කුඩා අවධියේ යයි ඔහු කියා තිබෙනවා. දැන් බොහෝ පාසල්වල 3 වන ශ්‍රේණියේ සිටම ඉංග්‍රීසි උගන්වන්නට පටන් ගන්නවා. නමුත් මේ අන්දමට ඉංග්‍රීසි උගන්වන්නට ගම්බද පාසල් කීයක ගුරුවරු සිටිනවාද කියා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි. ඒ සඳහා ගුරුවරුන් නොමැති බොහෝ පාසල් තිබෙනවා. ඒ නිසා දැනට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා පහසුකම් නැති. ඒ පාසල්වලට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ගුරුවරුන් වහාම පත් කරන්නට කටයුතු කරන්නය කියා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නට කැමැතියි. ඒ ඉංග්‍රීසි විෂයය සම්බන්ධවයි.

දැන් මේ රටේ නොයෙක් දෙනා තුළ මතයක් ඇති වී තිබෙනවා, සිංහල භාෂාව ඉගැන්වීම ගැන. සිංහල භාෂාව ඉගැන්වීම ගැන නොයෙක් මත ප්‍රවෘත්ති පත්‍රවලත් පළවී තිබෙනවා. ඒ අයගෙන් බොහෝ දෙනෙක් කියන්නේ මොකක්ද ? සිංහල විෂය පාඨමාලාවේ තිබෙන දුර්වලකම් නිසයි කියනවා, අද බොහෝ දෙනෙකුගේ සිංහල දැනීම අඩු වී තිබෙන්නේ.

" මගේ දැනුමේ හැටියට මෙම භාෂා දැනුමේ දුර්වලතාවය ගුරුවරුන්ගේ වරද නිසා සිදු වන්නක් නොවෙයි. එයට හේතුව සාමාන්‍ය පෙළ විභාගය සඳහා නිර්දේශිත පාඨ මාලාවේ ඇති ඌනතාවයයි. එහි සරල බවයි. "



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

ඔය ආදී වශයෙන් විවිධ මත පළ වී තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ළමයින්ට සිංහල භාෂාව නියම ආකාරයෙන් ඉගැන්වීමට මේ විෂය මාලාව නියම ආකාරයෙන් සකස් වී නැත්නම්, කරුණාකර ඒ ගැන කටයුතු කරන්නය කියා.

ඊළඟට මම ගුරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නට බලාපොරොත්තු වන්නේ ගුරු පුහුණුව ගැනයි. ගුරු පුහුණුව සම්බන්ධ වෙනස්කම් රාශියක් මේ රජය යටතේ සිදු වී තිබෙනවා. දැන් ගුරු පුහුණු පාඨමාලා ක්‍රම කීපයක් තිබෙනවා. සේවාස්ථ ගුරු පුහුණුව, පූර්ව සේවා පුහුණුව, තුන් අවුරුදු නේවාසික ගුරු පුහුණුව හා දුරස්ථ පුහුණුව ආදී වශයෙන් ගුරු පුහුණුව ලබා දෙන ක්‍රම කීපයක් දැන් තිබෙනවා. ඒ ඇති කර තිබෙන වෙනස්කම්වල සමහර යහපත් ලක්ෂණ තිබෙනවා. මම පළමුවෙන්ම බලාපොරොත්තු වෙනවා, ඒ යහපත් ලක්ෂණ පෙන්වන්නට.

පළමු වැනි එක තමයි, අපොස උසස් පෙළ සමත් අය ගුරු පුහුණුවට තෝරා ගැනීම. එය ඉතාම හොඳ කාරණයක්. ඊළඟට ගුරු පුහුණු පාඨමාලාව අවුරුදු 3ක් කිරීමයි. එයත් වැදගත් කාරණයක්, යහපත් කාරණයක්. එමෙන්ම ගුරු පුහුණු පාඨමාලාව නේවාසික කිරීමත් හොඳ ලක්ෂණයක්. එයින් විශාල ප්‍රයෝජන ලැබෙනවා. ගැසට් කර තිබුණු පිළිවෙළට — තෝරා ගැනීමේදී කොහොම කරයිද මම දන්නේ නැහැ — ගුරු විද්‍යාල කථිකාචාර්ය වරුන්ගේ සුදුසුකම් ඉහළ මට්ටමකට නැංවීමත් හොඳ ලක්ෂණයක්. යහපත් ලක්ෂණයක්. ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ඉහළ මට්ටමකට නංවා තිබෙන බව මම දැක්කා. මෙවැනි වැදගත් ලක්ෂණ කීපයක් තිබෙනවා යයි මම කියනවා. ඒ වැදගත් ලක්ෂණ මම නැවත කියන්නම්. අපොස උසස් පෙළ සමත් අය ගුරු පුහුණුවට බඳවා ගැනීම හොඳ කාරණයක්. කලින් තිබුණු පිළිවෙළට ගුරු පුහුණුවට බඳවා ගත්තේ අපොස සාමාන්‍ය පෙළ සමත් අයයි. එමෙන්ම ගුරු පුහුණුව නේවාසික කිරීමත් හොඳයි. කාලය අවුරුදු 3ක් කිරීමත් වැදගත් ලක්ෂණයක්. ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන්වීමේ සුදුසුකම් ඉහළ දැමීමත් හොඳ ලක්ෂණයක්.

තවත් කරුණක් මම ගුරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමතියි. අවුරුදු 18 සිට 22 දක්වා වන වයස් සීමාව අවුරුදු 25 දක්වා වැඩි කරන හැටියටත් මම ගුරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නට කැමතියි. මන්ද, අ.පො.ස. (උසස් පෙළ) සමත් බොහෝ දෙනෙක් ඉන්නවා, අවුරුදු 18 ත් 25 ත් අතර. ඒ නිසා ඒ වයස් සීමාවේ සිටින යම්කිසි කෙනෙකුට ගුරු පුහුණුවට ඇතුළත්වීමට අවශ්‍ය නම් එයට ඉඩ ලබාදීම සඳහා, ගුරු පුහුණු පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීමේදී වයස් සීමාව අවුරුදු 18 සිට 25 අතර කාලය ලෙස ගණන් ගන්නා හැටියට මම ඉල්ලා සිටින්න කැමතියි.

මේ සභාවේ සම්මත වූ පනතක් අනුව, ගුරු පුහුණුව සඳහා අළුතෙන් බඳවා ගන්නා ශිෂ්‍යයින් ගුරු පුහුණු අධ්‍යාපන ආයතනවලට ඇතුළත් කර පුහුණුව ලබා දෙනවා. ගුරු සේවයේ ඉන්න අයට පැරණි ගුරු විද්‍යාල මගින් පුහුණුව ලබා දෙනවා. තමුන්නාන්සේලා ඇති කර තිබෙනවා, ගුරු අධ්‍යාපන ආයතන කිහිපයක්. විද්‍යාවට, ගණිතයට, ඉංග්‍රීසිවලට සහ කාර්මික අධ්‍යාපනයට ආදී වශයෙන්. මම අහන්න කැමතියි, සිංහල, බුද්ධාගම, සමාජ අධ්‍යයනය කියන විෂයයන් ගැනත් තමුන්නාන්සේලා ගුරු පුහුණු ආයතන ඇති කරන්න බලාපොරාත්තු වෙනවාද කියා. එහෙම නැත්නම් අනාගතයේදී එම විෂයයන් සම්බන්ධයෙන් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද කියා මම දැනගන්නට කැමතියි.

ඊළඟට මම සඳහන් කරන්නේ මහරගම ගුරු විද්‍යාලය ගැනයි. මහරගම ගුරු විද්‍යාලය ලංකාවේ තිබුණු ඉතාමත්ම වැදගත් ගුරු විද්‍යාලයක්. ජනවාරි මාසයෙන් පසුව, මේ ගුරු විද්‍යාලයේ සේවය කරන ආචාර්ය මණ්ඩලවල තත්ත්වය කුමක්ද ? එහි තිබෙන සම්පත් කුමන ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමට යනවාද ? විශාල ප්‍රශ්ණයකට ලක් වූ කාරණයක් තමයි, මහරගම ගුරු විද්‍යාලය පිළිබඳ ප්‍රශ්ණය. ඒ නිසා මම ගුරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, විද්‍යා අංශ ඇතුළුව ඉතාම වටිනා සම්පත් තිබෙන්නා වූ මහරගම ගුරු විද්‍යාලය කවර කාරණයක් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වෙනවාද කියා.

ඊළඟට මම කතා කරන්න කැමතියි, ගුරු විද්‍යාලවල පුහුණුව ලැබූ ශිෂ්‍යයින්ට සිදු වූ අසාධාරණයක් ගැන. 1982 ජූනි මාසයේ ගුරු විද්‍යාලවල පුහුණුව අවසන් කළ ශිෂ්‍යයින් අවුරුදු එකහමාරක් ප්‍රායෝගික වශයෙන් ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා විද්‍යාලවලට පත් කලා. ඒ අයට 1983 දෙසැම්බර් මාසයේදී ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව තිබුණා. මේ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීමේදී බොහෝ ශිෂ්‍යයින්ට විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. මේ පරීක්ෂණය සම්බන්ධයෙන් ඒ අයට නියමිත වෙලාවට දන්වා නැහැ. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපි අදාළ පාසල්වලට ලැබී තිබුනේ නිවාඩු කාලයේදීයි. ඒ වන විට විදුහල්පතිවරු අ.පො.ස. (සා.පෙ.) විභාග වැඩ කටයුතුවල යෙදී සිටීම නිසාත් සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමේ ලිපි පමාවී ලැබීම නිසාත් විදුහල්පති වාර්තා ලිපි ලබා ගැනීමට ඒ ගුරු ශිෂ්‍යයින්ට අසීරු වුනා. එමනිසා මේ විධියට 1983 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණයක් මගින් ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සම්පූර්ණ අසාධාරණයක් හැටියට ගුරු ශිෂ්‍යයින් චෝදනා කරනවා.

ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන්නට ඕන, සම්මුඛ පරීක්ෂණයක් මගින් නොවෙයි. සම්මුඛ පරීක්ෂණයකින් කොහොමද, ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන්නේ ? ගුරු විද්‍යාලයක පුහුණුව ලැබූ පුද්ගලයෙක් හැටියට මම දන්නවා, ගුරු පුහුණුවේ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන්න ඕනෑ, ගුරු ශිෂ්‍යයා විද්‍යාලවල ඉගැන්වීම කරන අවස්ථා කිහිපයක් නිරීක්ෂණයට ලක් කර, ඒ අනුව යම්කිසි ලකුණු දීමක් කිරීමෙන්. ඒ වාගේම පුහුණුව ලබන අවුරුදු දෙකක නැත්නම් අවුරුදු තුනක කාලය තුළ ඔවුන් කරනු ලබන ප්‍රායෝගික ඉගැන්වීම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමෙන්. එහෙම නැතිව සම්මුඛ පරීක්ෂණයක් මගින් කොහොමද, ගුරු පුහුණුව පිළිබඳව ප්‍රායෝගික රීක්ෂණයක් පවත්වන්නේ කියා මම දැන ගන්නට කැමතියි.

1984.07.21 වැනි දින, විභාග කොමසාරිස්තුමා විභාගයක් පැවැත්වූවා, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා. ඒ සඳහා තෝරාගත් අයට එවූ ලිපියක මෙන්න මේ විධියට සඳහන් වෙනවා. :

"අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා විභාග කොමසාරිස් විසින් 84.07.21 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඔබ තෝරාගෙන ඇත. ඔබ වෙනුවෙන් වැයවන විශ්වවිද්‍යාල පාඨමාලා ගාස්තු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දරනු ලැබේ."

"පාඨමාලා ගාස්තු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දරනු ලැබේ" කියලයි, මෙහි සඳහන් වී තිබෙන්නේ. අන්න ඒ කාරණය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඒ කාරණය ඒ අයුරින් ඉටු වී නැහැ. ඒ අය විවෘත විශ්වවිද්‍යාලයට ගියාට පසුව පාඨමාලා සඳහා ගාස්තු අයකර තිබෙනවා. ඒ නිසා කරුණාකර මේ ලිපියේ සඳහන් අන්දමට ගාස්තු නොගෙවා මේ පාඨමාලාව හදාරන්නට අවකාශ ලබාදෙන හැටියට මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ ලිපිය යවා තිබෙන්නේ "අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට" කියා අත්සන් තබලයි.

දැනට අපට ආරංචියක් තිබෙනවා, විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙයවීම යටතේ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව දිස්ත්‍රික්ක කීපයක දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වන්නට කටයුතු කර තිබෙනවාය කියා. මම අහන්න කැමතියි ගරු ඇමතිතුමාගෙන්, කොහොමද මේක කරන්න යන්නෙ, ඒ විධියට කිරීමෙන් මේ කාර්‍ය්‍ය සාර්ථක වෙනවාද කියා. ඒ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. විශ්වවිද්‍යාලවල ආචාර්‍ය්‍ය උපාධි ලබා අධ්‍යාපනය සම්බන්ධයෙන් නොයෙක් අත්දැකීම් තිබෙන කථිකාචාර්‍ය්‍යවරු, මහාචාර්‍ය්‍යවරු, පීඨාධිපතිවරු ඉන්නවා. ගුරු විද්‍යාල තව පැත්තකින් තිබෙනවා. ඒ ගුරු විද්‍යාලවල කථිකාචාර්‍ය්‍යවරු ඉන්නවා. මේ අංශ සියල්ල ඒකාබද්ධ වී ඕනෑ, මේ රටේ ගුරු පුහුණුව සඳහා කටයුතු කරන්න. උපාධිධාරියෙක් පුහුණු කළත් අපොස උසස් පෙළ සමත් කෙනෙක් පුහුණු කළත් මේ අංශවල සම්බන්ධයක් තිබෙන්න ඕනෑ.

**සභාපතිතුමා**
(தவிசாளர்)
(The Chairman)

දැන් මිනිත්තු 20ක් කථා කළා. තව කොපමණ වෙලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙනවද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
තව මිනිත්තු 20ක් පමණ.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
තව හතලිස් දෙන්නෙක් කථා කරන්න ඉන්නවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
විරුද්ධ පක්ෂයට මිනිත්තු 45ක් දී තිබෙනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
එහෙනම් ඒ පැත්තෙන් වෙන කවුරුවත් කථා කරන්නෙ නැහැ ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
තව එක්කෙනෙක් දෙන්නෙක් කථා කරයි.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
තව මිනිත්තු 10ක් දෙන්නම්.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
මට තව කරුණු කීපයක් ගැන කථා කරන්න තිබෙනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
They must send me a note.
විරුද්ධ පක්ෂයේ නායකතුමා හෝ නියෝජ්‍ය නායකතුමා හෝ මට සටහනක් එවන්න එපායැ ? නැත්නම් මට පාලනය ගෙන යන්න අමාරුයි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි, මේ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම ගැන නැවත වරක් කල්පනා කර බලන්නය කියා. දැන් මේ වාරයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන පීඨවල පිරිවෙන් ගුරුවරුන් තිස් ගණනක් පමණ ඉන්නවා. ලබන අවුරුද්දේ මේ අය ඉවත් වුනාම කොළඹ විශ්ව විද්‍යාලයේ තිබෙන ඒ අධ්‍යාපන පීඨය අනිවාර්යයෙන්ම වසා දමන්න සිද්ධ වෙනවා. එතකොට ඒ අංශයේ ප්‍රවීනත්වයක් ලබා තිබෙන ඒ අංශවල සිටින අයගේ සේවය මේ කාර්යය සඳහා ලබා නොගන්නේ මන්ද කියා මම ගරු ඇමතිතුමාගෙන් මම අහන්න කැමතියි. ඒ නිසා කරුණාකර ඒ ගැන අවධානය යොමු කර ඒ අයගේ සේවය මේ රටේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ලබාගන්නා හැටියට මම ඉල්ලන්න කැමතියි.

ඊළඟට ගුරුවැටුප් පිළිබඳ ප්‍රශ්නය ගැන. දයාරත්න කමිටුවේ නිර්දේශ මත ගුරුවරුන් කොටසකගේ වැටිප් වැඩි කරනු ලැබුවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් දයාරත්න කමිටුවේ අවධානයට ලක් නොවුන යොමුවුනු ගුරුවරු රාශියක් මේ රටේ ඉන්නවා. සහතික ලත් ගුරුවරු 6,821ක් ඉන්නවා. අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික ලත් ගුරුවරු 19,999ක් ඉන්නවා. එතකොට පසුගිය අවුරුද්ද අන්තිම වන විට ගුරුවරුන් මුළු සංඛ්‍යාව විසිහයදහසකට අධික සංඛ්‍යාවක් ඉදලා තියෙනවා. ඒ අයට මේ වැටුප් වැඩිවීම ලැබුණේ නැහැ. ප්‍රවෘත්තිපත්‍රවල තිබෙනවා, මේ අය ගැන සලකා බලනවාය කියා. එමනිසා කරුණාකර නොපමාව මේ අයගේ වැටුප් වැඩි කිරීමට කටයුතු කරන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට ඒ වාර්තාව අනුව දැනට අධ්‍යාපන සේවයේ යෙදී ඉන්න අයගේ වැටුප් වැඩි කරන්නට නිර්දේශ කර තිබෙනවා. දැන් අවුරුද්දක් පමණ කල් ගත වුණා, තවම මේ වැටුප් වැඩි කර නැහැ. ගිය අවුරුද්දේ ලැබුණ මුදලත් මේ අවුරුද්දේ ලැබෙන මුදලත් සංසන්දනය කර බැලුවොත්, මේ රටේ මුදලේ අවප්‍රමාණ වීම ගැන කල්පනා කර බැලුවොත්, මේ අයට එයින් විශාල අසාධාරණයක් වී තිබෙන බව පේනවා. එම නිසා දයාරත්න කමිටුවෙන් නිර්දේශිත වැටුප් වැඩිවීම් අධ්‍යාපන සේවයේ යෙදුණු අයට වහාම ලබා දෙන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි.

දැන් මේ රටේම ගුරුවරුන් අතර තිබෙන ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා, චෙක් පත් මගින් ගුරුවරුන්ගේ වැටුප් ගෙවීම සම්බන්ධ යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නට යනවාය කියන කාරණය. මේ විද්‍යාලවල ගුරුවරුන්ට ගෙවීම සඳහා විදුහල්පතිවරුන් බැංකුවලට ඇවිල්ලා වැටුප් ගෙනියන්නට ඕනෑ. මේක දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. වෙන අංශවල වැටුප් ගෙවීමේදී පොලිස් ආරක්ෂාව තිබෙනවා. වතුවල පඩි ගෙනියන්නට පොලිස් ආරක්ෂාව තිබෙනවා, බොහෝවිට. සමුපකාරවල මුදල් ගෙනියන්න පොලිස් ආරක්ෂාව තිබෙනවා. අනෙක් අංශවල වැටුප් ගෙනියන්න පොලිස් ආරක්ෂාව තිබෙනවා. නමුත් මේ රටේ විදුහල්පතිවරයෙකුට වැටුප් ගෙනියන්න ඒ කිසිම ආරක්ෂාවක් දෙන්නේ නැහැ. බොහෝවිට මග යන විට රැක ඉඳලා මිරිස් කුඩු හෝ මොනවා හෝ ගහලා සල්ලි උදුරා ගන්නවා. එවැනි අවස්ථා රාශියක් ඇති වී තිබෙනවා. ඒකට ප්‍රතිකර්මයක් හැටියට ගුරුවරුන්ගේ වැටුප් චෙක්පතින් ගෙවන්නට නියම කළාම මේක විශාල ප්‍රශ්නයක් වෙනවා, ගුරුවරුන්ට. මේ චෙක්පත් මාරු කර ගැනීමේදී නොයෙක් අපහසුතාවයන්ට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. එම නිසා යම්කිසි ආරක්ෂිත පදනමක් මත ගුරුවරුන්ගේ වැටුප් එම විද්‍යාලවලටම ගිහිල්ලා ගුරුවරුන්ට බෙද හරින්නට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නටය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. ලංකාවේ පාසල් සංඛ්‍යාව බැලුවාම, ඒක ටිකක් අමාරු වැඩක්. 9,914ක් පාසැල් තිබෙනවා, ගිය අවුරුද්දේ වාර්තාවේ හැටියට. නමුත් ආරක්ෂාව සහිතව ඒ විද්‍යාලවලට ගිහිල්ලා ගුරුවරුන්ගේ පඩි ලබා දීමට යම්කිසි ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
Order, please ! I have consulted the deputy leader of your party and he has submitted six names and says that it is only he who will not be speaking. So I cannot allow you anything more than four minutes more. So you will please stop at 9.45.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

ඒවාගේම සෞන්දර්ය අධ්‍යාපන අංශයේ ගුරු පත්වීම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. දැන් විශ්ව විද්‍යාලයට සම්බන්ධ සෞන්දර්ය අධ්‍යාපන අංශයේ පුහුණුව ලබා, උපාධි ලබාගෙන ඉන්නවා, චිත්‍ර, සංගීත, නැටුම් කියන මේ අංශ තුනෙන්ම. නමුත් 1982 න් පස්සේ චිත්‍රකර්ම උපාධිය ලැබූ අය ගුරු වෘත්තියට කැඳවා නැහැ. විශාල රාශියකම මේ අංශයේ පුරප්පාඩු තිබෙනවා. එම නිසා උපාධි ලබාගෙන ඉන්න සෞන්දර්ය අධ්‍යාපන අංශයේ චිත්‍ර අංශයේ අය සම්මුඛ පරීක්ෂණයකට කැඳවන්නට කටයුතු කරන හැටියට මම ඉල්ලීමක් කරනවා.

අනෙක් කාරණය, අපි මෙම කාරණය පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදීත් තමුන්නාන්සේගේ අවධානයට යොමු කළා. පහසුකම් සහ සේවා ගාස්තුවලින් සුළු මුදලක් ගෙවා සංගීත හා නැටුම් අංශවලට අයත් ගුරුවරු දීර්ඝ කාලයක් තිස්සේ සේවයේ යොදවා ගෙන ඉන්නවා. ගැසට් නිවේදනයේ වයස් සීමාව අනුව අවුරුදු 28 පසු වුණාම, මේ අයට ගුරු පත්වීම් සඳහා ඉල්ලන්නට පුළුවන් කමක් නැහැ. එම නිසා මම ඉල්ලීමක් කරනවා, දැනට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රවඩ පතිරණ මහතා]
විද්‍යාලවල තැටුම් සහ සංගීත ගුරුවරුන් හැටියට පහසුකම් සහ සේවා ශාස්ත්‍රවලින් සේවයට යොදාගෙන ඉන්න අය, ගුරුවරුන් හැටියට ස්ථිර කරන්නට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නා හැටියට.

ඊළඟට මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට කැමතියි පෞද්ගලික පාසල් ගැන. මේ රටේ පෞද්ගලික පාසල් රාශියක් තිබෙනවා. ඒවාට නොයෙක් අන්දමේ ආධාරත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සපයනවා. එම නිසා පෞද්ගලික පාසල්වල අධ්‍යාපන පටිපාටිය ගැන, විෂය මාලාව ගැන, ගුරුවරුන් යොදා ගන්නා ක්‍රමය ගැන, ඔවුන් බඳවා ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කෙරෙන ආකාරය ගැන කරුණාකර අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කරුණු සොයා බලා ඒවා සාධාරණ අන්දමට සිදුවෙනවාද කියා සලකා බලන හැටියට මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.

ඊළඟට මම අධ්‍යාපන සේවා අමාත්‍යාංශය ගැන කරුණු කිහිපයක් කියන්න කැමතියි. මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනම සාකච්ඡාවට භාජනය කළා නම් මම කැමතියි. පොල් කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනම සාකච්ඡාවට භාජනය වුණා. ආයුර්වේද අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනම සාකච්ඡාවට භාජන වුණා. එම්නිසා අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත් වෙනමම සාකච්ඡාවට භාජන වුණා නම් ඒක වැදගත් වෙනවා. අධ්‍යාපන සේවා ඇමතිතුමා ඒ අමාත්‍යාංශය මඟින් කරන සේවාව ගැන අපි ඇත්තවශයෙන්ම සතුටට පත් වෙනවා. මම එතුමාගෙන් එක ඉල්ලීමක් කරන්න කැමතියි. පාසල් වලින් මේ ජනවාරි මාසයේ අපට එන විශාලම පැමිණිල්ල තමයි, ළී බඩු ගන්නටය කියා රුපියල් සියයේ සිට දෙසිය පනහ දක්වා මුදලක් ඒ ළමයින් ඇතුළු කරන දෙමාපියන්ට ගෙවන්නටය කියා නොයෙක් පාසල්වලින් ඉල්ලනවාය කියන පැමිණිල්ල. මේක ගාල්ල දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාවේ සැම දිස්ත්‍රික්කයකම තිබෙන තත්ත්වයක්. ඒ ගැන විශේෂ අවධානයක් යොමුවෙන කාලය මේක. එම්නිසා එවැනි මුදල් ගෙවන්නට බැරි දෙමාපියන්ගෙන් මෙම මුදල් ගැනීම සම්පූර්ණයෙන්ම වළක්වාලන හැටියට මම ඉල්ලා සිටින අතර, ඒ සඳහා එතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඒ සමහර දෙමාපියන් ඉන්නවා ඇත්තවශයෙන්ම ගෙවන්නට පුළුවන් අය. ඒ වාගේම සමහරු ඉන්නවා කොහෙත්ම ගෙවන්න පුළුවන් කමක් නැති අය. එම්නිසා ඔවුන්ගේ ඒ දිළිඳුකම දරුවන් පාසල්වලට ඇතුළත් කරවීමට බාධාවක් නොවන හැටියට සුදුසු කටයුතු කරන්නය කියා මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

පූ. භා. 9.41

විභාග දෙපාර්තමේන්තුව ගැනත් එක වචනයක් පමණක් මම සඳහන් කරනවා. මේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ගැන ජනතාවගේ විශ්වාසය ඇතිවෙන ආකාරයෙන් කටයුතු කළයුතුව තිබෙනවා. විභාගවලට ප්‍රාදේශීය මට්ටමෙන් විභාග ශාලාධිපතිවරුන් පත් කිරීමේදී ඔවුන්ට තමන් කැමති විභාග මධ්‍යස්ථානවලට පත්වෙන්නට කිසිසේත්ම ඉඩ නොදෙන්නය කියා මම ඉල්ලීමක් කරන්න කැමතියි. විභාග ශාලාධිපතිවරුන්ට තමන් කැමති මධ්‍යස්ථානයකට පත්වෙන්නට අවකාශ ලැබෙනවා නම් එය වහාම නතර කරන හැටියට ඉල්ලමින්, ගරු ඇමතිතුමාගෙන්, නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, අධ්‍යාපන සේවා ඇමතිතුමාගෙන් මෙහෙයවීම යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු ඉදිරි වර්ෂයේදී වඩාත් සාර්ථක කරගැනීමට හැකිවේවායි පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (කඹුරුපිටිය)
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன — கம்புறுப்பிட்டிய)
**(Mr. Chandrakumara Wijeya Gunawardane – Kamburupitiya)**

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාගේත් අවධානය යොමු කරවන්නට අවස්ථාව ලබාදීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබාදීම සඳහා නියම මාර්ගයේ දූන් අධ්‍යාපනය ගමන් කරවීමට කටයුතු සංවිධානය කිරීම ගැන මම පළමුවෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාටත් මේ වේලාවේදී ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම ඔබ දෙපොළගේම අවධානය යොමු කරවන්නට බලාපොරොත්තු වෙනවා පළමුවෙන්ම අද අධ්‍යාපනය ලබාගන්නා දරුවාගේ කියවීමේ රුචිය වැඩි කිරීමට හැම විදුහලකම පුස්තකාල දිනට වඩා උසස් අන්දමින් ඇති කිරීමට කටයුතු කරන ලෙස. ඒ සඳහා දැන් අවස්ථාව එළඹ තිබෙනවා. ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා දැනටමත් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා යම් යම් විදුහල්වල පුස්තකාල ආරම්භ කිරීමට. නමුත් දැනට පුස්තකාල පහසුකම්, හැම විදුහලකටම, ලැබී නැහැ. පසුගිය කාලයේ කළ සමීක්ෂණ වලදී මට දැනගන්නට ලැබුණු එක කාරණයක් තමයි අපේ දරුවන්ගේ දැනුම පාඨශාලාවේ ඉගෙන ගන්නා විෂයයන්ට පමණක් සීමාවෙමින් පවතින බව. එනිසා බාහිර අධ්‍යාපනයක් ලබාගැනීමට කියවීමේ රුචිය දියුණු කිරීම ඉතාමත්ම අවශ්‍ය බව මම මේ වේලාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්නට කැමතියි.

යුනෙස්කෝ වැනි සංවිධානවල විශේෂ ආධාර ලබා ගෙන ඒ පාසල්වලට වැඩි-වැඩියෙන් පුස්තකාල පහසුකම් ලබා දීම සඳහා කටයුතු කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙනවා. මගේ ආසනයේ තිබෙන හැම විදුහලකම විදුහල්පතිවරු තමන්ගේ විදුහල්වලට පුළුවන් ප්‍රමාණයෙන් පුස්තකාල පහසුකම් ලබා දී තිබෙනවා. නමුත් ඒ සමහර පුස්තකාලවලට දිනපතා පුවත් පත්වත් ලබා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා. හැම විදුහලකම පහසුකම් ගාස්තු අය කෙරෙන්නේ නැහැ. හැම විදුහලකම පහසුකම් ගාස්තු අය කිරීමේ අපහසුතා තිබෙනවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා, හැම විදුහලකටම දිනපතා පුවත්පත්, සඟරා ලබා දී ඒවා කියවීමේ අවස්ථාව ඒ දරුවන්ට ලබා දෙන්න.

ඊළඟට මම ස්තුතිවන්ත වෙනවා, අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රවඩ පතිරණ මහතා) කීවා වාගේ ජීවන කුශලතා විෂයය ඉගැන්වෙන පාඨශාලාවල අද ඉතාමත් ජනප්‍රිය විෂයයක් වශයෙන් එය පවත්වාගෙන යෑම ගැන. නමුත් හැම පාඨශාලාවකම ඒ විෂයය ඉගැන්වෙන්නේ නැහැ. මගේ ආසනයේ හාදුගල විදුහලේ ජීවන කුශලතා විෂයය ඉගැන්වීමට අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ ශිෂ්‍යයන් ඉතාමත් උනන්දුවෙන් ඒ විෂයය හදාරනවා. පසුගිය දවස්වල ඒ විදුහලේ පැවැත්වුණා, ප්‍රදර්ශණයක්. ඒ අවස්ථාවේදී මට පුදුම හිතුණා, ඒ ළමයින්ගේ කුශලතාවන් පිළිබඳව. තමන්ගේ සහජ දක්ෂතාවන් ඔප-මට්ටම් කරගෙන ඒවායින් නියම ප්‍රයෝජන ලබාගෙන ඉදිරියේදී ඇතිවන අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමට ඒ විෂයය ඉතාම ප්‍රයෝජනවත් වෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ජීවන කුශලතා විෂයය සෑම පාඨශාලාවකම අනිවාර්ය විෂයයක් වශයෙන් ඉගැන්වීමට කටයුතු සැලැස්වීමෙන් අපේ දරුවන්ට අවශ්‍ය වන ඒ කුශලතා දියුණු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්නය කියා.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකයෙනුත් විශාල සේවයක් ඉටු වේගෙන යනවා. විශේෂයෙන් වැඩිහිටි ශිෂ්‍යයන්ට තාක්ෂණික දැනුම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය වෙමින් පවතිනවා. මේ වගේ නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා කීපයක් මගේ ආසනයේත් දැනට ආරම්භ කර තිබෙනවා. ඒවා ඉතාමත් සාර්ථක ලෙස කරගෙන යනවා. ඒ අතර තවත් පන්ති ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර තිබෙනවා. නමුත් පාඨශාලා හතරක ඒ වගේ අධ්‍යාපන පාඨමාලා සකස් කිරීම සඳහා දැනට මාස හය-හතක් තිස්සේ සංවිධාන කටයුතු කරගෙන ඇවිත්, අප විසින් කරනු ලැබිය යුතු කටයුතු සියල්ල නිම වී තිබුණත් ඒවාට අවශ්‍ය උපකරණ ටික අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තවම අපට ලබාදී නැහැ. ඒ නිසා, ඒ වැඩිහිටි පන්තිවලට අවශ්‍යවන උපකරණ ඉතා ඉක්මණින් අපට සපයාදීම පිළිබඳව ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ මොකද කීවොත් ඉතාමත් ජනප්‍රිය පාඨමාලාවක් වශයෙන් එය අපේ ආසනවල පවත්වාගෙන යන නිසයි.

ගරු අධ්‍යාපන ඇමතිතුමා සහ අධ්‍යාපන සේවා ඇමතිතුමාත් යන දෙපොළත්, නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත් දන්නවා, කඹුරුපිටිය ආසනයේ මධ්‍ය මහා විද්‍යාලයේදී උපාලි විජේවර්ධන සම්මන්ත්‍රණ ශාලාව පසුගිය දවස්වල විවෘත කරන්න යෙදුණු බව. එය උපාලි විජේවර්ධනගේ මැතිමැතිණියන්ගේ පරිත්‍යාගයන් තුළින් ඉදි කරනු ලැබූ විශාල සම්මන්ත්‍රණ ශාලාවක්. අද ඒ සම්මන්ත්‍රණ ශාලාවේ විශාල වශයෙන් සම්මන්ත්‍රණ පවත්වාගෙන යනවා. විශේෂයෙන් ප්‍රදේශයේ අධ්‍යාපනික කටයුතු පිළිබඳ සම්මන්ත්‍රණ සියල්ලම ඒ සම්මන්ත්‍රණ ශාලාවේ තමයි, පැවැත්වෙන්නේ. ඒ සම්මන්ත්‍රණ ශාලාවට තිබෙන එකම අඩුපාඩුව මෙයයි : සම්මන්ත්‍රණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශාලාවට පුටු 250ක් පමණ පරිත්‍යාග කර තිබෙනවා. උපාලි විජේවර්ධන මැතිතුමා. නමුත් ඒ ශාලාවේ 1,000කට ආසන පහසුකම් සපයන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අධ්‍යාපන සේවා ඇමතිතුමාගෙන් මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්මන්ත්‍රණ ශාලාවට අවශ්‍ය ඉතිරි පුටු ටික ලබාදෙන්නය කියා.

අපේ මාතර දිස්ත්‍රික්කයේ පාඨශාලාවලට අවශ්‍යවන සියලුම පුටු එතුමා ලබා දී තිබෙනවා. නමුත් තවම ඩෙස්ක් ලබා දී නැහැ. ඒ නිසා ඩෙස්ක් ලබා දීමටත් ඉතා ඉක්මණින් පියවර ගන්නා ලෙස මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පාඨශාලාවලට උපකරණ ප්‍රදානය කිරීමේදී ඒ කිසිවක් ආධාර ලබන පාඨශාලාවලට ලැබෙන්නේ නැහැ. මගේ ආසනයේත් තිබෙන සාන්ත මරියා කන්‍යාරාම පාඨශාලාවත් රජයේ ආධාර ලබන පාඨශාලාවක්. ඒ පාඨශාලවත් අපේ අධ්‍යපන ක්ෂේත්‍රයේ ඉතා වැදගත් ස්ථානයක් ගන්නවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සංවිධානය කරන හැම සම්මන්ත්‍රණයකටම, හැම තරගයකටම ඒ පාඨශාලාවත් ඉදිරිපත් වෙනවා. ඒ පාඨශාලාවෙනුත් ඉතා උසස් අධ්‍යාපනයක් ලබාදෙනවා. ඒ නිසා මම ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පාසල්වලටත් අවශ්‍ය උපකරණ, පුටු බංකු ආදිය දෙන්න පුළුවන්කමක් නැත්නම් අඩු ගණනේ—

**ලයනල් ජයතිලක මහතා (ඇමතිතුමා)**
**(திரு. லயனல் ஜயதிலக்க — அமைச்சர்)**
**(Mr. Lionel Jayatilleke – Minister)**

ඒ පෞද්ගලික පාසල්වලට රජයට බැදෙන්නය කියා නමුන්නාන්සේට යෝජනා කරන්න පුළුවන්. එතකොට ප්‍රශ්නයක් නැහැ.

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)
**(Mr. Chandrakumara Wijeya Gunawardane)**

නමුන්නාන්සේට පුළුවන් නම් අඩු ගණනේ භූමි ශාස්ත්‍රය උගන්වන්නට අවශ්‍ය උපකරණ, ලෝක ගෝලය, සිතියම් ආදී දේවල්වත් ලබා දෙන්නට කටයුතු කරනවා නම් ඉතාමත් වැදගත් වෙනවා.. මොකද ? මා පෞද්ගලිකව විශ්වාස කරනවා මේ පෞද්ගලික පාසල් අද ඉතා උසස් අන්දමින් කටයුතු කරගෙන යන බව. විනය පිළිබඳව බැලුවත් ඉතාමත් හොඳ තත්ත්වයකින් පවත්වාගෙන යනවා. අධ්‍යාපනය පිළිබඳව බැලුවත් ඉතා උසස් අන්දමේ අධ්‍යාපනයක් ළමයින්ට ලබාදෙන බව පෙනී යනවා. අද විවෘත ආර්ථිකයක් තිබෙන්නා වාගේ තරගකාරී ආර්ථික ක්‍රමයක් තිබෙන්නා වාගේ මේ පෞද්ගලික පාසල්ද අමාත්‍යාංශයේ පාසල් තත්ත්වයෙන් පවත්වාගෙන යන්නට තරගකාරීව ඉදිරියට යමින් උසස් අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කරනවා. මා හිතන විධියට දහස් ගණනක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ පාසල්වල ඉගෙන ගන්නවා. ඒ නිසා ඒ අයගේ පහසුව සඳහා නමුන්නාන්සේගේ අමාත්‍යාංශය මගින් ඒ අවශ්‍යතාවයත් සපුරා දෙනවා නම් එය ඉතා උසස් ක්‍රියාවක් බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි.

ඒ සමගම මා මතක් කරන්න කැමතියි. මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය මගින් නිකුත් කර තිබෙන වීරචරිත පොත් පිංච කීපයක් මම පසුගිය දවස්වල දුටුවා. මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් මේ පොත් ප්‍රසිද්ධ කරගෙන යනවා. මේ පොත් ඉතාම සරල බසින් ලියවී තිබෙන අතර සෑම ළමයෙකුටම ඉතාම හොඳින් අවබෝධ කර ගන්න පුළුවන් විධියට සකස් කර තිබෙනවා. ඒ නිසා මේ පොත් ලංකාවේ සෑම පාසලකම දරුවන්ට කියවන්න අවස්ථාවක් සලසා දෙන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ දරුවන්ට අපේ වීර චරිත ගැන අවබෝධයක් ලබා දිය යුතු කාලය දැන් එළඹ තිබෙනවා. මේ වීර චරිත අනුව අපේ දරුවන්ගේ චරිත සකස් කර ගැනීමට අවශ්‍ය කාලය දැන් එළඹ තිබෙනවා. මේ කාලයේදී බොහොම ළමයින් කතා කරන්නෙ " තයිටරයිඩර් " ගැන. එහෙම නැත්නම් " සුපර් මෑන් " ගැන අපේ ධර්මපාලතුමා ගැන කථා කරන්නෙ බොහොම අඩුවෙන්. මද්දුම බණ්ඩා ගැන කථා කරන්නේ බොහොම අඩුවෙන්. වෙනත් ජාතික වීරවරයින් ගැන කථා කරන්නෙ බොහොම අඩුවෙන්. ඒ නිසා අපේ පාසල් පුස්තකාලවලට අනිවාර්යයෙන්ම මේ පොත් ලබා දී අපේ දරුවන්ට විශේෂයෙන් වීර චරිත තුළින් තමන්ගේ චරිත ශක්තිය දියුණු කර ගැනීමට අවස්ථාව සලසා දෙන්නය කියා විශේෂයෙන් අධ්‍යාපන සේවා ඇමතිතුමාගෙන් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඊළඟට අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරන මහතා) සඳහන් කළ කාරණයක් ගැන මම මතක් කරන්න කැමතියි. අපේ ගුරුවරුන් අතර පඩි වැඩිවීමට ලක් නොවුණ විශාල ගුරු පිරිසක් නව දහස් ගණනක් අද සිටිනවා. ඒ අයත් පඩි වැඩිවීමට ලක් වුණ ගුරුවරුන් වගේම සේවයක් අද කරගෙන යනවා. ඇතැම් ගුරුවරුන් උසස් පෙළ සහතික පමණක් ලබාගෙන සිටියත්, සහතික ලත් ගුරුවරුන් වශයෙන් සේවය කළත්, උපාධිධාරී ගුරුවරුන් වගේම පුහුණු ගුරුවරුන් වගේම ඒ අයත් ඉතාම උනන්දුවෙන් ඉතා උසස් සේවයක් දැනට කරගෙන යනවා. ඒ නිසා ඒ ගුරුවරුන්ගෙන් පඩි වැඩි කිරීමට ඉතා ඉක්මනින් ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිමින් 1986 වර්ෂයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති කිරීමට නමුන්නාන්සේලා දෙපොළටම ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා

**කේ. අබේවික්‍රම මහතා (මාතර දිසා ඇමතිතුමා)**
**(திரு. கே. அபேவிக்ரம — மாத்தறை மாவட்ட அமைச்சர்)**
**(Mr. K. Abeywickrema – District Minister, Matara)**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී කඹුරුපිටිය ගරු මන්ත්‍රීතුමාත් කථා කරන්න යෙදුනා. ඒ නිසා මම දීර්ඝ වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ ඉතාම වැදගත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කෙරෙන සාකච්ඡාවට සහභාගී වීම ඉතාම වැදගත්ය කියා මා කල්පනා කළා. මීට කලිනුත් සඳහන් වුණ පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශය මේ රටේ ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක් හැටියට සඳහන් කරන්න පුළුවන්. මක්නිසාද ? වර්තමානයට පමණක් නොව මේ රටේ අනාගතයටද බෙහෙවින් බලපාන විශාල භාරදූර කර්තව්‍යයක් ඉටු කරන අමාත්‍යාංශයක් හැටියට විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය සැලකිය හැකි නිසයි. අක්මීමන ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලබන දරු දැරියෝ තිස් හය ලක්ෂයක් පමණ සිටිනවා. ගුරු බවතුන් එක් ලක්ෂ හතළිස් දහක් පමණ කටයුතු කරනවා. එයින් පැහැදිලි වෙනවා මේ අමාත්‍යාංශය මේ දෙපාර්තමේන්තුව මේ රටේ සංවර්ධනය සඳහා මේ රටේ අනාගත යහපත සඳහා කොතරම් දුරට ඉවහල් වෙනවාද යන බව. රජයේ වැය ගැන කල්පනා කරන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන වැදගත්කම නිසාම මේ තරම් විශාල මුදලක් මේ අමාත්‍යාංශය වෙනුවෙන් වැය කරන්නට සිදු වී තිබෙන බව පෙනෙනවා.

ඒ වාගේම මෑත යුගය ගැන සලකා බලන විට 1977න් මෙපිට මේ රජය යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති වී තිබෙන බව අප සඳහන් කරන්න ඕනෑ. ප්‍රාථමික අධ්‍යාපනයේත් ඒවාගේම අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලත් සෑහෙන දියුණුවක් ඇති වී තිබෙනවා. ඒ වාගේම ඒ සඳහා සෑහෙන පහසුකම් රාශියක් ලබා දීමටත් කටයුතු කර තිබෙනවා. ගොඩනැගිලි, ගුරු අභ්‍යාස විද්‍යාල සහ වෙනත් අවශ්‍ය පහසුකම් රාශියක් මේ නොයෙක් දුෂ්කරතා මධ්‍යයේත් ලබා දී තිබෙන බව සඳහන් කරන්න ඕනෑ. ඒවාගේම වැඩි වන ජනගහනය අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි වන පිරිස ගැන සලකා බලන විට තවත් සෑහෙන කාර්ය භාරයක් රජයට පැවරී තිබෙන බව මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. තව බොහෝ පහසුකම් ලබා දීම අවශ්‍ය බව මම මතක් කරන්න ඕනෑ.

පූ. භා. 10

අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන කරුණු සඳහන් කළා. එය ඉතාම වැදගත් දෙයක්. බණ්ඩාරනායක යුගයේදී සිංහල භාෂාව පැය විසි හතරෙන් රාජ්‍ය භාෂාව හැටියට පරිවර්තනය කරන්නට බලාපොරොත්තු වීමේ විපාකය තමයි ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීමට අදත් තිබෙන අපහසුව කියන එක මතක් කරන්න ඕනෑ. මා එසේ කියන්න අදහස් කලේ ද්වේෂ සහගතව නොවෙයි. නමුත් සමහර අවස්ථාවල අපි දුර දිග කල්පනා නොකර තාවකාලික දේශපාලන වාසි තකාගෙන කටයුතු කලොත් එහි ඵල විපාක අවුරුදු සිය ගණනක් බලපාන තත්ත්වයක් ඇති වන බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාත් (මෛත්‍රීපාල සේනානායක මහතා) මේ අවස්ථාවේදී බොහෝම ඕනෑකමින් බලා සිටින බව පෙනෙනවා. මගේ මේ ප්‍රකාශය කිසිසේත් ද්වේෂ සහගතව කළ එකක් නොවන බව මම එතුමාටත් කියන්න කැමතියි. නමුත් රටක ජාතියක වැදගත් තීරණ ගන්නා අවස්ථාවලදී තාවකාලික දේශපාලන බලය තකා ක්‍රියා කලොත් එහි ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. අද ඉංග්‍රීසි භාෂාව විශේෂයෙන් ගම්බද ප්‍රදේශවලත් මුළු රට පුරාත් පුදුම දුර්වල තත්ත්වයකට පත් වී තිබෙන්නේ මේ කාරණය නිසාම තමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ කේ. අබේවික්‍රම මහතා ]

ගරු ඇමතිතුමාත් අමාත්‍යාංශයත් කොයි තරම් මහන්සි ගත්තත් ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා ගුරුවරුන් ලබා ගැනීම බොහෝම ක්ෂණිකව කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ සඳහා කාල පරිච්ඡේදයක වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. අමාත්‍යාංශය ඒ සඳහා කටයුතු කරගෙන යනවායයි මම හිතනවා. ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය රජය දෙනවාය යන්න ගැනත් මට කිසිම සැකයක් නැහැ.

මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන සඳහන් කරන විට ඒ ප්‍රදේශයේ සෑහෙන ගුරු පිරිසක් සිටින බව කියන්නට ඕනෑ. නමුත් දුෂ්කර ප්‍රදේශ තිබෙනවා. දෙනියාය, හක්මන වැනි ආසනවල සේවය කරන්නට ගුරුවරුන්ගේ වැඩි සතුටක් නැහැ. ඒ අයගේ පෞද්ගලික ප්‍රශ්න නිසාත්, අවශ්‍ය පහසුකම් නැතිකම නිසාත් ඒ ප්‍රදේශවල සේවය කරන්නට වැඩි කැමැත්තක් දක්වන්නේ නැහැ. එම නිසා, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කර, මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් කිසියම් සහයෝගයක් දෙන්නට සිදු වන බවයි මගේ විශ්වාසය. එවැනි ප්‍රදේශවලට යම්කිසි අසාධාරණයක් සිදු විය හැකි නිසා මේ කාරණය ගැන වැඩි අවධානයක් යොමු කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

දෙනියාය, හක්මන ආසන ගැන සිත් යොමු කරන විට, ඒ ප්‍රදේශ ජාතික ධනයට විශාල මුදලක් එක් රැස් කර දෙන ප්‍රදේශ හැටියට හඳුන්වා දෙන්නට පුළුවනි. එවැනි ප්‍රදේශවල පදිංචි ජනතාවට වෙනත් ප්‍රදේශවල ජනතාවට වඩා අඩු පහසුකම් සලසා තිබෙනවා නම්, එයින් අසාධාරණයක් ඇති විය හැකි බව මා කල්පනා කරනවා. එමනිසා එම ප්‍රදේශ ගැන විශේෂයෙන් සලකා බලා. එවැනි දුෂ්කර ප්‍රදේශවල සේවය කරන අයට වැඩි පහසුකම් සලසා දීමෙන් හෝ සහනදායී වැඩ පිළිවෙළක් ඇති කර දීමෙන් හෝ සාධාරණය ඉෂ්ට කරන හැටියට මා ඉල්ලා සිටින්නට කැමතියි.

පසුගිය කාල පරිච්ඡේදය තුළදී, ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කර දීමටත්, ඒ වගේම අර කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර කුමාර විජය ගුණවර්ධන මහතා) ප්‍රකාශ කළ අන්දමට, පාඨශාලාවලට අවශ්‍ය භාණ්ඩ රාශියක් ලබා දීමටත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයත් කටයුතු කර තිබෙනවා. එයින් සෑහෙන ප්‍රයෝජනයක් මෙන්ම සෑහෙන සේවාවක් සිදු වී තිබෙනවා. ඒ හැම දෙයක් ගැනම මගේ කෘතඥතාව පළ කරනවා.

වර්තමානයේ මේ රටේ ඇති ප්‍රශ්න ගැන සලකා බලන විට, අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් මෙම සේවාව ඉටු කරගෙන යන්නේ සෑහෙන කම්කටොළු හා දුෂ්කරතා මධ්‍යයේ බව පිළිගන්න ඕනෑ. දැනට අකුරැස්සේ මැතිවරණ කොට්ඨාශයේ, ජපානයේ ආධාර ඇතුව, රුපියල් දස ලක්ෂ හාරසීයක් වැය කරමින්, විශාල ගුරු පුහුණු මධ්‍යස්ථානයක් ඉදිවෙමින් පවතිනවා. මා හිතන හැටියට 1987 මුල් භාගයේදී පමණ එය විවෘත කරන්නට අපට අවකාශ ලැබෙයි. මෙන්න මේ විධියේ විශේෂ වරප්‍රසාද අපට ලැබී තිබෙනවා. මේ හැම දෙයක්ම ලබාදීම ගැන අප කෘතඥ වෙනවා. මේ නිසාම අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් ඇති වෙනවාය කියා අප විශ්වාස කරනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවන පරිවර්තනයන්ගෙන් තමයි අනාගතයේ රටක යම්කිසි යහපතක්, දියුණුවක් ඇති වෙන්නේ. එම නිසා මේ දූරදර්ශී වැඩ පිළිවෙළට අපේ කෘතඥතාව හිමිවෙන්න ඕනෑ. මෙයට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මාතර සහ ඒ අවට ග්‍රාමීය ප්‍රදේශවල ඉදිකර ඇති, ආරම්භ කර ඇති, මධ්‍ය මහා විද්‍යාල සම්බන්ධයෙන් විශේෂ අනුග්‍රහයක් ලබා දෙන්නටය කියා මා ඉල්ලා සිටිනවා. මක්නිසාද ? නගරවල ඇති විද්‍යාලවලට ළමයින් ඇතුළු කිරීම ඉතාමත්ම දුෂ්කර නිසා. ඒ ගම්බද ප්‍රදේශවල ඇති මධ්‍ය මහා විද්‍යාලවලට වැඩි අනුග්‍රහයක් දක්වා ඒවා, දියුණු කිරීම ඉතාමත් අවශ්‍ය වෙනවා. එම නිසා ඒ ගැනත් විශේෂ අවධානය යොමු කර, ඒවා තව තවත් දියුණු කර, අවශ්‍ය වරප්‍රසාද ලබා දෙන ලෙස ඉල්ලමින්, ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාටත්, එතුමන්ලාගේ නිලධාරි මණ්ඩලයටත්, මේ කාලය තුළ සෑහෙන වෙහෙසක් ගෙන කරන ලද සේවා වෙනුවෙන් අපේ ගෞරවාදර ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**මෛත්‍රීපාල සේනානායක මහතා (මැදවච්චිය)**
**(திரு. மைத்திரிபால சேனநாயக்க —மதவாச்சி)**
**(Mr. Maithripala Senanayeke–Medawachchiya)**

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී එක් කරුණක් ගැන පමණක් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න අදහස් කරනවා. උතුරු මැද ප්‍රදේශයේ අද ඇති වී තිබෙන ජනවාර්ගික ප්‍රශ්නය නිසාම නොවෙයි. පදවිය වැනි ප්‍රදේශවල පාඨශාලාවලට ගුරුවරුන් ලබා ගැනීමේ ප්‍රශ්නය දීර්ඝ කාලයක සිටම පැවතීගෙන එන බව ගරු අධ්‍යාපන ඇමතිතුමාට මා යවා තිබෙන ලිපි රාශිය අනුවම දන්නවා ඇති. ඒ ප්‍රදේශවලට ගුරු පත්වීම් ලබාගෙන එන්නට ඒ ප්‍රදේශවාසීන්ගේ සමහර ඥාතීන් කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. ඒ ජනවාර්ගික ප්‍රශ්නය මේ අද තිබෙන තත්ත්වයට උග්‍ර වෙන්න කලිනුයි. මේ කාරණය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මෙන්න මේ විධියට කටයුතු කරන්නට පුළුවන් කමක් තිබේද කියා මම කල්පනා කරනවා. මෙන්න මේ මේ පාඨශාලාවල, මේ මේ ගුරු තනතුරු සඳහා ඇබෑර්තු තිබෙනවා, ඒ පත්වීම් ලබාගන්න කැමති අය ඒ සඳහා අයදුම් කරන්නය කියා ප්‍රසිද්ධ කර ඒ අනුව ගුරුවරුන් බඳවා ගැනීමේ හැකියාවක් තිබේද කියන කාරණය මම මේ අවස්ථාවේදී මතු කරන්නට කැමතියි. ඒ අනුව අසුවල් පාඨශාලාවේ මෙන්න මේ විධියේ ඇබෑර්තුවක් තිබෙනවා, කැමති කෙනෙක් ඒ සඳහා ඉදිරිපත් වෙන්න යයි ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් හෝ වෙන යම් මාර්ගයකින් ප්‍රසිද්ධියට පත් කළොත් ඒ අනුව මේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියාවක් ලැබෙයි කියන විශ්වාසයක් මා තුළ තිබෙන නිසයි මේ අදහස මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ.

ඒ වාගේම පාඨශාලාවලට අවශ්‍ය වන බඩුබාහිරාදියේ හිඟකමක් තිබෙනවා. ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාට දන්නුවාම ඒ අඩුපාඩුකම් වරින් වර සම්පූර්ණ කරගෙන යනවා. ඒ වුණත් ඒ ගැනත් විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (අනුරාධපුර දිසා ඇමතිතුමා)**
**(திரு. கே. டீ. எம். சீ. பண்டார — அனுராதபுர மாவட்ட அமைச்சர்)**
**(Mr. K. D. M. C. Bandara – District Minister, Anuradhapura)**

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මගේ අදහස් ඉදිරිපත් කරන්නට ලැබීම ගැන විශේෂයෙන් මම සන්තෝෂ වෙනවා. අධ්‍යාපනය අපේ රටේ අනාගත දියුණුවට ඉතාමත්ම ඉවහල් වන අංශයක් හැටියට සඳහන් කරන්නට පුළුවන්. ඒ නිසා අපේ දිස්ත්‍රික්කයේ තිබෙන අඩුපාඩුකම් කීපයක් පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාටත්, නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාටත් කරුණු කීපයක් දැනුම් දීමටයි මම බලාපොරොත්තු වන්නේ.

විද්‍යාව ඉගැන්වීම සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්වමින් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩ කටයුතු රාශියක් ක්‍රියාත්මක කරගෙන යාම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පසුගිය කාල සීමාවේ අපේ ප්‍රදේශයේ විශාල වශයෙන් විද්‍යා ගුරුවරුන්ගේ හිඟයක් තිබුණා. දැන් එය සෑහෙන ප්‍රමාණයකට පිරිමැසී ගොස් තිබෙනවා. නමුත් විද්‍යා ගුරුවරුන් සහ අතිකුත් විෂයයන් උගන්වන ගුරුවරුන් ලබා දීමේදී මේ දුෂ්කර ප්‍රදේශ ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඒ අය ලබා දීමට කටයුතු කරන හැටියට මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මේ අනුව දැනට අපේ ප්‍රදේශයට අඩුපාඩු වී තිබෙන විද්‍යා ගුරුවරුන් සංඛ්‍යාව පුළුවන් තරම් ඉක්මනින් ලබන අවුරුද්දේවත් ලබා දෙන්නට කටයුතු කළොත් අපේ ප්‍රදේශයේ විද්‍යාව ඉගෙන ගන්නා දරුවන්ට ඒ අංශයෙන් දැනට වඩා ප්‍රගතියක් දක්වන්නට පුළුවන් වෙනවා.

ඒ වාගේම විද්‍යාව ඉගැන්වීම සඳහා විද්‍යාගාර ඉතාමත්ම අවශ්‍යයි. උපකරණ අවශ්‍යයි. එම උපකරණ ලබා දීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර එම භාණ්ඩ රාශියක් අපට ලබා දීම ගැන ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාට මම ඇත්තවශයෙන්ම ප්‍රශංසා කරනවා. නමුත් මේ අලුත් වැඩ පිළිවෙළ යටතේ තව හුඟක් පාසල්වල විද්‍යාව ආරම්භ කරන්නට තිබෙනවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට නම් අලුතෙන් නව විද්‍යාගාර ඉදි කිරීම අවශ්‍ය වෙනවා. විමධ්‍යගත අයවැයෙන් වෙන් කෙරෙන මුදල්වලින් විද්‍යාගාර ඉදි කරන්නට ගියොත් මම හිතන විධියට ඒ සඳහා තව සෑහෙන කාලයක් ගත වෙනවා. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස මම මේ අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා. අපේ ප්‍රදේශය වගේ දුෂ්කර ප්‍රදේශවල විද්‍යාව ඉගැන්වීම අන්තිම අඩු ලක්සුවකයි තිබුණේ. දැන් එය ක්‍රමක්‍රමයෙන් දියුණු වෙගෙන එනවා. එම නිසා විද්‍යාගාර සැපයීමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සහ ඒවාට අවශ්‍ය ගුරුවරුන් වැඩි වැඩියෙන් ලබා දීමෙන් සැහෙන අතදීමක් කිරීම ඉතාමත් අවශ්‍යයි. එසේ කළොත් විද්‍යා විෂයය ඉගැන්වීමේ කටයුතු නැංවීමට අපට පුළුවන් වෙනවා.

අද විද්‍යාව අත්‍යවශ්‍යයි. කලා අංශයෙන් පමණක් අධ්‍යාපනය ලැබූ දරුවන්ට අද ප්‍රශ්නයක් වී තිබෙනවා. කලා අංශයෙන් අධ්‍යාපනය ලැබූ දරුවන්ට රැකියාවක් ලබා ගැනීමේ ඉඩකඩ බොහොම සීමිතයි. විද්‍යා අංශයෙන් අධ්‍යාපනයක් ලබා තිබෙනවා නම් රැකියාවක් ලබා ගැනීම වඩා ලෙහෙසියි. රටේ අනාගත දියුණුවටත් එයින් විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා. අනුරාධපුරය වගේ දුෂ්කර දිස්ත්‍රික්ක මේ රටේ රාශියක් තිබෙනවා. එම නිසා මේ දිස්ත්‍රික්කවල විද්‍යා විෂයයන් ඉගැන්වීම දියුණු කිරීම සඳහා යම් වැඩපිළිවෙලක් අමාත්‍යාංශයෙන් සකස් කර, ඒ තිබෙන අඩුපාඩු සම්පූර්ණ කර දෙනවා නම් ඒ අංශය දියුණු කර ගැනීමට අපට පුළුවන් වෙනවා.

පූ. භා. 10.15

ගුරුවරුන් මාරු කිරීම පිළිබඳවත් වචනයක් දෙකක් කියන්න මම බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන සේවා කොමිෂන් සභාවෙන් අවුරුදු පතා ගුරුවරුන් මාරු කරනවා, අයදුම්පත් කැඳවලා. ගම් ප්‍රදේශ අනුව, යන්න කැමති ප්‍රදේශ අනුව, අවශ්‍යතාවන් අනුව ඒ ගුරු මාරු සිදු කරනවා. අපි එයට විරුද්ධ නැහැ. ඇත්ත වශයෙන්ම එක ප්‍රදේශයක, එක දිස්ත්‍රික්කයක සැමදම සේවය කරන්න බැහැ. ඒ උදවියටත් තමන්ගේ ඕනෑ එපාකම් අනුව මාරුවීම් අවශ්‍යයි. නමුත් ඒ මාරුවීම් කරන විට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සමඟ කිට්ටු සම්බන්ධකමක් ඇතිව ඒ කටයුතු කිරීම ඉතාමත් අවශ්‍යයි. එසේ නොවුණොත් ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාට බොහාම අමාරු වෙනවා, ඒ ගුරු පුරප්පාඩු පුරවා ගැනීමට. බොහෝ අවස්ථාවල ගුරුවරුන් මාරු කර යවනවා. නමුත් ඒ අය වෙනුවට ඒ ස්ථානවලට නියම වේලාවට ගුරුවරුන් නැහැ. නියම වෙලාවට ඒ ස්ථානයට ගුරුවරුන් එවන්නේ නැහැ. පාඨශාලාවල විශේෂ විෂයයන් උගන්වන ගුරුවරුන් මාරු කළ විට, ඒ පුරප්පාඩු නියම වේලාවට පිරවූයේ නැත්නම් ඒ ශිෂ්‍යයින්ට ලොකු කරදරයක් වෙනවා. විශේෂයෙන් උසස් පන්තිවල ශිෂ්‍යයින්ට ඒ ඒ විෂයයන්වල අධ්‍යාපනය ලබා දීමට පුළුවන් වෙනවා. විශේෂයෙන් අපොස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග ගන්නා අවස්ථාවලදී එවැනි තත්ත්වයක් ඇතිවුවහොත් ඒ විභාග ගන්නා දරුවන්ට එයින් ලොකු හානියක් සිදු වෙනවා. එම නිසා ගුරු මාරුවීම් කරන විට, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක සමඟ සාකච්ඡා කර ඒ ගුරුවරුන්ගේ අවශ්‍ය මාරුවීම් කර දීමේ කිසිම වරදක් නැහැ. එයට අපේ විරුද්ධත්වයක් නැහැ. දිස්ත්‍රික්කයේ පාඨශාලාවලට හානියක් නොවන අන්දමට එම මාරුවීම් කර දෙන ලෙස මා ඉල්ලීමක් කරනවා.

අනුරාධපුර ගුරු අභ්‍යාස විද්‍යාලය ගැනත් යමක් කියන්න ඕනෑ. එම ගුරු අභ්‍යාස විද්‍යාලය තිබෙන්නේ පුලියන්කුලමෙයි. යුද්ධ කාලයේදී තිබූ පරණ කෑම්ප් වගයක් ප්‍රතිසංස්කරණය කරලයි එය ආරම්භ කළේ, අදත් එම විද්‍යාලය ඒ තත්ත්වයේමයි තිබෙන්නේ. එය පුළුවන් ප්‍රමාණයෙන් දියුණු කිරීමට අපි පසුගිය දවස්වල කටයුතු කළා.නමුත් එහි දැන් පුහුණුවන සංඛ්‍යාව දෙගුණයක් වී තිබෙනවා. අපි ඒ ගැන සන්තෝසයි. ගුරුවරු වැඩි දෙනෙක් හොඳ පුහුණුවක් ලබනවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගත් ඒ උදර වැඩ පිළිවෙල ගැන අපි ප්‍රශංසා කරනවා. අපි පුළුවන් තරම් එයට උපකාර කරනවා. මොකද, ගුරුවරුන්ට හොඳ පුහුණුවක් ලබා දිය යුතුයි. නමුත් අද එහි ඉඩකඩ මදි. පුදුම ඉඩකඩ මදිකමක් තිබෙන්නේ. එම නිසා ලබන අවුරුද්දේ සිට එම ගුරු අභ්‍යාස විද්‍යාලය දියුණු කරන ලෙසත්, වැඩි වැඩියෙන් ඉදුම්-හිටුම් පහසුකම් සපයාදීමෙන් වැඩියෙන් එන ඒ ගුරු පිරිසට අමාත්‍යාංශයෙන් විශේෂත්වයක් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

පුස්තකාල ගැන මීට ප්‍රථමයෙනුත් ප්‍රකාශ වුණා. ඇත්ත වශයෙන්ම පුස්තකාල ඉතාම අවශ්‍ය දෙයක්. 1965 සිට 1970 දක්වා පැවැති රජය කාලයේ අධ්‍යාපනයට සියවසක් පිරීම නිමිත්තෙන් එවකට සිටි අධ්‍යාපන ඇමති ගරු ඊරියගොල්ල මැතිතුමා පුස්තකාල ඇති කිරීමේ විශාල වැඩ පිළිවෙලක් ආරම්භ කළා. ඒ අනුව පුස්තකාල රාශියක් ඇති වුණා. දැනුත් අපේ අධ්‍යාපන සේවා ඇමතිතුමා පුස්තකාල ආරම්භ කරගෙන යනවා. නමුත් අපේ කඹුරුපිටිය ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා) කිව්වා වගේ ජාත්‍යන්තර මට්ටමේ විශේෂ ආධාර වැඩ පිළිවෙලක්වත් ලබාගෙන හෝ මේ පුස්තකාල දියුණු කිරීම තවත් පුළුල් අන්දමින් කරන්නට අපි මහන්සි ගන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම දරුවන් පාසල් පොත්පත් පමණක් කියවීම මදි. අද අධ්‍යාපනය හුඟක් දුරට සීමා වී තිබෙන්නේ දරුවන් පාසල්වලදීත්, විභාග පන්තිවලදීත්, ගෙදරදීත් කියවන්නේ පාසල් පොත්පත් පමණක් නිසයි. ඉන් පිටස්තරව පොත්පත් සඟරා වැනි දේ කියවීම බොහෝ සෙයින් සීමාසහිත වී තිබෙනවා. ඒ නිසා බාහිර දේවල් ගැන දැනුමක් ඇති කර ගැනීම සඳහා පොත්පත් කියවීමට පහසුකම් සැලසීම පිණිස පුස්තකාල දියුණු කිරීම ගැන ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කර, අධ්‍යාපන සේවා ඇමතිතුමා විසින් වැඩි වැඩියෙන් තව තවත් මුදල් ලබා ගෙන මේ කටයුත්ත තව තවත් දියුණු අන්දමින් කර ගෙන යන්නට වැඩ කටයුතු සකස් කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

එමෙන්ම අධ්‍යාපන සේවා ඇමතිතුමා විසින් පාසල්වලට භාණ්ඩ සපයාදීමත් දැන් හුඟක් සතුටුදායක අන්දමින් කර ගෙන යනවා. අපට දැනටමත් භාණ්ඩ සැහෙන ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ලබන අවුරුද්දේත් අපට භාණ්ඩ රාශියක් ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමහර පාසල්වලට අවුරුදු 15කට 20කට කලින් තිබුණු ඩෙස්ක් පුටු හැර අළුතින් කිසිවක් ලැබුණේ නැහැ. දැන් තමයි, අළුතින් ඩෙස්ක් පුටු ආදිය ටිකෙන් ටික දීගෙන යන්නේ. එවැනි තත්ත්වයේ පාසල් තවත් රාශියක් තිබෙනවා. ඒ නිසා මම විශේෂ ඉල්ලීමක් කරනවා, මේ වැඩ පිළිවෙළ යටතේ විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කය වැනි එවැනි භාණ්ඩ අඩු දිස්ත්‍රික්කවල පාසල්වලට පුළුවන් තරම් ඉක්මණින් ඒවා සපයා දෙන්නය කියා.

**එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)**
**(ஜனாப் எம். ஹலீம் இஷாக் — கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)**
**(Mr. M. Haleem Ishak – Third Colombo Central)**

Mr. Chairman, I wish to speak on a few matters on the Votes of the Ministry of Education especially pertaining to my electorate and in general about some other matters. Out of the decentralized funds that are allocated to electorates like Colombo Central, urban electorates in the City, most of the money is set apart for development of schools, especially in my electorate. We are given a sum of Rs. 25 lakhs every year and I should say that about 80 per cent of this money I allocate for the development of schools in my electorate, but the greatest difficulty we have when we make these proposals is to get these estimates expedited. From about January/February these proposals are sent up, but, very unfortunately, even till to-date the estimates for some of the proposals that I have sent have not come. As a result of this we are unable to spend the money given by the Government usefully and the schools do not get the benefit.

I do appreciate the difficulties that the Education Office in Colombo would have especially due to the lack of staff. I was informed that even the engineer who was there had left. He has probably gone abroad. I would make the suggestion to the Hon. Minister of Education to increase the cadre of the section which deals with school buildings at least in respect of Colombo because there is a large number of electorates that come within the Colombo Education Office ; otherwise it would be impossible for the Education Department to undertake the job of estimating for jobs that have been proposed by Members of Parliament. You will appriciate that out of 25 lakhs of rupees if Rs. 10 lakhs or Rs. 15 lakhs are to be re-voted to the Treasury without being spent, then it does not serve the purpose for which the Government has voted the money. So, I would kindly request you to see that you increase the cadre of engineers and various other technical personnel in the Education Department or get it under the Kachcheries, under the District

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. හලීම් ඉෂාක් මහතා]

Ministries, so that they will be able to call for estimates and even award the contracts and see that the work proceeds, for otherwise it will be a thorough waste of money if the money voted is not spent for the purpose for which the Government voted it.

As I told you when I started, Sir, the major portion of the money that has been allocated by me is for education and I think my Hon. Colleagues of Colombo Central and other Colombo electorates would definitely agree with it because we have no commitments on highways, irrigation or agricultural projects to finance. Highways is done by the Colombo Municipal Council. Therefore, I kindly appeal to the Minister of Education to give serious consideration to this matter as it is affecting our schools very badly. We are not able to spend the money that the government gives us, due to our not getting the estimates in time. Even if we get the estimates approved now, do you expect any contractor to complete a job within the next two months ? It is simply impossible. I once again request the Hon. Minister to see that he gives consideration to this proposal either to increase the strength of the technical staff in the Education Department or in the alternative get the District Ministers to handle this job of calling for estimates, implementing the scheme, and even awarding the contracts and supervising the work that would be undertaken in respect of school buildings.

The other matter I would like to mention is regarding the furniture for Colombo Central schools. There is a very big shortage of school furniture ad unfortunately some school children in many schools sit on the floor and carry on with their education. I kindly request you to take immediate steps to get your officials to do a survey of the shortage of furniture in the Colombo Central schools and see that the children are given the same opportunity as the children of other schools is getting enough furniture. I feel that without the necessary furniture they will not be able to do their studies properly and consequently they will not be able to attain the standards required. On the other hand, it will not be fair by us or by the Government to se that the children are not provided with the basic requirements of furniture for their schools.

Then, Sir, you are aware how they have decided to transform eight training colleges into colleges of education. I am informed that Addalachchanai is one of the schools that has been proposed. It has now been dropped most probably due to security reasons. I suppose, you will have certain other difficulties due to the prevailing conditions in the country. The schools that had been earlier proposed and had been transformed into Residental Colleges of Education were Wattalegedera, Mirigama, Peradeniya, Uyanwatte, Bandarawela, Kalutara, Pallali and Addalachchanai. Peradeniya and Addalachchanai have been left out most probably due to the present situation prevailing in this country. Since Addalachchanai is a College with many Muslim trainees, I would kindly request the Hon. Minister to consider getting this also transformed into a Residential College of Education.

The other matter which I would like to refer to is that there is no matron at the Dharga Town Training College. It is very important that a matron is appointed. Very recently you had appointed a Principal to the Dharga Town Training College and since this is a women's Training College I would kindly request the Hon. Minister to appoint a matron to this College without further delay.

Quite a number of Muslim Schools in this country are without Moulawi teachers. Islam is a very important subject. Arabic is also being taught. I would kindly request the Hon. Minister of Education to get a report on this matter and see that immediate action is taken to fill these vacancies by appointing Moulavi teachers to these schools.

I think earlier the Ministry of Education had an Advisor for Islamic and Muslim affairs. I do not think you have one such Advisor. It would be very advisable if you could get an Advisor appointed to your Ministry to advise you on Islamic Education. Islam and Arabic are taught as subjects as was done by the last Government.

Very recently the Department of Education called for applications for appointment of teachers for estate schools. It is very welcome. There had been 200 applicants from the Kalutara District, but very unfortunately non of these people who were interviewed and satisfied the department were appointed. I do not know the reason as to why they were not appointed. But I know that there were 200 applicants from the Kalutara District. I think it is very unfair not to file these vacancies. Why were these applicants from the Kalutara District not appointed to these posts ? Even now you have called for applications for 2,000 teachers to be appointed to estate schools. Definitely the estate schools must have teachers ; but even this time you have left out Kalutara District. I do not know on whose advice this has been done or why this has been done. But I think it is very unfair. There are quite a number of estates in the Kalutara District and quite a number of eligible people in the Kalutara District who can apply and might get appointments. I kindly request you to go into this matter and hold an inquiry to see why the ealier lot of 200 teachers were not appointed from the Kalutara District and why the Kalutara District has been left out when calling for applications for 2,000 teachers for the estate schools. If this has been done it is very unfair. I do not know whether anybody has advised you to do this, but I think you will give consideration to this matter and take appropriate action.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

The Deputy Speaker will now take the Chair.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [ திரு. நோமன் வைத்யரத்ன ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *took the Chair.*

**ජේ. ජී. විජේරත්න බණ්ඩා මහතා** (ලග්ගල)
**(திரு. ஜே. ஜி. விஜேரத்ன பண்டா — லக்கல)**
**(Mr. J. G. Wijeratne Banda – Laggala)**

ගරු සභාපතිතුමනි, මේ රටේ ඉතා වැදගත් අමාත්‍යාංශයක් හැටියට ඒ වගේම යහපත් පුරවැසියන් බිහි කරන අමාත්‍යාංශයක් හැටියට සැලකෙන අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ වන විට විශාල වැඩ කොටසක් සිදු වී තිබෙනවා.

ආසියාවේ රටවල් අතරින් හොඳින් ලියන්න කියන්න පුළුවන් අය සිටින රටක් හැටියට ශ්‍රී ලංකාව ගණන් ගන්නවා. විශේෂයෙන්ම එය නිදහස් අධ්‍යාපනය නිසා අපට හිමි වූවක්. මේ රජය බලයට පත් වූවාට පසුව නොමිලයේ පාසල් පොත් ලබා දීම වැනි කටයුතු කිරීම නිසා තවදුරටත් අධ්‍යාපනය කෙරෙහි දරුවන්ගේ සැලකිල්ල, අවධානය සහ උනන්දුව වැඩි වී තිබෙනවා කියන එක මම මතක් කරන්න ඕන.

පූ. භා. 10.30

මම අද බලාපොරොත්තු වන්නේ පොදුවේ මුළු රටටම වගේම මගේ මැතිවරණ කොට්ඨාශයටත් බලපාන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාගේත් අධ්‍යාපන සේවා ඇමතිතුමාගේත් සැලකිල්ල යොමු කරන්නයි. පළමුවෙන්ම මතක් කරන්න කැමතියි, පාසල් ගොඩනැගිලි හා උපකරණ පිළිබඳව. අද පාසල්වලට ළමයින් ඇතුළු වන වේගය අනුව අවශ්‍ය ගොඩනැගිලි හා උපකරණ සපයා ගැනීම සැහෙන ප්‍රශ්නයක් වී තිබෙනවා. වැඩි වන ශිෂ්‍ය සංඛ්‍යාවට ඔරොත්තු දෙන විධියට මේ උපකරණ සපයා දීමට අධ්‍යාපන සේවා අමාත්‍යාංශයට පුළුවන්කමක් ඇති වී තිබෙන බවක් පෙනෙන්නට නැහැ. එසේ වන්නේ පාසල්වලට ඇතුලු වන ශිෂ්‍ය සංඛ්‍යාව දිනපතා වැඩි වෙමින් තිබෙන නිසයි. තිබෙන උපකරණ අබලන් වන නිසාත්, අලුතෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාසල්වලට ඇතුළු වන නිසාත් තව තවත් මේ හිඟය උග්‍ර වෙනවා. පාසල්වලට අවශ්‍ය වන උපකරණ සපයා ගැනීම සෑම මන්ත්‍රී කොට්ඨාශයකටම යම්කිසි මුදල් ප්‍රමාණයක් වෙන් කර දෙන්නය කියන එක ගැන මම ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්න කැමතියි. එවිට පාසල් සංවර්ධන සමිති මාර්ගයෙන් දෙමාපියන්ගේ ආධාරයත් ලබාගෙන මේ උග්‍ර ප්‍රශ්නයට මුහුණ දීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. එහෙම නැති වුනොත් මේ ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර වෙනවා.

විමධ්‍යගත අයවැයෙන් මුදල් වෙන් කර අපි අලුත් ගොඩනැගිලි ඉදි කරනවා. නමුත් ඒවාට අවශ්‍ය උපකරණ ඇත්තේ නැහැ. බොහෝ පාසල්වල ළමුන්ට වාඩි වෙන්න පුටුවක් නැහැ. ඩෙස්ක් එකක් නැහැ. මෙවැනි පාසල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිසා මේ ගැන තමුන්නාන්සේගේ විශේෂ සැලකිල්ල යොමු කරන්නය කියා මම මතක් කරනවා.

මේ රට නිදහස ලබාගත් දිනයේ සිට අධ්‍යාපනය දියුණු කිරීම සඳහා නොයෙකුත් ක්‍රියා මාර්ග ගත් බව අපි දන්නවා. නමුත් සමහර ප්‍රදේශවල, විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල මේ සම්බන්ධයෙන් තවමත් නියම විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුනාය කියා අපට සන්තෝෂ වන්නට පුළුවන්කමක් නැහැ.

අපි දන්න සමහර පාසල් තිබෙනවා, ඒවායේ ඉන්නෙ එක ගුරුවරයයි. ඒ ගුරුවරයාට නිවාඩු ලබාගැනීමේ අයිතිවාසිකමවත් නැහැ. ඇයි, මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ ? විශේෂයෙන්ම ඒ ප්‍රදේශ දුෂ්කර නිසා.

අපි දුෂ්කර ප්‍රදේශ කියන ඒවා හඳුනාගන්න ඕන. දුෂ්කර ප්‍රදේශවල සේවය කරන අයටත් අපේ රටේ පුරවැසියන් හැටියට මිනිස් අයිතිවාසිකම් ලබාදිය යුතුය කියා අපි හිතන්න ඕන. මම උපදේශක කාරක සභාවේදීත් යෝජනාවක් ඉදිරිපත් කළා, මේ දුෂ්කර ප්‍රදේශවල ගුරු හිඟය මග හරවන්න. ඒ ප්‍රදේශ දුෂ්කර ප්‍රදේශ හැටියට පිළිගෙන තිබෙන්නේ, යන්න පාරක් නැති නිසා. ගුරු නිවාස නැති නිසා. ගුරුවරයෙකුට ගිහින් නවතින්න තැනක් නැති නිසා. මෙන්න මේ වගේ හේතුන් නිසයි, ඒ ප්‍රදේශ දුෂ්කර හැටියට පිළිගෙන තිබෙන්නේ. සාමාන්‍ය ගුරුවරුන් බඳවා ගැනීම සඳහා දැනට විභාගයක් පවත්වනවා. ඒ විභාගය එලෙසම පවත්වන්න. දුෂ්කර ප්‍රදේශවල අයත්වන මැතිවරණ කොට්ඨාශවල යම්කිසි ගුරු පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙනවා නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා අදාළ මැතිවරණ කොට්ඨාශයෙන් විභාගයට පෙනී සිට වැඩිම ලකුණු ලබාගත් අය තෝරා ගන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. එසේ වුවොත් ඒ අය මාරුවීම් ඉල්ලන්නෙත් නැහැ, ගුරු නිවාස ප්‍රශ්නයක් ඇති වෙන්නෙත් නැහැ.

ඊළඟ කාරණය නම් ගුරු මාරු ක්‍රමයයි. අපේ අනුරාධපුර දිසා ඇමතිතුමාත් තමුන්නාන්සේට දැන් ඒ ගැන මතක් කළා. විශේෂයෙන්ම අධ්‍යාපන සේවා කොමිෂමෙන් ගුරුවරුන් මාරු කරනවිට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමග අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ඇතිව එය කෙරෙනවාය කියා අපට පෙනෙන්නෙ නැහැ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දන්නෙ නැහැ, තමන්ගේ කොට්ඨාශයේ ගුරුවරු ඒ දිස්ත්‍රික්කයෙන් එහෙම නැත්නම් ඒ ප්‍රදේශයෙන් ස්ථාන මාරු ලබාගෙන යනතුරු. එය පාසල්වල වැඩකටයුතුවලට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන් සංඛ්‍යාව ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ තිබෙන ලැයිස්තුවේ තිබෙනවා. නමුත් ඒ ලැයිස්තුවට සැසඳෙන්නෙ නැහැ සිටින සංඛ්‍යාව. එසේ වන්නේ අධ්‍යාපන සේවා කොමිෂමෙන් ගුරුවරුන් නිදහස් කරගන්නා නිසායි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට දන්වන්නේ නැතිව. ගුරුවරුන් මාරු කරන්න එපා කියා අපි කියනවා නොවෙයි. අපි කියන්නේ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂත්, අධ්‍යාපන සේවා කොමිෂමත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ඇති කරගෙන මේ කටයුත්ත කරන්නය කියන එකයි.

ඊළඟට අපි දන්නවා, කුඩා පාසල් කියා හඳුන්වාගෙන ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන විශේෂ වැඩපිළිවෙළක් දැනට ක්‍රියාත්මක වෙන බව. ඒක හොඳින් ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒ පාසල්වල ගුරුවරුන්, විදුහල්පති වරුන් " කුඩා පාසල් " යන නමින් එම පාසල් හැඳින්වීම පිළිබඳව එපමණ කැමැත්තක් දක්වන්නේ නැහැ. ප්‍රාථමික අධ්‍යාපනය ඉතාමත්ම වැදගත්. එය අධ්‍යාපනයේ අත්තිවාරම හැටියට අපි සඳහන් කරනවා. එම නිසා එම අත්තිවාරම හොඳින් ලබා දෙන ස්ථානයේ වැඩ කරන ගුරුවරුන්ට සන්තෝෂයෙන් වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපි ඇති කරන්න ඕනෑ. එම නිසා එම පාසල්වලට " කුඩා පාසල් " කියන එක වෙනස් කර ඒවා " නියාමක පාසල් " හැටියට නම් කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ගුරුවරුන් සැහෙන පිරිසක් මේ ගැන මා සමග කතා කළා. කුඩා පාසල් ගුරුවරුන්ය කිව්වාම අනික් පාසල්වල ගුරුවරු මේ අය දිහා අමුතු විදියකට බලනවා. එමනිසා මේවා නියාමක පාසල් වශයෙන් නම් කරන්න කියා මම නැවත වරක් මතක් කරන්න කැමතියි.

ඊළඟට අපි අවුරුදු ගණනාවක් තිස්සේ කතා කරන දෙයක් සම්බන්ධයෙන් දැනුත් මතක් කරන්නට ඕනෑ. දැන් අළුත් ප්‍රතිසංවිධානයක් කරගෙන යනවා, පොකුරු පාසල් පිළිබඳව. මම දන්නා හැටියට ඒ මගින් මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි ක්‍රමය නැති වෙන්නයි යන්නෙ. අද මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන් — කා.නි.මා.අ.නි.ලා. — ඉන්නවා. අපි දන්නවා මේ කොටස කාලයක් තිස්සේ ඒ තත්ත්වයේම සිටින බව. ඒ ගුරුවරුන්ට උසස්වීම් නැත්නම් ශ්‍රේණි ලබාගන්න බැරිව කාලයක සිටම බොහොම අසරණ තත්ත්වයට පත්වෙලා සිටිනවා. දැන් මේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි ක්‍රමය වෙනස් වුනොත් මේ අයට විදුහල්පති වරුන් හැටියට විද්‍යාලවලට යන්නට ලැබෙන්නෙ නැහැ, සේවයක් නැති නිසා. ඔවුන්ට යන්න වෙන්නෙ උප ගුරුවරුන් හැටියටයි. ඒ නිසා මනුෂ්‍යයන් හැටියට ආත්ම ගෞරවයක් ඇතිව වැඩ කරන්න ඔවුන්ට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ අයට ශ්‍රේණියක් ලබා දී විද්‍යාල වලට යවන්නට වැඩපිළිවෙළක් සකස් කරන්නය කියා මම මතක් කරන්න සතුටුයි.

ඒ වාගේම වැඩිහිටි අධ්‍යාපන නිලධාරීන් ගැනත් මා මතක් කරන්න කැමතියි. වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය කියා එකක් අපි පටන් ගත්තා. නමුත් දැන් ඒක ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒක අවශ්‍ය නැතැයි කියා සිතනවා නම් ඒ අයටත් අර විදියට ශ්‍රේණි ක්‍රමයක් ලබා දෙන්න. අපි විශේෂයෙන්ම මේ ක්‍රමය සඳහා තෝරාගන්නේ ප්‍රදේශයේ සිටි දක්ෂතම ගුරුවරුන්. එනිසා ඒ අයට ශ්‍රේණියක් ලබා දී ආපසු විද්‍යාලවලට යවන්න. එහෙම නැත්නම්, වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය තව දුරටත් අවශ්‍ය නම් ඒක ප්‍රතිසංවිධානය කර ඒ අයටත් ආත්ම ගරුත්වයක් ඇතිව වැඩ කරන තත්ත්වයක් ඇති කර දෙන්න කියන එක මම ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේදී මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ජේ. ජී. විජේරත්න බණ්ඩා මහතා ]

ඊළඟට නගරබද පාසල්වල ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ප්‍රාථමික පන්තිවලට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඒ විද්‍යාල අවට එක්තරා සීමාසහිත දුර ප්‍රමාණයක් ඇතුළත පදිංචි ළමුන් පමණක් භාරගැනීමේ ක්‍රමය නිසා සමහර දෙමව්පියන්ගේ දරුවන්ට පාසල් නැතිවෙන තත්ත්වයක් ඇතිවී තිබෙනවා. මේ ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර වෙනවා. එමනිසා විශේෂයෙන්ම නගරවල ප්‍රාථමික පාසල් තවතවත් වැඩි කරන්න වැඩ පිළිවෙලක් සකස් කරන්න කියන එක මම තමුන්නාන්සේට මතක් කරනවා.

ඒ එක්කම අද රැකියා ලබා ගැනීමේ නගරබද පාසල්වලට දී ඇති තැම්වලට දක්වන විශේෂ සැලකිල්ල, බොහෝදුරට හේතුවෙලා තිබෙනවා, පිටිසරබද ළමයින් නගරවල – පාසල්වලට ඇදී එන්නට. සම්මුඛ පරීක්ෂණයකදී නගරයේ විද්‍යාලයක නමක් කිව්වම ඒ තනතුරට තෝරා ගැනීමේදී ඒ නම විශාල වශයෙන් බලපානවා. ළමයින් වාගේම ගම්බද ප්‍රදේශවල දෙමව්පියන් වැඩි උනන්දුවක් දක්වනවා නගරයට ළමුන් එවන්න. ඒ නිසා අඩු වශයෙන් ඒ විධියට වියදම් දරාගෙන කරන්නට පුළුවන් අයටවත් නගරවල අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවන පරිදි නගරයේ පාසල් ව්‍යාප්ත කරන්න ඕනෑ. උදාහරණයක් වශයෙන් මාතලේ නගරය ගත්තොත් එහි තිබෙන්නේ එක බාලිකා විද්‍යාලයයි. ඒ නිසා එතන තරගයක් ඇත්තෙත් නැහැ. තරගයක් ඇති වන විධියට මාතලේ නගරයේ තව බාලිකා විද්‍යාලයක් ආරම්භ කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ඒ එක්කම ඉංග්‍රීසි අධ්‍යාපනය සහ විද්‍යා අධ්‍යාපනය සඳහා පිටිසරබද ප්‍රදේශවල විශේෂ සැලකිල්ලක් දක්වන නිසා ඒ අධ්‍යාපන විෂයයන් ඒ ගම්වලටත් පැතිරී යන්න පුළුවන් විධියට ඉංග්‍රීසි ගුරුවරුන් සහ විද්‍යා ගුරුවරුන් බෙද දෙන්න ඕනෑ. විශේෂයෙන් ඉංග්‍රීසි ගුරුවරු එක වරටම ගොඩක් සොයාගන්න බැහැ කියන එක මම පිළිගන්නවා. ඒ නිසා වැඩි වැඩියෙන් පුහුණු කිරීම සඳහා තෝරාගෙන ඉංග්‍රීසි අධ්‍යාපනය මුළු රටටම සමානව බෙද දෙන්නට පුළුවන් වැඩ පිළිවෙලක් හැකි ඉක්මනින් ඇති කරන්නය කියා මම ඇමතිතුමාට මතක් කරනවා.

මාතලේ දිස්ත්‍රික්කය අවට තිබෙන සෑම දිස්ත්‍රික්කයකම වාගේ ගුරු අභ්‍යාස විද්‍යාල තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයෙන් ප්‍රාථමික පුහුණුව සඳහා යන සියලු දෙනාටම වෙනත් ප්‍රදේශවලට යන්න වෙනවා. ඒ නිසා මාතලේ දිස්ත්‍රික්කයට ගුරු අභ්‍යාස විද්‍යාලයක් ලබාදීම ගැන සැලකිල්ල යොමු කරන ලෙස මම ගරු ඇමතිතුමාට මතක් කරනවා.

ඊළඟට මම ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, පාසල්වල විනය ගැන. අපි අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන්නේ ඇත්ත වශයෙන්ම හැදුණු වැඩුණු පිරිසක් සමාජයට යවන්නයි. මේ රටේ වගකීම සහ මේ රටේ කාර්යභාරය භාරගන්නට ඉන්න ඒ දරුවන් රටටත් සමාජයටත් කාටත් එපා වෙච්ච පිරිසක් හැටියට පත්වුණොත් ඇතිවන තත්ත්වය කුමක්ද ? එහෙම පිරිසක් රටට සමාජයට පිට කිරීමද අපි අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන්නේ ? රටේ අනික් හැම දෙයක් වෙනුවෙන්ම වියදම් කරන්න තිබෙන මුදල් පවා අඩුකර අපි දරුවන්ට අධ්‍යාපනයක් ලබා දෙන්නේ හොඳ හැදුණු පිරිසක් සමාජයට යවන්නයි. ඒ නිසා හැදුණු දරු පිරිසක් සමාජයට යැවීම සඳහා මීට වඩා විධිමත් වැඩ පිළිවෙලක් ඇති කරන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම අද තිබෙන විෂම සමාජය ගැන අපි කල්පනාව යොමු කරන්න ඕනෑ. විද්‍යාලවලින් අපට නොයෙක් විධියේ පැමිණිලි ලැබෙනවා විෂ මත්ද්‍රව්‍ය විද්‍යාලවලටත් යනවාය කියා. ඒ නිසා අපි විද්‍යාලවල සැහෙන විනයක් ඇති කරන්න ඕනෑ. දරුවන් පමණක් නොවෙයි, ගුරුවරුන් සම්බන්ධයෙනුත් විනයක් ඇති කරන්න ඕනෑ. පංති කාමරයට යන විට ගුරුවරයෙක් වශයෙන් යන්න ඕනෑ. අපි දැකලා තිබෙනවා සමහරු පංතියට යන්නේ යක්කු වාගේ. ළමයි බයවෙනවා. ඇඳුමෙනුත් බාහිර පෙනුමෙනුත් ගුරුවරයෙක් කියන්න බැරි විධියටයි යන්නෙ. එහෙම තැන් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් ගුරුවරුන් සඳහා විනය පද්ධතියක් සකස් කරන්න ඕනෑ. පත්වීම දෙනවිටම ඒ ලිපියෙන්ම කියන්න ඕනෑ මේ විධියට ඉන්න ඕනෑය කියා. සමහරවිට හිතන්න පුළුවන් මිනිස් අයිතිවාසිකම් තිබෙන අපට කොයි විධියෙන් ඉන්න බැරිද කියා. නමුත් මේ කාරණය පැහැදිලි කර දෙන්න ඕනෑ. ඒ නිසා ඒ පත්වීම් ලබාදෙන අවස්ථාවේ සම්මන්ත්‍රණ මාර්ගයෙන් හෝ ඒ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. ඒ අනුව ගුරුවරුන්ගේ විනය පිළිබඳ සැලැස්මක් ඇති කරගෙන ඒ තුළින් දරුවන්ගේ විනය ඇති කරන්නය කියලා මම මතක් කරනවා. එහෙම නැත්නම් මේ රජය වියදම් කරන මුදල රටට සමාජයට එපා කළ පිරිසක් හදන්න යොදන මුදලක් හැටියට සඳහන් කරන්න සිද්ධ වෙනවා.

ඒ අඩුපාඩු හුඟාක් දුරට සිදු වන්නේ ගම් මට්ටමෙන් සිටින මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්ට ඒ පාසල් නිතර නිතර බලන්න යාම සඳහා අවස්ථාව නොලැබීමයි. ගමන් ගාස්තු සීමා කරලයි තිබෙන්නෙ. ඒ නිසා ඔවුන්ගෙන් ඉටු වියයුතු සේවය හරි හැටි සිද්ධ වෙන්නෙ නැහැ. ඒ නිසා අපි මේ යොදන මුදලෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම පිණිස ඇදුරු පිරිසවත් සකස් කර ගැනීමට විනය ඇති කරන්න ඕනෑ.

මේක අමාරුම වැඩක් බව ඇත්ත. මේ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිස් හය ලක්ෂයක් පමණ ඉන්නවා. ගුරුවරුන් 1,40,000ක් පමණ ඉන්නවා. වෙනත් සෑම දෙපාර්තමේන්තුවකට වඩා අමාත්‍යාංශයකට වඩා කාර්ය බහුල, විවිධ වර්ගයේ පිරිස් ඉන්න අමාත්‍යාංශයක් අධ්‍යාපන අමාත්‍යාංශය. ඒ වුණත් අමාරුවෙන් හෝ ඒ කාර්ය ඉෂ්ට කරන්නට සැලකිල්ල යොමු කරන්නය කියා මතක් කරමින් අධ්‍යාපන කටයුතු මීට වඩා විධිමත් විධියට කරගෙන යන්නට තමුන්නාන්සේගේ විශේෂ සැලකිල්ල නැවතත් යොමු කරවමින් මම නවතිනවා.

**එස්. ඩබ්ලිව්. අලවතුවල මහතා (නියෝජ්‍ය මහාමාර්ග ඇමතිතුමා සහ නියෝජ්‍ය පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා)**

(திரு. எஸ். டபிள்யு. அலவத்துவல — நெடுஞ்சாலைகள் பிரதி அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண பிரதி அமைச்சரும்)

(Mr. S. W. Alawathuwala – Deputy Minister of Highways and Deputy Minister of Local Government, Housing & Construction)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාමත් සන්තෝෂ වෙනවා. අපේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ගැන කල්පනා කරන විට අනෙක් රටවලට නොදෙවෙනි පහසුකම් රාශියක් සැලසී තිබෙනවා, මේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ. ඒ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ අඩුවක්ව තිබුණු කොටසත් සම්පූර්ණ කරමින්, වර්තමාන රජය යටතේ සෑම ළමයෙකුටම වුවමනා කරන පොත් පත් සියල්ලම නොමිළයේ දුන් බෙද දෙනවා. එම නිසා දෙමව්පියන්ටත්, අධ්‍යාපනය ලබන දරුවන්ටත් ලොකු පහසුවක් සැලසී තිබෙනවා, නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ අධ්‍යාපනය ලබන්නට. ඒවාගේම අධ්‍යාපන තත්ත්වය උසස් කිරීම සඳහා නව පත්වීම් දීමේ ක්‍රමය වෙනස් කරමින් ගුරුවරුන්ගේ තත්ත්වය උසස් කිරීමට කරන්නට ඕනෑ හැම කටයුත්තක්ම ගරු ඇමතිතුමා කරගෙන යනවා.

පූ. භා. 10.45

එසේම ලග්ගල ගරු මන්ත්‍රීතුමා (ජේ. ජී. විජේරත්න බණ්ඩා මහතා) දැන් මොහොතකට කලින් සඳහන් කලා වාගේ, වැඩිහිටි අධ්‍යාපන නිලධාරීන් වශයෙන් පත් කර ගෙන ඉන්න කොටස පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ඒ අය තවමත් ස්ථිර තත්ත්වයට පත් නොකර තිබීම සැහෙන අඩුවක් බව සඳහන් කරන්නට සිදුවී තිබෙනවා. ඒ පිළිබඳව මා විස්තර කරන්නේ නැහැ : ලග්ගල ගරු මන්ත්‍රීතුමා විස්තර කලා. එම නිසා, ඒ වැඩිහිටි අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුහුණු කරන අධ්‍යාපන නිලධාරීන් ගැන අවධානය යොමුකර ඒ අයගේ සේවා තත්ත්වයන් ස්ථිර කිරීමට කටයුතු කිරීමට ගරු ඇමතිතුමා කල්පනාව මෙහෙය වුවහොත් ඉතා වටිනා කටයුත්තක් බව මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඒ සමගම තවත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා. සමහර ආසනවලට ගුරු පත්වීම් කරන්නට ඉතාමත් අපහසුයි. අමාරුවෙන් පත් කළත් ඒ පත්වීම් ලබා ඒ ඒ ආසනවලට ගියත්, ටික දවසකින්, අවුරුද්දකින් හමාරකින් මොන ක්‍රමයක් හෝ කරලා ඒ අයගේ ගම් ප්‍රදේශවලට එනවා. එවිට අර දුෂ්කර ආසනවල තිබුණු ගුරු පුරප්පාඩු ඒ විධියටම පවතිනවා. නිදර්ශනයක් වශයෙන් දෙඩම්ගස්ලන්ද වැනි දුෂ්කර ආසනයක් ගනිමු. මේ දුෂ්කර ආසනය තුළ අති දුෂ්කර පාසල් තිබෙනවා. කඳුකර ප්‍රදේශවල මාර්ග නැති ප්‍රදේශවල පිහිටි ඒ පාසල් වලට ගුරුවරුන් දැම්මාට මොන විදියකින්වත් ඉන්නේ නැහැ. එම නිසා මේ ප්‍රශ්නය ටිකක් දුරටවත් මගහරින්නට විදුහල්පතිවරුන්ගේ සහ දෙමව්පියන්ගේත් තිබෙන ලොකු ඕනෑකමක් උඩ ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රදේශයේ සුදුසුකම් තිබෙන අයට ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් පත් කරගෙන වැඩ කර ගෙන එනවා. ඒ විධියෙන් පත් කරගෙන වැඩ කරගෙන ඉන්නා සමහර අය අවුරුදු දෙකතුන දිගටම පඩි ලබන්නේ නැතිව ස්වේච්ඡාවෙන් ඉතාමත් උනන්දුවෙන් ගුරුවරුන් වශයෙන් සේවය කරනවා. පඩි ලබන, ස්ථිර තත්ත්වයට පත් වෙලා ඉන්න — ගුරුවරුන් තමන්ට තිබෙන නිවාඩු සියල්ලක්ම ගන්නවා. පාසලේ වැඩ කටයුතුවලට සමහරවිට ඒ තරම් උනන්දුවක් දක්වන්නේ නැතිව කටයුතු කරනවා. ස්වේච්ඡා සේවයට පත් කරන අය කිසිම දවසක නිවාඩු ගන්නේ නැතිව ඒ අඩුපාඩු සම්පූර්ණ කරමින් තමන්ගේ කාලය සම්පූර්ණයෙන්ම වැය කර ගුරුවරුන් හැටියට කටයුතු කරනවා. අවුරුදු දෙකක් හෝ තුනක් ඒ විධියට තමන්ගේ ක්ෂේත්‍රයට ලොකු පරිත්‍යාගයක් කිරීම පිළිබඳව ඒ අයට කරන ගෞරවයක් වශයෙන් ඒ අයගේ රැකියා තත්ත්වයත් ස්ථිර කිරීමට යම්කිසි වැඩපිළිවෙළක් ඇති කරනවා නම් ඔවුන් කළ සේවයට ගෞරවයක් කළා වන බව මම සඳහන් කරනවා.

සමහර එස්. එස්. සී. ගුරුවරුන් ඉන්නවා. එච්. සී. සී. මූලික අවශ්‍යතාව වශයෙන් සඳහන්කර තිබෙන නිසා එස්. එස්. සී. අය ගැන අපි කියන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මේ අය අතර ඉන්නවා, අවම සුදුසුකම වශයෙන් සලකන එච්. එස්. සී. වැඩ තුනක් සමත් අයත්. ඒ නිසා ඒ විධියට එච්. එස්. සී. වැඩ තුනක් සමත්, අඩු වශයෙන් අවුරුදු 2ක්වත් සේවය කර තිබෙන අය පිළිබඳවවත් කල්පනා කර බලා ඒ අයගේ පත්වීම් ස්ථිර කර දුන්නොත් එය, කාලයක් තිස්සේ තමන්ගේ ශ්‍රමය යොදවා වැඩකළ උදවියට කරන සැලකිල්ලක් වෙනවා පමණක් නොවෙයි ඒ පාසල්වලට ගුරුවරුන් පත් කරන්න බැරිව ඉන්න අවස්ථාවක ඒ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් ලොකු අධාරයක් වෙනවා. ඒ නිසා මේ පිළිබඳව කල්පනා කර බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මේ විධියේ අය සිටින්නේ එක ආසනයක පමණක් නොවෙයි. ඒ අතර හැම ආසනයකමත් නැහැ, මේ විධියේ අය. කොළඹ ප්‍රදේශය වගේ ගුරුවරුන් ඕනෑ තරම් ඉන්න ප්‍රදේශවල මේ ප්‍රශ්නය කොහෙත්ම ඇත්තේ නැහැයි මම හිතනවා. ඉතාමත් දුෂ්කර ආසනවල තමයි, මේ ප්‍රශ්නය තිබෙන්නේ. මේ අය පත්කර තිබෙන්නේ රැකියා අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නොවෙයි. මේ ප්‍රශ්නය පැන නගින්න මුල් හේතුව මම කලිනුත් සඳහන් කළා. ඈත පළාත්වලින් පිටිසරබද දුෂ්කර ප්‍රදේශලට යන ගුරුවරුන් රැඳී ඉන්නේ නැති නිසා ගුරු හිඟයක් ඇතිවන නිසාත්, ඒ පිටිසරබද දුෂ්කර ප්‍රදේශවල පාඨශාලාවල කටයුතුත් මොන විධියකින් හෝ කරගෙන යන්න ඕනෑ නිසාත්, දෙමාපියන්ගේ ඉල්ලීම මත ඒ විදුහල්පතිවරු මේ විධියට හොඳ සුදුසුකම් තිබෙන උදවිය තම පාඨශාලාවලට පත් කරගෙන කටයුතු කරගෙන යනවා. ඒ නිසා ඒ තත්ත්වය ගැන කල්පනා කර බලා ස්වේච්ඡාවෙන් උගන්වන ඒ අයට කරන ලොකු සැලකිල්ලක් හා කෘතඥතාව දක්වීමක් වශයෙනුත්, ගුරුවරුන් හිඟ පාසල්වල ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමක් වශයෙනුත් ඒ අය අතුරින් සුදුසුකම් තිබෙන උදවිය ඒ පත්වීම්වල ස්ථිර කිරීමට ගරු ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු වෙනවා නම් එය ඉතා වැදගත් කාර්යයක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ආනන්ද දසනායක මහතා** (කොත්මලේ)
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
**(Mr. Ananda Dassanayake – Kotmale)**

ගරු සභාපතිතුමනි, අද ඉතාම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂයි, අපි සලකා බලන්නේ. මේ අමාත්‍යාංශය තමයි, මම හිතන හැටියට ලංකාවේ ආර්ථිකයේ කොඳු ඇටය. එහෙම නම් අපේ ආර්ථිකයේ කොඳු ඇටය දුර්වල වුණොත් එයින් මුළු ආර්ථිකයමත්, රට ජාතියත් අඩපණ වෙනවා. මෙය ඒ තරම් වැදගත් අමාත්‍යාංශයක්. මම මීට කලින් වතාවකත් කියා තිබෙනවා, මේ වැදගත් අමාත්‍යාංශය භාර වී තිබෙන්නේ විකක් විසේ තිබෙන, දඟකාර, වැඩ කරන්න පුළුවන් හොඳ තරුණයන් දෙදෙනෙකුට බව.

කලින් අධ්‍යාපනය තිබුණේ එක ඇමතිවරයකු යටතේයි. නමුත් දැන් එය කොටස් කර තිබෙනවා, කීප අංශයකට. අධ්‍යාපන අමාත්‍යාංශය කියා එකක් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කියා තවත් එකක් තිබෙනවා. ඊළඟට තවත් එකක් තිබෙනවා, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය කියා. ඒ විධියට කලින් එකට තිබුණු අධ්‍යාපන අමාත්‍යාංශය දැන් කොටස් තුනකට බෙදා තිබෙනවා. ඒ කොටස් තුනෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය භාර ඇමතිතුමා, අතිගරු ජනාධිපතිතුමාමයි. එහෙම නම් අධ්‍යාපනයෙන් කොටසක් එතුමාත් අරගෙන තිබෙනවා. එහෙම කර තිබෙන්නේ අධ්‍යාපනය " කන්ට්‍රෝල් " කිරීමක් වශයෙන් වෙන්න ඇති. [බාධා කිරීම්] ඒ විධියට " කන්ට්‍රෝල් " කෙරෙනවාය කියන එක ඔය සාමාන්‍ය මන්ත්‍රීවරයකුට නොපෙනුණාට මට කරන්න දෙයක් නැහැ. ඒ විධියට " කන්ට්‍රෝල් " කරන්නේ මොනවාටද කියන එක මම දන්නේ නැහැ. සැහෙන පරීක්ෂාවකින් කටයුතු කිරීමයි, කෙරෙන්නේ. ඒ කියන්නේ එක ඇමතිවරයකුට තමාට ඕනෑ විධියට කටයුතු කරන්න ඉඩ නොසැලසෙන අයුරිනුයි කටයුතු කර තිබෙන්නේ. ඒ විධියට අධ්‍යාපන ක්ෂේත්‍රය කොටස් තුනකට බෙදීමෙන් බලාපොරොත්තු වුණේ උසස්ම අධ්‍යාපන කොටස අතිගරු ජනාධිපතිතුමා අතට ගැනීමයි. එනකොට එයින් තමයි සම්පූර්ණ ප්‍රතිඵල විකාශනයක් වෙන්නෙත්, ප්‍රතිඵල තිකුත් වෙන්නෙත්, රටට යම්කිසි සේවයක් වෙන්නෙත් කියන හැඟීම තිබෙනවා. මොනවා වුණත් මම ඒ සම්බන්ධයෙන් කථා කරන්න යන්නෙ නැහැ.

අපේ අනික් මන්ත්‍රීවරුන් කිව්වා වාගේ පළමුවෙන්ම මටත් කිව යුතු කාරණයක් තිබෙනවා. 1980 වර්ෂය සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පාලන වාර්තාව — එරික් ජේ. ද සිල්වා මහතා ගේ —1982 නොවැම්බර්වලදී පිටවී තිබෙනවා. ඊට පසුව වාර්තාවක් තවම පිටවී නැහැ. සාමාන්‍ය වශයෙන් ශිෂ්‍යයන් පාසල්වලට ඇතුළත් කිරීමට තිබෙන අපහසුව ගැනත් එහි විග්‍රහ කර තිබෙනවා. ඒ කියන්නෙ ශිෂ්‍යයින් වැඩි වෙනවා. පාසල්වල ඉඩකඩ මදි වෙනවා. සාමාන්‍යයෙන් පස්වන පංතියේ සිට හයවන පංතියට ඇතුළත් වෙන්න ඉන්න ශිෂ්‍යයන්ට හුඟක් දුරට අපහසු තත්ත්වයකට වැටී තිබෙනවා. ඒ පංතියට ඇතුළත් වෙන්න සිටින ශිෂ්‍ය ප්‍රමාණයත් වැඩිවී තිබෙනවා. එහෙම නම් පාසල්වල ඉඩකඩ ප්‍රමාණයත් වැඩිවෙන්න ඕනෑ. සමහර අය මේ කාරණය නිසා නිලධාරී මහත්වරුන් සමග හැප්පෙන්න යනවා. නමුත් මම හිතන විධියට නිලධාරී මහත්වරුන් සමග හැප්පීමේ තේරුමක් නැහැ. ඊට හේතුව, අපි සොයා බැලුවොත් පේනවා. පාසල්වලට ඇතුළත් වෙන්න අවුරුදු පතා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලක්ෂ දෙකහමාරක් තුනක් පමණ ඉදිරිපත් වෙනවා. සමහර විට ඊටත් වැඩියි කියල කියන්න පුළුවන්. ඒ සංඛ්‍යා ලේඛන අනුව බලන විට ලක්ෂ දෙක හමාරකට තුනකට සැහෙන්න ඉඩකඩ ප්‍රමාණයක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සලසා දී තිබෙනවාද ?

මගේ ආසනයේ තිබෙන එක්තරා පාසලකට මම ගියා. එතැන පංති පවත්වන්නවත් ඉඩ නැහැ. එක් පංතියකට උගන්වනවා. ඊටපසු ඒ පංතිය එළියට පිටත් කර වෙනත් පංතියක් ඇතුළත් කර ගන්නවා. වැස්ස දවසට එහෙම කරන්නත් බැහැ. මේ කටයුතු භාරව තිබෙන්නෙ අධ්‍යාපන අමාත්‍යාංශයටද, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයටද කියා මම දන්නෙ නැහැ. මම හිතන්නෙ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයට වෙන්න ඇති. අපේ අධ්‍යාපන සේවා ඇමතිතුමා කැබිනට් ඇමතිවරයෙක් නොවුණත් එතුමා සැහෙන උත්සාහයක් ගන්නවා. නමුත් ගොඩනැඟිලි ප්‍රශ්නය ආවාම එතුමා අපට කියන්නෙ විමධ්‍යගත අයවැයෙන් ගොඩනැගිලි හදගන්න කියලයි. මේ හැම එකක්ම විමධ්‍යගත අයවැයෙන් කරන්න නම් රුපියල් ලක්ෂ 200ක් පමණ විමධ්‍යගත අයවැය හැටියට අපට ලැබෙන්නෙ ඕනෑ.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

පසුගිය ආණ්ඩු කාලයේදී කොයි තරම් ලැබුණාද ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

තමුන්නාන්සේ හිතන්නෙ දැන් දෙන ගණනෙත් එද දුන්න ගණනෙත් වෙනසක් තිබෙනවා කියලද ? අද දෙන ගණනත් එද දී තිබෙන ගණනත් සංසන්දනය කර බැලුවොත් වටිනාකමේ එක සමාන තත්ත්වයක තිබෙන බව පෙනෙයි. භාණ්ඩාගාරයේ ඉන්න නිලධාරී මහත්වරුන් භාණ්ඩාගාරයේ තිබෙන මුදල් ප්‍රමාණය ඒ විධියට රැකෙන්න සකස් කර තිබෙනවා. එය හැමදම කරන වැඩක්. රුපියල බාල්දු වුණාට පසුව ඒ ගණනට සරිලන විධියට සකස් කර තිබෙනවා. අද රුපියල් පනස් ලක්ෂයක වටිනාකම එද රුපියල් පන් ලක්ෂයකට සමානයි. එද රුපියල් ලක්ෂ පහක් දුන්නා නම් අදත් දෙන්නෙ ඒ වටිනාකම තිබෙන මුදල් ප්‍රමාණයක් තමයි. ඒ නිසා භාණ්ඩාගාරයේ අය අපි වගේ හිතුවක්කාර ලෙස මුදල් වෙන් කරන්නෙ නැහැ. ඒවා රටේ සල්ලි. ඒ නිසා කොයි තරම් ජනගහනය වැඩි වුණත් සංවර්ධනය සඳහා දී තිබෙන්නේ එද දුන්න ගණනමයි. ඊට වඩා වෙනසක් සිදු වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

මා විශේෂයෙන් තමුන්නාන්සේලාට පෙන්නා දෙන්න කැමතියි, අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ 1980 වර්ෂය සඳහා වූ පාලන වාර්තාවේ, "1979 - 80 පාසල් හැර යන්නවුන් සහ පාසල් හැර යන්නවුන්ගේ අනුපාතය" සඳහන් කර තිබෙන සංඛ්‍යා කීපයක්. කොළඹ පාසල් හැර යන්නවුන්ගේ අනුපාතය සියයට 1.06යි. නුවරඑළියේ සියයට 4.35යි. එතකොට එයින් පේනවා ලොකු වෙනසක්. මන්නාරම පාසල් හැර යන්නවුන්ගේ අනුපාතය සියයට 5.99යි. පුත්තලම සියයට 5.24යි. හලාවත 5.62යි. අනුරාධපුරයේ 3.08යි. පොළොන්නරුවේ 4.99යි. බණ්ඩාරවෙල .74යි. මොනරාගල 3.17යි. රත්නපුරයේ 2.74යි. පිටිසර බද ළමයින් අට වැනි පන්තියෙන් පාසල් හැර යන බව මේ අනුව පෙනෙනවා. නගරබද පාසල්වල විශේෂයෙන් කොළඹ එසේ හැර යන ප්‍රමාණය සියයට එක දක්වා අඩු වී තිබෙනවා. ඊට හේතුව මේකයි. නගරබදව අධ්‍යාපන පහසුකම් තිබෙනවා. වියදම් කර උගන්වන්න පුළුවන් දෙමාපියන්ම තමයි මේ නාගරික අධ්‍යාපනයට එකතු වෙන්නේ. මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. ළමයෙක් අට වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා අයින් වෙනවා නම් ඊළඟට ඒ ළමයා ඇටකුණා වුණා වාගේ තත්ත්වයකට පත් වෙනවා. ඔහුට නියමිත අධ්‍යාපනයකුත් නැහැ. ඔහු අධ්‍යාපනයක් නොලැබුවෙත් නැහැ. බාගෙට නැම්බිලා. ඇත්ත වශයෙන්ම කියනොත් ඔහුට ජීවිතය පිළිබඳව නියමාකාර හරි අවබෝධයක් ලබා ගන්නට බැරි වෙනවා. ඒකට ශක්තියක් නැහැ. ඔහු බාගෙට ඉගෙන ගන්නා. ඊළඟට ඔහු එළියට යනවා. ඊට හේතුව පිටිසර බද පළාත්වල අධ්‍යාපන පහසුකම් මදිකමයි. ඒ වාගේම මිනිසුන්ගේ දිළිඳුකමයි.

පූ. භා. 11

අපි මේකට ප්‍රතිකර්ම යොදන්න ඕනෑ. එසේ ප්‍රතිකර්ම යෙදීමට කටයුතු නොකළහොත් ගම්බද ප්‍රදේශ දියුණු කරනවායයි රජය කොතෙක් කෑ ගැසුවත් එයින් පලක් නැහැ. ගම්බද ප්‍රදේශ දියුණු කිරීමේ විශාලම අවශ්‍යතාව තමයි අධ්‍යාපනය. අට වැනි ශ්‍රේණියට යන විට ළමයින්ගෙන් වැඩි පිරිසක් පාසල්වලින් එළියට යනවා නම් එහි තේරුම ගම්බද ළමයින් වැඩි පිරිසක් අනාථ වන බවයි. ඒ කියන්නේ ඔවුන් කිසිම රැකියාවකට සුදුසුකම් නොලබන අය. අපි සැමදෙනාම එකතු වී අධ්‍යාපන ක්ෂේත්‍රයේ මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම මේ වාර්තාවේ මේ කොටස ගත්තේ ඒ නිසායි. මේ සම්බන්ධයෙන් කරුණු සලකා බලා අට වැනි ශ්‍රේණියෙන් ළමයින් පාසල් හැර යෑමේ ප්‍රමාණය වෙනත් ක්‍රමවලින් අඩු කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඒ එකක්.

මේ වාර්තාවේ තව හුඟක් දේ තිබෙනවා. මම ඒවා ගැන කතා කරනවා යන්නේ නැහැ. මේ පොත පළකිරීම ගැන අධ්‍යාපන අමාත්‍යාශයට මගේ ස්තුතිය හිමි කරනවා. මෙය ඉතාම වැදගත්. බොහෝම අමාරුවෙන් කළයුතු වැඩක්. පැහැදිලිව ඒ වැඩේ කර තිබෙනවා. නමුත් අදට නියමිත වාර්තා ලැබී නැති නිසා නිලධාරී මහත්වරුන් ඒ සම්බන්ධයෙන් ඉතා ඉක්මණින් කටයුතු කර මහජනයාටත් මහජන නියෝජිතයන්ටත් උගත් පිරිසටත් ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ වාර්තා සපයන ලෙස මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

හැම කෙනෙක්ම තමන්ගේ දරුවන් රෝයල් කොලේජ් එකටම ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරන තත්ත්වය ඇත්තවශයෙන්ම පසුගිය ආණ්ඩු කාලයේත් තිබුණා. හැමදෙනාම ඉල්ලන්නේ රෝයල් කොලේජ් එක. එසේ නැත්නම් කොළඹ වෙනත් මහා විද්‍යාලයක්. රෝයල් කොලීජියට සමාන තත්ත්වයේ විද්‍යාල ගම්බද ප්‍රදේශවලත් හදනවාය කියා හැම ආණ්ඩුවක්ම ප්‍රකාශ කළේ මේ ප්‍රශ්නය උඩ තමයි. නමුත් ඒවා කොහේ හැදුවාදැයි මම දන්නේ නැහැ. අපේ පාසල් කීයක් උසස් කර තිබෙනවාදැයි මම් දන්නේ නැහැ. අපේ අධ්‍යාපන ඇමතිතුමාත් අධ්‍යාපන ධවල පත්‍රිකාවය කියන එක ඉදිරිපත් කරමින් කිව්වා, නගරබදට සීමා වී තිබෙන උසස් අධ්‍යාපනය නගරබද පාසල්වල තරම්ම පහසුකම් ඇති පාසල් ගම්බදත් ඇති කිරීමෙන් ගම්බදටත් ලබාදී ගම්බද පාසල්වලින් පිටවන ශිෂ්‍යනුත් රෝයල් කොලේජ් එකෙන් පිටවන ශිෂ්‍යයන්ගේ තත්ත්වයටම ගේනවාය කියා. මේ යෝජනා දැන් කොහේද කියා මා දන්නේ නැහැ. දැන් එය අහෝසි වෙලාද දන්නේත් නැහැ. වචනයෙන් මේවා කියනවා. නමුත් ක්‍රියාවෙන් නැහැ. ඒ විධියේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකළොත්, ගම්බදත් නගරබද තත්ත්වයට දියුණු කරනවාය යන හැඟීමක් ඇති වෙන්නේ නැහැ. ගම්බද දියුණු වෙන්නේ නැති නම් නගර දියුණු වෙන්නේත් නැහැ. ගම්බදින් තමයි නගර දියුණු කරන්නට තිබෙන්නේ. ගම්බද පරිසරය දියුණුවන තරමට තමයි නගරවල පරිසරයත්, ආර්ථිකයත් දියුණු වෙන්නේ. එහෙම නම් ගමේ ආර්ථිකය දියුණු කිරීමේ වැඩපිළිවෙළට පොදුවේ ගම දියුණු කිරීමේ වැඩපිළිවෙළට අධ්‍යාපන ක්ෂේත්‍රයත් නැඹුරු විය යුතුයි.

ගරු සභාපතිතුමනි, ගම්බද පාසල්වල ගුරුවරුන්ගේ හිඟය ගැන හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ කිව්වා. මටත් කියන්නට තිබෙන්නේ ඒ ටිකමයි. පසුගිය 28 වනද, මහනුවර දිසා ඇමතිතුමාත් මමත් එක්තරා රැස්වීමකට ගියා. එතැනදී අපට කිව්වා, පාසල්වලට අවශ්‍ය ගණිත ගුරුවරුන්, විද්‍යා ගුරුවරුන් නැති බව. කලා ගුරුවරුන් නම් වුවමනා ප්‍රමාණය සිටියත්, අවශ්‍ය උපාධිධාරී ගුරුවරුන් නැති බව අපට කිව්වා. අපට ඉදිරිපත් කළ වාර්තාව ඒකයි. හැම පාසලකටම ගියාම අපට අසන්නට ලැබෙන්නේ ඒ දෙයමයි. හපුගස්තල මහා විද්‍යාලයේ ක්‍රීඩා උත්සවයට සහභාගි වෙන්නට ගිය අවස්ථාවේදීත් අපට කියා සිටියේ ඒ දෙයමයි. ගණිත ගුරුවරුන්, විද්‍යා ගුරුවරුන් පමණක් නොවෙයි, වානිජ ගුරුවරුන් නැති බව අපට කිව්වා. ඒ අන්දමට ගුරුවරුන් ඉල්ලා සිටින්නට විශේෂ හේතුවක් තිබෙනවා. අපේ ආර්ථිකය සකස් වී ඇති ආකාරය අනුව, කලා උපාධි ලබාගෙන ආර්ථික වශයෙන් සතුටුදායක ජීවිතයකට හැඩ ගැසෙන්නට බැරිය යන හැඟීමක් දැන් අපේ රටේ තිබෙනවා. ඒ හැඟීම දෙමව්පියන් අතරත් තිබෙනවා. එම නිසා ශිෂ්‍යයන් කලා විෂයයන් තෝරා ගන්නේ ගණිත, විද්‍යා ආදි විෂයයන් උගන්වන්නේ නැති නම් පමණයි. ඊළඟට, වානිජ ගුරුවරුන් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. එසේ ඉල්ලා සිටින්නේ එම විෂයන්ගෙන් උපාධිය සමත් වුණොත් පෞද්ගලික අංශයේ හෝ රැකියාවකට යන්නට පුළුවන් වනවාය කියන හැඟීම උඩයි. මා කලින් සඳහන් කළා වාගෙ වැඩි වැඩියෙන් ගණිත ගුරුවරුන් සහ විද්‍ය ගුරුවරුන් පාසල්වලට ලබාදීමට කටයුතු කරන්න ඕනෑ. එසේ ලබාදීමට ක්‍රියාකර ඇති බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළත්, කොයිතරම් දුරට එම වැඩපිළිවෙළ සාර්ථක වී තිබෙනවාදැයි කියන්නට මම දන්නේ නැහැ.

උපාධි ගුරු පත්වීම් පත් දහසක් දෙන්නට යන බවට ප්‍රවෘත්තියක් පත්‍රයේ පළ වී තිබුණා. ඒ සංඛ්‍යාව අඩු වී ගිහින්, පන්සියයට පහත බැස තිබෙනවාද කියන්න මම දන්නේ නැහැ. ගුවන් විදුලියෙන් අරකෙන් මේකෙන් නම් ප්‍රචාරය කරනවා, පත් දහසක් බඳවා ගන්නවාය කියා. එහෙම ප්‍රචාරයක් කළාම ඉල්ලුම් පත්‍ර එවනවා. නමුත් බඳවා ගන්නා විට කලින් සඳහන් කළ ගණන බඳවා ගන්නේ නැහැ. හැමදාමත් සිදු වෙන්නේ මේකයි. මෙම උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මොන ආකාරයෙන් ක්‍රියා කරනවාදැයි කියන්න මම නම් දන්නේ නැහැ. යම් යම් අංශවලින් මේ පිළිබඳව ලැයිස්තු යවා ඇති බවක් මට දැනගන්න ලැබුණා. මට නම් එවැනි ලැයිස්තුවක් තවමත් ලැබී නැහැ. කෙසේ වුණත් ඒ අන්දමේ ලැයිස්තු ලබා ඇති බවක් ගැන මට අසන්නට ලැබුණා. හැබැයි එය දැනගන්නට ලැබුණේ අපේ මන්ත්‍රීතුමන්ලාගෙන් නොවෙයි, වෙනත් අයගෙන්. ලැයිස්තු යැවීමේ සිරිත තවමත් පවතිනවාදැයි කියන්නට මම නම් දන්නේ නැහැ. එසේ යවනවා නම් එක කණ්ඩායමකට පමණක් යවන්නේ ඇයි ? එසේ යවා තිබෙනවා නම් ඒ ගැන මගේ බලවත් විරෝධතාව ප්‍රකාශ කරනවා. මේ විධියට ලැයිස්තු යැවීම වැරදි සහගත ක්‍රියාවක්. අනික එසේ යවනවා නම් එක කොටසකට පමණක් යැවීමත් වැරදියි.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නම් කාටවත් ලැයිස්තු යවා නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කිසිම ලැයිස්තුවක් කිසිම මන්ත්‍රීවරයෙකුට දී නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් යැව්වාද, වෙනත් අංශයකින් යැව්වාද කියන්න මම දන්නේ නැහැ. නමුත් මා ඉදිරිපිටදීම එක් අයෙක් ප්‍රකාශ කළා, සුදුසුකම් ලැබූ තිස් දෙදෙනකුගේ නම් ලැයිස්තුවේ තිබුණු බව. ඒ විධියට ලැයිස්තු යවා තිබුණත් මට නම් එවැනි ලැයිස්තුවක් ලැබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

අපේ අමාත්‍යාංශයෙන් ලැයිස්තු යවා නැහැ. ලංකාවේ කිසිම ආසනයක මන්ත්‍රීවරයකුට, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ මොහොත වනතුරු ගුරු පත්වීම් පිළිබඳ ලැයිස්තු යවා නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙමනම් ඒවා යවා තිබෙන්නේ අධ්‍යාපන සේවා කොමිසමෙන්ද ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

කොහොමටවත් එකෙන් වෙන්නට බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ කිසිම ආයතනයකින් මෙවැනි ලැයිස්තු යවා නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

දැන් ලැයිස්තු යැවීම නතර කළාද ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

අපි යවලා නැහැ.

අනිල් මූණසිංහ මහතා (මතුගම)
(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)
(Mr. Anil Moonesinghe - Matugama)

ඉස්සර යැව්වා නේ. දැන් ඒක නතර කළාද ?

සභාපතිතුමා
(தவிசாளர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වේලා ගන්නවාද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තව පැය භාගයක් පමණ.

සභාපතිතුමා
(தவிசாளர்)
(The Chairman)

The hon. Member for Akmeemana spoke for about 40 minutes. I notice that the hon. Member for Matugama is also waiting to speak.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මේ සම්බන්ධයෙන් ලැයිස්තු යවන්නේ නැහැයි කියනවා නම් මම එය පිළිගන්නම්. නමුත් ඔය ලැයිස්තුව ගැන අපි ඉදිරිපිට මහ රැස්වීමකදී විග්‍රහයක් කළා. ඒ නිසා එහි ඇත්තක් තිබෙනවා ද කියන එකයි මම ඇහැව්වේ. මට හොරා වෙනත් කෙනෙකුට යවනවාද කියන එක දැන ගන්නටයි ඇහැව්වේ. එහෙම යවන්නේ නැහැයි කියනවා නම් අදට මම එය පිළිගන්නම්.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අංශයෙන් ඉටු කෙරෙන විශේෂ අවශ්‍යතාවක් හැටියට මට පස්වැන්නේ ශිෂ්‍යත්වය සඳහන් කරන්නට පුළුවන්. මම හිතන විධියට පස් වැන්නේ ශිෂ්‍යත්වය තවමත් දෙන්නේ ශිෂ්‍යයන් එක් දහස් පන්සියයකට පමණයි. ඒ අනුව මාසයකට රුපියල් සියයක ගෙවීමකුයි කරන්නේ. මාසයකට රුපියල් සියය බැගින් අවුරුද්දකට මාස දහයකට රුපියල් 1000 ක් දෙනවා. 6, 7, 8, 9 වන ශ්‍රේණි සඳහා පොත්පත් ආධාර වශයෙන් මාසයකට රුපියල් 40කුත් 11 වන ශ්‍රේණියට රුපියල් 100කුත් 12 වන ශ්‍රේණියට රුපියල් 50කුත් දෙනවා. එතකොට මේ ශිෂ්‍යත්ව සංඛ්‍යාව ඇතිද කී ?ක ප්‍රශ්නයක් වී තිබෙනවා.

විශේෂයෙන් ගම්බද ප්‍රදේශවලට ලැබෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව අඩු බව සංඛ්‍යාලේඛණවලින් පෙනෙනවා. කොළඹ දිස්ත්‍රික්කයෙන් සිංහල මාධ්‍ය 139 කුත්, දෙමළ මාධ්‍ය 24කුත් තෝරී තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයෙන් සිංහල 90කුත් දෙමළ 26කුත් තේරී තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් සිංහල 21කුත් දෙමළ 29කුත් තෝරී තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයෙන් සිංහල 47කුත් දෙමළ 17කුත් තේරී තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සිංහල 53කුත් දෙමළ 2කුත් තේරී තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කයෙන් සිංහල එක්කෙනෙක්වත් නැහැ. දෙමළ 80ක් තේරී තිබෙනවා. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් සිංහල 10 දෙනෙකුත්, ද්‍රවිඩ 14කුත් තේරී තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයෙන් සිංහල 71කුත් ද්‍රවිඩ 9කුත් තේරී තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයෙන් සිංහල 66කුත්, දෙමළ 3කුත් තේරී තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් සිංහල 43කුත් දෙමළ 1කුත් තේරී තිබෙනවා. කොළඹත්, මහනුවරත්, යාපනයේත් විශාල සංඛ්‍යාවක් තේරී තිබෙන බව මෙයින් තමුන්නාන්සේලාට පෙනෙනවා. ප්‍රාදේශීය මට්ටමින් වෙනසක්වත් කළේ නැත්නම් ගම්බද ප්‍රදේශවලට ලැබෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව අඩු වෙනවා. මෙය ඉතා අවශ්‍ය දෙයක්.

මම හිතන විධියට දැන් අවුරුදු දහයක, පහළොවක පමණ කාලයක සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ ශිෂ්‍යත්ව 1,500 ගණන එහෙමම තිබෙනවා. රටේ ජනගහනය වැඩි වෙනවා. ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වෙනවා. මේ අනුව කල්පනා කර රටේ අද තත්ත්වයේ හැටියට මේ ශිෂ්‍යත්ව සංඛ්‍යාව අඩු තරමින් 3,000 ක් වත් කරන ලෙස මම අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත්, අධ්‍යාපන නිලධාරී මහත්වරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා. පස්වැන්නේ ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කළ තරමටයි ඒ අයට උසස් අධ්‍යාපනය සඳහා මඟ පෑදෙන්නේ. ඉතාමත්ම දක්ෂ ශිෂ්‍යයන් 1,500ක් පමණයි දැනට මේ ශිෂ්‍යත්ව සඳහා තේරෙන්නේ. මේ ශිෂ්‍යත්ව සංඛ්‍යාව 3,000 දක්වා වැඩි කළොත් තවත් 1,500කට උසස් අධ්‍යාපනය ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා. එහෙම කළොත් ගම්බද සිසුන් වැඩි පිරිසකට ශිෂ්‍යත්ව මාර්ගයෙන් උසස් අධ්‍යාපනයක් ලබාගෙන උසස් ජීවිතයක් ගත කරන්නට පුළුවන් වෙනවා. එම නිසා විශ්වවිද්‍යාලවලට තේරෙන සිසුන්ට දෙන ශිෂ්‍යත්වවලටත් වඩා මෙය ඉතාමත් වැදගත් වෙනවා. වැඩි වශයෙන් විශ්වවිද්‍යාලවලට තේරෙන්නේ පස්වැන්නේ ශිෂ්‍යත්වයෙන් සමත් වන ශිෂ්‍යයනුයි. එම නිසා අවුරුදු පහළොවක් විස්සක් තිස්සේ දුන් ශිෂ්‍යත්ව 1,500 දැන්වත් වැඩි කරන්නට බැරිද ? අද අපට ආධාර ගන්නට පුළුවන් නොයෙක් සංවිධාන තිබෙනවා. මේ පිළිබඳව පැහැදිලි විස්තරයක් කළොත් සමහර විට යුනෙස්කෝ එකෙන් අපට ආධාර ගන්නට පුළුවන්.

ඒ වාගේම ශිෂ්‍යත්ව වෙනුවෙන් අද දෙන ආධාර මුදල රුපියල් සියයයි. රුපියල් සියයකින් කරන්න පුළුවන්ද ? රුපියල් සියයක් නොවෙයි රුපියල් තුන්සියයක් දුන්නත් සමහර විට ඔහුට ජීවත් වෙන්න හෝ යම් සහනයක් ලැබෙන්නේ නැහැ. නමුත් මෙය ආධාර දීමනාවක් වශයෙන් ගෙවන්නේ. නගරබද අයට කෙසේ වෙතත් ගම්බද දුගී දුප්පත් අයට එය විශේෂ ආධාරයක් වෙනවා.

දැන් මෙයට තවත් ශිෂ්‍යත්ව ක්‍රමයක් එකතු කර තිබෙනවා. එනම් දැන් වැවිලි අංශයට ශිෂ්‍යත්ව තෝරනවා. ඒ ගැන අපේ අධ්‍යාපන ඇමතිතුමාට ස්තුති කරනවා. එය මොන විධියකින් තෝරනවද කියන්න මා දන්නේ නැහැ. ප්‍රසිද්ධ කරල ගන්නවාද, එහෙම නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වෙනම තෝරල ගන්නවාද කියන්න මා දන්නේ නැහැ. ජේ. ඊ. ඩී. බී. එක සහ එස්. පී. සී. එක මේ ශිෂ්‍යත්ව සඳහා රුපියල් තුන්සියය බැගින් මාසයකට ගෙවන්න එකඟ වීමෙන් හොඳ වැඩක් කර තිබෙනවා. එය සාධාරණයි. රුපියල් තුන්සියයක් දුන්නාම ඉතිරි වියදම් ටික ඒ ශිෂ්‍යයාගේ දෙමව්පියන්ට පහසුවෙන් කරන්න පුළුවන් වෙයි. ඒ නිසා මේ ශිෂ්‍යත්ව ලබන ගම්බද ගුරුවරයින්ගේ, රජයේ සුළු සේවකයින්ගේ දරුවන්ට සෑහෙන සහනයක් ලැබෙයි. ඒ නිසා වැවිලි අංශයට දෙන ශිෂ්‍යත්ව ක්‍රමය ඉතා වැදගත්. මා හිතන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එය පිළියෙළ කර තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා දෙන රුපියල් සියයේ ශිෂ්‍යත්ව මුදල රුපියල් තුන්සියය දක්වා වැඩි කළොත් හොඳයි. එය වැඩි කරන්නත් පුළුවන්. ඊළඟට, ශිෂ්‍යත්ව ප්‍රමාණය තුන්දහ දක්වා වැඩි කරනවා නම් එය අධ්‍යාපන අමාත්‍යාංශය කරන ලොකුම සේවයක් වෙනවා. ඒ මොකද, උසස් අධ්‍යාපනය ලබන්නට නම් මධ්‍යම පන්තියේ අධ්‍යාපනය. එනම් පස්වන ශ්‍රේණියෙන් ඉහළ අධ්‍යාපනයට සුදුස්සන් වශයෙන් වැඩි පිරිසක් තෝරන්න ඕනෑ. ඒ සුදුස්සන් තේරීමේ විභාගය පහේ ශිෂ්‍යත්වය නම් ඒ පහේ ශිෂ්‍යත්වයෙන් තෝරන ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ.

පූ. භා. 11.15

**සභාපතිතුමා**
(தவிசாளர்)
(The Chairman)

දැන් විනාඩි 20 ක් කථා කළා. තව 42 දෙනෙක් ඉන්නවා. කථා කරන්න.

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

තව විනාඩි 2ක් පමණක් කථා කරනවා. තමුන්නාන්සේගේ ඉල්ලීම උඩ. මම හරි කීකරු පුද්ගලයා නේ ? ඕනෑ දෙයක් පිළිගන්නවා.

මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය මා අගය කරනවා. මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමයෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ආධාර කරනවා වාගේම පහේ ශිෂ්‍යත්වවලට මහපොළින් ඇයි ආධාර ගන්න බැරි. අගමැතිතුමා දැන් ආවා. එතුමා මෙතෙක් මේ සභාවේ හිටියේ නැහැ. දැන් උනන්දුවක් නැතිවද දන්නේ නැහැ අධ්‍යාපන වැය ශීර්ෂය ගැන. තමුන්නාන්සේට අරගන්න පුළුවන් මහපොළ ශිෂ්‍යත්වයෙන්, යම්කිසි මුදලක්. දැනට මහපොළ ශිෂ්‍යත්වය දෙන්නේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා පමණයි. පහේ ශිෂ්‍යත්ව සඳහාත් යම් මුදල් ප්‍රමාණයක් මහපොළ ශිෂ්‍යත්ව කටයුතු කරන අපේ ජාතික ආරක්ෂක ඇමති ගරු ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමාගෙන් තමුන්නාන්සේ ඉල්ලා සිටියොත් එතුමා එය දෙන්න බැරිය කියාවි යයි මා හිතන්නේ නැහැ. එය ඉතා වැදගත් දෙයක්. එසේ ලැබුණොත් ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කරන්න පුළුවන්. ඒ වාගේම ශිෂ්‍යත්ව සඳහා දෙන මුදල් ප්‍රමාණයත් වැඩි කරන්න පුළුවන් වෙනවා. දරුවන්ට සහ දෙමව්පියන්ට සහනයක් වශයෙන්. ජේ. ඒ. ඩී. බී. එක සහ එස්. පී. සී එක ඉදිරියට ගෙන ඒ අයගේ ආධාර ලබා ගෙන වැවිලි අංශයට ශිෂ්‍යත්ව දීම සම්බන්ධනේ අධ්‍යාපන අමාත්‍යාංශය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරනවා. ඒ මගින් ඉදිරියට පියවරක් තැබුවාය කියා මා කියනවා. එය ඉතා වැදගත් කොට මා සලකනවා. ඒ නිසා එය ඉෂ්ට කරන්නට කියා මා ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේ එය ඉෂ්ට කරයි. මොකද, තමුන්නාන්සේ පසුගිය කාලයේදී අපක්ෂපාත පත්වීම් වගයකුත් දුන්නා. ඒ පත්වීම්වලට කිසිකෙනකුට අත ගහන්න බැරි වුණා. සමහර පිරිස් එයට විරුද්ධ වුණා. ඒ පත්වීම් දුන්න ක්‍රමය හරිය කියා අපිත් කියනවා. නියම සුදුස්සන්ට පත්වීම් ලැබෙනවා නම් ඒවාට අත ගසන්න අපට ඕනෑකමක් නැහැ. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන මා කිසිම විරුද්ධත්වයක් ප්‍රකාශ කරන්නේ නැහැ. මේ අමාත්‍යාංශයේ වැඩකටයුතු ගැන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**දයානන්ද වික්‍රමසිංහ මහතා (අකුරැස්ස)**
(திரு. தயானந்த விக்ரமசிங்ஹ — அக்குரஸ்ஸ)
**(Mr. Dayananda Wickremasinghe – Akuressa)**

ගරු සභාපතිතුමනි, අද අපි කථා කරන්නේ මේ රටට ඉතා වැදගත් අමාත්‍යාංශයක් පිළිබඳවයි. විශේෂයෙන් අවුරුදු ගණනාවක් නොයෙක් ප්‍රශ්න මත ගෙනගිය මේ අමාත්‍යාංශය මගින් 1977 වර්තමාන රජය බලයට පත්වීමෙන් පසුව ශ්‍රීමත් ජනාධිපතිතුමාගෙන් අධ්‍යාපන ඇමති ධුරය ලැබූ ගරු රනිල් වික්‍රමසිංහ ඇමතිතුමාත්, එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාත්, ගරු ලයනල් ජයතිලක අධ්‍යාපන සේවා ඇමතිතුමාත් විසින් අතිවිශිෂ්ට සේවාවක් මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් කරන බව අපි කවුරුත් දන්නවා. විශේෂයෙන් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. මා නියෝජනය කරන කොට්ඨාශය තිබෙන්නේ 1970 බලයට පත් රජයේ වැඩබලන අධ්‍යාපන ඇමතිවරයෙකු නියෝජනය කළ කොට්ඨාශය තිබෙන දිස්ත්‍රික්කයේයි. පසුගිය වකවානුව දෙස බලන විට අපට පෙනී ගියා, එද අධ්‍යාපන කටයුතු පැවැති ආකාරය නිසා නොයෙක් ප්‍රශ්න මත අපේ තරුණ පරපුර බෝක්කු උඩ කාලය ගත කිරීමෙන් හෝ නොයෙකුත් අයථා කටයුතුවලට පුරුදු වීමෙන් හෝ ඔවුන්ගේ අනාගතය කාලකන්නි කර ගැනීමට යොමු වූ බව. නමුත් අපට අද පැහැදිලි වෙනවා වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා මගින් ක්‍රියාත්මක කෙරෙන මේ නව වැඩ පිළිවෙළ තුළින් මේ රටේ අනාගතය භාර ගන්නට සිටින තරුණ පරපුර යහමඟට යවන්නට විශේෂ සැලැස්මවල් කීපයක් අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අධ්‍යාපන සේවා ඇමතිතුමාත් සකස් කර තිබෙන බව.

මාතර දිසා ඇමතිතුමාත්, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා) අපේ දිස්ත්‍රික්කය වෙනුවෙන් කථා කළා. මේ රටේ තරුණ පරපුර යහමඟට යවන්නට ජපන් ආධාර යටතේ දශ ලක්ෂ 40ක් පමණ වැය කොට තනනු ලබන නිල්වලා අධ්‍යාපන පීඨය මගේ ආසනයේ වල්පිට ප්‍රදේශයේ දැන් නිම වෙමින් පවතින බව මාතර දිසා ඇමතිතුමාත් සඳහන් කළා. 1986 අගෝස්තු අවසානය වන විට අපට පුළුවන්කමක් ඇති වෙනවා, ඒ අධ්‍යාපන විද්‍යා පීඨය විවෘත කොට මේ රටේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන්නට නොහැකි වූ අපොස උසස් පෙළ විෂයයන් හතරක් සමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් එයට ඇතුළත් කර පුහුණුවක් ලබාදී ඒ තුළින් ඔවුන්ගේ අනාගතය වාසනාවන්ත කරන්න. අධ්‍යාපන ඇමතිතුමාගේත් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් නිලධාරී මහත්වරුන්ගේත් ක්‍රියාකලාපය නිසා අනාගත පරපුර වාසනාවන්ත ගමනක මෙහෙය වන්නට මේ රජයට පුළුවන්වීම මුළු රටේත්, මුළු ජාතියේත් වාසනාවක්ය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

පසුගිය රජය කාලයේ උපාධිධාරීන් දහස් ගණනක් රැකියා නැතිව සිටියා. අසරණ දෙමව්පියන් තමන්ගේ ගේදොර උකස් කර බැංකුවලින් ණය ලබා ගෙන තමන්ගේ දරුවන් උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලවලට යැව්වා. නමුත් ඔවුන් විශ්ව විද්‍යාලවලින් උපාධිය ලබාගෙන ගෙවල්වලට ඇවිත් අවුරුදු ගණනාවක් තිස්සේ රැකියා නැතිව සිට නොයෙක් නරක වැඩවලට යොමු වී අනාගතය කාලකන්නි කර ගන්නට පටන් ගත්තා. උපාධිය ලබාගෙන අවුරුදු ගණනාවක් රැකියාව නැතිව සිටි උපාධිධාරීන්ට 1977 න් පසු 1984 වන තෙක් මේ අමාත්‍යාංශය යටතේ තමන්ට නියමිත වැටුප් සහිතව ගුරු පත්වීම් ලබාදීම මුළු මහත් උපාධිධාරීන්ටම විශාල ජයග්‍රහණයක්ය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි.

1977 මැතිවරණයට පෙර එවකට සිටි උපාධිධාරීන්ට උදව්වක් කළා නම් කළේ ශිෂ්‍යගුරු පත්වීම් දීමයි. රු. 100ක් පමණ වූ අඩු වැටුපකටයි, ඒ අයට පත්වීම් දුන්නේ. නමුත් අද මේ රජය බලයට පත්වුණාට පසුව උපාධියේ ගෞරවය ආරක්ෂා කරමින් ඔවුන්ගේ උගත්කම අනුව නියම වැටුපක් ගෙවන්නට අපට පුළුවන් වීම මේ රජයේ ජයග්‍රහණයක්. එපමණක් නොවෙයි. උපාධිය ලබා ගැනීම සඳහා විශ්ව විද්‍යාලවලදී වියදම් කරන්නට බැංකුවලින් ලබාගත් ණය මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වී බැංකුවලටත් විශාල ප්‍රශ්නයක් ඇති වී තිබුණා. නමුත් අද අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ ක්‍රියාකලාපය මත උපාධිධාරීන්ට රැකියා සැපයීම නිසා අද ඒ බැංකුවලටත් පුළුවන්කම ඇති වී තිබෙනවා, ඒ ණය මුදල් ඔවුන්ගේ වැටුපෙන් අය කර කගන්නට. ඒ නිසා එවැනි තවත් පිරිසකට ණය ලබාදීමට හැකියාවක් ඇති වීමත් අපි ලැබූ තවත් ජයග්‍රහණයක් හැටියට මම මතක් කරන්නට ඕනෑ.

තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ පුටු බැංකුවල අඩුපාඩුවක් තිබුණු අපේ පාසල්වලට ලයනල් ජයතිලක අධ්‍යාපන සේවා ඇමතිතුමා විසින් ඒවා සපයා දී අපේ අසරණ දෙමව්පියන්ගේ දරුවන්ට වාඩිවී ඉගෙනගෙන තමන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යන්නට අවස්ථාව සලසා දීමත් මේ රජයේ තවත් ජයග්‍රහණයක්.

අධ්‍යාපන ඇමතිතුමා ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල ක්‍රමය ආරම්භ කර තිබෙනවා. මගේ ආසනයට අයිති ප්‍රදේශවල සිට මාතර ප්‍රධාන අධ්‍යාපන කාර්යාලයට කෙනෙක් එනවා නම්, සමහර අවස්ථාවලදී හැතැප්ම ගණනක් පයින් ඇවිල්ලා ඊට පසුව බස් එකෙනුත් ඇවිල්ලයි එන්න වෙන්නේ. නමුත් ආසන මට්ටමෙන් ඇති කළ අධ්‍යාපන කාර්යාල නිසා එවැනි දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට පහසුවක් ඇති වුණා. නිවාඩු ප්‍රශ්නයක් ගැන, පාසලේ ගැටළුවක් ගැන, එහෙම නැත්නම් මහජන ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කර ගැනීමට, ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල පිහිටුවීම නිසා විශාල පහසුවක් ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට ඇති වුණා. එය අපට විශේෂ සිද්ධියක්. ඒ මන්ද, දින දෙක තුනක් නිවාඩු ලබා නොගන්නාට පැය ගණනකදී තමන්ගේ ප්‍රශ්න ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මගින් විසඳා ගැනීමට හැකි වීමයි. ඒ ගැන අපේ ස්තුතිය මේ අවස්ථාවේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන ඇමතිතුමාට පුද කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන යන උදර වැඩ පිළිවෙළ ගැනත්, මුළු මහත් අනාගත පරපුරම යහ මගකට යොමු කරන්නට කටයුතු කිරීම ගැනත් නැවත වරක් ගරු ඇමතිතුමා ඇතුළු සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ගරු සභාපතිතුමනි, මම දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න කැමතියි. එතුමා කථා කරන අවස්ථාවේදී ඒවාට පිළිතුරු ලැබේවිය කියන බලාපොරොත්තුවෙන්.

අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (දයානන්ද වික්‍රමසිංහ මහතා) කිව්වා, 1977 ඉස්සෙල්ලා රැකියා නැතිව උපාධිධාරීන් දහස් ගණනක් හිටියා කියා.

**දයානන්ද වික්‍රමසිංහ මහතා**
**(திரு. தயானந்த விக்ரமசிங்ஹ)**
**(Mr. Dayananda Wickremasinghe)**

අපේ ආසනේ ඕනෑතරම් හිටියා.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

එක පාරටම ඉදිරිපත් කරන්න සංඛ්‍යා ලේඛන මා ළඟ නැහැ. නමුත් මම කියන්නෙ අපේ කාලයේදී නම්, උපාධිධාරීන් තමන්ගේ විභාගය සමත් වූ හැටියම වාගේ රැකියාවලට අනුයුක්ත කළ බවයි.

ජිනදාස වීරසිංහ මහතා (තංගල්ල)
(திரு. ஜினதாச வீரசிங்ஹ — தங்கல்ல)
(Mr. Jinadasa Weerasinghe – Tangalle)

තමුන්නාන්සේලාගේ කාලේ රුපියල් 250යි උපාධිධාරීන්ට පඩි ගෙව්වේ. මහ ලොකු කජ්ජක් කරලා [බාධා කිරීමක්].

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

1971න් පස්සේ දුන්නේ නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

දුන්නා. ඕනෑ තරම් දුන්නා. මා ළඟ දැන් ඒ සංඛ්‍යා ලේඛන නැහැ.

රේනුකා හේරත් මහත්මිය (නුවරඑළිය දිසා ඇමතිතුමිය)
(திருமதி ரேணுகா ஹேரத் — நுவரெலிய மாவட்ட அமைச்சர்)
(Mrs. Renuka Herath – District Minister, Nuwara Eliya)

වැටුප රුපියල් 250යි.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඔබතුමන්ලාට ලේඛන ඇතිව පුළුවන් පෙන්වන්න, "මේ තරම් උපාධිධාරීන් පිරිසක් රැකියා නැතිව සිටියා. අපි ඒ අයට රැකියා දුන්නා" කියලා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

මොකටද ලේඛන ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ත්‍රස්තවාදී අරගල පටන් ගත්තේ විශ්ව විද්‍යාලවලින්. විද්‍යෝදය විශ්ව විද්‍යාලය හිර ගෙයක්, ඒ කාලේ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඒ ප්‍රශ්නය ඉවරයි නේ දැන් ? කරුණාකරල මට කථා කරන්න ඉඩ දෙන්න. දළ ජාතික නිෂ්පාදිතය අනුව අධ්‍යාපනයට වෙන් කරන ලද ප්‍රමාණය බලමු.

**රනිල් වික්‍රමසිංහ මහතා (යොවුන් කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. ரணில் விக்ரமசிங்ஹ — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)**
**(Mr. Ranil Wickremasinghe – Minister of Youth Affairs & Employment and Minister of Education)**

From where are you quoting ?

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

From the Central Bank of Ceylon – Annual Review – 1984.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. ரணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

But I thought that you do not accept the Central Bank statistics.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

That is not true. I never said that. The Hon. Minister was not here. I quoted the Hon. Minister of Finance where he doubted the Central Bank statistics, but he continued to quote them. Why are you holding it against me only ? You must hold it against him also.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. ரணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

I wanted to know whether you accept them or not.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

I accept generally the Central Bank figures, except those concerned with the cost of living and the general deflationary digits. That is all I am saying.

අපේ ගරු ඇමතිතුමා මගෙන් ටිකක් ප්‍රශ්න කරන්න පටන් ගත්තා. එතුමා දන්නවා මම අහන්න යන ප්‍රශ්නය මොකක්ද කියා. ඒකයි, භය වුණේ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

භය වෙන්න දෙයක් නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

හොඳයි. භය නැත්නම් අහගෙන ඉන්න.

ශිෂ්‍ය/ගුරු අනුපාතය

| 1975 | 1976 | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 24.6 | 23.2 | 21.7 | 25.0 | 23.5 | 24.0 | 25.6 | 26.3 | 26.5 | 25.9 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මහතා]

තමුන්නාන්සේලා එවිට පිළිගනිව්. ගුරුවරුන්ගේ සාමාන්‍ය අනුපාතය ශිෂ්‍යයන් අනුව බැලුවාම තමුන්නාන්සේලාගේ කාලයේ ශිෂ්‍යයින් වැඩි බවත්, ගුරුවරුන් අඩු බවත්.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
**(Mr. W. P. B. Dissanayake)**

මම එකක් පෙන්වා දෙන්න කැමතියි.

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

කරුණාකරලා මම ඉවරවෙනතුරු ඉන්න. ඊට පසුව ඕනෑ එකක් පෙන්වන්න තමුන්නාන්සේගේ කථාවේදී.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
**(Mr. W. P. B. Dissanayake)**

අවුරුදු පහේදී ළමයි ඇතුළු කළ එක තමයි මේ ප්‍රශ්නය.

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

මම දන්නෙ නැහැ. ඕනෑ එකක් කියන්න.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
**(Mr. W. P. B. Dissanayake)**

අවුරුදු හය වනතුරු තමුන්නාන්සේලා සිටියා.

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

ඒක තමයි මම කියන්නෙ. මගේ කතාවට පස්සේ ඕනෑ එකක් කියන්න ඉඩ තිබෙනවා.

**රේනුකා හේරත් මහත්මිය**
(திருமதி ரேணுகா ஹேரத்)
**(Mrs. Renuka Herath)**

ඒ කාලයේ උඩිනුත් කැපුවා, යටිනුත් කැපුවා.

**එච්. ජී. පී. නෙල්සන් මහතා (ත්‍රිකුණාමලය දිසා ඇමතිතුමා)**
(திரு. எச். ஜீ. பீ. நெல்சன் — திருகோணமலை மாவட்ட அமைச்சர்)
**(Mr. H. G. P. Nelson – District Minister, Trincomalee)**

උඩින් යටින් දෙකින්ම කැපුවා.

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

ඊළඟට එදිනෙද වියදම අනුව බැලුවාම ජාතික දළ නිෂ්පාදනයේ අනුපාතයක් වශයෙන් මේ අන්දමට සඳහන් වෙනවා :

| ශීර්ෂය | 1975 | 1976 | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 9. දළ ජාතික ආදායමෙහි (ඇ) ප්‍රතිශතයක් වශයෙන් මුළු ජංගම වියදම | 2.2 | 2.4 | 2.2 | 2.2 | 2.0 | 2.1 | 1.9 | 1.7 | 1.9 | 1.7 |

මේ අනුව තමුන්නාන්සේලා පිළිගනිව්, අධ්‍යාපනය පැත්තෙන් තමුන්නාන්සේලා වියදම් කර තිබෙන්නේ 1975 අනුපාතයට වඩා අඩු අනුපාතයක් බව.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)
**(Dr. Wimal Wickremasinghe)**

What about item 8 ? Why do you not read item 8 ?

පූ. භා. 11.30

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

I am coming to that now. Item 8 is only expenditure per pupil. It is in rupees – devalued rupees. But I am going on the GNP.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)
**(Dr. Wimal Wickremasinghe)**

Read both. Then we can reply.

**අනිල් මුණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

I can quote that also, but what is the use of that because you are using devalued rupees ? Then we have item 10.

අධ්‍යාපනයට මුළුමනින්ම වියදම් කළ ප්‍රමාණය. ඒ කියන්නේ එදිනෙද වියදම් සහ ප්‍රාග්ධන වියදම්.

| ශීර්ෂය | 1975 | 1976 | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10. රජයේ මුළු වියදමෙහි ප්‍රතිශතයක් වශයෙන් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා මුළු වියදම | 8.1 | 8.2 | 9.1 | 5.1 | 5.3 | 4.9 | 5.5 | 4.7 | 5.5 | 5.3 |

මම ඊට වැඩිය මේවායින් කියවන්නෙ නැහැ. [බාධා කිරීම්] ලංකාවේ ජනතාවට පෙනෙයි, අධ්‍යාපනයට තමුන්නාන්සේලා කර තිබෙන සැලකීම ගැන. [බාධා කිරීම්]

කරුණාකරලා ශ්‍රී ලංකා මහ බැංකුවත් එක්ක හබ කරන්න. මා එක්ක හබවෙන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

These figures do not include monies invested by the Mahweli Development Board, the IRDB projects etc.– (*Interruption*)

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! I am sure the Hon. Minister will reply.

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

බොරු කියන්න දෙන්න බැහැ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
**(Mr. Anil Moonesinghe)**

මගේ ආසනයේ මිරිස්වත්ත පාසලට ගිය අවුරුද්දේ ශිෂ්‍යයින් අළුතෙන් ඇතුළු කරන විට රුපියල් 250ක් ඉල්ලා තිබෙනවා, දෙමව්පියන්ගෙන් ඇතුළුවීමේ ගාස්තු වශයෙන්. ඒවාට දෙන්නෙ නැහැ, රිසිට්. ඇසුවාම කියනවා, මේ ඉස්කෝලෙට ඇතුළු කරනවිට එක්කෝ බංකුවක හෝ පුටුවක හෝ දෙකේම හෝ මිල දෙන්නය කියා. එහෙම දෙන්නෙ නැත්නම් රුපියල් 250ක් අරගෙන තිබෙනවා. [බාධා කිරීම්] ඕනෑ වෙලාවක. ඔබතුමා දෙන්න මට අවසරය. මාත් එක්ක ගිහිල්ලා ගමේ උදවියත් සමඟ කතා කරන්න පුළුවන්. මම කියන දේ සනාථ කරයි.

ඊළඟට, කජුදූවේ ප්‍රාථමික පාසලේ වැසිකිළියක් නැහැ, අවුරුදු 10ක් තිස්සේ.

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

උනන්දු වෙනවා නම් විමධ්‍යගත අයවැයෙන් ගන්න පුළුවන්නේ මුදල් ?

**එච්. ජී. පී. නෙල්සන් මහතා**
**(திரு. எச். ஜீ. பீ. நெல்சன்)**
**(Mr. H. G. P. Nelson)**

ඕක වුණේ ප්‍රදේශයේ මන්ත්‍රීතුමා නොසිටි නිසයි. ලක්ෂ 50ක් දෙනවා විමධ්‍යගත අයවැයෙන්.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
**(Mr. Anil Moonesinghe)**

මම ඇවිල්ලා දැන් අවුරුදු දෙකහමාරක් නැහැ. මම සල්ලි වෙන්කර තිබෙනවා. මම කියන්නේ ඊට ඉස්සරවෙලා සිටි උදවිය ගැන.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මීට කලිනුත් පෙන්නුම් කර දුන්නා, ගුරුවරුන්ගේ නියම පඩිය සියයට 3.1 කින් වැටී තිබෙනවාය කියා. ඒ කියන්නේ රුපියලේ අගය බාල්දු කිරීම හේතුකොටගෙනත් වෙනත් නොයෙක් හේතුන් නිසාත් ගුරුවරුන්ගේ නියම පඩිය සියයට තුනයි දශම ගණනකින් අඩුයි. ඒකෙන් පේනවා, තමුන්නාන්සේලා ගුරුවරුන්ට සලකන හැටි. ඇත්ත වශයෙන්ම මේ රටේ අනාගත පරපුර හදන වඩන මේ කොටස ගැන තමුන්නාන්සේලා මීට වඩා සැලකිල්ලක් දක්වන්න ඕනෑ. එපමණයි මම කියන්නෙ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

කවුරු හෝ කියන්න ඇති කථා කරන්නය කියා. ඒගොල්ලො ගැන.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
**(Mr. Anil Moonesinghe)**

කවුරු හෝ කියයි. තමුන්නාන්සේලාට ගුරුවරු හම්බ වෙන්නෙ නැහැ නෙ. [බාධාකිරීමක්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගුරුවරුන් විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන උදවියත් අපට ඇවිත් කියනවා, ඒ උදවියගේ ප්‍රශ්න ගැන. ඔබතුමන්ලාට කියන්න බයයි. අන්න එපමණයි, මම කියන්නෙ.

**දයාරත්න වලගම්බාහු මහතා (මිහින්තලේ)**
**(திரு. தயாரத்ன வலகம்பாகு — மிஹிந்தலை)**
**(Mr. Dayaratne Walagambahu – Mihintale)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ අනාගත පරපුර නගා සිටුවීම සඳහා 1977 න් පසු අධ්‍යාපන අමාත්‍යාංශය විශාල සේවයක් ඉෂ්ට කර තිබෙනවා. ගම්බද ශිෂ්‍යයන්ගේ අනාගතය 1977, 1978 කාලය වන තුරු බොහෝම අඳුරු තත්ත්වයකයි තිබුණේ. එහෙම වුණේ අධ්‍යාපනය සඳහා එවකට සිටි වගකිය යුත්තන් ගම්බද පාසල් නගා සිටුවීම සඳහා හරියාකාර කරුණු සොයා බලා ක්‍රියා නොකළ නිසයි. නමුත් 1977 සිට මේ දක්වා සිටි අධ්‍යාපන ඇමති ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමාත්, ඉන් පසුව මේ භාරදූර කාර්‍ය්‍ය භාරගත් වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාත් ඉතාමත්ම ඕනෑකමින් මේ රටේ අනාගත පරපුර ජාත්‍යන්තර මට්ටමට සකස් කිරීම සඳහා — විශේෂයෙන් ජාත්‍යන්තර මට්ටමට සකස් කිරීම සඳහා — යන වචන පාවිච්චි කළ යුතුයි. සෑහෙන පියවරක් තබා තිබෙන බව මම සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන් මෑත අවුරුදු කීපය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය සකස් කරගෙන යන ආකාරය ගැන බලනවිට යම් යම් දේශපාලන වාසි තකා සමහර අය විවේචනය කළත් — මන්ත්‍රීවරුන් වශයෙන් අපට යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වුණත් ජාත්‍යන්තර මට්ටමේ අනාගත පරපුරක් සකස් කිරීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු එම අමාත්‍යාංශය ගෙන තිබෙන වැදගත් පියවර වෙනුවෙන් ජාතියේ ප්‍රණාමය එතුමන්ලාට පුද කරන්න කැමතියි. මීට ප්‍රථමයෙන් සමහර දේශපාලන වාසි තකා ගන්නා ලද පියවරවලට වඩා, අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ වැදගත් උපදෙස් ලබාගෙන මේ ගෙන යන වැඩ පිළිවෙළ නිසා මේ රටේ බහුතරය වූ ගම්බද ග්‍රාමීය ශිෂ්‍යයන්ට විශාල සෙතක් ශාන්තියක් අනාගතයේදී ඉෂ්ට වනු නිරනුමානයි.

පාසල් වර්ග කිරීම සම්බන්ධව අනාගතයේදී ඇති වන්නට යන ප්‍රගතිය ගැන බලන විට විරුද්ධ පක්ෂය කොපමණ රොස් පරොස් කිව්වත් නවමත් ගමේ සිටින ගැමි නායකයන් වශයෙන් අපේ ගැමි සමාජය තුළින් අනාගතයේදී ජාත්‍යන්තර මට්ටමේ උගතුන් බිහිවන ලකුණු අපි දකින නිසා මේ රජයට අපේ ඒ ප්‍රණාමය අපි යළි යළිත් පුද කරන්න සූදානම්. ඊට හේතුව මෙයයි : මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් ගුරුවරුන් ලිපිකරුවන් වැනි අයයි මෙපමණ කලක් බිහි කළේ. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති කරගෙන යන ජාත්‍යන්තර මට්ටමේ තත්ත්වය නිසාත්, වෙනස්කම් නිසාත්, දැන් සිටම අපේ ඇස් පනාපිට පෙනෙන්නට තිබෙනවා, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, විද්‍යාඥයින්, කෘෂිකාර්මික විද්‍යාඥයින් වැනි අය අපේ ගැමි දරුවන් අතරින් ඇති වෙන බව. ඒ තත්ත්වයට අපේ ගැමි දරුවනුත් එක්කාසු වෙනවා. ඒ තත්ත්වයන් ලැබීම සඳහා ඔවුන් විශ්ව විද්‍යාලවලට ඇතුලත් වෙනවා. අපි එය ඉතාමත් අගය කළයුතු කාරණයක් බව මතක් කරන අතර, එය ඉතිහාසයේ සටහන් වෙනවාට සැකයක් නැහැ.

ඒ වාගේම, නාගරික අධ්‍යාපන ක්ෂේත්‍රයත්, ගම්බද අධ්‍යාපන ක්ෂේත්‍රයත් එක මට්ටමකට ගෙන එන්නට නම් හැම පලාතකම එක ශිෂ්‍යයෙකු වෙනුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැය කරන මුදල එක සමාන කිරීම ඉතාම වැදගත් වෙනවා. ගම්බද අධ්‍යාපන ක්ෂේත්‍රය දුර්වලයි, නගරබද අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණුයි කියා විවේචනයට ලක් වන්නාවූ කාරණයට මෙය හොඳ පිළිතුරක් වෙනවා, අපිට මේක කරන්න පුළුවන් නම්.

මම ගරු අධ්‍යාපන ඇමතිතුමාට එක යෝජනාවක් කරන්න කැමතියි. ඔබතුමා යටතේ තිබෙන ගොඩනැගිලි අංශය වහාම අයින් කර එය භාර දෙන්න, ඒ ඒ සංවර්ධන සභාවලට හෝ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට හෝ වෙනත් අංශයකට. දැන් ඒ ගොඩනැගිලි අංශය ක්‍රියා කරන්නේ ඉතාමත් දුර්වල විධියටයි. දෙසැම්බර් 31 වන ද වනවිට අප අනුමත කරන මුදල් ඊළඟ අවුරුද්දේ දෙසැම්බර් 31 වන ද වනතුරු වියදම් කරන්නේ නැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ දයාරත්න වලගම්බාහු මහතා ]

ගොඩනැගිලි අංශය නිසා අධ්‍යාපන අමාත්‍යාංශයට විශාල නරක නමක් ඇති වෙනවා. ටෙන්ඩර් ප්‍රතිපත්තියෙන් පරිබාහිරව, තමන් කැමති අයට කොන්ත්‍රාත් ක්‍රමයට, නොවැම්බර් මාසයේ පමණ වන විටයි ඒ වැඩකටයුතු භාර දෙන්නේ. වැහි කාලයත් අල්ලලා, අපේ ප්‍රදේශවල තත්ත්වය බැලුවාම. ඒක ඒ ඒ නිලධාරීන් අතරේ කෙරෙන වැඩක්. මේක කරන්නට බැහැ. විරුද්ධ පාර්ශ්වයෙන් සහ ආණ්ඩු පාර්ශ්වයෙනුත් මේක කියවුණා. එමනිසා කරුණාකර මේ කටයුත්ත වෙනත් ගොඩනැගිලි අංශයකට භාර දෙන්න. ඒ වාගේම හැම විද්‍යාලයකටම ඇතුළත් වන දරුවන්ගේ සිත් සතන් සතුටුවන අයුරින් එම විද්‍යාල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා මුදල් වෙන් කරන්නට ඕනෑ. අපේ ප්‍රදේශවල පාසැල් දිරාපත්ව ගරා වැටී තිබෙනවා.

මගේ කථාව කෙටි කළයුතු නිසා තව එක කාරණයක් පමණක් සඳහන් කරනවා. ගුරුවරුන්ගේ පඩි වැඩි වුණා, සෑහෙන ප්‍රමාණයක්. සෑහෙන ගුරු පිරිසක් ඉතා ඕනෑකමින් උනන්දුවෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වැඩකටයුතු කරනවා, ඔවුන් අධ්‍යාපනය අතින් තගා සිටුවීමට. තව පිරිසක් " මේ අපේ ආණ්ඩුව, මේ අපේ ඇමතිතුමා, මේ අපේ මන්ත්‍රීතුමා, පළාතේ මන්ත්‍රීතුමාගෙන් මොනවා වුණත් ඇමතිතුමාගෙන් හරි බේරෙන්නට පුළුවන්. සමාව තිබෙනවා " කියා වැඩ නොකර ඉන්නවා. කඩාකප්පල් වැඩ කරනවා. තවත් සමහර පිරිසක්, අපේ ආණ්ඩුවක් ආපු දවසක අපි වැඩ කරනවා කියා කඩාකප්පල්කාරී වැඩ කරනවා. එමනිසා ඔබතුමා මීට වඩා විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගතහොත් මේ තත්ත්වය නැති කර ගන්නට පුළුවන් වෙනවා. සමහර ගම් ප්‍රදේශවලට කොපමණ ගුරුවරුන් පත්කර තිබුණත් දෙමව්පියන් කියනවා, අපේ ළමයා පාස් වුණේ අසවල් තැන තිබෙන පුද්ගලික ටියුෂන් පන්තියට යවා උගන්වපු නිසයි කියා. එසේ කීමෙන් වෙන්නේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු අධ්‍යාපන ආයතනයට අපකීර්තියක්, අපිටත් අපකීර්තියක් වෙනවා.

ඊළඟට මගේ ආසනය තුළ වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය අසාර්ථක වී ඇති නිසා මා පස් අවුරුද්දක් තිස්සේ කරන ලද ඉල්ලීම අනුව, මගේ ආසනය තුළ වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය වෙන විධියකින් කිරීමට ඉඩ හැර අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අයින් කරන මෙන් ඉල්ලනවා. අවසාන වශයෙන් තමුන්නාන්සේලා මේ ගත් උත්සාහයන් නිසා තව අවුරුදු තුන හතරකින් ගම්බද විශාල පිරිසක් හොඳ උගතුන් වන ලකුණු පහළ වී ඇති බව නැවත වරක් මතක් කරමින් මම නිහඬ වෙනවා.

**මර්වින් ජේ. කුරේ මහතා** (පානදුර)
**(திரு. மேவின் ஜே. குரே — பாணந்துறை)**
**(Mr. Mervyn J. Cooray - Panadura)**

ගරු සභාපතිතුමනි, මේ කාරක සභා අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කථා කරන්න ලැබීම පිළිබඳව මම අද ඉතාම සන්තෝෂ වෙනවා. පළමුකොටම මගේ අවංක ආදර - ස්තුතිය පුද කරන්න ඕනෑ, ගරු අධ්‍යාපන ආමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමාටත්, ගරු අධ්‍යාපන සේවා අමාත්‍යතුමාටත්. මන්ද, අද මුළු රටේම අධ්‍යාපන ක්ෂේත්‍රය විශාල නව නැම්මක් තුළින් දියුණු කිරීමටත්, විශේෂයෙන් අපේ පාසල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ ආධ්‍යාපනික තත්ත්වය දියුණු කිරීමටත්, ඒ වාගේම පාසල් සියල්ලකම පාහේ තත්ත්වය උසස් කිරීමටත් එතුමන්ලා විශේෂ උනන්දුවක් දක්වා තිබෙනවා.

පූ. භා. 11.45

මේ වැඩ පිළිවෙළ යටතේ පානදුර මැතිවරණ කොට්ඨාශයටත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශාල මෙහෙවරක් ඉෂ්ට වන බව මම මතක් කරන්න ඕනෑ. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙනුත්, නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමාගෙනුත්, විශේෂයෙන් ගරු අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙනුත් කළ සෑම ඉල්ලීමක්ම එයාකාරයෙන්ම එතුමන්ලා ඉෂ්ට කර දුන්නා.

මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (දයාරත්න වලගම්බාහු මහතා) ගොඩනැගිලි අංශය පිළිබඳව යමක් ප්‍රකාශ කළා. නමුත් පානදුරේ මැතිවරණ කොට්ඨාශය පිළිබඳව කථා කරන විට ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මට ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙනුත්, ඒ අමාත්‍යාංශයෙනුත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයෙනුත්, ඒ වාගේම ගොඩනැගිලි අධ්‍යක්ෂතුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන්ගෙනුත් අපේ මැතිවරණ කොට්ඨාශයේ සෑම කටයුත්තකටම සහයෝගය ලැබුණු බව කියන්න ඕනෑ. දැනට අවුරුදු තුනකට පමණ පෙර පානදුරේ මැතිවරණ කොට්ඨාශයේ පාසල් පිළිබඳව ලොකු පසුබෑමක් තිබුණා. නමුත් මගේ විශේෂ ඉල්ලීම පිට පාසල් ගොඩනැගිලි අලුත්වැඩියා කර ගැනීමට පමණක් රු. 14,00,000ක පමණ මුදල් ප්‍රමාණයක් මට අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයෙනුත් ලැබුණු බව ආඩම්බරයෙන් මතක් කරන්න ඕනෑ.

මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) ප්‍රකාශ කළා, පාසල්වල අඩුපාඩුකම් තිබෙනවාය කියා. මම හිතන්නේ එතුමන්ලා තමන්ගේ මැතිවරණ කොට්ඨාශවල පදිංචි වී නොසිටීම නිසාත්, ඒ පාසල් පිළිබඳව විශේෂ සොයාබැලීමක් – අධීක්ෂණයක් – නොතිබුණු නිසාත් තමයි, එතුමන්ලාට ඒ පාසල්වල තිබෙන අඩුපාඩුකම් සපුරාලන්න බැරි වී තිබෙන්නේ. නමුත් පානදුර මැතිවරණ කොට්ඨාශයට මා පත් වී ගත වුණු අවුරුදු 2 1/2 ඇතුළත ඒ ආසනයේ පාසල්වල අඩුපාඩුකම් සම්පූර්ණ කර ගන්න මට පුළුවන් වී තිබෙන බව ආඩම්බරයෙන් මතක් කරන්න කැමතියි. මට විමධ්‍යගත අයවැයෙන් ලැබෙන්නේ රුපියල් ලක්ෂ 50 යි. නමුත් මම රුපියල් ලක්ෂ 70ක පමණ වැඩ කර තිබෙනවා. ඒ විධියට රුපියල් ලක්ෂ 70ක් පමණ වියදම් කොට ගොඩනැගිලි 16ක් හද තිබෙනවා. ඒ බවට, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාත්, ගරු අධ්‍යාපන සේවා අමාත්‍යතුමාත්, ඒ වාගේම නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමාත් සාක්ෂි දරයි. ආරාධනා කළ සෑම අවස්ථාවකම එතුමන්ලා ඒ ගොඩනැගිලි විවෘත කරන්න පැමිණියා.

පාසල් උපකරණ අඩුපාඩුකම් පිළිබඳව නොයෙකුත් මන්ත්‍රීවරු කථා කළා. නමුත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ, අපේ පාසල් සඳහා ඩෙස්ක්, බංකු, පුටු ආදිය ඉල්ලූ සෑම විටකම අධ්‍යාපන සේවා අමාත්‍යාංශය ඒවා අපට ලබා දුන් බව. ඒ වාගේම පාසල්වලට සම්පත් බෙදා දීමේ වැඩ පිළිවෙළ යටතේත් අධ්‍යාපන සේවා අමාත්‍යතුමා විශේෂ මෙහෙවරක් කරන බව මතක් කරන්න කැමැතියි. මම හිතන්නේ නැහැ, එතුමා නත්තල් සීයා විධියට නම් කළොත් මාත් එක්ක අමනාප වෙයි කියා. ඒ මොකද කිව්වොත් පානදුරේ මැතිවරණ කොට්ඨාශයට එතුමා එන බව දැනගත්තාම හැම පාසලකම අය කියන්නේ "අපේ නත්තල් සීයා අපට තෑගි මල්ලක් අරගෙන එනවා" කියායි. එතුමා අපේ පාසල්වලට ආ හැම අවස්ථාවක ඒවායේ අඩුපාඩුකම් සම්පූර්ණ කළා පමණක් නොව තෑගි මල්ලකුත් දීලයි ගියේ කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ විධියට සේවය කිරීම සඳහා සැදී - පැහැදී, ඇප - කැප වී සිටින ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමාටත්, ගරු අධ්‍යාපන සේවා අමාත්‍යතුමාටත් අපි ප්‍රශංසා කරන්න ඕනෑ. අපේ ප්‍රදේශයේ තිබෙන පාසල්වල අත්‍යවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා මන්ත්‍රීවරුන් වශයෙන් අප ඉල්ලීම් කළ සෑම අවස්ථාවකම අපට ඒවා ලැබුණු බවත් මතක් කරන්න කැමැතියි. ඒ නිසා එතුමන්ලා ඒ ආකාරයෙන් කරන මෙහෙවර පුන - පුනා සන්තෝෂයෙන් මතක් කිරීම මන්ත්‍රීවරුන් වශයෙන් අපේ යුතුකමක්.

ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ අතුරින් වර්ග ප්‍රමාණයෙන් ඉතාම කුඩා කොට්ඨාශය මගේ මැතිවරණ කොට්ඨාශය බව පෙන්වා දෙන්න කැමැතියි. නමුත් ජනගහණයෙන් ඉතා විශාලම මැතිවරණ කොට්ඨාශයත් පානදුරයයි. වැඩිම ඡන්දදායකයන් පිරිසක් ඉන්නේත් අපේ මැතිවරණ කොට්ඨාශයේයි. ඒ වාගේම පාසල් යන ශිෂ්‍ය - ශිෂ්‍යාවනුත් වැඩිම පිරිසක් ඉන්නේත් අපේ මැතිවරණ කොට්ඨාශයේයි. අපේ කොට්ඨාශයේ පාසල් 52 ක් පමණ තිබෙනවා. ඒ වාගේම පාසල් යන ශිෂ්‍ය - ශිෂ්‍යාවන් 29,000 කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. සෑම වර්ෂයක් පාසාම විමධ්‍යගත අයවැයෙන් වැඩිම මුදලක් වෙන් කෙරෙන්නේත් අධ්‍යාපනය සඳහායි. ඒ විධියට ඒ සඳහා පසුගිය වර්ෂයේදී මම රුපියල් ලක්ෂ 19 ක් වෙන් කළා.

මේ අවස්ථාවේදී ගොඩනැගිලි අධ්‍යක්ෂ අබේසිංහ මහත්මයා ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා එතුමා විශේෂ උනන්දුවක් දක්වා කටයුතු කරනවා. ඒ වාගේම ඒ ගොඩනැගිලි වැඩ කිරීම සඳහා කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාත් අපට විශේෂ ආධාර - උපකාර කරනවා. ඒ වැඩ පිළිවෙළ දියත් කොට හොඳ අධීක්ෂණයකින් යුතුව ඒ මුදල් වියදම් කිරීමට කටයුතු යොදා තිබෙනවා.

ඒ වාගේම දැන් රු. 1,50,000 දක්වා ගොඩනැගිලි වැඩ කිරීමට ග්‍රාමෝදය මණ්ඩලවලට අවසරය, අවස්ථාව ලබා දී තිබෙන බවත් මතක් කරන්න ඕනෑ. මා කියනවා සමහර අවස්ථාවලදී ඒ ප්‍රමාණය ටිකක් වැඩි කළොත් හොඳයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. මගේ මැතිවරණ කොට්ඨාශයේ ග්‍රාමෝදය මණ්ඩලවලින් විශාල මෙහෙයක් කර තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රමාණය ටිකක් වැඩි කලොත් අපේ නව ගොඩනැගිලි සෑදීම වැනි කර්තව්‍යයත්, භාරදූර වැඩකටයුතු, විශ්වාසයක් ඇතිව ඒ මණ්ඩලවලට භාරදී ඉක්මනින් අවසන් කර ගන්න පුළුවන් වෙනවා. සමහර අවස්ථාවලදී නිලධාරී මහත්වරුන්ගේ යම් යම් අඩුපාඩුකම් සිදුවෙන්න පුළුවන්. නමුත් මගේ කොට්ඨාශයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් නම් ඒ නිලධාරී මහත්වරුන්ගෙන් විශාල මෙහෙයක් සිදු කරගන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. අපට එවැනි සේවයක් කර ගන්නට පුළුවන් වී තිබෙන්නේ අපේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, ඒ වගේම අධ්‍යාපන සේවා ඇමතිතුමාත් මේ කටයුතු පිළිබඳව විශාල අධීක්ෂණයකින්, අවබෝධයකින් කටයුතු කරන නිසා බව මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා යටතේ සිදු කෙරෙන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අද පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළත් විශාල බලාපොරොත්තුවක් හැඟීමක් තිබෙනවා. ඒ වගේම අධ්‍යාපන සේවා ඇමතිතුමා යටතේ කෙරෙන වැඩපිළිවෙළ සම්බන්ධයෙනුත් ලොකු විශ්වාසයකින් යුතුව සියලු දෙනාම කටයුතු කරන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අදත් මම මේ සභා ගර්භයට පැමිණියේ පානදුරේ ශ්‍රී සුමංගල මහා විද්‍යාලයේ උත්සවයකට සහභාගී වීමෙන් පසුවයි. ඒ වගේම මේ අවස්ථාවෙදී මා මතක් කරන්න ඕනෑ, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කර ගන්න, අපේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙන්න මහපොළ ශිෂ්‍යත්ව වැඩපිළිවෙළ තුළින් විශාල සේවයක් සිදු වෙන බව. දෙමව්පියන්ගේ පාසල් සංවර්ධන සමිති අද ඉතා උනන්දුවෙන් කටයුතු කරනවා. පානදුරේ දනපති මහත්මයෙකු විසින් අද ශිෂ්‍යත්ව අරමුදලක් සඳහා රු. 30,000ක් පරිත්‍යාග කළා. එක් කෙනෙකුට රුපියල් පන් සියය බැගින් ශිෂ්‍යයන් කීප දෙනෙකු අතරේ එම මුදල බෙදා දෙන්නට බලාපොරොත්තු වෙනවා. ජනතාව අද ඒ විධියට උදව් කරන්න ලැස්ති වී සිටින්නෙ අද ගෙන යන අධ්‍යාපන වැඩපිළිවෙළ යටතේ අධ්‍යාපනයේ යම්කිසි දියුණුවක් ඇතිවේවිය කියන විශ්වාසය, බලාපොරොත්තුව නිසා බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වගේම මගේ මැතිවරණ කොට්ඨාශයේ අධ්‍යාපන කටයුතු අධීක්ෂණය කරමින් විශාල බලාපොරොත්තුවකින් යුතුව මම ඉදිරියට ගෙන යන විට ප්‍රදේශයේ සිටින ජනතාව ලක්ෂ ගණනින් ආධාර කරන්න ඉදිරිපත් වෙනවා. මම මතක් කරන්න කැමතියි, එක් මුස්ලිම් මහත්මයෙක් රුපියල් දෙලක්ෂ පනස් දහසක් පමණ වැය කර දුන් විද්‍යාගාරයක් තනාගෙන යනවා. එය විවෘත කිරීමට එන්නය කියා මම ළඟදීම ගරු ඇමතිවරුන්ට ආරාධනා කරන්න බලාපොරොත්තු වෙනවා. අද අපේ රටේ අධ්‍යාපනයේ යම් දියුණුවක් තිබෙන නිසා රටේ ජනතාවත් අපට උදව් උපකාර කරනවාය කියන එක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මම හිතන්නෙ නැහැ, මම දීර්ඝව කථා කළයුතුයි කියා. විශේෂයෙන්ම මම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, අධ්‍යපන සේවා ඇමතිතුමාටත් ස්තුති කරන්න ඕනෑ. ඒ අතරම මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල ලැබූ කෙනෙක් හැටියට, නිදහස් අධ්‍යාපනයේ ගුණ කියන්නට හැදී පැහැදී සිටින පුද්ගලයෙක් හැටියට සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. දුප්පත් දෙමව්පියන්ගේ දරුවෙකු වන මට මේ රටේ තිබෙන ශ්‍රේෂ්ඨම ස්ථානයට එන්න පුළුවන් වුණේ නිදහස් අධ්‍යාපන ක්‍රමය නිසා බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අපේ ඉතිහාසය දෙස බැලුවොත් පැහැදිලිව පෙනෙනවා, එක්සත් ජාතික පක්ෂයත් එක්සත් ජාතික පක්ෂ රජයත් නිතරම රටේ අනාගත පරම්පරාව කෙරෙහි බලාපොරොත්තු තබාගෙන රටේ නිදහස් අධ්‍යාපනය දියුණු කරන්නට උත්සාහ කර තිබෙන බව. දිවංගත මහාමාත්‍ය ඩී. එස්. සේනානායක අගමැතිතුමා යටතේ ඒ වගේම නිදහස් අධ්‍යාපනයේ පියා වශයෙන් හැඳින්විය හැකි සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ වැඩපිළිවෙළ යටතේ ඉදිරියට ආ අධ්‍යාපන ක්‍රමය සර්වප්‍රකාරයෙන්ම, සර්ව සාධාරණව බෙදී යන්නට කටයුතු කළ යුතු බව අපේ ගරු ජනාධිපතිතුමා කල්පනා කළා. මේ රටේ අධ්‍යාපනය ලබන සෑම දරුවෙකුටම නොමිලේ පොත්පත් බෙදා දෙන්නට එතුමා තීරණය කලේ ඒ නිසයි. අද දුප්පත් පංතියේ හැම දරුවෙක්ම, පොහොසත් පංතියේ හැම දරුවෙක්ම එයින් නියම ඵල ප්‍රයෝජන ලබන බව මතක් කරන්න ඕනෑ.

මගේ මැතිවරණ කොට්ඨාශයේ 1979 දී පමණ ආරම්භ කළ අගමැති බාලිකා විද්‍යාලය ගැන සඳහන් කරන්න කැමතියි. මේ අවුරුද්දේ පැවති පස්වන පංතියේ ශිෂ්‍යත්ව විභාගයෙන් වැඩිම සංඛ්‍යාවක් සමත් කරවීමෙන් මුළු දිස්ත්‍රික්කයේම පළමුවැනි ස්ථානය අද ඒ පාසල හිමි කරගෙන තිබෙන බව මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් සඳහන් කරන්න කැමතියි. එය මට ලොකු ගෞරවයක් නම්බුවක් බව මේ සභාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. අපි විශාල අධීක්ෂණයකින් කටයුතු කරන නිසයි අපේ දරුවන් ඉගෙන ගන්නෙ. ඒ දරුවන් 'ටියුෂන්' පංතිවලට ගොස් ඉගෙන ගන්නවා නොවෙයි. ඉතාමත් හොඳ ගුරුවරුන් සංඛ්‍යාවක් අපට ඉන්න බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ ගුරුවරුන්ගේ මැදිහත් වීම නිසා ඒ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාගන්න පුළුවන්. ඒ වගේම කළුතර දිස්ත්‍රික්කයේ මගේ මැතිවරණ කොට්ඨාශයේ අධ්‍යාපන මණ්ඩලයෙන් තමයි වැඩිම පිරිසක් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී සිටින්නෙ. ඒ වගේම විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබුවේ කළුතර දිස්ත්‍රික්කයෙන්ම 12 දෙනෙක් පමණයි. එයින් පස් දෙනෙක්ම පානදුරේ ශ්‍රී සුමංගල මහා විද්‍යාලයේ ඉගෙන ගත් අය බව මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා නව නැම්මකින්, හොඳ වැඩපිළිවෙළක් යටතේ අපේ මේ කටයුතු දියත් කර තිබෙනවා කියා මම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා අපේ ගරු ඇමතිවරුන්ට මේ වැඩපිළිවෙළ තව තවත් ඉදිරියට ගෙන යන්නට ධෛර්ය්‍ය හා ශක්තිය ලැබේවාය කියා අපි ඒ අයට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන්න ඕනෑ.

නමුත් විපක්ෂයේ සමහර උදවිය කල්පනා කරන්නෙ එහෙම නොවෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් තමන්ගෙන් කෙරෙන්න ඕනෑ කටයුතු අතපසු කර දමා දරුවන් වෙනුවෙන් පාසල් වෙනුවෙන් කළ යුතු දේ අතපසු කර දමා, කොළඹට වී ඉඳගෙන යම්කිසි තැනක කඩා වැටුණ වැසිකිළියක් ගැන කථා කරනවා. අඩු වශයෙන් පාසල් සිසුන්ට වැසිකිළියක්වත් හදල නොදුන්න කාලයක් තමයි, 1970 - 77 කාලය. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොමඟ යන තත්ත්වයක් එද ඇති වී තිබුණා. ඒවා සියල්ලම යථා තත්ත්වයට පත් කර එතුමන්ලා ගෙන යන මේ වැඩ පිළිවෙළ තවත් හොඳින් කරගෙන යෑමට එතුමන්ලාට අපේ සෑම සහයෝගයක්ම දෙනවා. එතුමන්ලා අපට මෙතෙක් දුන් සහයෝගය වඩ වඩාත් අපට දෙන්න කියා ඉල්ලා සිටිමින් එතුමන්ලා ගන්නා ක්‍රියා මාර්ගයට දේවාශීර්වාද ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ජිනදාස වීරසිංහ මහතා**

**(திரு. ஜினதாச வீரசிங்ஹ)**

**(Mr. Jinadasa Weerasinghe)**

අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ වේලාවේදී දෙපාර්ශවයෙන්ම පැසසුම් ලැබුණු අතර අඩුපාඩුකම්ද ඉදිරිපත් වුණා. මම ඒ සම්බන්ධයෙන් දීර්ඝ ප්‍රශංසාවක් දෙන්නට හෝ එය හුවා දක්වන්නට හෝ නොවෙයි බලාපොරොත්තු වන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශය ගන්නා උත්සාහය අතරමග නතර නොවී තවත් ඉදිරියට ගෙන යෑම සඳහා දැනට ක්‍රියාත්මක කරන ආකල්පවලට විකල්පයක් යෝජනා කරන්නයි මම අදහසක් කරන්නේ.

මම ඉස්සෙල්ලාම අධ්‍යාපන සේවා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ පාසල්වල විශාල අඩුවක්ව තිබුණු පාසල් උපකරණ ඒවාට ලබා දීම පිළිබඳව. නමුත් ඇමතිතුමනි, අප එයින් සෑහීමට පත් වන්නේ නැහැ. දවසින් දවස වර්ෂයෙන් වර්ෂය අධ්‍යාපනය සඳහා පාසල්වලට ඇතුළත් වන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ගණන වැඩි වන විට උපකරණවල තවත් ලොකු හිඟයක් ඉදිරියටත් බලපාන්න පුළුවන්. ඒ නිසා ඒ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ පරිහරණයට අවශ්‍ය උපකරණ කොහොමහරි ලබා දීම සඳහා තමුන්නාන්සේ අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර හෝ තව මුදල් ටිකක් ලබා ගන්නා ලෙස මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මේ පාර්ලිමේන්තුවේදී මම මීට කලින් ඉදිරිපත් කළ කරුණක් අධ්‍යාපන ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. හිටපු අධ්‍යාපන ඇමති නව අධිකරණ ඇමතිතුමාත් මේ සභාවේ සිටිනවා. පාසල් ගොඩනැගිලි ඉදි කිරීමේදී ඇති වන පමා වළක්වන්න ඒවා අප කැමති කොන්ත්‍රාත් කරුවන් ලවා කලට වේලාවට ඉදිකරවා ගැනීම සඳහා මම එද යෝජනාවක් ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කලින් අනුගමනය කළ ප්‍රතිපත්තිය වෙනස් කර මේ වැඩ ලගින තත්ත්වයෙන් ගොඩ අරගෙන ගොඩනැගිලි ඉක්මන් කර හද පාසල් ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනයට ගැනීමට පුළුවන් වන අන්දමට එද තිබුණු චක්‍රලේඛනය වෙනස් කරන ලෙස මම ඉල්ලීමක් කළා. මේ ගොඩනැගිලි ඉදිකරවා ගැනීම සඳහා දක්ෂ කොන්ත්‍රාත්කරුවන් සිටිනවා නම් චක්‍රලේඛනය මම හෙටම වෙනස් කරනවාය කියා අධ්‍යාපන ඇමතිතුමා එද මේ පාර්ලිමේන්තුවේදී ප්‍රතිඥාවක් දුන්නා. මම ඒ ගැන අධ්‍යාපන ඇමතිතුමාට ස්තුති වන්න වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ජිනදාස වීරසිංහ මහතා ]

ඒ අනුව අපට වෙන් කරන විමධ්‍යගත අයවැයේ මුදලුත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන මුදලුත් යොද දෙසැම්බර් මාසය අවසාන වන්නට කලින් නව පාසල් වාරය ආරම්භ කරන විට අළුතෙන් ඇතුළු වන ශිෂ්‍යයන්ට ඉඩකඩ සැලසීමත් ඒ වන විටද අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට වැඩි ඉඩකඩ සැලසීමත් සඳහා ගොඩනැගිලි සකස් කරන්න අපට පුළුවන් වුණා. ඒ චක්‍රලේඛනය යළිත් වෙනස් කිරීමෙන් පසු දැන් අපේ දෙපාර්තමේන්තුවේම අධ්‍යාපන කාර්යාලයේ ගොඩනැගිලි පරීක්ෂකවරුන් කූටොපක්‍රමයෙන් ව්‍යාජ නම්වලින් ඒ ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගන්නවා. එසේ නැත්නම් නියම කොන්ත්‍රාත්කරුවකු මේ කොන්ත්‍රාත් ගත්තොත් ඔවුන් පසුපස ගිහින් සියයට පහක් නැත්නම් දහයක් දෙන්න පොරොන්දු වී දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරීක්ෂකවරුන් වෙනත් පුද්ගලයින්ගේ නමින් මේවා ලබා ගන්නවා. මෙය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වරදක් නොවෙයි. මේ අය ප්‍රාදේශීය අධ්‍යක්ෂකගේ ඇඟටත් වැලි ගහනවා. මම මේ චෝදනාව එල්ල කරන්නේ අසාර්ථක ඉදිකිරීම් කීපයක් කර තිබුණු බව මගේ ඇහින් දැක්ක නිසායි.

ගොඩනැගිලි ඉදි කරන්නේත් මේ ගොල්ල. තත්ත්ව පරීක්ෂණ වාර්තාව දෙන්නේත් මේ ගොල්ල. ගෙවීම් වාර්තා අනුමත කරන්නෙත් මේ ගොල්ල. අවසාන ගෙවීම් සඳහා රඳවාගෙන තිබෙන මුදල් නිදහස් කිරීමට නිර්දේශ කරන්නෙත් මේ ගොල්ල. මගේ ආසනයේ ඉස්කෝල දෙකක ඒ විධියට දුර්වල ඉදිකිරීම් කර තිබුණා. පළමුවැනි පන්තියේ ලී නොවෙයි ඒවාට පාවිච්චි කර තිබුණේ. තුන් වන පන්තියෙ ලීවලට කළුතෙල් හෝ සොලිග්‍රම් ගා යොද තිබුණා. ඉදි කිරීම් නිම කළාට පස්සේ අවසාන ගෙවීමත් ලබා ගෙන තිබුණා. ඊට මාසයකට පමණ පස්සේ මම ගිහින් බලන විට, යට ලී වක්කවලච්චි වී ගිහින් තිබුණා. ලී, ගුළුකුඩු හැලිලා, කුරුම්ණියෝ කාලා. ලීවල සිටි කුරුම්ණියෝ ළමයින්ට ඇණලා. රෝහලටත් ගෙන යන්නට සිද්ධ වී තිබුණා. එම නිසා මේ වැඩ පිළිවෙළ අසාර්ථක බව පෙනෙන්නට තිබෙනවා. එම නිසා අමාත්‍යාංශයේ ලිහිල් ප්‍රතිපත්තිය නිසා අයුතු ප්‍රයෝජන ගන්නට ඇති ඉඩකඩ වළක්වන්නටය කියා විකල්පයක් හැටියට ගරු ඇමතිතුමාට මම යෝජනා කරනවා. මන්ද ? අපි ක්‍රියාත්මක කළ වැඩවලින් සාර්ථක ප්‍රයෝජන ලබා ගත්තා. ඒ අත්දැකීම්වලින් තුළින් ලත් අවබෝධයෙනුයි මෙම යෝජනාව මම ඉදිරිපත් කරන්නේ. ඒ ගැන අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මේ අතර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් නැගූ චෝදනාවලට ප්‍රති උත්තර දෙන්නට ගියොත්, අපේ ගරු සභාපතිතුමා මගේ කථාව නතර කරන්නට කියාවි.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
දැන් වෙලාව 12 යි. කථාව අවසන් කරන්නට වෙලාව හරි.

**ජිනදාස වීරසිංහ මහතා**
**(திரு. ஜினதாச வீரசிங்ஹ)**
**(Mr. Jinadasa Weerasinghe)**
එහෙම නම් සභාව අත්සිටුවමෙන් පස්සේ නැවත රැස් වුණාම මගේ කථාව තවදුරටත් කර ගෙන යන්නට මට අවස්ථාව ලබා දෙනවාද ?

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
දැන් අවසන් කරන්න වඩා හොඳයි.

**ජිනදාස වීරසිංහ මහතා**
**(திரு. ஜினதாச வீரசிங்ஹ)**
**(Mr. Jinadasa Weerasinghe)**
එහෙම නම් මම වැඩිදුර කථා කර ගෙන යන්නේ නැහැ.

එදට වඩා වැඩි ප්‍රගතියක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අද දකින්නට පුළුවන් බව මතක් කරන අතරම මෙහිදී අපේ ඇමතිතුමන් දෙපළට මම එක් යෝජනාවක් කරන්නට කැමතියි. දැනට අධ්‍යාපන සේවා අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් යම් යම් කටයුතු සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලවලට මුදල් නිදහස් කරනවා. ඒ අය ඉදිරිපත් කරන සැළැස්මට නැතිනම් ඇස්තමේන්තුවලට අනුමත කරන මුදල් අධ්‍යාපන කාර්යාලවලට නිකුත් කරන්නේ නැතුව කෙළින්ම දිසාපතිවරයාට නිකුත් කරන්නට පුළුවන් නම්, ඒ මුදල් වියදම් කරන ආකාරය ගැන නියම අවදියෙන් සිට, එයින් අන්තිම ශතය දක්වාම අමාත්‍යාංශය බලාපොරොත්තුවන උපරිම ප්‍රයෝජනය ලබා දෙන්නට යොදවන්නට ක්‍රියා කරන බව මතක් කරමින්, අපේ රටේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් ඔබතුමන්ලා කරන කටයුතු හේතු කොට ගෙන උගත්, එමෙන්ම සමාජයට වැඩ දයක දරු පරපුරක් බිහි වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
The sitting is suspended till 1.00 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 1ට නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு பி. ப. 1 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
**(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)**
**(Mr. Sarath Muttetuwegama – Kalawana)**
ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ මම වැඩි වේලාවක් කථා කිරීමට අදහස් කරන්නේ නැහැ. මට හුඟක් දුරට සඳහන් කරන්නට තිබෙන කරුණු පොදුවේ ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් ප්‍රකාශ වෙනවා ඇති. පළමුවෙන්ම අවුරුදු කීපයක සිට මා ඉදිරිපත් කරන ප්‍රශ්නයකට නැවත වරක් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මම සඳහන් කරන මේ පිරිස මේ ඇමතිතුමා, වැඩ වර්ජකයින් හැටියට හඳුන්වනවාද නැතිනම් සේවයට නොපැමිණි අය හැටියට හඳුන්වනවාද කියන්න මම දන්නේ නැහැ. නමුත් රත්නපුර දිස්ත්‍රික්කයේ සේවය කළ, 1980 දී සේවයට නොපැමිණි අය හැටියට සලකා රැකියා අහිමි කළ මේ උදවියට — එයින් එක් අයෙකුට හැරෙන්නට — නැවත රැකියා ලබා දී නැහැ. නැවත රැකියාව ලැබී ඇති එකම පුද්ගලයා රත්නපුර දිස්ත්‍රික්කයේ පදිංචිකරුවකු වුණත් ඔහු රත්නපුර දිස්ත්‍රික්කයේ පාඨශාලාවක සේවය කළ පුද්ගලයකු නොවෙයි. දැන් මේ ප්‍රශ්නය අනිකුත් පළාත්වල නම්, බොහෝ දුරට නිරාකරණය වී තිබෙනවා. මම දන්නා හැටියට පසුගිය අවුරුද්දේදී මේ පිරිස ආපසු රැකියාවලට ගන්නට ඇමතිතුමා සූදානම් වුණා. නමුත් මොකක් හෝ හේතුවක් නිසා ගැනීම ප්‍රමාද වුණා. මා දන්නා හැටියට, රත්නපුර දිස්ත්‍රික්කයේ — සෑහෙන පිරිසක් සිටින්නේ රත්නපුර දිස්ත්‍රික්කයේයි — හා කළුතර දිස්ත්‍රික්කයේ ටික දෙනෙකුත් පමණයි ඉතිරි වී සිටින්නේ. එමනිසා සේවයට නොපැමිණියා යයි සලකන මේ වැඩ වර්ජකයින් ආපසු සේවයට කැඳවන ලෙස මා ඉතා ඕනෑකමින් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවත් පොදු කාරණයක් පිළිබඳව ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මේ ප්‍රශ්නයට අදාළ කොළඹ තිබෙන පාඨශාලාවල නම් සඳහන් කරන්නට මා අදහස් කරන්නේ නැහැ. නමුත් වුවමනා නම් පසුව කියන්නම්. විභාග මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන යන කොළඹ තිබෙන ප්‍රධාන පෙළේ පාඨශාලා කීපයක විභාගවලට පෙනී සිටි එම ප්‍රදේශයේම පදිංචි අවුරුදු දහ හතක් දහ අටක් වයසැති ළමයින්, — පසුගිය අවුරුද්දක - දෙකක පමණ කාලය තුළදී, එම විභාග මධ්‍යස්ථානවලට පැමිණෙන සමහර ඉන්විජිලේටර්ස් ලා — ඒ ප්‍රදේශයේම පදිංචි උදවියද කියන්න මම දන්නේ නැහැ — භය ගන්වා ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියන විට කොපි කරන සිරිතක් පවත්වාගෙන යනවා. මේ දෙය බරපතළ ලෙස සිදු වන බව කීප දෙනෙකුගෙන්ම අසන්නට ලැබී තිබෙනවා. මම හිතන විධියට බොහොම නරක තත්ත්වයකුයි ඇතිවෙන්න යන්නේ. එක්කෝ ඔක්කොම කොපි කරන ළමයින් සිටින නිසා, එහෙම නැත්නම් භය වුණු ඉන්විජිලේටර්ස්ලා සිටින නිසා කාගෙන්වත් පැමිණිල්ලක් එන්නේ නැහැ. එමනිසා අපොස උසස් පෙළ විභාගය පැවැත්වෙන අවස්ථාවලදී කොළඹ යම් යම් පාඨශාලාවල තිබෙන විභාග මධ්‍යස්ථානවලට විභාග දෙපාර්තමේන්තුවේ හදිසි පරීක්ෂක කණ්ඩායම් පැමිණෙනවා නම් මේ ප්‍රශ්නයට හුඟක් දුරට මුහුණ දෙන්නට පුළුවන්කමක් ඇති වෙනවාය කියා මම හිතනවා. Striking force එකක් වගේ කණ්ඩායමක්, ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව සෝදිසි කිරීමේ කණ්ඩායමක් එනවා නම් මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා එය ප්‍රයෝජනවත් වෙයි කියා මම කල්පනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තව කාරණා දෙකක් පමණයි මට මතු කරන්නට තිබෙන්නේ. කළුතර, හිට්ටඹුව, මීරිගම, බණ්ඩාරවෙල, පත්තලගෙදර යනාදී ගුරු විද්‍යාලවල අලුතෙන් ආරම්භ කර තිබෙන තුන් අවුරුදු ගුරු පුහුණු පාඨමාලාවල පුහුණුව ලබන ගුරුවරුන්ට රුපියල් 600ක මුදලක් ගෙවනවා. එයින් රුපියල් 500ක් ආහාර සඳහා අඩු කර ගන්නවා. තවත් රු. 20ක් විදුලි බිල් වගේ වෙනත් පහසුකම් සඳහා අඩුකර ගන්නවා. මම හිතන විධියට ආහාර සඳහා රුපියල් 500ක මුදලක් අය කර ගැනීම ඉතාමත්ම වැඩියි. මොකද ? රජයෙන්ම ගණන් බලා තිබෙන පිළිවෙළ අනුව දනට රුපියල් 300කට වැඩි ආදායමක් පවුලේ එක් අයෙක් හෝ ලබනවා නම් ඒ පවුලේ සියලු දෙනාටම ආහාර මුද්දර ලැබෙන්නේ නැහැ. දැන් එය වැඩි කරන්නට යන්නෙත් රුපියල් 700 දක්වායි. ඒ අනුව සාමාජිකයන් හය දෙනෙක් හෝ හත් දෙනෙක් සිටින පවුලක වුණත් එක් අයෙකුට රුපියල් 700ක හෝ ඊට වැඩි ආදායමක් ලැබෙනවා නම් යෝජිත ක්‍රමය යටතේ ඒ අයටත් ආහාර මුද්දර ලැබෙන්නේ නැහැ. ඒ නිසා රුපියල් 500 කියන එක එතරම් ලොකු ගණනක් නොවූවත් ප්‍රතිපත්තිමය වශයෙන් ඒ වාගේ ගණනක් ආහාරවලට අය කිරීම වැඩියි කියන එකයි මම කල්පනා කරන්නේ.

ඒ වාගේම තව එක් කරුණක් පිළිබඳව සඳහන් කරන්නට කැමතියි. " පාසල් සඳහා ක්‍රීඩා තරඟ " යන කාරණය සම්බන්ධයෙන් 1984 පෙබරවාරි 10 වැනි ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා අංක 2/ක්‍රීවිබා/14 දරන චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මේ චක්‍රලේඛයේ " පොදු නීතිරීති " යටතේ 12 වන කාරණය හැටියට මෙසේ සඳහන් වෙනවා :

" 12. ක්‍රීඩා පාලක මණ්ඩල හෝ පිළිගත් ක්‍රීඩා සංගම් මඟින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා තරගවලට සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහභාගි විය නොහැක. "

මේ විධියේ නීතියක්, රෙගුලාසියක් දෙපාර්තමේන්තුවෙන් පනවා තිබෙන්නේ මොන හේතුවක් නිසාද කියන්නට මම දන්නේ නැහැ. මම හිතන විධියට මෙය පොදුවේ සියලුම ක්‍රීඩා සංගම්වලට ක්‍රියාත්මක කරන එක වැරදියි. මොකද ? කොළඹ සහ අනිකුත් ප්‍රධාන නගර ආශ්‍රිතව සිටින ළමයින්ට තමන්ගේ ක්‍රීඩා කෞශල්‍යතාවයන් දියුණු කර ගැනීම සඳහා ඒ සංගම්වලින් ගන්නට පුළුවන් සියලුම පහසුකම් ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. උදාහරණයක් හැටියට ජනප්‍රිය ක්‍රීඩාවක් වන ක්‍රිකට් ක්‍රීඩාව ගත්තොත් ක්‍රිකට් ක්‍රීඩාව පුහුණු කරන කුඩා අභ්‍යාස මධ්‍යස්ථාන දැන් කොළඹ පිහිටුවා තිබෙනවා. ඒවාට මුදල් ගෙවා තමන්ගේ දරුවන්ට ඒ ක්‍රීඩා පුහුණු කිරීමේ අවස්ථාව දෙමවුපියන්ට ලැබී තිබෙනවා. මලල ක්‍රීඩා සහ වෙනත් ක්‍රීඩා සම්බන්ධයෙනුත් ඒ විධියට පහසුකම් තිබෙනවා. නමුත් පිටස්තර පළාත්වල උදවියට සංගමයකට බැඳී පුහුණුවක් ලබා ගන්නවා හැරෙන්නට ක්‍රීඩා පිළිබඳව පුහුණුවක් ලබා ගැනීමට වෙන කිසිම ක්‍රමයක් නැහැ. ඒ නිසා මේ ගැන නැවත සලකා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම නැවතත් ඉල්ලා සිටිනවා. මෙම අමාත්‍යාංශය යටතේ මම මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තව කරුණු කීපයක් මතක් කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

**අමරාවතී පියසීලි රත්නායක මහත්මිය** (වාරියපොල)

(திருமதி அமராவதி பியசீலி ரத்நாயக்க — வாரியப்பொல)

**(Mrs. Amarawathie Piyaseeli Ratnayake – Wariyapola)**

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා පළමුකොටම ගරු ඇමතිතුමාට මගේ ප්‍රශංසාව හිමි කරන්න කැමතියි, විශේෂයෙන්ම අධ්‍යාපනයේ අනාගතය ගැන කල්පනා කර, රටේ අනාගතය ගැන කල්පනා කර අධ්‍යාපනය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා පසුගිය කාලසීමාව තුළදී ඉතාම අවංකවත් කාර්යක්ෂමවත් ගන්නා ලද වැඩපිළිවෙළවල් සම්බන්ධයෙන්. එවැනි තීරණ ගැනීම නිසා ඉදිරියේදී අපේ රටේ අධ්‍යාපන තත්ත්වය උසස් වෙනවාට කිසිම සැකයක් නැහැ කියා අපට සඳහන් කරන්න පුළුවන්.

මා මේ අවස්ථාවේදී යෝජනාවල් කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ගැන මා සඳහන් කරන්න කැමතියි. පස්වැනි ශ්‍රේණියේදී පවත්වන ශිෂ්‍යත්ව විභාගයෙන්, එහෙම නැත්නම් කුමන හෝ ශිෂ්‍යත්ව විභාගයක් පැවැත්වීමෙන් විශේෂයෙන් බලාපොරොත්තු වෙන පරමාර්ථ දෙකක් තිබෙනවා. එකක් ආදායම අඩු ගම්බද ප්‍රදේශවල වාසය කරන බුද්ධිමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රජයේ ආධාර ලබා ගැනීමට මාර්ගය සැලැස්වීම. අනික උසස් යයි සම්මත පහසුකම් වැඩි පාඨශාලාවලට අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඇතුළත්වීමට අවස්ථාව ලබා දීම. ආදායම් තිබෙන, ගම්බද ප්‍රදේශවල පහසුකම් නැති විද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් විද්‍යාලවලට ඇතුළත්වීමට අවස්ථාව ලබාදීම. එවැනි පහසුකම් ලබාදීම සඳහා පවත්වන ශිෂ්‍යත්ව විභාගයට, සමස්ත ලංකාවේම එක්තරා වයස් ප්‍රමාණයක් තුළ, එකම ශ්‍රේණියක ඉගෙනුම ලබන සියළුම සිසුන් සංඛ්‍යාව ඇතුළත් කරන බව අපට පෙනෙනවා. එහිදී, පහසුකම් තිබෙන, නගරබද විද්‍යාලවල ඉගෙන ගන්නා බුද්ධිමත් ශිෂ්‍යයනුත් මේ විභාගයට වාඩිවීම නිසා ඇතැම්විට පහසුකම් අඩු ගම්බද විද්‍යාලවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙය තරග විභාගයක් වන නිසා ශිෂ්‍යත්වලාභීන් තේරීමේදී ගම්බද සිසුන්ට යම්කිසි පාඩුවක් සිදු වෙනවා. ඒ වාගේම මෙයින් නගරබද උසස් විද්‍යාලවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වාසියක් සිදුවෙන්නෙත් නැහැ. ඒ නිසා මා යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, ගම්බද විද්‍යාලවල ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත්, පහසුකම් ඇති විද්‍යාලවල ආදායම අඩු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පමණක් මේ විභාගයට ඉදිරිපත් වෙන්නට අවස්ථාව සලස්වන්නය කියා. එසේ කළොත් මීට වැඩි පිරිසකට පහසුකම් සැලසෙන නිසා අපේ අදහස මුදුන්පත් කර ගැනීමට හැකියාව ලැබෙනවා.

මා ගුරුපත්වීම් දීම සම්බන්ධයෙනුත් යෝජනාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. එය ගුරුපත්වීම් දීමේ වයස් ප්‍රමාණය සම්බන්ධයෙනුයි. මා කියන්න යන මේ කරුණු හුඟක් දුරට පුවත්පත්වල සඳහන් වුණා. එසේ පුවත්පත්වල සඳහන් වුණේ රැකියාවල් බලාපොරොත්තුවෙන් ඉන්න වැඩි දෙනෙකුට අවස්ථාව නොලැබුණ නිසා වෙන්නට ඕනෑ. මා කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ, ගුරුපත්වීම් ලබා දීමේදී වයස් සීමාව අවුරුදු 28 දක්වා එසේ නැත්නම් අවුරුදු 30 දක්වා වැඩි කළහොත් සමස්තයක් වශයෙන් අධ්‍යාපනයේ ප්‍රගතිය සඳහා ඇතිවන යහපත පිළිබඳවයි. අද විද්‍යාව සහ ගණිතය පුළුල් ආකාරයට හැදෑරූ අය ඉන්නේ අවුරුදු 28ට වැඩි උදවිය අතරයි. අපි දන්නවා, මෑත යුගයේ අධ්‍යාපන ක්‍රමය අනුව, එනම් අපොස සාමාන්‍ය පෙළ සිට නොවෙයි 8 වැනි ශ්‍රේණියේ සිට විද්‍යා විෂයන් වෙන් වෙන්ව හැදෑරූ අයගේ දැනුම එනම් රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව ආදී වශයෙන් විද්‍යා විෂයයන් වෙන් වෙන් වශයෙන් හැදෑරූ අයගේ දැනුම හුඟක් පුළුල් බව. අද ගුරුපත්වීම්වලට ඉදිරිපත් වෙන්නට හැකියාව ලැබෙන්නේ විද්‍යාව විෂයයන් වශයෙන් හදරා එයින් සමත් වූ අයට පමණයි. අර වගේ පුළුල් දැනීමක් ඇති අයට ඇත්තෙන්ම අවස්ථාවක් ලැබී නැහැ. අපොස උසස් පෙළ විද්‍යා පන්තිවලට උගන්වන ගුරු මහත්ම මහත්මීන්ගෙන් අපට දැනගන්නට ලැබී තිබෙනවා, වෙන් වෙන් වශයෙන් මේ විෂයයන් හැදෑරූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉගැන්වීමේ පහසුවක් තිබෙනවාය, ඒ අයට හොඳ දැනීමක් තිබෙනවාය කියා. අන්න ඒ නිසා වයස් සීමාව පිළිබඳව එවැනි තීරණයක් ගත්තොත් හොඳ යයි මම කල්පනා කරනවා.

ඒ සමගම ඉදිරියේදී අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විද්‍යා දැනීම හා ගණිතමය දැනීම දියුණු කිරීම සඳහා දැන් තිබෙනවාට වඩා වෙනස්ව 8 වැනි ශ්‍රේණියේ සිටවත් අර පැරණි ක්‍රමයට විද්‍යා විෂයයන් හා ගණිතමය විෂයයන් වෙන් වෙන් වශයෙන් හදරන්නට අවස්ථාව සලසා දුන්නොත් උසස් අධ්‍යාපනය ලබනවිට එය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශාල පහසුවක් වෙනවා ඇති. විෂයමාලා අංශයෙන් ඒ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළොත් ඉතා වැදගත්ය කියා මම ප්‍රකාශ කරනවා.

ඒ සමගම අපට පැහැදිලිව පෙනෙන තවත් කරුණක් තිබෙනවා. අද උසස් අධ්‍යාපනය ලබන අයගේ වුණත් සිංහල ලිවීම හා කියවීම පිළිබඳ දැනුම බොහෝ දුරට අඩු වී තිබෙනවා. අද ශිෂ්‍යාවන්ට සිංහල ලිවීම හා කියවීම ගැන දැනුම ඇති වන්නේ සිංහල භාෂාව කියන විෂයෙන් පමණයි. අපි හොඳින් දන්නවා සිංහල සාහිත්‍යය හැදෑරූ අය තුළ සිංහල පිළිබඳ අවබෝධය හුඟක් දුරට වැඩි වී තිබෙන බව. ඒ නිසා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂය මාලාවට සිංහල සාහිත්‍යයත් ඇතුළත් කළොත් මීට වඩා හොඳ සිංහල දැනුමක් අපේ පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලැබෙයි කියා මා විශ්වාස කරනවා. අන්න ඒ නිසා මා මෙම අවස්ථාවේදී ඒ යෝජනාවත් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගුරුවරුන්ගේ ශ්‍රේණි ලබාදීම සම්බන්ධයෙනුත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්නට කැමතියි. මා මේ කරන්නේ විවේචනයක් නොවෙයි. පසුගිය කාලසීමාව තුළදී ඒ අදාල විභාගවලින් සමත්වී සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වූ ඇතැම් අයට ඉතාමත් කෙටි කාලසීමාවක් තුළදී ශ්‍රේණි එකක් හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරාවතී පියසීලී රත්නායක මහත්මිය]

දෙකක් ලැබී තිබෙනවා. නමුත් දක්ෂ ලෙස වැඩකරන ඇතැම් අයට අවුරුදු 10කටත් වැඩි කාලයක් ගතවෙලත් එකම ශ්‍රේණියක්වත් නොලැබී තිබෙන තත්ත්වයක් උදාවී තිබෙනවා.

අ. භා. 1. 15

පොදුවේ මම ඒ කරුණු ටික පමණයි, ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ. ඒ සමගම අපේ වාරියපොල ආසනය සම්බන්ධවත් සඳහන් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලසීමාව තුළ විශේෂයෙන් අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ සහයෝගය මත අපට හැකියාව ලැබුණා, ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් ඉදිකර ගන්නට. එපමණක් නොවෙයි, ගොඩනැගිලි උපකරණ, විද්‍යා උපකරණ, පුස්තකාල උපකරණ ආදී පාසල්වලට අවශ්‍ය උපකරණ වැඩි සංඛ්‍යාවක් අපට ලැබගන්නට ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාගේ උපරිම සහයෝගය ලැබුණු බවද මම මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් සඳහන් කරන අතර, ඒ පිළිබඳව එතුමාට මගේ අවංක ස්තුතිය පුද කරනවා. ඒ සමගම මම සඳහන් කරන්නට කැමතියි අද ගම්බද ප්‍රදේශවල ගුරු හිඟයට විශේෂ හේතුවක් වී තිබෙන්නේ ගුරුවරුන්ට නවතින්නට ස්ථාන – ගුරු නිවාස – නැතිකමයි කියා. මේ ගෙනයන වැඩපිළිවෙළ අනුව – ගරු ඇමතිතුමාගේ සහයෝගය අනුව අපි සෑහෙන ගුරු නිවාස සංඛ්‍යාවක් ඉදිකර දී තිබෙනවා. නමුත් තවමත් අඩුපාඩු තිබෙන ස්ථාන තිබෙනවා – ගුරු නිවාස වැඩි සංඛ්‍යාවක් ඉදිකරන්නට එතුමාගේ අවධානය තවදුරටත් යොමු කලොත් ඉතාම ප්‍රයෝජනවත් බවත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාත් ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත් අදාළ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව අධ්‍යාපනයේ දියුණුව සඳහා, විශේෂයෙන් අපේ අනාගත පරපුරේ දියුණුව සඳහා, ගෙනයන මේ වැඩපිළිවෙළ ගැන අපේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

**එන්. ඒ. සෙනෙවිරත්න මහතා (කෑගල්ල දිසා ඇමතිතුමා)**
**(திரு. என். ஏ. செனெவிரத்ன — கேகாலை மாவட்ட அமைச்சர்)**
**(Mr. N. A. Seneviratne – District Minister, Kegalle)**

ගරු සභාපතිතුමනි, මා මුලින්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කිරීමට මටත් අවස්ථාව ලබාදීම ගැන. අධ්‍යාපන ක්ෂෙත්‍රය රටක ඉතා වැදගත් කොටසක්. මම හිතනවා, මේ ක්ෂෙත්‍රයේ පාලනය ගෙනයන ඇමතිතුමාට නොයෙක් ප්‍රශ්න පැන නඟිනවා කියා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කථා කරනවිට ඇමතිතුමා ප්‍රශංසාවට ලක් කලා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. බොහොම කලාතුරකින් තමයි අධ්‍යාපන ඇමතිවරයෙක් ප්‍රශංසාවට ලක් වන්නේ. තරුණයකු වන අධ්‍යාපන ඇමතිතුමා මේ ආකාරයෙන් ප්‍රශංසාවට ලක්වීම ගැන අපි සන්තෝෂ වෙනවා.

මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) සඳහන් කලා, මේ රජයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩි සේවයක් සිදු වී නැත, ගුරුවරුන්ටත් ප්‍රයෝජනයක් වූයේ නැත කියා. මම කියන්න කැමතියි, පසුගිය රජයෙන් ගුරුවරුන්ට කල දේවල් නම්, මේ රජයේ අධ්‍යාපන ඇමතිතුමා විසින් ගුරුවරයන්ට කළේ නැත කියා.

පසුගිය රජය කාලයේදී අගමැති යම්කිසි මැතිවරණ කොට්ඨාශයකට එන කොට ඒ ප්‍රදේශයේ සෑම පාසලකටම ලියුම් යැව්වා, ගුරුවරුන්ට සහ ළමයින්ට එන්නය කියා පෙළපාලි යන්න. නමුත් අපි ආඩම්බරයෙන් සඳහන් කරනවා, එක්සත් ජාතික පක්ෂ රජය පිහිටෙව්වාට පසුව ගුරුවරුන් සහ ළමයින් දේශපාලනමය පෙළපාලිවල ගෙන යෑම සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙන බව. කිසිම භයක්, චකිතයක් නැතිව එවැනි ශ්‍රේෂ්ඨ පියවරක් ගැනීම පිළිබඳව අපි ගරු අධ්‍යාපන ඇමතිතුමාට ස්තුති කරනවා.

ගුරුවරුන්ගේ ශ්‍රේණි ක්‍රමය පිළිබඳව වාරියපොළ ගරු මන්ත්‍රීතුමිය (අමරාවතී පියසීලී රත්නායක මහත්මිය) සඳහන් කලා. මට කියන්න පුළුවනි අද හුඟක් ගුරුවරුන් සේවයටම පමණක් කැපවී සිටියත්, ඔවුන්ගේ දැනීම වැඩිකර ගැනීමට බලාපොරොත්තු නොවන බව. ගුරු අභ්‍යාස විද්‍යාලවලින් පිට වී ඉගැන්වීම සඳහා පාසල්වලට ගිය විට ඒ අය තුළ හැඟීමක් ඇති වෙනවා, ඉගැන්වීමේ අවසානය ඒ තත්ත්වයෙන්ම විශ්‍රාම යාමය කියා. තමන්ගේ සේවා කාලය තුළදී ශ්‍රේණියක් ලබාගැනීම අපහසුය කියන හැඟීම ඔවුන් තුළ තිබෙනවා.

පළමු පත්වීම දෙන විටම, යම්කිසි ශ්‍රේණියකට පත් කිරීමේ ක්‍රමයක් ලිපිකරු සේවයේ තිබෙනවා. ගුරු අභ්‍යාස විද්‍යාලවලින් පිට වන ගුරුවරුන් සඳහාත් යම්කිසි ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ඇති කළ යුතු බවත්, ඉන්පසු විභාග පවත්වා දක්ෂකම් මත ඉහළ ශ්‍රේණිවලට උසස් කළ යුතු බවත් මම යෝජනා කරනවා. එවිට ගුරු වෘත්තියේ යෙදී සිටින අය දැනට වඩා පොත්පත් කියවා, තමන්ගේ දැනීම වැඩි කරගෙන, ගුරු වෘත්තියේම උසස්වීම් ලබා ගැනීමට උත්සාහ කරාවිය කියා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, අතීතය දෙස බැලුවොත් අපට පෙනෙනවා, ලංකාවේ තිබෙන පොත්පත්වලින් වැඩිහරියක්ම ලියා තිබෙන්නේ ගුරුවරුන් විසින් බව. නමුත් අද අපට කියන්න සිදු වී තිබෙන්නේ පොත්පත් ලිවීමෙන් හුඟක් දුරට ගුරුවරුන් ඈත් වී සිටින බවයි. එයට මූලික හේතුව ශ්‍රේණි දීමේ ක්‍රමය සම්මුඛ පරීක්ෂණයකට පමණක් සීමා කර තිබීමය කියන එකයි මගේ හැඟීම. විභාගයක් පවත්වා ඒ විභාගයේදී ලැබූ ලකුණු අනුව ගුරුවරුන් ශ්‍රේණිවලට උසස් කරනවා නම්, ඒ ක්‍රමය සාර්ථකය කියන එක මම කියනවා.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව අපි මීට වඩා උනන්දුවක් දක්වන්න ඕනෑ. ගරු අධ්‍යාපන ඇමතිතුමාට මම යෝජනා කරන්න කැමතියි, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පර්යේෂණාගාර සෑම දිස්ත්‍රික්කයම පිහිටුවා ඉංග්‍රීසි අධ්‍යාපන දියුණු කිරීමට කටයුතු කරන්නය කියා. එවැනි වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඉතාම වැදගත්ය කියන එකයි මගේ හැඟීම.

ලංකාව කෘෂිකාර්මික රටක් හැටියට අපි පිළිගෙන තිබෙනවා. එම නිසා කෘෂි විද්‍යා පර්යේෂණාගාර සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවන ලෙසත්, ඒවා මගින් ගුරුවරුන්ටත්, ශිෂ්‍යයන්ටත් කෘෂිකර්මය පිළිබඳ අවශ්‍ය අවබෝධය ලබාදීමට කටයුතු කරන ලෙසත්, මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ දිස්ත්‍රික්කය කෑගල්ල. ඒ දිස්ත්‍රික්කය විශේෂයෙන් අධ්‍යාපනය විමධ්‍යගත කල දිස්ත්‍රික්කයක්. විමධ්‍යගත කිරීම නිසා අපේ දිස්ත්‍රික්කය ලබා තිබෙන ප්‍රතිඵල මේ සභාවේදී ප්‍රකාශ කල යුතුය කියා මම හිතනවා. අධ්‍යාපනය විමධ්‍යගත කරන්න යන අවස්ථාවේ විරුද්ධ පක්ෂය නොයෙක් ප්‍රචාර ගෙන ගියා. පාසල්වල විශාල වර්ජන ඇති වුණා. නොයෙක් කැළඹිලි රටේ ඇති කරන්න උත්සාහ ගත්තා. නමුත් අපි ආඩම්බරයෙන් කියනවා අධ්‍යාපනය විමධ්‍යගත කිරීම නිසා ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අනාගතයේදී විශාල ප්‍රයෝජනයක් ඇති වෙනවාට කිසිම සැකයක් නැත කියා. තමුන්නාන්සේ දන්නවා ඇති අධ්‍යාපනය විමධ්‍යගත කිරීමට ප්‍රථමයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු දෛනික තඩත්තු සේවයට පමණක් සීමා වූ බව. ඒ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට සිද්ධ වුණා දිස්ත්‍රික්කයේ සිටින ගුරුවරුන් සියයක් කාර්යාලයට පැමිණියත් ඒ සියය සමගම කථා කරලා නොයෙකුත් ප්‍රශ්න නිරාකරණය කරන්න. නමුත් විමධ්‍යගත කිරීම නිසා සැලසුම් සකස් කිරීමටත්, පාඨශාලා පරීක්ෂා කිරීම සඳහා නිතරම පරීක්ෂණ කණ්ඩායම් යැවීමටත්, විදුහල්පතිවරුන් සමඟ වැදගත් සම්මන්ත්‍රණ පවා පවත්වා අධ්‍යාපන කටයුතු පිළිබඳව දිස්ත්‍රික්කය තුළ විශාල දියුණුවක් ඇති කිරීමටත් අද ඒ ඒ දිස්ත්‍රික්කවල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව ලැබී තිබෙනවා.

ඊළඟට විමධ්‍යගත කිරීමෙන් ඇති වූ තවත් ප්‍රගතියක් තමයි එදිනෙද සාමාන්‍ය වැඩකටයුතුවලට පමණක් සීමා වුණු විදුහල්පතිවරුන් අද පරිපාලනයත්, කළමනාකාරිත්වයත් පිළිබඳව හොඳ අවබෝධයක් ලබා තිබීම. මේක ඉතා වැදගත් දෙයක්. ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අධ්‍යාපන ඇමතිතුමා කල වැදගත්ම සේවාව මෙයයි කියන එක අපට ආඩම්බරයෙන් කියන්නට පුළුවන්. ඊළඟට ප්‍රාදේශීය කාර්යාල මගින් අද වැටුප් ප්‍රශ්න, ආයතන ප්‍රශ්න, ගුරු හිඟය ආදී ප්‍රශ්න සියල්ලක්ම විසඳාගෙන යනවා. දුරතියගල වැනි ඉතා දුෂ්කර ආසනවල දුර සිට කෑගලු කාර්යාලයට ඇවිල්ලා දින ගණන් කාලය ගත කර තමන්ගේ පාඨශාලාවේ ප්‍රශ්න පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඒ අයගේ කාලය අපතේ යවන්නත්, මුදල් නාස්ති කරන්නත් එද ගුරුවරුන්ට සිදු වුණා. නමුත් අද පරිපාලනය කොට්ඨාශ මට්ටමට ගෙන ඇවිත් තිබෙන නිසා ඒ පරිපාලනය පාඨශාලාවට ළං වී තිබෙනවා. මේ අනුව අපේ දිස්ත්‍රික්කවල පාඨශාලා හොඳාකාරව පරීක්ෂා කිරීමටත්, ඒවායේ අවශ්‍යතා පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කර ඒ පාඨශාලා දියුණු කිරීමටත් අද අවස්ථාව ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, කොට්ඨාශ කාර්යාලවල සැලසුම් ඒකක මගින් අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව ඒ පාසල්වලට ලබා දීමට අවස්ථාව ලැබී තිබෙනවා. පාඨශාලාවල අඩුපාඩු හොඳාකාරව පරීක්ෂා කර ඒවාට ප්‍රතිකර්ම ලබාදීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ කොට්ඨාශ කාර්යාල මගින් කරගෙන යන බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. මීට පෙර පැවති ක්‍රමය අනුව, එක විදුහලක් දියුණු කරන්න පමණයි විදුහල්පතිවරයෙක් උත්සාහ කළේ. නව ක්‍රමය නිසා අද කලාපයක විදුහල්පතිවරුන්ට පුළුවන් වෙලා තිබෙනවා පාසල් 10 ක් 15 ක් පරීක්ෂා කිරීමටත්, ඒවායේ පරිපාලනය හා කළමනාකාරීත්වය ගැන අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමටත්. මේ අනුව එක පාසලක් පමණක් දියුණු කරනු වෙනුවට අද මුළු කලාපයක්ම, පාසල් 10 ක් 15 ක් පමණ දියුණු කරන්න පුළුවන්. ඒ පාසල් 10, 15 තුළ තිබෙන අඩුපාඩුකම් පිළිබඳව, ඒ විදුහල්පතිතුමාට පරීක්ෂාකාරීව කටයුතු කිරීමට අවස්ථාව ලබා දී තිබෙනවා.

මගේ කාලය ඉතා සීමිතයි. එනිසා මම තමුන්නාන්සේට කියන්න කැමතියි අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉතා උනන්දුවෙන් මේ ගත් නව ප්‍රතිපත්තිය මේ රටේ කවුරුන් අද විවේචනය කළත් මෙයින් අවුරුදු 10 ක් 15 ක් යන විට නියම අධ්‍යාපන ක්‍රමයක් මේ රට තුළ බිහි වෙනවාට කිසිම සැකයක් නැත කියා. ඊළඟට මම කියනවා විශේෂයෙන් ගුරුවරුන් පුහුණු කර පාඨශාලාවලට පත් කිරීමේ ක්‍රමය ආරම්භ කිරීම මේ රටේ කළ ඉතා වැදගත් ක්‍රියාවක්ය කියා. මීට පෙර කළ ක්‍රමය වුණේ විභාගයක් පාස් කළ කෙනෙකු ගුරුවරයෙකු හැටියට පාසලකට පත් කිරීමයි. ඔහුට ඉගැන්වීම පිළිබඳව පුහුණුවක් ලබා දුන්නේ නැහැ. නමුත් දැන් අළුත් ක්‍රමය අනුව ඉගැන්වීම පිළිබඳව හොඳ පුහුණුවක් ලබා දී තමයි පාඨශාලාවට පත් කරන්නෙ. මම හිතනවා ඒ මගින් ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අනාගතයේදී හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමේ අවස්ථාව සැලසෙනවාය කියා.

අධ්‍යාපන ඇමතිතුමා කළ අනෙක් වැදගත්ම කාර්යය තමයි, සෑම උපාධිධරයෙක්ම පිටවී අවුරුදු දෙකක් ඇතුළත ඔහුට ගුරු පත්වීමක් දීමට කටයුතු කිරීම. මෙය එතුමාගෙන් සිදුවූ වැදගත්ම සේවයක්ය කියන එක මගේ හැඟීමයි. ඒ අනුව බලන විට අපට සැකයක් නැතුව කියන්න පුළුවන් මීළඟ දශකය තුළ මේ රටේ අධ්‍යාපනයේ නව නැම්මක් ඇතිවෙලා, නව උදවක් ඇතිවෙලා, මීට වඩා උසස් සේවයක් අධ්‍යාපනයට ඇතිවෙලා, අධ්‍යාපන මට්ටම ඉහළ ගොස් මේ රටේ හොඳ උගතුන් බිහිවෙන්නට අත්තිවාරම වැටී තිබෙනවාය කියා. ඒ අත්තිවාරම දැමීම පිළිබඳව මගේ ස්තුතිය අධ්‍යාපන ඇමතිතුමාට පිරිනමන අතරම, ඒ සඳහා සහාය දෙන නියෝජ්‍ය ඇමතිතුමාටත්, ඒ වාගේම අපට හුඟක් උපකාර කරන අධ්‍යාපන සේවා ඇමතිතුමාටත් මම ස්තුති කරනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයට මේ රජයෙන් සේවයක් නොවුණාය කියා සමහර අය කිව්වත්, මට භය නැතිව කියන්නට පුළුවන්, 1978 වර්ෂයේ සිට 1984 වර්ෂය දක්වා එක් කෝටි විසි පන් ලක්ෂයක ගොඩනැගිලි පමණක් මගේ ආසනය වෙනුවෙන් දී ඇති බව. ගරු අධ්‍යාපන ඇමතිතුමාට එතුමාගේ සේවය තවදුරටත් කර ගෙන යාමට ත්‍රිවිධ රත්නයේ පිහිට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**අනුර බැස්ටියන් මහතා (නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා)**
**(திரு அனுர பஸ்தியன் — பாதுகாப்புப் பிரதி அமைச்சர்)**
**(Mr. Anura Bastian – Deputy Minister of Defence)**

ගරු සභාපතිතුමනි, අද මෙ රටේ අධ්‍යාපන සේවය ස්ථිර පදනමක් මත පවත්වාගෙන යාම ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මම පළමුවෙන්ම ප්‍රශංසා කරන්නට ඕනෑ. කෑගල්ල දිසා ඇමතිතුමා කීවාක් මෙන් මීට පෙර කිසිම දිනක නොතිබුණු විධියට එක එක දේශපාලන පක්ෂවල යම් යම් ප්‍රයෝජන සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ගුරුවරුන් සහ ළමයින් පාවිච්චි කිරීම අද සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. අද අධ්‍යාපන අමාත්‍යාංශයේ—විශේෂයෙන් පාසල්වල—දකින්නට ලැබෙන විශේෂ ලක්ෂණය තමයි විනය ගරුක භාවය. මෙය ඉතාම වැදගත් වෙන්නේ අපේ සමාජයේ අනාගත පරපුර එතුමාට භාරව ඇති නිසයි.

ගුරු මාරුවීම් ගැන මම කියන්න ඕනෑ. අද යම් පදනමක් මතයි ගුරු මාරුවීම් ඇති වෙන්නේ. එය ඉතා වැදගත් කාරණයක්. මීට පෙර එහෙම නොවෙයි. එක් එක්කෙනාගේ පෞද්ගලික මත අනුව ගුරු මාරුවීම් සිදු වෙලා තිබෙනවා. අසාධාරණ ගුරු මාරුවීම් සිදු වෙලා තිබෙනවා, දේශපාලන හේතුන් නිසා. ඒවා සියල්ලම නැති කර අද යම් පදනමක් මත ගුරු මාරුවීම් ඇති වීම ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අ. භා. 1.30

මම මේ කාරණය ගිය අවුරුද්දේත් මතක් කළා. කොළඹ ප්‍රදේශයේ අද විශාල තදබදයක් තිබෙනවා ළමයි ඇතුළත් කිරීමේදී. මේකට එක හේතුවක් තමයි අපේ රජය බලයට පත් වූවාට පසු සමාජ මට්ටමින් සෑහෙන දියුණුවක් ඇති වී තිබීම. ඒ දියුණුව නිසා ගම්බද ප්‍රදේශවල ජීවත්වුණු අය අද කොළඹ ප්‍රදේශවල ජීවත් වෙන්න ඇවිත් තිබෙනවා. එම නිසා මේ උදවියගේ ළමයින් සියලු දෙනාම ඇතුළත් කරන්න බලන්නේ කොළඹ තිබෙන පාසල්වලටයි. කොළඹ තිබෙන පාසල්වලින්, මම හිතන්නේ ජනාධිපති විද්‍යාලය පමණයි, අලුතෙන් ඇති වී තිබෙන්නේ. අද පාසල් තදබදය නිසා දෙමව්පියන්ට තවමත් තමන්ගේ ළමයින් සමහර පාසල්වලට ඇතුළත් කර ගන්නට බැරි වෙලා තිබෙනවා. මා මේ ගැන අධ්‍යාපන ඇමතිතුමාටත් දැනුම් දී තිබෙනවා. මේක ලෙහෙසි දෙයක් නොවෙයි. මේක විසඳන්නට නම් අඩු ගණනේ අලුතෙන් තවත් පාසල් තුන හතරක්වත් විවෘත කරන්නට වෙයි. නැත්නම් මේ ක්‍රමය දිගටම තිබුණොත් ප්‍රශ්න ඇති වෙනවා.

අපි මතක තබා ගන්න ඕනෑ, කිසිම දියුණුවක් දකින්නට නැති පාසලුත් කොළඹ තිබෙන බව. ඊකට එක හේතුවක් වී තිබෙන්නේ සුදුසු විදුහල්පතිවරුන් නැති එකයි. සමහර පාසල් දියුණු වී තිබෙන නිසා හැමෝම වගේ ඒ දියුණු වී තිබෙන පාසල්වලට ළමයින් ඇතුළත් කර ගන්න උත්සාහ කරනවා. අද සමහර පාසල්වලට අවුරුද්දකට අයදුම්පත් 1,500ක් 2,000ක් පමණ එනවා පළමුවෙනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා. පළමුවන ශ්‍රේණියට ඇති ඉඩ ප්‍රමාණය අනුව එයින් ඇතුළත් කර ගන්නේ ළමයින් සියයක් හෝ හැත්තෑපහක් වැනි සුළු ප්‍රමාණයක්. මේක දේශපාලන වශයෙනුත් කොළඹ සිටින මන්ත්‍රීවරුන්ට විශාල ප්‍රශ්නයක් වී තිබෙනවා. එම නිසා විශේෂයෙන් කොළඹ අලුතෙන් පාසල් විවෘත කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට පියවරක් ගන්න ඕනෑ. මම එහෙම කියන්නේ තමන්ගේ දූ දරුවන්ට හොඳම අධ්‍යාපනයක් ලබා දීම දෙමව්පියන්ගේ විශාල බලාපොරොත්තුවක් නිසයි. අන්න ඒ නිසා තමයි, කොළඹ මේ තදබදය ඇති වී තිබෙන්නේ. ඒ ගැන කාට හෝ දෙස් පැවරීමෙන් වැඩක් නැහැ. නමුත් අපි ඒ ප්‍රශ්නය යථා කාලයේදී විසඳාගන්න ඕනෑ.

අධ්‍යාපන සේවා ඇමතිතුමාට මම විශේෂයෙන් ප්‍රශංසා කළයුතු කාරණයක් තිබෙනවා. මීට පෙර සමහර අවස්ථාවල කථාවලට ඇහුම්කන් දිගෙන සිටි අවස්ථාවලදී ගම්බද පාසල්වල සෑහෙන නොදියුණු තත්ත්වයක් තිබෙනවාය යන්න අහන්න ලැබුණත් දැන් ඒ තත්ත්වය මග හැරී තිබෙන බව පේනවා. ඒ මොකද, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය මාර්ගයෙන් ඒ පාසල්වලට අවශ්‍ය පහසුකම් ලබාදී තිබෙන නිසා. කොළඹ තිබෙන පාසල් ගැනත් එතුමා විශේෂ උනන්දුවක් දක්වා තිබෙනවා. අපි සාමාන්‍යය වශයෙන් ලියුමක් ලියා යැවූ අවස්ථාවකදී වුණත් එතුමා යම් ක්‍රියාමාර්ගයක් අරගෙන ඒ අවශ්‍යතා ඉෂ්ටකර දී තිබෙනවා. කොළඹ තිබෙන පාසල්වලත් අඩුපාඩුකම් විසඳනවා. සමහර උදවිය සිතනවා කොළඹ පාසල්වල සෑහෙන දියුණුවක් තිබෙනවාය එම නිසා ඒවායේ අඩුපාඩු නැත කියා. එහෙම එකක් නැහැ. කොළඹ සීමාසහිත පාසල් ගණනක පමණයි, ඒ කියන දියුණුව තිබෙන්නෙ.

මා කලින් කිව්වා වාගේ අලුතෙන් පාසල් විවෘත කර ළමයින් ඇතුළත් කිරීමේදී ඇතිවන තදබදය නැති කරගන්න ඕනෑය කියා නැවතත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

**මෙරිල් කාරියවසම් මහතා** (අගලවත්ත)
**(திரு. மெரில் காரியவசம் — அகலவத்த)**
**(Mr. Merril Kariyawasam – Agalawatta)**

ගරු සභාපතිතුමනි, මගේ ආසනයට අදාළව ඇති එක ප්‍රශ්නයක් ගැන පමණයි, මම කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නෙ. අගලවත්ත වාගේ ග්‍රාමීය ප්‍රදේශවල තවමත් ගුරු හිඟයක් පවතිනවා. එදාට වඩා ලොකු දියුණුවක් අද තිබෙන බව අපි පිළිගන්නවා. නමුත් මේ මොහොතේ අදත් මගේ ආසනයේ — අගලවත්ත ආසනයේ — ගුරුවරුන් 128 දෙනෙකුගේ හිඟයක් තිබෙනවා. ගුරුවරුන් දෙන්නෙක් පමණක් ඉන්න පාසල් 12ක් පමණ තිබෙනවා. තනි ගුරුවරයෙක් පමණක් ඉන්න එක පාසලක් තිබෙනවා. මේ ප්‍රශ්නය කොතෙක් කිව්වත් කෙනෙකුට පිළිගන්වන්න අමාරුයි. ඒ මොකද, අගලවත්ත තිබෙන්නේ බස්නාහිර පළාතේ කොළඹට යාබද දිස්ත්‍රික්කයක නිසා. ඒ නිසා කොළඹට යාබදව තිබෙන ආසනයක කොහොමද ගුරු හිඟයක් පවතින්නේ කියා හුඟාක් වෙලාවට කෙනෙකුට පිළිගන්වන්න අමාරුයි. අගලවත්තේ තිබෙන එක් පාසලකට බස් එකෙන් බැහැලා හැතැප්ම අටහමාරක පයින් යන්න ඕනෑ. මම හිතන්නෙ හැතැප්ම අටහමාරක් පයින් යන්න තිබෙන පාසලක් ලංකාවේ කොහේවත් නැතිව ඇති. ඒ පාසල නම් කලුකන්දව පාසලයි. තමුන්නාන්සේ සොයලා බලන්න. ඒ පාසලේ ඉන්නෙ තනි ගුරුවරයායි. ඒ ගුරුවරයාත් ළඟදී විශ්‍රාම යන්න ඉන්න කෙනෙක්. ඔහු ගියාට පසුව ඒ පාසලට යවන්නෙ කවුද කියන එක උභතෝකෝටික ප්‍රශ්නයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙරිල් කාරියවසම් මහතා]

මෙසේ ගුරු හිඟයක් ඇතිවුණේ ඇයි ? මේ ගුරු හිඟය පියවන්න බැරිද ? බැරි ඇයි ? පසුගිය කාලය තුළ අධ්‍යාපන ඇමතිතුමා මේ සඳහා හුඟාක් විසඳුම් සෙව්වා. හුඟාක් මහන්සි ගත්තා, මේකට විසඳුමක් සොයන්න. ආසනය තුළ ගුරු හිඟය ගැන පමණක් කථා කරනවිට තමුන්නාන්සේ කල්පනා කරයි දිස්ත්‍රික්කයේ සිටින ගුරු සංඛ්‍යාව ගැන. කලුතර දිස්ත්‍රික්කයේ ගුරු අතිරික්තයක් තිබෙනවා. කලුතර දිස්ත්‍රික්කය වාගේ පාසල් මණ්ඩල දෙකක් තිබෙන, පාසල් 86ක් තිබෙන දිස්ත්‍රික්කයක ගුරු අතිරික්තයක් තිබිලා එහි එක් ආසනයක පමණක් ගුරුවරු 128 දෙනෙකුගේ හිඟයක් තිබෙනවාය කිව්වාම එය බැරෑරුම් ලෙස ගතයුතු දෙයක්. මේ 128 දෙනාගෙනුත් වැඩියෙන් හිඟ විද්‍යා සහ ගණිත ගුරුවරුන්. මේ විෂයයන් කිසිවක් සමහර පාසල්වල උගන්වන්නේ නැහැ. ඉංග්‍රීසි වචනයක්වත් උගන්වන්නේ නැති පාසල් තිබෙනවා. විද්‍යාව උගන්වන්නේම නැති පාසල් තිබෙනවා.

මේ සඳහා විසඳුම් සොයනවිට ඇත්තවශයෙන්ම මේ ප්‍රශ්නය අපට තේරුම් යනවා මානුෂික ප්‍රශ්නයක් වශයෙන්. මේ ප්‍රශ්නය ඇති තිබෙන්නේ ගුරුවරු නැතිකම නිසාම නොවෙයි. දුෂ්කර ප්‍රදේශවලට යාමට ගුරුවරුන් කැමති කරවා ගැනීමට තිබෙන අපහසුවයි, මෙහි තිබෙන්නෙ. ඉතින් මේ ගුරුවරුන් මේකට කැමති කරවා ගන්නේ කොහොමද ? දුෂ්කර ප්‍රදේශවල පාසල්වල සේවය සඳහා යන අයට සියයට 15ක 20ක දීමනාවක් පසුගිය දවස්වල දුන්නම අපි සතුටු වුණා. දුෂ්කර, අතිදුෂ්කර පාසල් පිළිබඳව කළ සමීක්ෂයේදී දුෂ්කර නොවන පාසල් ලෙසින් අපේ ආසනයේ පාසල් 86න් ඉතුරු වුණේ පාසල් 20ක් පමණයි. ඒ පාසල් 20 හැර ඉතුරු පාසල් එක්කෝ දුෂ්කර, එහෙම නැත්තම් අතිදුෂ්කර පාසල් වශයෙනුයි, බෙදුණේ. තමුත් අපි සන්තෝෂ වුණා, මේ අවුරුද්දේ ඉඳලා විශේෂ දීමනාවක් දීලා මේ දුෂ්කර පාසල්වලට ගුරුවරුන් පත් කරනවාය කියා ආරංචි වුණාම. තමුත් අදවන තුරුත් එය ක්‍රියාත්මක නොවීම ගැන අපි කනගාටු වෙනවා. මම පසුගිය දවස්වල අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනකුට කථා කරලා බැලුවා. ඔවුන්ගේන් කියැවුණු දේ අනුව නම් මේක ළඟදී ක්‍රියාත්කම වන බවක් මට දැනුණේ නැහැ. ඒ වගේ දුෂ්කර දීමනාවක් දෙනවා නම් අපේ ප්‍රදේශය වගේ දුෂ්කර පළාත්වලට ගුරුවරුන් එයි කියා අපි සන්තෝෂ වුණා. ඇත්තවශයෙන්ම අපිට බැ ගුරුවරුන්ට දෙස් කියන්න. ඇයි, ඒ ගොල්ල අපේ පළාත්වලට එන්නේ ? අමතර ප්‍රයෝජනයක් නැත්නම්, වැඩි පඩියක් ලැබෙන්නේ නැත්නම්, පානදුරේ ඉගැන්නුවත්, කළුතර ඉගැන්නුවත් හොරණ ඉගැන්නුවත් කාර් එකෙන්, බස් එකෙන් සුව - පහසුවට ගිහින් පහසුකම් සහිත හොඳ පාසල්වල ඉගැන්නුවත් ලැබෙන්නේ එකම පඩිය නම් අතලේ, කළුකන්දව, රාජ්‍ය වැවිලි අංක 1, රාජ්‍ය වැවිලි අංක 2, කෙලින්කන්ද වගේ අතිශයින් දුෂ්කර ප්‍රදේශවලට ජීදණ්ඩෙන් ගිහින්, පයින් ගිහින්, කුඩැල්ලන් කඩ - කඩා ගිහින්, නවාතැන් පහසුකම් නැතිව අපි උගන්වන්නේ ඇයි කියන ප්‍රශ්නයට ඒ අය මුහුණ දෙනවා. ඒ නිසා අපි ඒ ගොල්ලන්ට දෙස් කියන්නේ නැහැ. තමුත් ඒ නිසාමයි අපි කනගාටු වන්නේත්, අර දුෂ්කර දීමනාව තවම ක්‍රියාත්මක නොවීම ගැන. මම හිතනවා, ඒ දුෂ්කර දීමනාව එක්තරා විධියකට විසඳුමක් වෙන්න පුළුවන්ය කියා, මේ ප්‍රශ්නයට.

අනෙක දැන් පර්ෂද ක්‍රමය ක්‍රියාත්මක වෙනවා, ඇතැම් පාසල් සම්බන්ධයෙන්. මම හිතන හැටියට අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගෙන තිබෙනවා, අගලවත්ත ආසනයේ මීගහතැන්න පර්ෂදය ඉතාමත් සාර්ථකය කියා. සමහර විට නගරබදව ඒ පර්ෂද ක්‍රමය සාර්ථක වන එකක් නැහැ. අපි දන්නවා, අපි පිළිගන්නවා, අපේ ගම්බද ප්‍රදේශවල හැම පාසලකටම සම්පත් බෙදා දෙන්න බැරිය කියා. තිබෙන සම්පත් සීමිතයි. ඒ දේ අපි තේරුම් ගන්නවා. පර්ෂදය තුළ සම්පත් බෙදා ගැනීමක් කරන්න පුළුවන් නිසා අපේ ගම්බද ප්‍රදේශවල තවත් පර්ෂදයක් ඇති කළොත් සමහර විට සම්පත් පිළිබඳ දුෂ්කරතාවෙන් මිදෙන්න අපට පුළුවන් වෙයි කියා මම හිතනවා.

අනෙක, ගුරු පත්වීම් දීම. ඒ පත්වීම් දෙන ආකාරයත් ගුරු හිඟයට ප්‍රබල හේතුවක්ය කියන එකයි, මම කියා සිටින්නේ. අද අපි තරග විභාගයක් තියලා ගුරු පත්වීම් දෙනවා. එක අතකින් බලන විට තරග විභාගයක් තියලා දක්ෂ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට තැන දීම සාධාරණයි කියා කෙනෙකුට හිතෙන්න පුළුවන්. තමුත් ඒ ක්‍රමය ඇත්තවශයෙන්ම කොයි තරම් සාධාරණද ? මම හිතනවා, තරග විභාග තියලා පත්වීම් දෙන එක ඒ තරම් සාධාරණයි කියන්න පුළුවන් දෙයක් නොවේය කියා. ඒක සාධාරණයි කියන හැකියි අපි මුළු ලංකාවේ හැම පාසලකටම සමාන වරප්‍රසාද දීලා තිබෙනවා නම්. ඒ විධියට සමාන වරප්‍රසාද ලැබූ හැම පාසලකින්ම ඇවිත් තරග විභාගයකට වාඩි වන උදවිය අතරේ තරගයක් ඇති වී දක්ෂයා තේරෙන එක සාධාරණයි. තමුත් දැන් පවතින තත්ත්වය යටතේ නම් අගලවත්ත වැනි ඡන්ද කොට්ඨාශවල, ගම්බද ප්‍රදේශවල ජීවත් වන වරප්‍රසාද හීන පාසල්වල ඉගෙන ගත් දරුවන් නම් කවදාවත් ඒ තරග විභාගවලින් සමත් වන්නේ නැහැ. එයින් සිදු වන්නේ අර ගුරු පත්වීම් දෙන විට ඒවා ලැබීම සඳහා තේරෙන්නේත් නගරබද දරුවන්ම වීමයි. තමුත් ඔවුන් ගම්බද ප්‍රදේශවලට එන්නේ නැහැ. ඔවුන් කෙසේ හෝ නගරයට වී, නගරයේ පාසල්වල උගන්වාවි. ඒ නිසා මේ විධියට තරග විභාග මගින් පත්වීම් දීමේදී අසාධාරණයක් වෙනවාය කියන එක මම නිර්භයවම කියනවා.

වරප්‍රසාද හීන අපේ ආසනයේ පාසල්වල විද්‍යාව උගන්වා නැහැ. දැනට අවුරුදු තුනක් වන තෙක් වූ කාලය දක්වා අපේ පාසල්වල උසස් පෙළ පන්තිවල විද්‍යාව කළේ නැහැ. එහෙම නම් විද්‍යා ගුරු පත්වීම් සඳහා තරග විභාග මගින් සුදුස්සන් තේරීම නිසා අපේ ආසනයේ ළමයින්ට කිසිදක විද්‍යා ගුරු පත්වීමක් ලැබෙන්නේ නැහැ. අපේ ආසනයේ ඉංග්‍රීසි උගන්වන්න ගුරුවරුන් නැහැ. ඉංග්‍රීසි ඉගැන්වෙන්නේම නැහැ. එතකොට, ඉංග්‍රීසි ගුරු පත්වීම් සඳහා තරග විභාග මගින් සුදුස්සන් තෝරනවා නම් අපේ වගේ ආසනවල ළමයින්ට කිසිදක ඉංග්‍රීසි ගුරු පත්වීම් ලැබීමේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. අපේ වගේ ආසනවල විද්‍යාව ඉගැන්වෙන්නේ නැත්නම්, ගණිතය ඉගැන්වෙන්නේ නැත්නම්, ඉංග්‍රීසි ඉගැන්වෙන්නේ නැත්නම්, පුරප්පාඩු තිබෙන්නේත් ඒ විෂයයන්ම සඳහා නම්, ඒ විෂයයන් සඳහා ගුරු පත්වීම්වලට තරග විභාගවලින් සුදුස්සන් තෝරනවා නම් ඒ විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුවරුන් වශයෙන් අපේ ප්‍රදේශවලින් කිසිදක තේරෙන්නේ නැහැ. ඒ වාගේම දැනට පවතින ක්‍රමය අනුව අපේ වගේ දුෂ්කර ප්‍රදේශවල ගුරු හිඟය නැති කරන්න පුළුවන්ය කියාත් මම හිතන්නේ නැහැ. ඒ නිසා මීට වඩා ගම් මට්ටමින්, ආසන මට්ටමින් ගුරු පුරප්පාඩු පිරවීම සඳහා සාකච්ඡා කොට යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කර ගන්න සිද්ධ වෙනවාමයි.

මුළු ලංකාවටම පොදුවේ ගත් ප්‍රතිපත්තියක් තුළින් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එහෙම විසඳෙනවා නම් පසුගිය අවුරුදු 6-7-8 තුළ කළ පර්යේෂණවලට පසුව යෙදූ උපක්‍රමවලින් පස්සේ, අනුගමනය කළ ක්‍රියා මාර්ගවලින් මේ ප්‍රශ්නය විසඳිය යුතුව තිබුණා. තමුත් අදත් මගේ ආසනයේ ගුරු පුරප්පාඩු 128 ක් තිබෙනවා නම් එයින් පැහැදිලිවම පෙනෙන්නේ පසුගිය අවුරුදු 6-7-8 තිස්සේ ගත් උපාය මාර්ගවලින් මේ ප්‍රශ්නය විසඳී නැති බවයි. ඒ නිසා අපි මීට වඩා වෙනස් දෙයක් ගැන කල්පනා කළ යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි හැම තිස්සේම කල්පනා කරන්නෙ දිස්ත්‍රික්ක අනුවයි. දිස්ත්‍රික්ක අනුවයි, ගුරුවරුන් ගැන හිතන්නෙ. දිස්ත්‍රික්කයක් වශයෙන් කලුතර දිස්ත්‍රික්කය ගත්තොත් එම දිස්ත්‍රික්කයේ ගුරුවරුන්ගේ අතිරික්තයක් තිබෙනවා. ඒ අනුව බලන විට මෙහි තිබෙන අසාධාරණකම තවත් ප්‍රබලව පෙනෙනවා. එයින් පැහැදිලිවම පෙනෙන්නේ මොකක්ද ? ගම්බද පාසල්වල ගුරුවරුන්ගේ හිඟයක් තිබෙන අතර නගරබද පාසල්වල ගුරුවරුන්ගේ අතිරික්තයක් තිබෙනවා. එහෙම නම් පානදුර, කලුතර, හොරණ වගේ ප්‍රදේශවල ජනප්‍රිය පාසල්වල ගුරුවරුන් ගොඩගැහිල ඇති. සමහර තැන්වල ගුරුවරුන් ගොඩගැහිල ඉන්නවා. සමහර තැන්වල ඉංග්‍රීසි විෂය උගන්වන්න ගුරුවරුන් නැහැ. විද්‍යාව කියන විෂය උගන්වන්න ගුරුවරුන් නැහැ. එහෙම නම් විශාල අසාධාරණයක් මෙතැන තිබෙනවා. එම අසාධාරණය ගැන නුඹ දෙනෙකුගේ අවධානය යොමු කරවන්න අපි නැත් කළත්, එයට සාධාරණ විසඳුමක් මෙතෙක් ලැබී තිබෙන බවක් පෙනෙන්නෙ නැහැ. ඒ නිසා මෙහිදී විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේත් අවශ්‍ය නිලධාරීන්ගෙත් අවධානය යොමු කළ යුත්තේ මේ අසාධාරණය වෙතයි. මේ ප්‍රදේශවල දරුවන්ටත්, අපේ ආසනවල දරුවන්ටත් ඉගෙන ගන්න උරුමයක් තිබෙනවා. ඒ දරුවන්ටත් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්න උරුමයක් තිබෙනවා. විද්‍යාව, ගණිතය ඉගෙන ගන්නට ඒ දරුවන්ටත් උරුමයක් තිබෙනවා. තමුත් ඔවුන්ට උගන්වන්නට ගුරුවරුන් නොදීම විශාල අසාධාරණයක් බව මා මතක් කරන්න ඕනෑ.

මම හිතන විධියට මෙතැන තිබෙන්නෙ ගුරුවරුන් බෙදා හැරීමේ දුෂ්කරතාවයයි. ගුරුවරුන් නිසි ලෙස බෙදා හැරීමේ ක්‍රමයක් ඇති කර ගන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය ඇතිවෙන්නෙ නැහැ. අපි දන්නවා අපේ දිස්ත්‍රික්කයේ ඉන්න ගුරුවරුන් පිරිස පුළුවන් තරම් හොඳට බෙදා දෙන්න අපේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා නැත් කළ බව. තමුත් යම් යම් බලපෑම් නිසා එතුමාට ඒ වැඩේ කරගන්න බැරි වුණා. මම යම්නම්ත්වත් දෙස් කියන්නෙ නැහැ, කලුතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිස්ත්‍රික්කයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දෙදෙනාටම, එච්. කේ. රූපසිංහ මහත්මයාටවත්, සී. එම්. ආරියවංශ මහත්මයාටවත් මම දෙස් කියන්නෙ නැහැ. ඒ දෙදෙනා ඉතා හොඳ නිලධාරීන් දෙදෙනෙක් බව මම විශේෂයෙන් කියනවා. ඒ නිලධාරීන් දෙදෙනා කොයි තරම් වෑයම් කළත් ක්‍රමයේ ඇති යම්කිසි දුර්වලකමක් නිසා ඒ නිලධාරීන් දෙදෙනාට මේ බෙද හැරීම කරන්න පුළුවන් වුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, මම මේ විෂය ගැන පමණයි කථා කරන්න බලාපොරොත්තු වුණේ. මොකද ? අපට මෙය තදින් බලපාන ප්‍රශ්නයක් නිසයි. සාකච්ඡා මාර්ගයෙන් ආසන මට්ටමේ සාකච්ඡා මාර්ගයෙන්, ගම්බද පළාත්වල ඉන්න ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සමග සාකච්ඡා මාර්ගයෙන් මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්නට තැත් කරාවි කියන අපේක්ෂාවෙන් මම ඔබෙන් සමු ගන්නවා.

අ. භා. 1.45

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**
**(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)**
**(Mr. Amarasiri Dodangoda - Baddegama)**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අධ්‍යාපන ඇමතිතුමාත් නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත් පේන්න නැහැ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

හොඳයි, නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන, ඉදිරි ක්‍රියාමාර්ගය ගැන මුළු රටම ප්‍රවේශමකින් බලාගෙන ඉන්නවා. මොකද ? හැම ගෙදරකම වාගේ ළමයෙක් පාසල් යනව. මගේ දැනුමේ හැටියට රටේ මේ පාසල් 9,544ක් පමණ තිබෙනවා. ළමයින් ලක්ෂ 40කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. සමහරවිට ළමයින් සංඛ්‍යාව පිළිබඳ ගණන් හිලව්, ඉන්න ගුරුවරුන් සංඛ්‍යාව පිළිබඳ ගණන් හිලව්, තිබෙන පාසල් සංඛ්‍යාව පිළිබඳ ගණන් හිලව් පැහැදිලිවම අමාත්‍යාංශයේ ලේඛනගත වී නැතිව ඇති. එයට හේතුව මෙය ඒ තරම්ම විශාල, ජාතියට බලපාන, නිතර වෙනස්වන, නිතරම ගුරුවරුන් එන, විශ්‍රාම ගන්න, අලුතෙන් බඳවා ගන්න, ළමයින් සංඛ්‍යාව වැඩිවෙන අඩුවෙන තත්ත්වයක් තිබෙන, බොහොම බැරෑරුම් වගකීමක් ඇති අමාත්‍යාංශයක් නිසයි. මේ කටයුතු විමධ්‍යගත කර අධ්‍යාපන උසස් අධ්‍යාපන වශයෙන් බෙද පවරාදී තිබෙන්නේ ඒ නිසායි. ඇත්තවශයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මකවන, මේ රටේ ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම, අප දකින්නේ මිනිසුන්ගේ අයිතිවාසිකමක් හැටියටයි. එය දෙපාර්තමේන්තුවකින් කරන නියෝගයක් හෝ බලපෑමක් හෝ නොවෙයි. මිනිසුන්ගේ අයිතිවාසිකමක්. හැම ළමයකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය තිබෙනවා. එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ඒ අයිතිවාසිකම් ලංකාවේ ජීවත්වන පාසල් යන වයසේ සිටින හැම ළමයකුටම ලැබෙන්න ඕනෑ. ලැබෙන්නේ නැත්නම් හෝ අසමානව ලැබෙනවා නම් හෝ එහි අඩුපාඩුවක් තිබෙනවා. ඒ නිසා අධ්‍යාපනයේ අයිතිය ලබාගන්නට බැරිවුණු, එසේ නැත්නම් අසමානව අධ්‍යාපනය ලැබෙන හැම කෙනෙක්ම ඒ අයිතිවාසිකම නොඅඩුව රජයෙන් බලාපොරොත්තු වෙනවා. අයවැය ලේඛනයෙන් අධ්‍යාපන වැය ශීර්ෂය සඳහා කෝටි හතළිහක් පනණක් වෙන් කළත් ඊට වැඩි මුදලක් වෙන් කළත් ඒ මුදල හැම කෙනකුටම අයිතිවාසිකමක් හැටියට සමානව ලැබේයයි බලාපොරොත්තු වෙනවා.

අද මම විශේෂයෙන් මතු කරන පළමුවැනි කාරණය මේ අධ්‍යාපන අයිතිය පිළිබඳ අසමනාවයි. හැම දෙනාටම මෙය සමානව නොලැබෙනවා නම් එය අමාත්‍යාංශයේ සැලකිල්ලට යොමුවිය යුතුයි. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) එතුමාගේ කොට්ඨාශයේ අතිදුෂ්කර හා දුෂ්කර පාසල්, ගුරු හිඟය, උපකරණ සහ භාණ්ඩ පිළිබඳ ප්‍රශ්න ගැන කරුණු සඳහන් කළා. මෙය අගලවත්තට පමණක් සීමාවන දෙයක් නොවෙයි. මේ රටේ ගම්බද පහසුකම් අඩු දිස්ත්‍රික්කවල ළමයින්ට තමන්ගේ අධ්‍යාපන අයිතිය ලබන්න බැරි වී තිබෙනවා. දෙමවුපියන්ට තම ළමයින්ට උගැන්වීමේ අයිතිය සහ පහසුකම් නැති තත්ත්වයක් තිබෙනවා. මෙය නිදහස් ජාතියක් හැටියට හැම මිනිසකුගේම අයිතිවාසිකම් සමානයයි කියන ජාතියක් හැටියට අපි කල්පනාවට ගතයුතු කරුණක්. මෙය ක්‍රියාමාර්ගයෙන් භාවිතයෙන් චක්‍රලේඛන සහ අමාත්‍යාංශයේ වැඩපිළිවෙළෙන් ඉටු නොවීම පිළිබඳ කාරණය අපගේ අවධානයට යොමුකළ යුතුයි.

ජේ. ඊ. ජයසූරිය මැතිතුමා තමන් විසින් රචිත ග්‍රන්ථයක් තුළින් සපයා තිබෙන කරුණු කීපයක් මට මතකයි. විශේෂයෙන්ම තුන්වැනි ලෝකයේ රටවල අධිරාජ්‍යවලට යටත් වී තිබී තමන්ගේ ක්‍රමයක් ගොඩනගා ගන්නට දඟලන රටවල අධ්‍යාපන ප්‍රශ්නය පිළිබඳ කරුණු. ලංකාවට මෙය අදාළයි. 1978-79 සහ 1981-82 අතර අවුරුදු දෙකක කාල සීමාව තුළ අවුරුදු පහ සහ නවය යන වයස් සීමාවල සිටින දරුවන්ගේ නූගත් භාවය සියයට 4.1කින් වැඩි වී තිබෙන බව ජයසූරිය මහතා එතුමාගේ මෑත කාලීන ලිපියක සඳහන් කර තිබෙනවා. ලංකාවේ නූගත් දරුවන්ගේ සංඛ්‍යාව මේ ප්‍රමාණයෙන් වැඩි වී තිබෙන බව ඒ ග්‍රන්ථයේ සඳහන් වෙනවා. ඇත්තවශයෙන්ම මේ තත්ත්වය පිළිබඳ රජයේ අවධානය යොමු විය යුතුයි.

ඊළඟට අපේ මහ බැංකු වාර්තාව අඩු ආදායම් සහ වැඩි ආදායම් ලබන අය අතරේ දැනුම පිළිබඳ මිනුමක් ඉදිරිපත් කරනවා. අඩු ආදායම් ලබන අය සහ වැඩි ආදායම් ලබන අය අතර ඒ පරතරය සියයට 15.1යි. අධ්‍යාපන පහසුකම් පිළිබඳ පරතරයකුත් අපේ බැංකු වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. මේ පිළිබඳව පුන පුනා කියන්නට මම උත්සාහ කරන්නේ නැහැ. නමුත් රජයේ යුතුකමක් තිබෙනවා, රටේ ජාතික වත්කමෙන්, ජාතික ආදායම් හා වියදම් ලේඛන ගත කරන විට, වෙන් කරන විට, හැම කෙනෙකුටම සලසන පහසුකම් පිළිබඳව සමතාවක් ඇති කරන්නට. නමුත් එවැන්නක් කරන බවක් අපට නම් පෙනෙන්නට නැහැ. බොහෝ දිස්ත්‍රික්ක, බොහෝ ප්‍රදේශ ගැන සලකා බලන විට, අධ්‍යාපනයට වියදම් කරන මුදල් ප්‍රමාණය අතර සමානත්වයක් පෙනෙන්නේ නැහැ. එම නිසා, දිගු කලක් යටත් විජිතයක් වශයෙන් තිබී, තමන්ගේම ක්‍රමයක් ගොඩනගා ගන්නට උත්සාහ කරන ජාතියක් හැටියට, අප, අපේ ජාතියේ දරුවන්, ඉදිරියට මේ රටේ යහපත් පුරවැසියන් හැටියට පිළියෙළ කිරීමේදී ඒ හැම කෙනෙකුටම රටේ ජාතික ආදායමෙන් වැය කරන මුදලින්, සමානව ප්‍රයෝජන භුක්ති විඳීමට අයිතියක් තිබෙනවා. අධ්‍යාපනය පිළිබඳවත්, අමාත්‍යාංශයේ සෙසු සුභසාධනය මත ක්‍රියාත්මක කරන සියලුම ක්‍රියා මාර්ගවලිනුත් එම අයිතියේ සමානතාවක් තිබිය යුතු බවයි, අපේ අදහස.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය සඳහා අප වැය කරන මුදල්, අගලවත්තේ මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) කිව්වා වාගේම, රජයේ අනිකුත් ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක් ප්‍රකාශ කළා වාගේම, හැම දිස්ත්‍රික්කයක් සඳහාම, එළිමහන් ක්‍රීඩාගාර, විද්‍යා උපකරණ, ගොඩනැගිලි ආදිය පිළිබඳව වෙන් කරන මුදලේ සමතාවක් තිබිය යුතුයි. එයින් ප්‍රශ්න රාශියක්ම විසඳා ගන්නට අපට ඉඩ ලැබෙනවා. අද දෙමව්පියන් අතර, ලොකු තරගයක් පවතිනවා, ලොකු උත්සාහයක් තිබෙනවා, තමන්ගේ දරුවන් නගරයේ වැඩිපහසුකම් ඇති පාසල්වලට ඇතුළු කරවා ගන්නට. මේ නිසා වංචනික ක්‍රියා රාශියක්ම සිදු වෙනවා. සියලු දෙනාම දන්නා පරිදි ළමයින් ඇතුළු කරවා ගැනීමේ දී නොයෙකුත් වංචා සිදු වෙනවා. යථාර්ථයට පටහැනිව නොයෙකුත් දේවල් ක්‍රියාත්මක වෙනවා. සෑහෙන පිරිසක් නීතිරීතිවලින් රිංගා යනවා. යම් යම් රෙගුලාසි අරගෙන බැලුවොත් " සැතපුම් භාගයේ, සැතපුම් දෙකේ වාගේ සීමාව තුළ පදිංචි වී සිටිය යුතුය " යනාදී වශයෙන් නීති තිබෙනවා. නමුත් සැතපුම් විස්සක් එහා සිට පවා පාසල් බස් රථ නගරයට එනවා. ඒ නගරයේ පාසලේ නාම පුවරුව ඇතුව. මම මෙහිදී එක් උදාහරණයක් ගෙන පෙන්වන්නම්. අවිස්සාවේල්ලේ සිට විශාඛා විදුහල කියා බස් රථයක් ධාවනය කරනවා. නමුත් විශාඛා විදුහලට ශිෂ්‍යාවන් ඇතුළත් කිරීමේදී පාසලේ සිට සැතපුමක හෝ සැතපුම් භාගයක සීමාව තුළ පදිංචි වී සිටිය යුතු කියන නීතිය බලපානවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී එම පාසලට ඇතුළු වුණු ළමයින් එන්නේ නැද්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එහෙම එන්න පුළුවනි. තමුන්නාන්සේ ඒ කාරණය ගැන සඳහන් කිරීම ගැන ස්තුති වන්ත වෙනවා. නමුත් ඒ බස් රථය නවත්වා බැලුවොත්, ඒ මට්ටමට සුදුසුකම් ලැබූ අය වාගේම තවත් විශාල පිරිසක් පැමිණෙන බව පෙනෙනවා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

ඇයි තරඟ විභාගවලින් සමත් වී පාසලට ඇතුළු වූ අය.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එහෙම අයත් ඉන්න පුළුවනි. නමුත් මේ හැම දෙයක්ම නීතියට පමණයි සීමා වී තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මා සඳහන් කළේ උසස් විදුහල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමේ පොරය පිළිබඳවයි. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ, විදුහල් කීපයකම උසස් විදුහල් වශයෙන් නම් කර, ඒවාට වැඩි පහසුකම් සලසා දී ඇති නිසයි. ජාතික අධ්‍යාපනය වෙනුවෙන් පොදුවේ වැය කළ මුදල් විශාල ප්‍රමාණයක් මේ විදුහල් සඳහා වැය කරනවා. ඇත්තවශයෙන්ම පාසල් කීපයකට පමණක් සපයන මේ පහසුකම් විමධ්‍යගත කිරීමකට අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න ඕනෑ. අඩු ගණනේ ගම් දහයකට එක් පාසල බැගින් ගෙන එම පාසලට උසස් විදුහල්වලට සපයන පහසුකම් සලසන්නට ක්‍රියා කරනවා නම්, මේ ප්‍රශ්නයට එය විසඳුමක් වෙනවා. එම නිසා එක් වසරකදී, ආසනයකට වෙන් කරන රුපියල් හතලිස් පන් ලක්ෂය හෝ පණස් ලක්ෂයක මුදල, ඒ අවුරුද්ද තුළ එම කොට්ඨාශයේ පාරවල් හැදීම වාගේ හැම වැඩක්ම නතර කර, පාසල් දියුණු කිරීම සඳහා යොදවනවා නම්, ගම් පහකට හෝ දහයකට එක පාසල බැගින් වන සේ පාසල් දියුණු කිරීම සඳහා යොදවනවා නම්, එය ඉතා ප්‍රයෝජනවත් බව —

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

ඒක මන්ත්‍රීතුමාගේ පෞද්ගලික යෝජනාවකින් කළ හැකි වැඩක්.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මා ඒක යෝජනා කරනවා. පසල් පහකට හෝ දහයකට එක ජ්‍යෙෂ්ඨ විද්‍යාගාරය බැගින් ලබා දීමටත්, ඒ වාගේ පහසුකම් ලබා දීමටත් ක්‍රියා කරනවා නම්, එයින් අනාගතයට හුඟක් සාර්ථක ප්‍රතිඵල ඇති වෙනවා. සමහරවිට පාරවල් හදු, පාලම් හදු අවුරුද්දට රුපියල් ලක්ෂ 50ම අපට වියදම් කරන්නට පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් නැත්නම් ඒ මුදල් හෝ වියදම් කර ඒ ප්‍රදේශයේ ඉස්කෝල 10ක් විද්‍යාගාර, පුස්තකාල සහ වෙනත් පහසුකම්වලින් සමන්විත මට්ටමකට ගෙනෙනවා නම් ඉදිරියේදී අපට එහි ප්‍රතිඵල හුඟක් ලබා ගන්නට පුළුවන්. මේ වාගේ අධ්‍යාපන ආයතන විසින් ඉදිරියට ගෙනෙනු ලැබූ දිස්ත්‍රික්ක, ප්‍රදේශ තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් හොරණ අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය හේතුවෙන් බුද්ධිමතුන් සැහෙන පිරිසක් බිහි වූ ප්‍රදේශයක්. ඒ නිසා අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ප්‍රාන්ත වශයෙන්, ප්‍රාදේශීය වශයෙන් ඇති වන ප්‍රගතිය පවා ඒ ප්‍රදේශවල ජනතාවගේ යම් විශේෂත්වයක් ඇති කර තිබෙනවා. මෙය අපට මුළු රටක් හැටියටම පොදුවේ අත්හදා බලන්නට පුළුවන් නම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරනු ලබන වියදම්වලින් සහ ගනු ලබන ඒ ක්‍රියාමාර්ගවලින් උසස් ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්. මේ කාරණය අදහසක් හැටියටයි මම ඉදිරිපත් කළේ.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි 5කට වඩා දෙන්න බැහැ.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

තව කරුණු රාශියක් ඉදිරිපත් කරන්නට තිබෙනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

ආණ්ඩු පක්ෂයෙන්ම තව 10 දෙනෙක් පමණ කථා කරන්නට සිටිනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

තව විනාඩි 10ක්වත් ඕනෑ. මම සවස් වරුවේ කථා කරන්නට ආවේත් ටිකක් වැඩි වේලාවක් ලබාගන්න ඕනෑ නිසයි.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

අක්මීමන ගරු මන්ත්‍රීතුමා විනාඩි 40ක් කථාකර තිබෙනවා.

අ. භා. 2

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේගේ සීමාව පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. නමුත් මම ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වූ අදහස් ටිකක් කෙටියෙන් හෝ ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව කරුණු කීපයක් සඳහන් කරන්නට ඕනෑ. අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධව වැඩපිළිවෙළ කෙසේ වුණත් එය පිළිවෙළක් කර ගැනීමේදී ඒ අයිතිය සියලුදෙනාටම ලැබෙන පරිදි සකස් විය යුතුව තිබෙනවා.

මේ අමාත්‍යාංශයේ ඇතැම් කටයුතු පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට මම බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන සේවා කමිටුවට පැවරුණු වැඩකටයුතු ගැන සලකනවිට එහි සමහර වැඩ අධ්‍යාපන අමාත්‍යාංශය එයින් උදුරාගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට විනය පරීක්ෂණ කටයුතු පෙන්වන්න පුළුවන්. ගුරුවරුන්ගේ හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිකුත් අයගේ විනය පරීක්ෂණ කටයුතු අධ්‍යාපන සේවා කමිටුවටම භාර දුන්නොත් හොඳයි කියන එකයි මගේ අදහස. එය අමාත්‍යාංශයට අරගෙන නිලධාරීන් කළ විනය පරීක්ෂණවල ලොකු අසාධාරණතාවයක් පෙනෙන්නට තිබෙනවා. ඒවාගේම බඳවා ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ තරුණ සේවා සභාවේ නිලධාරීන් සම්මුඛ පරීක්ෂණ පවත්වන බව අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් අත්සන් කළ ලියවිල්ලක තිබෙනවා මම දැක්කා. සමහරවිට මේ අමාත්‍යාංශ දෙකම එකම ඇමතිවරයෙක් යටතේ තිබෙන නිසා එසේ සිදුවෙනවා වෙන්න පුළුවන්. නමුත් අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ, ඒ වැඩපිළිවෙළ යටතේ ඇතිකළ කමිටුවක කැඳවීම්වලට තරුණ සේවා සභාව සම්මුඛ පරීක්ෂණ පවත්වන්නේ කොහොමද කියන එක පිළිබඳවත්, එහි අසමතාවය පිළිබඳවත් අපි ටිකක් ප්‍රවේශමෙන් කල්පනා කර බලන්න ඕනෑ.

ඒ වාගේම ගුරු මාරුවීම් සම්බන්ධයෙන් දුෂ්කර පාසල් සහ දුෂ්කර ප්‍රදේශ පිළිබඳව අධ්‍යාපන සේවා ඇමතිතුමා යම් යෝජනාවක් ඉදිරිපත් කළා මට මතකයි. එහිදී දුෂ්කර ප්‍රදේශ වශයෙන් නම් කරන්නේ නැතිව දුෂ්කර පාසල් වශයෙන් නම් කිරීමෙන් ගුරු මාරුවීම් වඩාත් සාධාරණව කළ හැකි අන්දම පිළිබඳව නුවරඑළිය ගරු දිසා ඇමතිතුමියත් කරුණු දැක්වුවා. දුෂ්කර පාසල්වල සේවය කිරීමත් දුෂ්කර සේවයක් හැටියට සැලකුවොත් හොඳයැයි එතුමිය කිව්වා. එය තවම ක්‍රියාත්මක වෙලා නැහැ. උදාහරණයක් වශයෙන් ගත්තොත් ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන බෙන්තර - ඇල්පිටිය ආසනය දුෂ්කර ආසනයක්. මේ දුෂ්කර ප්‍රදේශයේ පාසල් ගාල්ල - කොළඹ පාරේත් තිබෙනවා. ජනප්‍රිය මට්ටමේ පාසලුත් ඒ දුෂ්කර ආසනයේ තිබෙනවා. එම නිසා ප්‍රදේශ දුෂ්කර වශයෙන් නම් කරන්නේ නැතිව, ඉස්කෝල දුෂ්කර වශයෙන් නම්කර ගුරු මාරුවීම් ක්‍රමය හැඩගස්වන්නය කියා අද අධ්‍යාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවා ඇමතිතුමා කළ යෝජනාව තවම ක්‍රියාත්මක වෙලා නැහැ. මෙය සැලකිල්ලට ගතයුතු කාරණයක්. එමනිසා මා විශේෂයෙන් මතක් කරනවා, දුෂ්කර ප්‍රදේශවල සේවා කාලය සැලකීමේදී, දුෂ්කර දිස්ත්‍රික්ක වශයෙන් නොව දුෂ්කර පාසල් මට්ටමෙන්, දුෂ්කර පාසල් වශයෙන් නම්කර, ඒවායේ සේවා කාලය ගණන් ගන්නය කියා.

මේ අවස්ථාවේදී මේ අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා වතු පාසල් පිළිබඳව. වතු පාසල්වල තත්ත්වය විශේෂයෙන්ම සැලකිය යුතුයි. මොකද, වතුකරයේ ජීවත්වෙන්නේ බොහොම අඩු ආදායම් තිබෙන අය. ඒ අය බොහොම අපහසුකම් මැදයි ජීවිත ගෙවන්නේ. වතු අංශයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ නූගත්භාවය පිළිබඳව සැහෙන වැඩිවීමක් පෙන්නුම් කරනවා, 1978ත් 1981ත් අතර අවුරුදු දෙකක් තුළදී. නූගත්භාවය පිළිබඳ සියයට ගණන වැඩිවී තිබෙනවා. මේ වාගේ පාසල් පිළිබඳව, විශේෂයෙන්ම වතු පාසල්වල අධ්‍යාපන මට්ටම පිළිබඳව, ඒ දරුවන්ගේ දැනුම පිළිබඳව, ඒ අයට තිබෙන පහසුකම් පිළිබඳව, අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුයි කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**
ඒවා රජයට අරගෙන තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
රජයට තමයි සේරම අරගෙන තිබෙන්නේ. ඒක නිසා මම මේවා රජයට කියන්නේ. පෞද්ගලික අංශයට අයිති නම් මා මේවා කියන්නේ නැහැ. රජය තමයි මේවාට වගකියන්න ඕනෑ.

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**
රජය තමයි වගකියන්නේ, නැතිව තමුන්නාන්සේද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
ගරු සභාපතිතුමනි, එතුමා කියන්නේ මේවා රජයට අරගෙනලු. ඒ නිසා කථා කරන්න එපාලු.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**
මහනුවර දිස්ත්‍රික්කයේ වතු පාසල්වල දියුණුව සඳහා රුපියල් ලක්ෂ 30 ක් විමධ්‍යගත අයවැයෙන් වෙන් කර තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
නමුත් වතු පාසල් ළමයින්ගේ නූගත්කම වැඩිවීම පිළිබඳව තමුන්නාන්සේලාගේ මහ බැංකු වාර්තාවේ තිබෙන සංඛ්‍යා ලේඛන ඊට වෙනස්.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**
මේ ආණ්ඩුවෙන් තමයි වතු පාසල්වලට සේවයක් කරන්න පටන් ගත්තේ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
ඒක හරි. ඒ වුණාට නූගත්කම වැඩිවීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ බැංකුවේ තියෙන වාර්තාව අනුවයි මම කියන්නේ.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**
කොයි අවුරුද්දේද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
1978 සිට 1981 දක්වා. මෙය තමුන්නාන්සේලාගේ කාලයේ ඇති වී තිබෙන දෙයක්.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**
1978 වර්ෂයේ පොතේ තිබෙන්නේ 1977 වර්ෂයේ සංඛ්‍යා ලේඛන.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
Order, please ! තවත් අය කථා කරන්න ඉන්නවා. ඉක්මණින් කථාව අවසන් කරන්න.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
සංඛ්‍යා ලේඛන වැඩි වුණාම ශබ්දයත් වැඩියි.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
Order, please ! තව කොපමණ වේලාවක් ගන්නවාද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
විනාඩි හතක් ගන්නවා.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
ඉක්මන් කරන්න ඕනෑ. ඇමතිතුමා 2.45 ට කථා කරන්න පටන් ගන්නවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
ගරු සභාපතිතුමනි, ඇමතිතුමාට වගේම තමයි විපක්ෂයටත්.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**
අපි බොහොම වේලාවක් දී තිබෙනවා. තව විනාඩි 5 කින් අවසන් කරන්න ඕනෑ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**
ගරු සභාපතිතුමනි, මා විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. නිදහස් සමරු දිනයේදී ජාතික වීරවරයින්ව සමරන්න රචනා ලියන්නය කියා කොළඹ දිසාපතිවරයා විසින් ඉස්කෝලවලට යවන ලද ජාතික වීරවරයන්ගේ නම් ලැයිස්තුවක් මා ළඟ තිබෙනවා. වීර චරිත ලැයිස්තුවක්. ඒ ජාතික වීර නම් ලැයිස්තුවේ 173 දෙනෙකුගේ නම් තිබෙනවා. [බාධා කිරීමක්] මේ ලැයිස්තුව ඉස්කෝලවලට යවලා තිබෙනවා, මේ වීර චරිත සමරන්න රචනා ලියන්නය කියා. මෙය හරිම පුදුම ලැයිස්තුවක්. මේකෙ සෝල්බරිසාමිවරයාගේ නමත් තිබෙනවා. එතුමා මොන මට්ටමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

ජාතික වීරවරයෙක්ද කියා මම අහනවා. ඒ වාගේම මෙහි තිබෙනවා, මද්දුම බණ්ඩාර මහතා, මඩුගල්ලේ මහතා, පිළිමතලාවේ මහතා කියා. පුදුමාකාර ජාතික වීරවරයින්ගේ නම් සඳහන් කිරීමක් මෙහි තිබෙනවා. ළමයින් සම්පූර්ණයෙන්ම නොමඟ යවන එකක්. නොම්මර 68ට තිබෙනවා සර් ෆ්‍රැන්සිස් මහතා කියා. සර් ෆ්‍රැන්සිස් මහතා කොයේ හිටපු ජාතික වීරවරයෙක්ද ?

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

ඔක මුද්‍රණය කරවා තිබෙන්නේ දිසාපති නම් ඒක දිසාපතිගෙන් අහන්න එපායැ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මේ ලැයිස්තුව හැදුවේ කවුද කියා තමුන්නාන්සේලා බලන්න. පෙබරවාරි 4 වැනි ද රචනා ලියැවීමට පාසල්වලට යැවූ ජාතික වීරවරයින්ගේ ලැයිස්තුවයි මේ. මෙහි නම් 173ක් තිබෙනවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

ඔක තමුන්නාන්සේලාගේ පක්ෂයේ නිලධාරියෙක් කළ වැඩක් වගෙයි.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මෙවැනි දේවල් පාසල්වලට යවන්නට කලින් තමුන්නාන්සේලා පොඩ්ඩක් බලන්න ඕනෑ. මේ අය මහතාද වීරවරයාද කියාවත් ටිකක් කල්පනා කර බලන්න ඕනෑ. මීදෙනියෙ අදිකාරම් මහතා කියාත් තිබෙනවා. මෙහි මහත්වරු ගොඩක් ඉන්නවා.

සර් රිචඩ් ෆ්‍රැන්සිස් මෝර්ගන් මහතා, ආචාර්ය ඩේවිඩ් රොක්වුඩ් මහතා, ආචාර්ය කර්බි ගෝමස් මහතා, සර් ජෝන් ඇන්ඩර්සන් කියාත් කෙනෙක් සිටිනවා. මේ ගැන නැවතත් සලකා බලන්නය කියා මම කියනවා. ස්කෝලවල ළමයින්ට මෙය දුන්නොත් ඒ ළමයින්ටත් ජාතික වීරවරයින් තෝරා ගන්නට බැරි වෙනවා. ෆ්‍රැන්සිස් මහතා කිව්වාම කවුද කියා කොහොමද දන්නේ ? හැම තැනම ෆ්‍රැන්සිස් මහත්වරු සිටිනවානේ.

ගරු සභාපතිතුමනි, මම තවත් කරුණක් සඳහන් කරන්නට ඕනෑ. විභාග දෙපාර්තමේන්තුවේ උත්තර පත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම ගැන. උත්තර පත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සිදු වන්නේ කොහොමද ? පරීක්ෂකවරුන් වශයෙන් ඉල්ලන අය පුරවා එවිය යුතු ආකෘති පත්‍රයේ 16 වැනි ඡේදය කියා එකක් තිබෙනවා. ඒක අහන්නේ පාසලේ විදුහල්පතිවරාගෙන්. උත්තර පත්‍ර පරීක්ෂකවරු තෝරා ගන්නා විට ඒ සඳහා ලකුණු ක්‍රමයක් තිබෙනවාලු. නමුත් ලකුණු ක්‍රමය පැත්තකට දමා විදුහල්පතිගේ නිර්දේශය ඉල්ලනවා. ඒ අනුව විදුහල්පති යම් ගුරුවරයෙකුට අකමැති නම් ඔහු කොතරම් ජ්‍යෙෂ්ඨ වුණත්, ඔහුට කොතරම් ලකුණු තිබුණත් ඔහු කපාහරිනවා. ඒ නිසා මේ ක්‍රමය ගැන විභාග කොමසාරිස්ගේ අවධානය යොමු කරන්නට ඕනෑ. මේ ගැන පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න ඕනෑ.

එමෙන්ම තවත් ප්‍රශ්නයක් තිබෙනවා, ගුරු වැටුප් චෙක්පත්වලින් දීම ගැන. මෙයට හේතු වුණේ පසුගිය කාලයේ වැටුප් අරගෙන යන විට විදුහල්පතිවරු කීප දෙනෙකුගෙන් මුදල් මල්ල උදුරා ගැනීමයි. නමුත් මෙසේ චෙක්පත්වලින් ගුරු වැටුප් ගෙවීම නිසා සිදු වන්නේ මොකක්ද ? ගුරුවරුන්ගේ ගිණුම්වලට බැර කිරීම සඳහා චෙක්පත් ලිවීමේ ක්‍රමයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ නැහැ. වෙනත් සේවකයින්ට නම් කෙලින්ම ඒ අයගේ ගිණුමට බැර කිරීම සඳහා චෙක්පත් ලියන්නට පුළුවන්. මෙහිදී එවැන්නක් කරන්නටත් බැහැ. ගිණුම් ආරම්භ කළත් අමාත්‍යාංශය ඒ වගකීම ගන්නේ නැහැ. ඒ නිසා මේ ගුරුවරුන්ට තමන්ගේ පඩිය මාරු කර ගන්නට ගියාම කොමිෂන්කාරයින්ට ගණනක් දෙන්නට සිදු වෙනවා. සමහරවිට පඩිය රු. 1000ක් තිබෙනවා නම් කොමිෂන් ගාස්තු ගෙවීමට සිදුවීම නිසා රු. 35ක් හෝ 40ක් ඔහුට නැති වෙනවා. ඒ නිසා චෙක්පත්වලින් ගුරු වැටුප් ගෙවීම ගැන යළිත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා නම් හොඳයි.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ ඉල්ලීම උඩ මම මීට වඩා කථා කරන්නේ නැහැ. නමුත් අවසාන වශයෙන් තවත් එක කරුණක් කියන්නට ඕනෑ. ගරු අධ්‍යාපන ඇමතිතුමා දේශපාලන බේදයෙන් තොරව ගුරු පත්වීම් පිළිබඳව ස්ථාපිත සේවයක් ඇති කර තිබෙනවා. නමුත් මා ළඟ තිබෙනවා ලැයිස්තුවක්. සමහර ආසනවල මන්ත්‍රීවරු එහි නම් කපලා තිබෙනවා. මේ තිබෙනවා මා ළඟ ඒ ලැයිස්තුව. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

Order, please !

දැන් කතාව අවසන් කරන්නයි හදන්නේ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

කතාව අවසන් කරනවා. කලබල වෙන්න එපා. මම මේ ලැයිස්තුව දෙන්නම්. [බාධා කිරීම්] තමුන්නාන්සේගෙ එකේ නැහැ. කලබල වෙන්න ඕන නැහැ. එහෙම කපපු නැත් තිබෙනවා.

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

කිසිම කලබලයක් නැහැ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ප්‍රතිපත්තියක් නම් මුළු රටටම එකක් විය යුතුයි. තාත්තා ශ්‍රී ලංකා, බාප්පා ජේ. වී. පී., මාමා සමසමාජ කියා නම් කපනවා නම්—

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

තමුන්නාසේලාගෙ කාලෙ කැපුවෙම නැහැ !

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

එහෙම නම් ඒක පැහැදිලිව කියන්න තිබුණා. පැහැදිලිව කියනවා නම් අපි දේශපාලන පක්ෂ භේදයෙන් තොරව පත්වීම් දෙනවාය කියා ලැයිස්තුවේ කිසිම නමක් කපන්න බැහැ. එහෙම කපනවා නම් පක්ෂ භේදය උඩයි කපන්නේ.

**රේනුකා හේරත් මහත්මිය**
**(திருமதி ரேணுகா ஹேரத்)**
**(Mrs. Renuka Herath)**

දේශපාලන භේදවලින් තොරව පත්වීම් දීලා නැද්ද ? [බාධා කිරීම්]

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

මූලාසනයට කතා කරන්න.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මේක ගැන විසඳුමක් දෙන්න ඕන නේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
ඒ අයත් එක්ක කතා කරන්න එපා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒ නිසා මම අහන්නේ ගුරු පත්වීම් දෙන්නේ පක්ෂ භේදය උඩද ? ඇමතිතුමා කියනවා නැහැ කියා. එතුමා කියනවා පක්ෂ භේදයක් සලකන්නේ නැහැ, සුදුසුකම් උඩයි දෙන්නේ කියා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ඉස්සර දුන්නේ කොහොමද ?

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඉස්සර–පස්සෙ ප්‍රශ්නක් නැහැ. තමුන්නාන්සේ ඊට වඩා ශ්‍රේෂ්ඨ වෙලාය කියලා නොවැ දැන් තියෙන්නේ. එහෙම නම්, මේ නම් කපපු ලැයිස්තුව මම දෙන්නම්. [බාධා කිරීම්] පක්ෂ භේදයෙන් තොරව මේ ලැයිස්තුවේ ඉන්න අය ගැන සලකන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේගේ ලැයිස්තුව ඉඩම් උදුරාගන්න ලැයිස්තුවනේ. අපි වාඩි වෙනවා.

ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා (මොණරාගල)
(திரு. ஆர். எம். புஞ்சி பண்டார — மொனறாகலை)
(Mr. R. M. Punchi Bandara - Moneragala)
ගරු සභාපතිතුමනි, වැදගත් අමාත්‍යාංශයක් යටතේ, බද්දේගම ගරු මන්ත්‍රීතුමාට පසුව (අමරසිරි දොඩන්ගොඩ මහතා) මට කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒක ලොකු වාසනාවක්.

ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා
(திரு. ஆர். எம். புஞ்சி பண்டார)
(Mr. R. M. Punchi Bandara)
ඒක ලොකු වාසනාවක් කියා එතුමා කියනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කතා කිරීමට කලින් මම අහන්න කැමතියි එතුමා සඳහන් කළ ඉඩම් උදුරා ගැනීම ගැන. මම නම් දන්නේ නැහැ එතුමාගේ ඉඩමක්—

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
අදාළ නැහැ.

ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා
(திரு. ஆர். எம். புஞ்சி பண்டார)
(Mr. R. M. Punchi Bandara)
අදාළ නැත්නම් ඒක ඉල්ලා අස්කර ගන්න.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒ අර සීනි සමාගමේ ප්‍රශ්නය.

ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා
(திரு. ஆர். எம். புஞ்சி பண்டார)
(Mr. R. M. Punchi Bandara)
අපි ඉඩම් අමාත්‍යාංශය යටතේ කතා කරනකොට තමුන්නාන්සේ එහේ ගිහිල්ලා කරපු වැඩ ටික ගැන කියන්න අපි බලාපොරොත්තු වෙනවා. දැන් මම අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණුවලට අදාළව කතා කරනවා.

විශේෂයෙන්ම මොනරාගල ආසනයට අදාළ කරුණු ගැනයි මම කතා කරන්නට බලාපොරොත්තු වන්නේ. මම පළමුවෙන්ම අධ්‍යාපන සේවා ඇමතිතුමාට ස්තුති කරනවා. අපේ දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් පාසල් උපකරණ හිඟයක් තිබුණා. ඒ සම්බන්ධයෙන් එතුමා ඉතා සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළා. ඒ නිසා පසුගිය අවුරුද්ද වනවිට උපකරණ හිඟයක් නැතිව පාසල් වැඩකටයුතු කරගෙන යාමට අපට පුළුවන්කම ලැබුණා. මම අගය කරනවා එවැනි වැඩපිළිවෙලක් දියත් කිරීම.

අ. භා. 2. 15

නිදහස් අධ්‍යාපන ක්‍රමය අංග සම්පූර්ණ වුවාට පසුව පාසල්වල ළමයින්ගේ පැමිණීම ඉතාමත්ම වැඩි වුණා. මේ හේතුව නිසා යළිත් සෑම පාසලකම උපකරණ හිඟක් ඇති වී තිබෙනවා. ඒ උපකරණ හිඟයටත් පිළියමක් යෙදීමට ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාට වාසනාව හා ශක්තිය ලැබේවා කියා මම ප්‍රාර්ථනය කරනවා.

මොනරාගල දිස්ත්‍රික්කයේ පාසල් ගොඩනැගිලි හිඟය නැති කිරීම සඳහා විමධ්‍යගත අයවැයෙන් ලක්ෂ පනහක් වැය කළා. නමුත් මොන විධියෙන්වත් ඒ ගොඩනැගිලි හිඟ තත්ත්වය වලක්වන්න පුළුවන්කමක් නැහැ. එක ආසනයක වර්ෂයකට පාසල් ගොඩනැගිලි 25ක් හැදුවත් ප්‍රමාණවත් වන්නේ නැහැ. 1977 සිට 1985 දක්වා සෑම වර්ෂයකම රුපියල් දශ ලක්ෂයක් පමණ වෙන් කරනවා, මගේ ආසනයේ අධ්‍යාපන කටයුතු සඳහා. නමුත් කොපමණ මුදලක් වෙන්කර පාසල් ගොඩනැගිලි තැනුවත්, 1977 වර්ෂයේ සිටම පැවති ගොඩනැගිලි හිඟය තවමත් අපට බලපාන නිසා අද අපට පුළුවන්කමක් ලැබී නැහැ, සාර්ථකව මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න. එනිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අධ්‍යාපනයට අමතරව සෞඛ්‍යය, මංමාවත්, පාලම්, බෝක්කු වැනි සියලුදේම කරන්න වෙලා තිබෙන්නෙ මේ විමධ්‍යගත මුදලින්. නමුත් අධ්‍යාපන කටයුතු කිරීමටවත් ඒ මුදල් ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. එනිසා අධ්‍යාපන සේවා අමාත්‍යාංශයෙන්, විශේෂයෙන්ම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ලබාදීමට කටයුතු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

මා දන්නා තරමට අළුතෙන් ගොඩනැගිලි ඉදිකරන්න ගත වූ අවුරුදු කිහිපය තුළම මුදල් ලැබුණේ නැහැ. භාණ්ඩාගාරයෙන් ඒ සඳහා මුදල් වෙන් වුණේ නැතැයි කියන එකයි ගරු ඇමතිතුමාත් සමග සාකච්ඡා කරනවිට මට දැනගන්නට ලැබුණේ. එම නිසා ගරු මුදල් ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා, ඒ සම්බන්ධව. අපි සංවර්ධනයක් ඇති කරන්නේ අනාගත පරම්පරාව සඳහායි. එහෙම නම් අනාගත පරම්පරාවේ ශුභසිද්ධිය සඳහා කටයුතු කරන මේ රජය දරුවන්ට අව්වට වේලෙන්නේ නැතුව, වැස්සට තෙමෙන්නේ නැතුව ඉගෙනගන්න පාසල් ලබා දෙන්නට ඕනැ. ගොඩනැගිලි ලබාදීම අත්‍යවශ්‍ය බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට ඕනැ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනැ දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලබාගත් උදවිය ගැන. සමහර උදවිය පත්වීම ලබාගත්තා ; ගිහින් අත්සන් කළා. නමුත් ඔවුන් ඉගැන්වීමට මේ පාසල්වලට ගිහින් නැහැ. [බාධා කිරීමක්]. ඒ ඒ ප්‍රදේශවල සුදුසුකම් ලබා ඇති, තරග විභාගවලට පෙනී සිටි අය පත් කරනවා නම් මේ තත්ත්වය උද වෙන්නේ නැහැ.

ඉංග්‍රීසි අධ්‍යාපනය අනිවාර්ය කර තිබෙනවා. එසේ අනිවාර්ය කරනවාත් සමගම ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ගුරුවරුන් පත් කිරීමේදී අසමාන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියන එකට මම ගරු බද්දේගම මන්ත්‍රීතුමාත් (අමරසිරි දොඩන්ගොඩ මහතා) සමග එකඟ වෙනවා. ඒ තත්ත්වය නිසාම ඉදිරියේදී අපේ ප්‍රදේශවල ඉගෙන ගන්නා දරුවන්ට කියිම විධියකින් මේ රටේ අධ්‍යාපනය ලබන අනික් ප්‍රදේශවල දරුවන් සමග තරගයකට ඉදිරිපත් වෙන්නට බැරිකමක් ඇති වෙනවා. එම නිසා විශේෂ අවධානය යොමු වෙන්නට ඕනැ, අධ්‍යාපන ඇමතිතුමාගේත්, ඒ වාගේම අධ්‍යාපන සේවා කමිටුවේත්. ඒ අයටත් සමාන අවස්ථා ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. පුංචිබණ්ඩාර මහතා]

දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ බඳවා ගනු ලැබූ ගුරු මහත්ම මහත්මීන් දැන් අවුරුදු තුන කොහොමහරි අවසන් කරලා සුදුසුකම් ලබා තිබෙනවා තමන්ගේ ගම් ප්‍රදේශවලට එන්නට. ඒ නිසා මොන මාර්ගයෙන් හරි, කාගේ පස්සෙන් ගිහිල්ලා හරි, කවුරු ලවා හරි, ඒ කටයුත්ත ඒ අය කරගන්නවා. එවිට අපේ ප්‍රදේශවල විශාල ගුරු හිඟයක් ඇති වෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි, 1984 අවුරුද්දෙ තරග විභාගයකට පෙනී සිටි, සුදුසුකම් ලැබූ ඒ ප්‍රදේශයේ ජීවත් වෙන අය මේ සේවයට බඳවා ගැනීමට කඩිනම් පියවරක් ගන්නය කියා.

මොන හේතුවක් නිසා වුණත් දිස්ත්‍රික් ක්‍රමය යටතේ ගුරු පත්වීම් දුන් විට තම ප්‍රදේශයෙන් පිටට ඒ ගුරු පත්වීම් ලබාගෙන යන ඒ ගුරු මහත්ම මහත්මීන්ට සමහර වෙලාවට තමන්ගේ ආහාර වේල ලබාගන්න පවා තැනක් නැහැ. තමන්ගේ ආහාර වේල ගන්න පවා ස්ථානයක් සොයාගන්න බැරි තැන් තිබෙනවා. ඒ අයට පහසුකම් නැහැ ; ගුරු නිවාස නැහැ. නමුත් රැකියාවක් ඕනෑකම නිසා ගිහිල්ලා පත්වීම භාරගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම රජයේ නීතිරීති මොනවා වුණත් සමහර තැන්වල මුළු සතියම පැමිණීමේ ලේඛන අත්සන් කර නැහැ. නමුත් සතියේ එක දවසක් ගියාම සියලුම දේ අත්සන් වෙනවා. මෙවැනි තත්ත්වයකයි ඉගැන්වීම තිබෙන්නේ. සංඛ්‍යා ලේඛන අනුව ගුරුවරු 10 ක් පාසලක වැඩට යෙදුවත්, ඒ ගණන සංඛ්‍යා ලේඛනවලට පමණක් සීමා වෙලා තිබෙනවා. නියම රාජකාරිය ඒවායේ කෙරෙන්නේ නැහැ. එනිසා අධ්‍යාපන සේවා කමිටුවේත්, ඒ වාගේම ගරු ඇමතිතුමාගේත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් විශේෂ අවධානය යොමුවෙන්නට ඕනෑ මේ වාගේ ප්‍රදේශවල පවතින තත්ත්වය ගැන.

තවදුරටත් කරුණු පැහැදිලි කරන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මේ රටේ ජීවත් වන අහිංසක දරු දැරියන් සමග මොනරාගල වාගේ දුෂ්කර ප්‍රදේශයක ජීවත් වන දරුවන්ටත් තරගකාරීව කටයුතු කරන්න අවස්ථාව සැලසෙන සමාන අධ්‍යාපනයක් ලබාදෙන තත්ත්වයක් ඇති කරන්නට ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, ඒ වාගේම අධ්‍යාපන සේවා ඇමතිතුමාටත් වාසනාව හා ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹறகம)
(Mr. Dinesh Gunawardene - Maharagama)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු කීපයක් මම ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ මොකද ? අපේ රටේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිසංස්කරණ කීපයක් ඉෂ්ට කර තිබෙනවා. නමුත් ඒ ප්‍රතිසංස්කරණවලින් පසුවත් ප්‍රධාන වශයෙන් අපේ අධ්‍යාපන ක්‍රමය දැනුම බිහි කරන්නේ එකම වැඩපිළිවෙළක සීමාවන් තුළයි කියන එකයි අපට අද මතු වන ප්‍රශ්නය. ඒ කියන්නේ අපේ රටේ මිනිස් බල වුවමනාතාවත්, අපි අධ්‍යාපන ක්‍රමයට සරිලන ආකාරයෙන් බිහි කරන දැනුමත් අතර විශාල අසමානතා පවතිනවා.

මම හිතන්නෙ මේ පිළිබඳව විවිධ විශේෂඥ වාර්තා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් අපේ අධ්‍යාපන ක්‍රමයේ ඉහළ මට්ටම් සියල්ලෙන්ම බිහිවන අය යොමු කර තිබෙන්නේ සේවා රැකියා සඳහායි.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අධ්‍යාපන රටාවේ අප මුහුණ දෙන අසමානතාවන් පිළිබඳ ප්‍රශ්නය ගැනයි මම කරුණු පැහැදිලි කරන්නේ. ඒ කියන්නේ සේවා රැකියා ඉලක්කය කරගත් දැනුමක් බිහි කිරීමක නමයි අපි යෙදී සිටින්නෙ. මේක අධ්‍යාපන ඇමතිතුමාගේම ප්‍රශ්නයක් නොවෙයි. සමස්ත ආර්ථිකයේම ප්‍රශ්නයක්. මොකද, සේවා ක්ෂේත්‍රයේ රැකියා සොයන අර්බුදය අපේ සමාජය ප්‍රමුඛතාවෙන් පිළිගන්නේ කුමන සමාජ මට්ටම්ද කියන ප්‍රශ්නය උඩ මතුවී තිබෙන ගැටළුවක්.

අපේ රටේ ගම්බද හා නාගරික අඩු ආදායම් ලබන්නන් විශාල සංඛ්‍යාවකගේ දරුවන්ට අධ්‍යාපනයේ ඉහළ මට්ටමට යාමට නොහැකි වීම නිසා ඒ අය විශාල මානසික අර්බුදයකට යොමු වෙනවාය කියා අපි කියන්න ඕනෑ. එහෙම නැත්නම් මේක දරිද්‍රතාව ඉංග්‍රීසියෙන් කියනවා secondary poverty කියා — හේතුකොටගෙන ඇති වන මානසික අර්බුදයක්. බලාපොරොත්තු වන රක්ෂාවට යන්න බැහැ. යම්කිසි සහතිකයක් කරා යොමු වුණු අධ්‍යාපන ක්‍රමයෙන් බිහිවුණ අය සඳහා වෙනත් ක්ෂේත්‍රවල දියුණු වීමක් මේ ආර්ථිකය තුළ නැහැ.

නිෂ්පාදන ක්ෂේත්‍රය තුළට යොමු වන කොටස සඳහා වූ විශේෂත්වය අප බලාපොරොත්තු වුණ ආකාරයට සෑම යුගයකම දියුණුවී නැහැ. මේ යුගයේ පමණක් නොවෙයි සෑම යුගයකදීම අධ්‍යාපන රටාව ඒ ආකාරයෙන් යොමු වුණේ නැහැ. ඒ නිසා අප මුහුණ දෙන ප්‍රශ්නය අධ්‍යාපන ක්‍රමයේ විෂයමාලා සංශෝධන තුළින් පමණක්ම කරන්න බැහැ. අපේ සමස්ත ආර්ථික රටාවේ සකැසුමත් සමග අධ්‍යාපන රටාවේත් සකැසුමත් ඕනෑය කියන එකයි මම කෙටියෙන් කියන්නෙ. ඒ ප්‍රශ්නය ගැන මම මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්නේ නැහැ. මම හිතන්නෙ අධ්‍යාපන ඇමතිතුමාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනික් සියලු දෙනාමත් මේ ප්‍රශ්නය තේරුම් ගන්නවා ඇති.

ගම්බද දරුවන් විශාල ලෙස අද මේ අර්බුදයට මුහුණ දෙනවා. අනික් අතට නාගරික ප්‍රදේශවල අඩු ආදායම් ලබන්නන්ගේ දරුවන් අධ්‍යාපනය කර ගෙන යාමෙන් ඉහළ තත්ත්වයන් තුළට යාමට නොහැකි තත්ත්වයකට මුහුණ දෙමින් සිටිනවා. මේකත් ලොකු අර්බුදයක්. මොකද, අපේ රට වැනි රටක මූලික අධ්‍යාපනය ලබා නොමැති සංඛ්‍යාව අරගෙන බැලුවොත් එය සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයක්. අනුපාතිකව විශාල ප්‍රමාණයක් නොවෙයි. නමුත් සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයක්. මෙය සම්පූර්ණයෙන්ම ඉවත් කර ගැනීමේ සංග්‍රාමයක යෙදෙන්නට ඕනෑය කියන එකයි මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්නේ. අපේ රටේ අධ්‍යාපනික තත්ත්වවල පහසුකම් ප්‍රයෝජනයට ගෙන නොදැනුවත්කම සම්පූර්ණයෙන්ම අතුගා දැමීම සඳහා අපි යම්කිසි උත්සාහයක යෙදෙන්නට ඕනෑ. අඩු වශයෙන් මූලික දැනුම සියලු දෙනාටම ලබා දීම සඳහා අපේ අධ්‍යාපන රටාවත් අධ්‍යාපන රටාවට සම්බන්ධිත ආයතනත් යොමු කරන්නට ඕනෑය කියන ප්‍රශ්නය මම ඇමතිතුමාගේ අවධානයට විශේෂයෙන් යොමු කරනවා.

අද වැනි යුගයකදී අපේ රට වැනි රටක අධ්‍යාපනයේ පසුබිම දෙස බලන විට අප විසින් සමාජය වෙත ඉෂ්ට කළයුතු උපරිම යුතුකමක් නොවෙයි සමාජයේ එවැනි කොටසක් ඇති කිරීමෙන් අපි සිද්ධ කරන්නේ. ඊට අතිරේකව වර්තමාන අයවැය ලේඛනයත් සමග මතු වී තිබෙන ප්‍රශ්න ගැන බලන්න ඕනෑ. අධ්‍යාපන පහසුකම් පිළිබඳ ප්‍රශ්නය මතු වෙනවා. සෑම ක්ෂේත්‍රයකම දරුවන් මේ අවුරුද්ද තුළදී ලොකු අර්බුදයකට මුහුණ දෙනවා. පැන්සලේ, ඉරේසර් කෑල්ලේ සිට පොත්පත් ආදී සෑම දෙයකම මිල නගිනවා. මේවා තමන්ගේ දරුවන්ට ලබා දෙන්නට බැරි දෙමව්පියන්ගේ සංඛ්‍යාව විශාල කොටසක් බව කවුරුත් පිළිගන්නට ඕනෑ. මේ මේවායේ මිල අඩු කිරීම සඳහා විශාල පියවරක් ගන්නට වෙනවා.එසේ නැත්නම් අධ්‍යාපනයේ අපේ ඉලක්කවල ඉහළ මට්ටම්වලට ආ එක ගැන කථා කිරීමේ අර්ථයක් නැහැ. අඩු ආදායම් ලබන්නන්ගේ දරුවන්ට මේ පහසුකම් නොමැති වීම නිසා බොහෝ විට පාසල්වලට එන්නට ඔවුන්ට ලැබෙන්නේ නැහැ. පැන්සලක්, කවකටු පෙට්ටියක්, ඉරේසර් කෑල්ලක් විතරක් නොවෙයි සපත්තු දෙකක් ගන්නත්— අඩුම මිල සපත්තු කුට්ටම අරගෙන බලන්න— ළමයින් හතර දෙනෙක් පාසල් යන පවුලක සපත්තු වලට යන වියදම අරගෙන බැලුවොත් මේක ඒ පවුලට ඔරොත්තු දෙන්නට පුළුවන් තත්ත්වයක්ද ? සාමාන්‍ය ගම්බද ජනතාවගේ දරුවන්ට කොහොමද මේවා ලබා දෙන්නේ ? මොකද, මේක අද ක්‍රමිකව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිවාර්ය වෙමින් පවතින දෙයක්. අපි මේවා පිළිගන්නට ඕනෑ. මේ ප්‍රශ්නයට මුහුණ දෙන යම්කිසි ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ බවයි, මම කියන්නේ. එසේ නොවුණොත් විශාල ප්‍රශ්න ගණනාවකට අපි මුහුණ දෙනවා.

මම බොහොම සන්තෝෂයි අද කර්මාන්ත ඇමතිතුමා මෙම ගරු සභාවේ හිටියා නම්. මොකද, එතුමාගේ කථාවේදී කිව්වා, " රෙදි මේ රටට නිදහසේ ගෙනෙන්නට ඉඩ දුන්නොත් රෙදි මිල බහිනවාය කියා. " මේක තමයි, අපේ කර්මාන්ත ඇමතිතුමාගේ මානසික තත්ත්වය. ඉදිරි කාලයේදී මේ දරුවන් මුහුණ දෙන රෙදි මිල අර්බුදයට විසඳුමක් වශයෙන් යම්කිසි ස්ථාවර මිළකට රෙදි ප්‍රමාණයක් හෝ සැපයීමට අපි පියවර ගතයුතුව තිබෙනවා. එසේ පියවර නොගත්තොත් මොකද වෙන්නේ ? රෙදි මිල නැග්ගාට පස්සේ අඩුම වශයෙන් රෙදි යාරයක් නැත්නම් රෙදි මීටරයක අවම මිල රු. 25ක් වෙනවා. එවිට එද සිට යම්කිසි පිරිමි දරුවෙකුට හෝ ගැහැණු දරුවෙකුට පාසල් යාමට ඇඳුමක් ලෑහැස්ති කර ගන්නට යන වියදම කීයක් වේදැයි අපි කල්පනා කර බලන්නට ඕනෑ. මේක ලොකු අර්බුදයක්.

දුම්රිය ප්‍රවේශ පත්‍ර ගාස්තු වැඩි විමකුත් නිර්දේශ කර තිබෙනවා. මේ තත්ත්වයට කොච්චර දුරට මුහුණ දෙන්නට අපට පුළුවන්ද ? මේ ප්‍රශ්නය මම හිතන්නේ චක්‍රාකාරයෙන් පාසල්වල උසස් අධ්‍යාපනයට සහභාගි වන ප්‍රමාණය තීන්දු කිරීමේ ප්‍රශ්නයකට තුඩුදෙන බව අද හොයා ගෙන තිබෙන සමීක්ෂණවලින් හෙළිදරව් වෙනවා. එම නිසා මෙම අයවැය ලේඛනයෙන් වෙන් කරලා නැති වුණත්, දිස්ත්‍රික් අමාත්‍යාංශය තුළින් හෝ විමධ්‍යගත අයවැය තුළින් හෝ යම්කිසි ස්ථාවර සැලැස්මක් ඇති කිරීම අනිවාර්ය යුතුකමක් වෙනවා. එය අනිවාර්යයෙන්ම ඇතිවන්න යන ප්‍රශ්නයක් ලෙස පිළිගෙන අධ්‍යාපන ඇමතිතුමා ඒකට මැදිහත් වන්න ඕනෑ.

අ. භා. 2.30

ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කෙරෙන්න ඕනෑ තවත් ප්‍රශ්නයක් තමයි, කොළඹ දිස්ත්‍රික්කය පොදුවේ මුහුණ දෙන ගොඩනැගිලි ප්‍රශ්නය. මම නියෝජනය කරන මහරගම ආසනය වගේ කොළඹ දිස්ත්‍රික්කයේ තදසන්න ආසන සියල්ලක්ම මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි, වැඩි වන ජනගහණයේ වේගය අනුව ගොඩනැගිලි ඉදි කර දීමට අපේ විමධ්‍යගත අයවැය අරමුදල්වලට හැකියාවක් නොමැතිවීම. මේක අධ්‍යාපන ආයතනවලට බලපානවා. ඒ නිසා ඒ ගැන විශේෂ උත්සාහයක් දරන්න දැන් කාලය ඇවිත් තිබෙනවා. ආයතනිකව තිබෙන මේ සේවා අඩුපාඩුකම්— විද්‍යාගාර, පුටු-මේස ආදිය අඩුපාඩුකම්—එන්න එන්නම වැඩි වෙමින් පවතිනවා. ඒ නිසා ගම්බද අධ්‍යාපන ආයතන රටේ ජාතික අධ්‍යාපන ආයතනවලට අවශ්‍ය මට්ටමට ගෙන ඒමත්, නාගරිකවම ඉහළ පාසල් සහ පහළ පාසල් අතර තිබෙන පරතරය තේරුම් ගෙන එයට විසඳුමක් සෙවීමත් අනිවාර්යයෙන්ම කළ යුතුයි.

මම මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ, වෙලාව පිළිබඳ ප්‍රශ්නය නිසා. නමුත් මම හිතනවා, ගරු ඇමතිතුමා මේ කාරණය පිළිගෙන ඒ ප්‍රශ්නයට යම්කිසි විසඳුමක් යොදයි කියා. අඩුම වශයෙන් විසඳුමක් සෙවීම සඳහා උත්සාහයකවත් යෙදෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ මොකද කිවොත් නිලධාරීන් තුළින් පමණක් මෙය විසඳන්න බැරි නිසයි. කොටින්ම කියනවා නම් අධ්‍යාපන සේවා අමාත්‍යාංශය මඟින් දැනට දරන උත්සාහය තුළින් පමණක්ම මේ ප්‍රශ්නය විසඳන්න හැකියාවක් නැහැ. ඒ නිසා ඊට වඩා වෙනස් ආකාරයේ මූල්‍යමය සහයෝගයක් ඊට අවශ්‍ය වී තිබෙනවා.

ඊළඟට, පහේ ශිෂ්‍යත්ව ප්‍රශ්නය සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන්න කැමැතියි. මම කියන්නේ නැහැ, අනෙක් අයට අසාධාරණයක් කරන්නය කියා. මේ පහේ ශිෂ්‍යත්වය පැවැත්වීමේ ඉලක්කය කර ගත්තේ දුප්පත් අයගේ දරුවනුයි. නමුත් අද පහේ ශිෂ්‍යත්ව තරගයට ඉදිරිපත් වන්න සුදුසුකම් ලබන්නන් අතර සිටින්නේ ඒ කණ්ඩායම පමණක් නොවෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් යම්කිසි වෙනසක්—තීරණාත්මක වෙනසක්—කරන්න සිද්ධ වෙනවා. ඒ අතර උසස් පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා වෙනම විභාග පැවැත්වෙනවා. ඒවා ඒ ඒ පාසල් විසින්ම වෙනම පවත්වනු ලබන විභාග. ඒ නිසා ඒ උසස් පාසල් සඳහා ඒ පාසල් විසින්ම පැවැත්වෙන විභාගවලට පොදුවේ නාටත් ඉදිරිපත් වන්න පුළුවන් ක්‍රමයකුත්, නිශ්චිත වශයෙන් පහළ ආදායම් ලබන්නන්ගේ දරුවන් සඳහාම ඇති කළ ශිෂ්‍යත්ව විභාගය ඒ අයට පමණක් සීමා කරන්නත් පුළුවන්ද කියන කාරණය ගැනත් සොයා බලන ලෙස මම විශේෂයෙන් ඉල්ලන්න කැමැතියි. ඒ මොකද කිවොත් පහේ ශිෂ්‍යත්ව ක්‍රමය ඇති කළේ ඒ දුප්පත් දරුවන් සඳහාම නිසයි.

කොළඹ දිස්ත්‍රික්කයේ එක පාසලකින් ඉවත් වී වෙනත් පාසලකට යෑමට දරුවන්ට තිබුණ අයිතිය එක්තරා චක්‍රලේඛයක් මඟින් දැනට අත්හිටුවා තිබෙනවා. මම හිතන්නේ, මෙය මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක්ය කියායි. ඒ නිසා, එක පාසලකින් ඉවත් වී තවත් පාසලකට යන්න දරුවකුට හෝ, එසේ සිය දරුවා යවන්න ඒ දරුවන්ගේ දෙමාපියන්ට හෝ තිබුණු අවස්ථාව අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ තීන්දුවකට යටත් කර තබා ගැනීම සාධාරණ නැහැ. ඒ නිසා ඒ චක්‍රලේඛයට අදාළ ප්‍රශ්නය ගැනත් යම් පියවරක් ගන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මම හිතන හැටියට අධ්‍යාපන සේවා ඇමතිතුමාත් දන්නවා, අධ්‍යාපනයට අවශ්‍ය පොත්පත් මුද්‍රණ කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුද්‍රණ සංස්ථාව සිය හැකියාවෙන්, ධාරිතාවෙන් සියයට 50 ක්වත් ප්‍රයෝජනයට ගන්නේ නැති බව. මේ කටයුත්ත සඳහා නිරත වන්න ජපන් රටේ විශේෂ ආධාරයක් යටතේ රාජ්‍ය මුද්‍රණ සංස්ථාවට අලුත් යන්ත්‍ර සූත්‍ර ලැබුණා. නමුත් අද රාජ්‍ය මුද්‍රණ සංස්ථාවට මුද්‍රණය සඳහා ලැබෙන පොත් පත් ප්‍රමාණය සීමාසහිතයි. මම දන්නේ නැහැ, ඊට හේතුව ඒ ආයතනයේ මිල ගණන් පිළිබඳ වෙනසක්ද කියා. සමහර විට හැකියාව පිළිබඳ ප්‍රශ්න වෙන්න පුළුවන්. ඒ නිසා බොහෝ පොත්පත් පෞද්ගලික අංශයට භාර දෙනවා. නමුත් යම්කිසි වැඩපිළිවෙළක් යටතේ වර්ෂයකට හෝ වර්ෂ දෙකකට රජයේ මුද්‍රණ සංස්ථාවත් සමග ගිවිසුමක් ඇති කර ගන්නට, එහි උපරිම ධාරිතාවය පාවිච්චි කරන්න පුළුවන් විධියට රජයේ මුද්‍රණ සංස්ථාවත් සමග ගිවිසුමකට එන්නට, ගරු ඇමතිතුමාට පුළුවන් නම් මේ ප්‍රශ්නය හුඟක් දුරට විසඳා ගන්න පුළුවන් වේවිය කියා මා හිතනවා. ඒ වගේම අවුරුද්ද මුලදී මේ පොත්පත් ලැබෙන ප්‍රමාණයේ අඩුපාඩුකම් විශාල ලෙස තිබෙනවා. සමහර පංතිවලට අවුරුද්ද මුලදී මේ පොත් පත් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ශිෂ්‍යයින් බොහෝ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ තත්ත්වය නිවැරදි කිරීමට අධ්‍යාපන ප්‍රකාශන අංශයේ අවධානය යොමු කිරීම හා මැදිහත්වීම මේ අවස්ථාවේදී සුදුසුය කියා මා විශ්වාස කරනවා.

ඊළඟට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සෑම රජයේ සේවකයෙකුටම ස්ථාන මාරුවක් ලැබුණවිටදී තමන්ගේ දරුවන් කිට්ටු පාසලකට ඇතුළත් කර ගැනීමේ අවස්ථාව තිබුණා. නමුත් සමහර තැන්වල අද ඒ වරප්‍රසාදය නැතිකර දමා තිබෙනවා. මා හිතන්නේ එය අසාධාරණයක්. ගරු ඇමතිතුමාත් මමත් අධ්‍යාපනය ලැබූ රාජකීය විද්‍යාලය මෙම ගැටළුවට සීඝ්‍රයෙන් මුහුණ දී තිබෙනවා. එතැන ගුරුවරුන්ගේ දරුවන්ට —

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

මන්ත්‍රීතුමනි, එය වරප්‍රසාදයක් හැටියට නොවෙයි සලකන්නෙ. නමුත් පාසලක් දෙන්න පුළුවන්. නගරයට එන හැම දෙමව්පියන්ගේම ඉල්ලීම ඉහළම විද්‍යාලයක් වීමයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. එහෙම නැතුව පාසලක් දීම පිළිබඳව ප්‍රාදේශීය කාර්යාලවලට කිසිම ප්‍රශ්නයක් පැන නගින්නෙ නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එය වරප්‍රසාදයක් නොවෙයි කියා මම හිතනවා. නමුත් එය සම්ප්‍රදායක් හැටියට තිබුණු දෙයක්. එය ඉටු කරන්න බැරිකමක් නැහැ. වෙනත් අයගේ දරුවන් ඒ පාසල්වලට ඇතුළත් කරගන්නවා නම් ගුරුවරුන්ගේ දරුවන් කිට්ටුව තිබෙන එම පාසලට ඇතුළත් කරගන්නට විශේෂ තහංචියක් දමන්නෙ ඇයිද කියන ප්‍රශ්නයයි අපි අහන්නෙ. රට පුරා ඇති පාසල් කීපයක තිබෙන තත්ත්වයක් මේ. ගුරුවරුන්ට තමන්ගේ දරුවන් කිට්ටුම පාසල්වලට ඇතුළත් කර ගැනීමේ ඕනෑකම තිබෙනවා. එයට අවස්ථාව සලසා දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා.

**රනිල් වික්‍රමසිංහ මහතා**
**(திரு. ரணில் விக்கிரமசிங்ஹ)**
**(Mr. Ranil Wickremasinghe)**

එහෙම සම්ප්‍රදායක් තිබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු ඇමතිතුමනි, එහෙම සම්ප්‍රදායක් තිබුණේ නැතිවුණත් මෙය ක්‍රියාත්මක වෙමින් ආව දෙයක්. එය සම්ප්‍රදායක් හැටියට මිස අයිතියක් හෝ වරප්‍රසාදයක් හැටියට තිබුණේ නැහැ. සම්ප්‍රදායානුකූලව එය කරගෙන ආවා. ළඟදී සිට — අවුරුදු කීපයක සිට — ඒ ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමට ඉඩ නොදෙන තත්ත්වයක් ඇතිවී තිබෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

බැහැ කියලම නැහැ. ඉඩ තිබෙනවා නම් දෙනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඉඩ තිබෙනවා නම් දෙන්න කියල තමයි අපිත් කියන්නෙ. ඉඩ තිබෙන නිසා තමයි, අද ඒ ප්‍රශ්නය මතුවී තිබෙන්නෙ. ඉඩ තිබෙන තැන්වල ගුරුවරුන්ගේ දරුවාට අවස්ථාව නොලැබුණත් වෙනත් අයගේ දරුවන්ට ඒ පාසල ලබාගන්නට පුළුවන්කමක් තිබෙනවා. එතැනදී අනිවාර්යයෙන්ම අසාධාරණයක් සිදුවෙන බවයි අපි කියන්නෙ. වෙන කෙනෙකුගේ දරුවන් විශේෂයෙන් ඇතුළත් කරගන්න පුළුවන්නම් ගුරුවරුන්ගේ දරුවන්ටත් ඒ අයිතිය දෙන්න කියලයි අපි කියන්නෙ.

ඒ වගේම අධ්‍යයන නිවාඩු පිළිබඳ ප්‍රශ්නය මම 1983දීත් මතු කළා. විශ්වවිද්‍යාලයට ඇතුළත් වී අධ්‍යාපන ඩිප්ලෝමාව හැදෑරීම සඳහා නිවාඩුදීම දැන් අවලංගු කර තිබෙනවා. ඒ කියන්නේ ඒ උපාධිය ලබාගැනීම සඳහා ඉදිරිපත් වෙන ගුරුවරුන්ට නිවාඩු නිර්දේශ කරන්නෙ නැහැ. මේ නිසා මම හිතන විධියට අද සිදුවී තිබෙන්නේ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පෞද්ගලික අංශයේ ගුරු සේවයේ යෙදී සිටින අය වෙතටම හැරවීමකුයි. පෞද්ගලික අංශයේ ගුරුවරුන්ටත් වැටුප් ගෙවන්නෙ රජයෙන් තමයි. නමුත් ඒ ආයතනවල සේවය කරන ගුරුවරුන්ට ඒ පාඨමාලාව හැදෑරීමට නිවාඩු දෙනවා. රජයේ ගුරුවරුන්ට ඒ අවස්ථාව දෙන්නෙ නැහැ. සති අන්තයේ සෙනසුරාද දවස්වලදී කොළඹ නගරය කිට්ටුව ඉන්න අයට පමණක් තමන්ගේ ඕනෑකමින් මේ පාඨමාලාව හදාරන්න පමණයි ඉඩ දී තිබෙන්නෙ. මම හිතන විධියට මෙය ඉතාම අසාධාරණයි. ඇමතිතුමා අධ්‍යාපන ආයතනයක් පිහිටුවනවයි කිව්ව නිසා මේ තිබුණු වරප්‍රසාදය සීමා කළා කියලයි මම හිතන්නෙ. නමුත් ඒ සඳහා තේරෙන අයට — සීමාසහිත ප්‍රමාණයක් පමණයි තේරෙන්නෙ — අවස්ථාවක් දෙන්න ඕනැ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන්, කොළඹ විශ්වවිද්‍යාලයෙන්, විශාල සංඛ්‍යාවක් මේ අධ්‍යාපන ක්‍රමය තුළින් ප්‍රයෝජන අරගෙන තිබෙනවා. ඒ අවස්ථාව තවදුරටත් ලබා දෙන්නය කියා මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඒ අතරම, වාණිජ විෂයයන් පිළිබඳව ඉදිරියේදී අධ්‍යාපන මට්ටමෙන් ගන්න යන තීරණය කුමක්ද ? දැනට වාණිජ විෂය කියන ක්ෂේත්‍රය දහවැනි ශ්‍රේණියෙන් ඉවත් කරන්නට අදහස් කර තිබෙන බවයි, අපට දැනගන්න ලැබී තිබෙන්නේ. අප රටේ ඉදිරි සංවර්ධනයේදී මේ ක්ෂේත්‍රය ඉතා වැදගත් වෙනවා. ඒ ක්ෂේත්‍රයට කුමක්ද කරන්න බලාපොරොත්තු වන්නේ ? ඒ ක්ෂේත්‍රයට සම්බන්ධිත විෂයයන් යොමු කරන්නට බලාපොරොත්තු වන්නේ කුමන අංශයකටද යන කාරණය දැනගන්න කැමතියි.

ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව මන්ත්‍රීවරුන් ගණනාවක් කරුණු කිව්වා. මම ඒ කරුණු නැවත කියන්න යන්නේ නැහැ. නමුත් ඉංග්‍රීසියෙන් විෂය කීපයක් උගන්වන්න මත්තෙන් අපේ පාසල්වල ඉංග්‍රීසි විෂයය හරියට උගන්වන්න පුළුවන් ගුරුවරුන් ප්‍රමාණය වැඩි කිරීමට අපි උත්සාහයක යෙදෙන්න ඕනැ. එසේ නැතිව හදිසියේම ඉංග්‍රීසියෙන් විෂය කීපයක් උගන්වන්නට යොමුවීම මම හිතන හැටියට ලොකු අවුලක් බවට පරිවර්තනය වන ප්‍රශ්නයක්. මම කියන්නේ ඉංග්‍රීසි උගැන්වීම අවශ්‍ය නැහැයි කියන එක නොවෙයි. අප රටේ පාසල්වල මවු භාෂාවෙන් සමත්වන අයගේ ප්‍රමාණය එන්න එන්නම පහළ වැටෙන බව විභාග දෙපාර්තමේන්තුවත් පිළිගන්නවා. 1984 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්තාව ගෙන කියවා බැලුවොත් පේනවා, තම මවු භාෂාවේ ප්‍රවීණත්වය ලැබීම පිළිබඳ විශාල ගැටළු රාශියකට ශිෂ්‍යයන් මුහුණ දී තිබෙන බව. මවු භාෂාවෙන් උගැන්වීම මේ තරම් දුරට ගැටළුවක් වී තිබෙන රටක ඉංග්‍රීසියෙන් ඊට වඩා දක්ෂ ලෙස ඉගෙන ගන්නට ශිෂ්‍යයන් යොමු කිරීමට දරන උත්සාහය මම හිතන හැටියට විශාල ප්‍රශ්නයකට ගොදුරු වෙනවා. ඒකට මූලික වැඩ සැලැස්ම සකස් කළේ නැත්නම්.

දයාරත්න වැටුප් කොමිෂම පිළිබඳව අධ්‍යාපන ඇමතිතුමාත් මුදල් ඇමතිතුමාත් කරුණු කිව්වා. ගුරුවරුන් විශාල ගණනකට මෙයින් වැටුප් වැඩි වුණා. නමුත් යම් කිසි ගණනකට වැටුප් වැඩිවෙලා නැහැ. ඒ අයගේ ප්‍රශ්නය මාස කීපයක් ඇතුළතදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත්කර ඒ පිළිබඳ තීරණයක් දෙන බව කියා තිබුණත් සහතිකලත් හා නොලත් ගුරුවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව අද වනතුරු තීරණයක් ගෙන නැහැ. දයාරත්න වැටුප් කොමිෂමේ නිර්දේශ මඟින් වැටුප් වැඩිවීම් නොලැබුණු කොටසටත් තමන්ගේ බලාපොරොත්තු ඉෂ්ටකර ගැනීමට යම්කිසි පියවරක් ගනිතොත් හොඳයි.

දයාරත්න කොමිසම මඟින් වැටුප් වැඩි කිරීමෙන් අවුරුදු පනස්පහෙන් පසු සේවය දීර්ඝ කරන ලද අයත් ප්‍රයෝජනය ලබනවා. සමහර අයගේ සේවය වයස අවුරුදු පනස්පහෙන් දීර්ඝ කරන්නේ නැහැ. ඒ නිසා වයස පනස්පහෙන් විශ්‍රාම ගිය අයට ඒ වරප්‍රසාදය බුක්ති විඳින්න බැහැ. නමුත් වයස පනස්පහේදී සේවය දීර්ඝ කළ අයට ඒ වරප්‍රසාදය බුක්ති විඳින්න පුළුවන්. මම මේ ගැන ඉල්ලීමක් කරනවා නොවෙයි. මේ ගැන සලකා බලන්න ඕනැ. මොකද ? වයස පනස්පහේදී සේවය දීර්ඝ කිරීම නිසා එක් පිරිසකට මේ වරප්‍රසාදය බුක්ති විඳින්න පුළුවන්නම් පනස්පහෙන් විශ්‍රාම ගිය අයටත් යම්කිසි සහනයක් මේ මඟින් ලබාදීම අපේ යුතුකමක්.

අ. භා. 2.45

දිස්ත්‍රික් ක්‍රමය යටතේ බඳවා ගත් අයගේ ප්‍රශ්න කීපයක් තිබෙනවා. මම ඒවා වෙනම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

බාහිර උපාධිධාරීන්ගේ ගුරු පත්වීම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. බාහිර උපාධිධාරීන් තමන්ගේ උපාධි ලබා ගැනීමේ කටයුතුවලට ඉදිරිපත් වන්නේ දුෂ්කරතා රාශියක් තුළින්. ඒ උපාධිධාරීන් මේ වනතුරු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා නැහැ. ඒ නිසා 1986 ජනවාරියේ ගුරු පුරප්පාඩු පිරවීමේදී මේ බාහිර උපාධිධාරීන් ගැනත් සලකන ලෙස මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

පෞද්ගලික පාසල් සඳහා ක්‍රමානුකූලව ඉඩ දීගෙන යන නිසා මම ඒ පිළිබඳව කරුණු කීපයක් පමණක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. එක් කරුණක්, ඒ අයගෙන් අය කරන ගාස්තුවල විවිධත්වය පිළිබඳවයි. නොයෙක් නොයෙක් දේ සඳහාය කියා මේ පෞද්ගලික පාසල් විශාල විවිධ ගාස්තු අය කරනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අවසරයක් ඇතිව පමණක් ඒ ආයතනවලට ගාස්තු අය කරන්න පුළුවන් වන අන්දමේ යම් කිසි තීරණයක් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා මඟින් ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා. ඒවාගේම මේ පෞද්ගලික ආයතනවල සේවයට ගුරුවරුන් බඳවා ගැනීමේදීත් උසස්වීම් දීමේදීත් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ යම්කිසි ආවරණයක් ඇතිකිරීම අත්‍යවශ්‍යයි. එසේ නැති වුණොත් පෞද්ගලික අධ්‍යාපන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් මගක ගමන් කරන්නට ඉඩ තිබෙනවා. ඒ වාගේම මා කලින් සඳහන් කළ ආකාරයට, මුදල් අයකිරීම වාගේ කාරණා අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පාලනය යටතට ගන්නටය කියා ඉල්ලීමක් කරනවා. මෙයට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්නට යන්නෙ නැහැ. මා මුලින් සඳහන් කළ ප්‍රශ්නයට නැවත වරක් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි. විශේෂයෙන්ම අද අපේ සමාජය මුහුණ දී ඇති සමාජ සාරධර්මයන් පිළිබඳ ගැටුමේදී, අපේ සමාජය ඉදිරියට තල්ලු කර ගෙන යන්නට අනිවාර්යයෙන්ම හැකි වන්නේ, අපේ අධ්‍යාපන ක්‍රමය තුළින් බව අප පිළිගන්නට ඕනැ. එම නිසා ඒ ගැන මෙයට වඩා අධ්‍යයනය කර, ගැඹුරින් සිතා බලා, අපේ මුළු ආර්ථික සැලැස්ම සකසා ගැනීමේ නිවැරදි ක්‍රියා මාර්ගයක් අප ගත්තේ නැතිනම් දැනට පවත්නා මේ මානසික ගැටුම නිසා සමාජයේ මතු වී ඇති ප්‍රශ්න සම්බන්ධයෙන් ඉදිරියේදී මෙයට වඩා අර්බුදයකට මුහුණ දෙන්නට සිදු වන බව මතක් කරන්න කැමතියි.

අවසාන වශයෙන් මගේ ආසනයේ ඇති පාසල් කීපයක දැනට මතු වී තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. එම සිද්ධීන් ගැන මේ සභාව තුළදී මම විස්තර කරන්නට යන්නේ නැහැ. කෙසේ වෙතත් ප්‍රදේශයේ දරුවන්ගේ යහපත පිණිස දේශපාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භේදවලින් තොරව මේ ආයතන පිළිබඳව කිසියම් තීරණයකට පැමිණෙන ලෙස ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මොකද ? මේ පිළිබඳව විවිධ දේශපාලන බලපෑම් ඇති නිසයි. විශේෂයෙන්ම, මා නියෝජනය කරන මහරගම ආසනයේ ගුරුවරුන් සමග හෝ විදුහල්පතිවරුන් සමග හෝ කිසිම දේශපාලන මතභේදයක් මම ඇති කර ගෙන නැහැ. අපේ ආසනය තුළ ඇති ලංකාවේ ඉහළම අධ්‍යාපන මට්ටමට පැමිණුන අධ්‍යාපන ආයතන කීපයක්ම වසා දැමීමේ සිද්ධියක් ඇති වන විට, කනගාටුදායක ලෙස ප්‍රශ්න සමූහයකට මුහුණ දී සිටින විට, ඒ ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්ට ඕනෑ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය ගැන මෙම සභාවේදී මා සඳහන් කළේ දේශපාලන බලපෑම් නිසා, ප්‍රශ්නය නොවිසඳී ඇති නිසා ප්‍රදේශවාසීන් තුළ දැවැන්ත කලකිරීමක් ගොඩනැගෙමින් පවතින නිසයි. එම නිසා මේ සම්බන්ධයෙන් නොපමාව විසඳුමක් ඉදිරිපත් කරන්නටය කියා අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට මතක් කරමින් මා නවතිනවා.

**ලයනල් ජයතිලක මහතා (ඇමතිතුමා)**
**(திரு. லயனல் ஜயதிலக்க — அமைச்சர்)**
**(Mr. Lionel Jayatilleke – Minister)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ අවසන් කථා දෙක - තුන කරන්නටයි දැන් අවස්ථාව ලැබී තිබෙන්නේ. අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙනුත් අපට ස්තුතියක් ලැබුණා. එසේ ලැබුණේ පසුගිය වර්ෂ කීපය තුළදී අපට ලැබුණු මුදල් ප්‍රතිපාදන හැම දෙයක්ම වියදම් කරමින් පාසල් සම්පත් බෙදීම උපරිම ප්‍රමාණයෙන් ඉටු කිරීමේ වාසනාව අපට ලැබුණු නිසයි. පසුගිය වර්ෂය තුළදීත්, ඊට කලින් වර්ෂවලදීත් පාසල් සම්පත් බෙදදීම දිස්ත්‍රික් මට්ටමෙන් අප කරගෙන ආවා. දැනටමත් දිස්ත්‍රික්ක 14ක සම්පත් බෙදදීමේ කටයුතු අවසන් කර තිබෙනවා. ඊළඟ වර්ෂ දෙක තුළදී ඉතිරිව ඇති දිස්ත්‍රික්කවලටත් බෙද දීමෙන්, දැනට පාසල්වල සම්පත් පිළිබඳව ඇති අඩුපාඩුකම් සම්පූර්ණ කර ගැනීමට අවකාශ සැලසෙනවාය කියා මා කල්පනා කරනවා.

පුස්තකාල සම්බන්ධයෙනුත් අපේ අමාත්‍යාංශය කටයුතු කරගෙන යනවා. මේ වන විට පාසල් 300කට වාර්ෂිකව පොත් සපයා දීම හැරෙන්නට එම පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් හැටියට කටයුතු කරන එම පාසල්වල ආචාර්ය මණ්ඩලයේ මහත්ම, මහත්මීන්ටත් විශේෂ පුහුණුවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් දැන් සකස් කර තිබෙනවා. මේ වන විට පුස්තකාල භාරව කටයුතු කරන ඒ මහත්ම මහත්මීන්ගෙන් වැඩි පිරිසකට අවශ්‍ය ඒ පුහුණුව ලබා දී තිබෙනවා. රජය මගින් දරුවන්ට ලබා දෙන පාසල් පොත්වලට අමතරව, පාසල් පුස්තකාලවලටත් පොත් සපයා දී දරුවන්ගේ බුද්ධි වර්ධනයට අවකාශ සලසා දීමට කටයුතු කර තිබෙනවා. මේ අන්දමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් විශේෂ සේවාවක් මේ වර්ෂයේදීත් ඉටු කර තිබෙන බව මා සඳහන් කරන්නේ බොහොම සන්තෝෂයෙන්.

තමන් විසින් රචනා කරන ලද පොත් පළකර ගන්නට අවස්ථාවක් නොලැබුණු ග්‍රන්ථ කර්තෘවරුන් 125 දෙනෙකුට, තමන්ගේ වටිනා පුස්තක පළකර ගැනීමට අපේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් අවස්ථාව සලසා දී තිබෙනවා. මේ අන්දමට පොත්පත් මුද්‍රණය කර ගැනීමට ඒ අයට අවස්ථාව සලසා දීමත් ඉතාමත් වැදගත් සේවාවක්. ලබන වසරේ ඊටත් වැඩි පොත් සංඛ්‍යාවක් මුද්‍රණය කර ගැනීමට අවස්ථාව සහ ආධාර ලබා දීමට පුස්තකාල සේවා මණ්ඩලය කටයුතු කරගෙන යනවා. ඒ එක්කම දිවයිනේ පාසල් පුස්තකාල පමණක් නොවෙයි, පළාත් පාලන ආයතන මගින් පවත්වාගෙන යන පුස්තකාලත්, වෙනත් නොයෙක් ආයතන මගින් පවත්වාගෙන යන පුස්තකාලත් දියුණු කර ගැනීමට විශේෂ සේවා විධි රාශියක් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් දැනට කරගෙන යනවා.

විශේෂයෙන් බෙද දෙන පොත් මුද්‍රණය කිරීම පිළිබඳව මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රශ්නයක් මතු කළා. අපි 1985 වර්ෂයේදී පමණක් පොත් 1,12,75,000ක් මුද්‍රණය කර තිබෙනවා. රුපියල් 11,81,00,000ක මුදලක් ඒ සඳහා වියදම ගොස් තිබෙනවා. මේ වසරේ මුද්‍රණය කෙරෙන පොත් සංඛ්‍යාව ඊට වැඩි වී තිබෙනවා. අලුතෙන්ම මුද්‍රණය කිරීම සඳහා පොත්පත් රාශියක් ලියා අවසන් කර දැන් ඒ මුද්‍රණ කටයුතු කෙරෙමින් පවතිනවා. ඒ අලුත් පොතුත් සමග මේ වසරේ පොත් 1,54,50,000ක් පමණ මුද්‍රණය කරන්නට සිදු වී තිබෙනවා. 1986 වසරේ, ඒ සඳහා යන වියදම ඒවාගේ එකහමාරකින් පමණ වැඩි වෙනවා. මෙම පොත් මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නයයි මහරගම ගරු මන්ත්‍රීතුමා නැඟුවේ.

බෙද දෙන පොත් මුද්‍රණය කිරීම පිළිබඳ වගකීම අපි පළමුවෙන්ම පවරන්නේ රජයේ මුද්‍රණාලයටයි. ඒ සඳහා එහි අවස්ථාව නැතිව යන විට, ඉඩකඩ නැතිව යන විට ඉතිරි වැඩ කොටස් අපි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවට භාර දෙනවා. ඒ මුද්‍රණ සංස්ථාවටත් මුද්‍රණය කරන්නට බැරි පොත් සංඛ්‍යාවක් තිබෙනවා නම්, මුද්‍රණය කරන්නට ඉඩක් නැහැයි කියනවා නම් ඒ පොත් මුද්‍රණය රජයේ ආයතනයක් වන ලේක්හවුස් මුද්‍රණාලයට දෙනවා. පෞද්ගලික ආයතනවලට දෙන්නේ පොත් ඉතාම ස්වල්පයයි. අර රජයේ ආයතන දෙක තුනට දීමෙන් පසු ඉතිරි වන ඉතාම සුළු ප්‍රමාණයකුයි අපි ටෙන්ඩර් කැඳවා, මිල ගණන් කැඳවා පෞද්ගලික අංශයට දෙන්නේ. රජයේ ආයතනවලින් කරගන්න බැරි මුද්‍රණ කටයුතු සඳහා පමණයි අපි පෞද්ගලික අංශය පැත්තට හැරෙන්නේ.

පොත් බෙද දීමේ කටයුතු සම්බන්ධයෙන් පසුගිය වාරයේ පොඩි ප්‍රමාදයක් හෝ ඇති වුණා නම් මේ වසරේ එවැන්නක් හෝ සිදු වේවිය කියා මා හිතන්නේ නැහැ. ඒ මොකද ? දැන් අපි ඒ හැම දෙයක්ම කල් ඇතිව සම්පාදනය කර ගෙන තිබෙනවා. වසරක් පාසා මේ රටේ දරුවන්ට පොත් බෙද දීමේ කටයුතු අපි ශ්‍රීමත් ජනාධිපතිතුමා අතින්ම ආරම්භ කරනවා. ඒ පොත් බෙද දීමේ ජාතික උත්සවය අපි පවත්වන්නේ සම්පූර්ණයෙන්ම පාසල් දරුවන් තුළ උනන්දුවක් ඇති කිරීම සඳහාමයි. 1986 වර්ෂයේ පොත් බෙද දීමේ උත්සවය අපි පවත්වන්නේ ගාල්ල නගරයේයි. 1986 ජනවාරි 13 වන ද ඒ ප්‍රදේශයේ දරුවන් ඉදිරිපිට ගාලු දිසාවේ හැම මන්ත්‍රී කොට්ඨාශයකම දරුවන්ට ජනාධිපතිතුමා අතින්ම පොත් බෙද දී, මුළු දිවයිනේම තිබෙන හැම පාසලකම දරුවන්ට පොත් බෙද දීමේ කටයුතුත් එදිනම කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ පොත් බෙද දීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදු වෙමින් පවතිනවා.

මා මුලින් ප්‍රකාශ කළ පරිදි අපේ අමාත්‍යාංශයේ සම්පත් බෙද දීමේ වැඩ පිළිවෙළ පිළිබඳව අපි සෑහෙන දුරට සතුටු වෙනවා. නමුත් භාණ්ඩාගාරයට අපේ අමාත්‍යාංශය සඳහා මුදල් ලබා දිය හැකි උපරිම සීමාවක් තිබෙනවා. ඒ ලබා දෙන සෑම සතයක්ම අඩු නොකර වියදම් කිරීමේ වගකීම අපි ඉෂ්ට කරනවා. පසුගිය වසරටත් වඩා සෑහෙන මුදල් ප්‍රමාණයක් අධ්‍යාපන අමාත්‍යාංශයටත්, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ කටයුතු සඳහාත් වෙන් කර දීම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් නොතිබුණා නම්, මුදල් ඇමතිතුමා සමග කළ සාකච්ඡා අනුව, අපට සතුටු වෙන්න පුළුවන් විධියට මීටත් වඩා වැඩි මුදලක් ලැබෙන්නටයි අවස්ථාව තිබුණේ. නමුත් අපි කවුරුත් දන්නා පරිදි ඒ ඇති වී තිබෙන අවාසනාවන්ත තත්ත්වය නිසා, පසුගිය වර්ෂයටත් වඩා වැඩි මුදලක් ලැබුනත් අපත් ගරු මුදල් ඇමතිතුමාත් බලාපොරොත්තු වූ තරම් විශාල මුදලක් පාසල් දරුවන්ගේ ඕනෑ එපාකම් ඉෂ්ට කර ගැනීමට සම්පත් වශයෙන් බෙද දීම සඳහා ලබා ගන්නට බැරිවීම එක් අතකින් ඉතාමත්ම කණගාටුවට කාරණයක්.

දරුවන්ට බෙද දෙන මේ සම්පත් පුළුවන් තරම් ඉකිමණින්, පුළුවන් තරම් සාධාරණ ලෙස ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුව බෙද දීමට පසුගිය වසර කිහිපය තිස්සේම කටයුතු සංවිධානය කිරීම ගැන අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, අතිකුත් සියලුම නිලධාරී මහත්වරුන්ටත් මගේ පෞද්ගලික ලේකම්තුමාටත්, මා ස්තුති කරන්න ඕනෑ. ලබන වසරේදීත් ඒ කටයුතු ඒ විධියට කරන්නට දැන් නියාම සූදානම් කරගෙන සිටින බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්නට කැමතියි. මට මීට වඩා කථා කරන්නට අවස්ථාවක් නැහැ. මොකද, නියෝජ්‍ය ඇමතිතුමාටත් අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. අධ්‍යාපනය පිළිබඳව තිබෙන තත්ත්වය හොඳින් අවබෝධ කර දෙන්නට ගරු ඇමතිතුමාට පැයක් පමණ කාලයක්වත් අවස්ථාව දෙන්නටයි තිබුණේ. දැන් තිබෙන තත්ත්වය අනුව එතුමා පැය කාලක්වත් ඒ ගැන කථා කරන්න අවස්ථාවක් නැති නිසා මා මීට වඩා මේ සභාවේ කාලය ගන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. අමාත්‍යාංශයෙන් සිදුවන සේවාවන් ඉෂ්ට කර ගැනීමට අපේ අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන්ට පමණක් නොව, සියලුම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලා, ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරීතුමන්ලා, මාණ්ඩලික නිලධාරී තුමන්ලා, ඇතුළු විදුහල්පතිවරුන්ද අපට පුදුම සහායක් දැක්වූවා. ඒ සහයෝගය ගැන සෑම දෙනාටම ස්තුති කරන අතර, පසුගිය වසර කිහිපය තුළ මේ රටේ අධ්‍යාපනයේ ඇති වූ ප්‍රගතිය පිළිබඳව විශේෂයෙන්ම නව අධ්‍යාපන වැඩපිළිවෙළ යටතේ ලැබුණු නව ප්‍රගතිය ගැන මගේ සංතෝෂය ප්‍රකාශ කරමින් ලබන වසරේදීත්, ඊළඟ වසරේදීත් මීට වඩා උසස් අන්දමින් මේ රටේ දරුවන්ට සේවය කිරීමට මේ අමාත්‍යාංශයට වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3

**වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)**
**(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)**
**(Mr. Weerawanni Samaraweera – Deputy Minister of Education)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන මේ වේලාවේදී ගරු ඇමතිතුමාත්, අප සියළු දෙනාත් බලාපොරොත්තු වුණා, විපක්ෂයෙන් මීට වඩා ප්‍රබල අදහස් ප්‍රකාශ වෙයි කියා. නමුත් බලාපොරොත්තු වූ තරම් අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව විපක්ෂයෙන් අදහස් ඉදිරිපත් වුණේ නැහැ කියා මම මතක් කරන්න ඕනෑ. අපි හිතුවේ විපක්ෂය රට පුරාම ප්‍රකාශ කරන ආකාරයට රටේ ප්‍රචලිත කරන ආකාරයට මේ අවස්ථාවේදී විපක්ෂයෙන් විශාල ප්‍රහාරයක් එල්ල වෙයි කියා. නමුත් ඇත්ත වශයෙන්ම සාමාන්‍ය වේදිකාවේ කථා කරන විලාශයෙන් මේ සභාවේ වැය ශීර්ෂයක් යටතේ කථා කරන්න බැරි නිසා මා හිතනවා, පිළිගත නොහැකි, ප්‍රබල විධියටම කල්පනා නොකළ යුතු යම් යම් කරුණු ටිකකුයි ඉදිරිපත් වුණේ කියල.

විශේෂයෙන් අපේ මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මූණසිංහ මහතා) නොයෙක් විෂයයන් පිළිබඳව බොහෝම බරපතල ලෙස කථා කරන මන්ත්‍රීතුමෙක්. නමුත් එතුමා අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ වැසිකිළියක් ගැන පමණක්ම ප්‍රමුඛත්වය දීම ගැන අපි කණගාටු වෙනවා. එතුමා කීවා, එතුමාගේ මැතිවරණ කොට්ඨාශයේ අවුරුදු 10ක් තිස්සේ වැසිකිළියක් හදගන්න බැරි වුණාය කියා. එතුමාගේ මැතිවරණ කාලයේදී, එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වූ කාලය තුළවත් මා හිතන්නේ එය කර ගැනීමට හොඳටම අවස්ථාව තිබුණා. නමුත් පසුගිය ආණ්ඩු කාලයේදී වැසිකිළි හදන්න බැරි වුණාය කියා කිව්වොත් එය පිළිගන්න පුළුවන්. මොකද, මුදල් ලබා දුන්නේ නැහැ, ප්‍රතිපාදන දුන්නේ නැහැ, ඒවා ගැන අවබෝධයක් අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. රටපුරාම පෙළපාලි රැස්වීම් පැවැත්තුවා. පාසල් ගැන හිතන්න කාලයක්, වේලාවක් තිබුණේ නැහැ. බලහත්කාරයෙන් පාසල් දරුවන්ට, ගුරුවරුන්ට එකට මත්පැන් පොවලා පෙළපාලි එක්කරගෙන ගිය කාලය අපට සිහි වෙනවා. මා හිතන්නේ ඊට වඩා විනයානුකූල තත්ත්වයක් දැන් තිබෙනවා. භාණ්ඩාගාරයෙන් අපට ලැබී තිබෙන මුදල් ප්‍රතිපාදන අනුව කිසියම් විනයානුකූල තත්ත්වයකින් පාසල්වල වැඩකටයුතු කෙරෙන බව අපට පෙනෙනවා.

එතුමා මහා භාණ්ඩාගාරයේ වාර්තාව අනුව කිව්වා, පාසල්වල තත්ත්වය. උපාධිධාරී ගුරුවරුන් ඒ තරම් සංඛ්‍යාවක් බඳවා ගත්තේ නැහැ කියා කිව්වා. නමුත් 1984 ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ ආර්ථික විවරණයේ 88 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා.

" අධ්‍යාපන සේවා කොමිසම මගින් පත් කරනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව 1983 දී 4,069ක්ද, 1984 දී 8,158ක්ද විය. මෙම නව පත් කිරීම්වලින් 2,710ක් හෙවත් සියයට 33ක් උපාධිධාරී ගුරුවරුන් වූ අතර 2,629ක් හෙවත් සියයට 32ක් සහතිකපත් ලාභී ගුරුවරුන් විය. මීට අතිරේක වශයෙන් අධ්‍යාපන සේවා කොමිසම විසින් 1985 ජනවාරි මාසයේ සිට පත්වීම් ලබාදීම සඳහා 1984 දී ගුරුවරුන් 6,270ක් තෝරාගෙන ඇත. වඩා හොඳ අධ්‍යාපන සේවාවක් ඇති කිරීම සඳහා විමසුමට ලක් වන කාලය තුළදී දෙපාර්තමේන්තුව සිය ගුරු පුහුණු වැඩ පිළිවෙළ අඛණ්ඩ ලෙස පවත්වාගෙන ගොස් ඇත. "

මෙන්න මේ අන්දමට එහි සඳහන් වෙනවා. නමුත් ඒවා නොවෙයි, මේ අය ඉදිරිපත් කරන්නේ. අපට ලැබුණු පළමුවන අභියෝගය වුණේ 1970 සිට 1977 දක්වා වූ කාලය තුළදී ගුරු පුහුණුවට අවශ්‍ය ගුරුවරුන් නිසි කලට වේලාවට තෝරා නොගැනීම නිසා ගුරු විද්‍යාල සම්පූර්ණයෙන්ම පාළු තත්ත්වයකට පත්වී තිබීමයි. ඒ නිසා සම්පත් විනාශයක් තිබුණා. 1971න් පසුව උපාධිධාරී ගුරුවරුන් එක්කෙනෙක්වත් සේවයට බඳවා ගෙන නැහැ. මැතිවරණ කාලය කිට්ටු වන විට මැතිවරණ එය ඔන්න මෙන්න කියා තිබියදී, උපාධිධාරීන්ට යම් යම් ආයතනවල රක්ෂාවල් දුන්නා. රු. 250ක වැටුපකට. අධ්‍යාපන අමාත්‍යාංශයටත් ගුරුවරුන් හැටියට බඳවා ගත්තා, රු. 250ක වැටුපකට. ඔවුන් උපාධිධාරී වැටුපට පත් කර උපාධිධාරී ගුරුවරුන් හැටියට ඔවුන්ගේ තත්ත්වය ස්ථිර කරන්නට පුළුවන් වුණේ අපේ ආණ්ඩුව බලයට ආවාට පසුවයි. තත්ත්වය එසේ තිබියදීත් මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මූණසිංහ මහතා) කිව්වා, වැසිකිළිය හද ගන්නට බැරි වුණාය කියා. එය ඔහුගේ දුර්වලතාවයයි. දරුවන් ගැන ඔය තරම් කැක්කුමකින් කථා කරන මනුෂ්‍යයාට පුළුවන් වුණේ නැහැ, අවුරුද්දකට විමධ්‍යගත අයවැයෙන් දෙන රුපියල් ලක්ෂ 25නුත් සංවර්ධන සභාවට දිසා සංවර්ධන අරමුදල හැටියට දෙන රුපියල් ලක්ෂ 25නුත්—ඒ කියන්නේ රුපියල් ලක්ෂ 50 කිනුත්—ඒ වැඩේ කර ගන්නට.

අධ්‍යාපන සේවා ඇමතිතුමාට කියන්නට අමතක වූ කරුණක් තිබෙනවා. මේ අවුරුද්ද ආරම්භ වන විටම ලංකාවේ සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එතුමාගේ අත්සනින් ලිපියක් ගියා තමන්ගේ මැතිවරණ කොට්ඨාශයේ තිබෙන අළුත්වැඩියා කරන්නට වුවමනා පාසල් 10ක් නම් කර එවන්නය කියා. එතුමා හැම මන්ත්‍රීතුමෙකුටම අවුරුද්ද පටන්ගන්නා විටම ලියා යැව්වා. " තමුන්නාන්සේගේ කොට්ඨාශයේ පාසල්වල අළුත්වැඩියා කිරීම් තිබෙනවා නම්, අළුත්වැඩියා කිරීමට අවශ්‍යතාවයක් තිබෙනවා නම්, ඒ සඳහා මුදල් වෙන් කිරීම සඳහා කරුණාකර එවැනි පාසල් 10ක් නම් කර එවන්න " කියා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ඒවා ගැන සෙවිල්ලක් බැලිල්ලක් නොකර, ඒ ගැන කථා නොකර, එහෙන් මෙහෙන් කරුණු ටිකක් සොයා ගෙන මෙතැනට ඇවිත් පාසල් දරුවන් සහ ගුරුවරුන් නොමග යවන කථා කිරීම ගැන කණගාටුයි. අධ්‍යාපනය ප්‍රායෝගිකව, අවබෝධයකින් යුතුව, ආදර්ශයක් ඇතිව, හැම දෙනාම ක්‍රියා කළ යුතු ක්ෂේත්‍රයක් බව මා මතක් කරන්නට ඕනෑ.

මෙයට පෙර අවුරුදුවල අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන අවස්ථාවලදී මාරුවීම් පිළිබඳව විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සැහෙන චෝදනා එල්ල වුණා. අධ්‍යාපන අමාත්‍යාංශයට, අධ්‍යාපන සේවා කොමිසමට, ප්‍රාදේශීය කාර්යාලවලට හා ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ට ගුරුවරුන්ගේ මාරුවීම් පිළිබඳව කිසිම පිළියමක් යොදන්නේ නැතැයි නොයෙක් අන්දමේ මැසිවිලි කිව්වා. ගුරුවරුන් සැහෙන අමාරුවට හා හිංසා පීඩාවලට පත්වුණායයි කිව්වා. එවැනි තත්ත්වයක් තිබුණා, 1980 අධ්‍යාපන සේවා කොමිසම පත් කරන විට. 1980 අවුරුද්ද අවසාන වන විට ගුරුවරුන් 23,000 කගේ මාරුවීම් ඉල්ලුම් පත්‍ර තිබුණා. ඒ තරම් විශාල සංඛ්‍යාවක් ගොඩගැසී තිබුණා. නොයෙක් අන්දමේ ප්‍රශ්න තිබුණා. හැම මැතිවරණ කොට්ඨාශයකම ඒ ප්‍රශ්න තිබුණා. නමුත් අද තත්ත්වය ඉතාමත්ම සතුටුදායකයි. 1984 අවසාන වන විට ඒ තරම් විශාල බරපතල ප්‍රශ්නයක්ව තිබුණු අන්තර් දිස්ත්‍රික් ගුරුමාරු සංඛ්‍යාව 4,500 දක්වා අඩුවී තිබුණා. 1980 අවසාන වන විට ගුරුවරුන් 23,000 ක් මාරුවීම් ඉල්ලා තිබුණා. 1984 වන විට ගුරුවරුන් මාරුවීම් ඉල්ලා තිබුණේ 4,500 යි. ඒ ප්‍රමාණයෙනුත් 1985 ජනවාරි මාසය වන විට 3,500 කට මාරුවීම් දී ගුරු විද්‍යාල වලින් පිටවූ අය ප්‍රාදේශීය මට්ටමෙන් ඒ ඒ දිස්ත්‍රික්කවලට යවා, ඒ අයගෙන් අඩුපාඩු පිරෙන විට අනෙක් ඉතිරි ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු සූදානම් කර තිබෙනවා.

මේ අවුරුද්දේ දෙසැම්බර් මාසය වන විට දිස්ත්‍රික් ගුරු මාරු ක්‍රමයට අනුව මාරුවීම් ඉල්ලා ඇත්තේ මුළු ලංකාවෙන්ම සිංහල ගුරුවරුන් 2,700 යි. ද්‍රවිඩ ගුරුවරුන් 700 යි. මේකෙන් පෙනෙනවා අධ්‍යාපන සේවා කොමිෂන් සභාවේ ආධාරය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය කොයි තරම්දුරට ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ගෙන යනවාද කියා. ඒ ගැන කිසිම වචනයක් අද සඳහන් වුනේ නැහැ. ඒ ගැන මොනම දෙයක්වත් කිව්වේ නැහ. මම හිතනවා 1986 වර්ෂය අවසාන වන විට මේ ප්‍රමාණය 1,000 දක්වා අඩු කර ගන්න පුළුවන් වේය කියා.

සමහර මැතිවරණ කොට්ඨාශවල ගුරුවරුන්ගේ හිඟකම පිළිබඳව ප්‍රශ්න තිබුණා. අදත් සමහර මන්ත්‍රීවරුන්ගෙන් ගුරු හිඟය ගැන කියවුනා. එයට ප්‍රායෝගික පිළියමක් වශයෙන් ගරු ඇමතිතුමා දිස්ත්‍රික් පදනම යටතේ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කළා.

දිස්ත්‍රික් පදනම යටතේ ගුරුවරුන් තෝරා ගැනීමෙන් වාසි කිහිපයක් අත්වුණා. දුෂ්කර දිස්ත්‍රික්කවල සිටින නියමිත අධ්‍යාපන සුදුසුකම් ඇති, ගුරු පත්වීම් ලබාගැනීමට බලාපොරොත්තුවෙන් සිටි අයට මේ විභාගය සඳහා පෙනී සිටීමට පුළුවන් වුණා. කලින් පත්වීම් ලබාගැනීමේදී ඒ අයට සැහෙන අසීරු තත්ත්වයක් ඇති වුණා.

1977 වර්ෂයට කලින් පත්වීම් දීමේදී මේ විධියේ පදනමක් තිබුණේ නැහැ. ඉතාමත් දියුණු පළාත්වල අය නොයෙකුත් ක්‍රමවලින් පත්වීම් ලබා ගත්තා. එසේ පත්වීම් ලබාගෙන ඒ අය දුෂ්කර පළාත්වලට ගියා. මාස කිහිපයක් ඒ පළාත්වල සේවය කර, ඒ අය ආපසු තමන්ගේ ගම් පළාත්වලටම ආවා. එහෙම ආවාම ඒ දිස්ත්‍රික්ක අතිරික්ත ගුරුවරුන්ගෙන් පිරී ඉතිරී ගියා. සමහර දිස්ත්‍රික්කවල ගුරු හිඟය නිසා දැඩි පීඩනයට පත් වුණා. මේ තත්ත්වය ගැන අධ්‍යාපන ඇමතිතුමා ප්‍රායෝගිකව කල්පනා කර බැලුවා. ඊට පසු අධ්‍යාපන සේවා කොමිෂන් සභාව මගින් පුරප්පාඩු පිළිබඳව ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකර ඒ ඒ විෂයයන් පිළිබඳව සුදුසුකම් ඇති අය ඒ ඒ දිස්ත්‍රික්කයෙන්ම බඳවා ගැනීමට කටයුතු කළා. ඒ දිස්ත්‍රික්කය තුළ සුදුසුකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලත් උදවිය නැත්නම් පමණයි, අනෙක් දිස්ත්‍රික්කවලින් බඳවා ගත්තේ. ඒ අනුව ඒ ක්‍රමයේ සැහෙන සාධාරණත්වයක් තිබෙනවා. ඒ සමගම, යම් යම් අවස්ථාවල උපදේශක කාරක සභාවේදී ගරු මන්ත්‍රීවරුන් ඉල්ලීම් කළා, දිස්ත්‍රික් පදනමටත් වඩා තවදුරටත් මේ ක්‍රමය විමධ්‍යගත කරන ලෙස. මණ්ඩල නම් කර ඒ අනුව ගුරුවරුන් පත් කළොත් තවදුරටත් සාධාරණව මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හැකි බව ඔවුන්ගේ අදහස වුණා.

සැහෙන ප්‍රශ්න රාශියක් වශයෙන් තිබුණු එක් එක් අංශ වෙන වෙනම අරගෙන, ඒවාට ප්‍රායෝගිකව පිළිතුරු සැපයීමට අපි ගත් ක්‍රියා මාර්ගය හේතුකොටගෙන අනාගතයේදී ඇති වන ප්‍රශ්නවලට අපට පහසුවෙන් පිළිතුරු සපයා ගැනීමට පුළුවන් වේයයි කියා මම සිතනවා.

ගුරුවරුන් විශ්‍රාම ගත්තාට පසුව ඔවුනට වැටුප් ලබාගැනීමට අපහසුකම් ඇති වී තිබෙනවාය කියාත් නොයෙක් අන්දමේ මැසිවිලි තිබුණා. ඒ සම්බන්ධයෙන් සමහර පුවත්පත් මගින් නොයෙක් අවස්ථාවල අධ්‍යාපන අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට, චෝදනා එල්ල කර තිබුණා. ඒ තත්ත්වය සම්බන්ධයෙන් මීට අවුරුදු දෙකකට කලින් අපි ක්‍රියා මාර්ගයක් ගත්තා. එනම්, සේවයට පත් වන සියළුම ගුරුවරුන් තමන් විසින්ම තම සේවා කාලය පිළිබඳව විස්තර සපුරා ගත යුතු "සේවා අත් පොත්" ක්‍රමයක් අපි හඳුන්වා දුන්නා. විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා සමහර ගුරුවරුනට අවුරුදු කිහිපයක් බලාගෙන සිටීමට සිදුවන්නේ ඒ අයගේ පෞද්ගලික ලිපි ගොනු සොයා ගැනීමට ඇති අමාරුකම නිසයි. ගුරුවරුන් මාරුවී යන අවස්ථාවලදී ප්‍රාදේශීය කාර්යාලවලට ලිපි ගොනු හුවමාරු වන විට නොයෙක් හේතුන් නිසා, නොයෙක් සිද්ධීන් නිසා, ඒ ලිපි ගොනු නැති වෙනවා. සමහර අවස්ථාවලදී පෞද්ගලික ලිපි ගොනුවලට සේවා වාර්තා ඇතුළත් කර නොතිබීම නිසා විශ්‍රාම ගන්නා අවස්ථාවේදී කලින් සේවය කළ මුල් පාසල් මොනවාද කියා සොයාගැනීම අපහසු වෙනවා.

අද මේ රටේ ඇති වන විශාල සංවර්ධනය දෙස බැලුවාම විශේෂයෙන්ම මහවැලි ව්‍යාපාරය නිසා ඇරඹෙන සංවර්ධන ව්‍යාපාර දෙස බැලුවාම, අපට පෙනෙනවා. නොයෙකුත් දුෂ්කර පළාත් වේගයෙන් දියුණු වේගන යන බව. එවිට ඒවායේ තිබුණු පැරණි ගොඩනැගිලිත් නැති වී යනවා. පාසල් ගොඩනැගිලි තිබුණා නම් ඒවාත් නැති වී යනවා. ඒ අනුව මේ සේවා අත් පොත් හඳුන්වා දී තිබෙනවා. ගුරුවරයා සේවයෙන් විශ්‍රාම යන අවස්ථාවේදී එය ඉදිරිපත් කළාම ඒ අඩුපාඩුකම් සම්පූර්ණයෙන්ම මග හරවා ගන්න පුළුවන්. දැන් විශ්‍රාම ගැනීම පිළිබඳව ගැටළුවක් ඇත්තේ නැහැ. මේ අවුරුද්ද අවසානයේ ගුරුවරුන් 2,788 දෙනකුට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා අපි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාට ලිපිගොනු වාර්තා යවා තිබෙනවා. මේ ක්‍රමය මීටත් වඩා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවන්න දැන් අපි ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් සඳහා සංස්කරණ සම්මේලන පැවැත්වීමට යෝජනා කර තිබෙනවා. ඊටත් වැඩි දෙයක් තමයි අපි පරිගණක යන්ත්‍ර මගින් කරන්නට බලාපොරොත්තු වන්නේ. මේ පරිගණක යන්ත්‍ර මගින් දත්ත එකතු කර කෙළින්ම ප්‍රාදේශීය කාර්යාලවලට නිලධාරීන් යවනවා. ඒ ලිපිගොනු පෞද්ගලික විමසීම්වලට ලක් කරන්න. එමගින් මේ සඳහා ගතවෙන කාලය හුඟක් දුරට අඩු කරගෙන කෙළින්ම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට මේ වාටුප් වාර්තා යවන්නට කටයුතු සළස්වන්නට සූදානම් කර තිබෙනවා 1986 වර්ෂයේ සිට. මම හිතනවා එවිට මීටත් වඩා වැඩි ප්‍රමාණයකට විශ්‍රාම වැටුප් ලබා දීමේ ක්‍රමයක් සොයාගන්නට පුළුවන් වෙයි කියා.

සම්පත් බෙදලීම පිළිබඳව ක්‍රමානුකූල සැලැස්මක් අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍යය කියාත්, දුෂ්කර පළාත් දියුණු කිරීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් අවශ්‍යය කියාත්, දුෂ්කර පළාත්වල අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීමට නිදහස් අධ්‍යාපනයේ සමාන අවස්ථාවක් අවශ්‍යය කියාත් අදහස් කිහිපයක් විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් වුණා. ඒවාට පිළිතුරක් හැටියට මට කියන්න පුළුවන්, ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ නියෝගය අනුව සියලුම පාසල් දරුවන්ට—පළමුවැනි ශ්‍රේණියේ සිට 10 වැනි ශ්‍රේණිය දක්වා සියලුම පාසල් දරුවන්ට—පාසල් පොත් නොමිලේ ලබා දීමට අපි ක්‍රියා මාර්ගයක් ගත් බව. අපේ අධ්‍යාපන සේවා ගරු ඇමතිතුමා ඉතාමත්ම කාර්යක්ෂම අන්දමට ඉතාමත්ම දක්ෂ අන්දමට ඒ කාර්ය භාරය ඉටුකරගෙන යනවා. රුපියල් කෝටි ගණනක් වැය කර, අධ්‍යාපන අමාත්‍යාංශය, රජය මේ කටයුත්ත සම්පූර්ණයෙන්ම භාර අරගෙන කරනවා. නමුත් මේ වාගේ බැරෑරුම් තත්ත්වයකට රට පත්වී තිබෙන අවස්ථාවකදී, රටේ ආරක්ෂාව සඳහා ජාතික ධනයෙන් කෝටි සංඛ්‍යාත මුදලක් වියදම් කරන්නට වෙලා තිබෙන අවස්ථාවකදී, එනම් අද වැනි දවසකදී පාසල් පොත් නොමිලේ බෙද දීම කරන්නට ගියා නම් ඒ සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීම ඉතාමත්ම අසීරු වෙනවා. මීට අවුරුදු කිහිපයකට පෙර පාසල් දරුවන්ට අවශ්‍ය පොත්පත් අමාත්‍යාංශයෙන් සපයා දෙන්නට අප ගත් පියවර ගැන මම සිතනවා ලක්ෂ සංඛ්‍යාත දෙමව්පියන් හා පාසල් දරුවන් අද සැනසුම් සුසුම් හෙළනවා කියා. දැන් මෙය ඉතිහාස ගතවන සිද්ධියක් වෙලා ඉවරයි. ඒ නිසා මොන විදියේ ජාතික ප්‍රශ්න ඇතිවුණත් මම හිතන්නෙ නැහැ පාසල් දරුවන්ට පොත්පත් බෙද දීමේ මේ ක්‍රියාවලිය සඳහා දරන්නට වන වියදම මේ වැය ශීර්ෂයෙන් කපා හරියි කියා. එද, බොහොම දූරදර්ශී විදියට ශ්‍රීමත් ජනාධිපතිතුමා ඒක නොකරන්න අද සැහෙන අසීරු තත්ත්වයකට මුහුණ දෙන්නට ජනතාවට සිද්ධ වෙනවා.

අ. භා. 3.15

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ධවල පත්‍රිකාව ඉදිරිපත් කළ වෙලාවේදී එහි යම් යම් යෝජනා තිබුණා සම්පත් හිඟ පළාත්වලට සම්පත් බෙද දීමේ අධ්‍යාපන වැඩකටයුතු විමධ්‍යගත කිරීමේ වැඩපිළිවෙලක් සඳහා පාසල් පර්ෂද ඇතිකිරීමට. ඒකට නොයෙක් අන්දමේ චෝදනා, අපවාද එල්ල වුණා. ලක්ෂ සංඛ්‍යාත පාසල් දරුවන් පාසල්වලින් එළියට ගන්නා. පාසල් ගුරුවරුන් එළියට ආවා. නොයෙක් නොයෙක් ගුරු සංවිධාන සම්බන්ධවෙලා විශාල කලබගෑනියක් ගෙන ගියා, මේ පාසල් පර්ෂද පිළිබඳව. නමුත් මා ඉතාමත්ම සන්තෝෂයි කියන්න පාසල් පර්ෂද, එහෙම නැත්නම් පොකුරු පාසල් ව්‍යාපෘතිය දැන් ඉතාමත්ම සාර්ථකව අත්හද බලාගෙන යන බව.

රජය අධ්‍යාපන ධවල පත්‍රිකාව ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ ගැන පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළ වෙලාවේදී, ඉතාමත්ම දරුණු විධියට පාසල් දරුවන් ඔක්කොම වාගේ පංති වර්ජනය කළ එක දිස්ත්‍රික්කයක් තමයි හම්බන්තොට දිස්ත්‍රික්කය. ගරු ඇමතිතුමාටත් ලොකු ප්‍රශ්නයක් වුණා මේ පාසල්වලින් එළියට ආ දරුවන් ආපසු පංති කාමරවලට යවා, පංති ආරම්භ කරන්නේ කොහොමද කියන එක. නමුත් මම අද සන්තෝෂයෙන් මතක් කරනවා ඉතාමත්ම ප්‍රායෝගික වශයෙන් කියාත්මක වන, සාර්ථකව ක්‍රියාත්මක වන, පාසල් පර්ෂද තිබෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බව. එද මේ ගැන දරුවන් කිසිදෙයක් දැනගෙන සිටියෙ නැහැ. නමුත් අපට පුළුවන් වෙලා තිබෙනවා අවුරුදු කිහිපයක් තුළ රුපියල් එක්කෝටි අසූ ලක්ෂයක් වෙන් කරන්න පාසල් පර්ෂද ව්‍යාපෘති යටතේ පමණක්. 1983දී ලක්ෂ 50කුත්, 1984දී ලක්ෂ 60කුත්, 1985දී ලක්ෂ 70කුත් පාසල් පර්ෂද ව්‍යාපෘතිවලට වෙන්කර තිබෙනවා. එයින් බලාපොරොත්තු වුණේ ඒ පාසල් පර්ෂදයට අයත්වන පාසල්වල – තනිකර පාසල් මට්ටමෙන් නොවෙයි – ව්‍යාපෘති හරිගස්සා ගන්නයි. පර්ෂදයකට පාසල් 10ක් ඇතුළත් වෙනවා නම් ඒ පාසල් දහයේම විදුහල්පතිවරුන් දහදෙනාම එකට එකතුවෙලා වාර්තාවක් හරිගස්සා අත්‍යාවශ්‍ය පාසල් ගොඩනැගිලි, ගුරු නිවාස, පංති කාමර, අතිකුත් අවශ්‍යතාවයන්, වුවමනා කරන උපකරණ, බඩුමුට්ටු මොනවාද කියා ඒ වාර්තාවේ සඳහන් කොට එය ප්‍රාදේශීය කාර්යාලයට ඉදිරිපත් කළාම ඒ අනවු ඒ පාසල් දියුණු කිරීමට පියවර ගන්නවා.

දුෂ්කර පළාත්වල ගුරු හිඟයක් තිබෙන බව පසුගිය කාලවලදීත් අදත් මේ සභාවේදී ප්‍රකාශ වුණා. විශේෂයෙන් විද්‍යා, ගණිත, ඉංග්‍රීසි ආදී විෂයයන් සම්බන්ධව ගුරු හිඟයක් රටේ තිබෙන බව හැබැයි. විද්‍යා, ගණිත අවශ්‍යතාව ඇතිවුණේ තාක්ෂික අධ්‍යාපනය ලබාදීම සඳහා අධ්‍යාපනයේ දියුණුවක් ඇතිවන බව සමාජයට පෙන්වන්නට මේ රජය බලයට පත්වීමෙන් පසුව යම් යම් ක්‍රියාමාර්ගයන් ගත් නිසයි. විශේෂයෙන් රූපවාහිනිය පැමිණීම, පරිගණක යන්ත්‍ර පාවිච්චියට ගැනීම ආදී විද්‍යාව හඳුන්වාදීමේ ක්‍රියාමාර්ග නිසා තාක්ෂණික ලෝකය පිළිබඳව අලුත් අවබෝධයක් අලුත් දැනුමක් ලබාගැනීමට දක්වූ උනන්දුවත් උද්‍යෝගයත් නිසා විද්‍යා ගණිත ආදී විෂයයන්වලට පාසල් තුළිනුත් පාසල් දරුවන් තුළිනුත් තද ඉල්ලුමක් තිබුණා.

ගුරු විද්‍යාලවල ගුරු පුහුණුව පසුගිය කාලවල ඉතාමත් කනගාටුදායක තත්ත්වයකට අඩාල වී තිබුණ නිසා අවශ්‍යතාව අනුව ගුරුවරුන් ලබාදීම පිළිබඳ අඩුපාඩුවේ සම්පූර්ණ බර දරන්න සිද්ධවුණේ, ඒ වගකීමට සහ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධවුණේ අපටයි; අපේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි. ගුරු පුහුණුව ලබා දෙන්නට නොහැකි වූ ගුරුවරුන් 15,000ක් පමණ අද තවමත් ඉන්නවා. නමුත් 1990 වනවිට ලංකාවේ සියලුම ගුරුවරුන්ට කිසිම අඩුපාඩුවක් නැතිව ගුරු විද්‍යාලවල පුහුණුව දී අවසන් කරන්න පුළුවන් වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

දැනටත් ගුරු පුහුණුව සඳහා අවුරුද්දකට 4;000ක් බැගින් ගන්නවා. විශේෂයෙන් දූරස්ථ අධ්‍යාපන සේවය ලෝකයේ නොයෙක් රටවල ක්‍රියාත්මක වෙනවා ; දූරස්ථ අධ්‍යාපන සේවය මගින් ගුරුවරුන් පුහුණු කරනවා. ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේදී මෙය වැඩි වාසිදායක තත්ත්වයක්. පෞද්ගලික ප්‍රශ්න, පවුල් ප්‍රශ්න, දූ දරුවන් පිළිබඳ ප්‍රශ්න ආදිය වළක්වාගන්න පුළුවන්. විශේෂයෙන් කුඩා දරුවන් ඇති පවුල්වල ගුරුවරුන්ට තම කුඩා දරුවන් පිළිබඳ ප්‍රශ්නය නිසා එක දිගට අවුරුද්දක් දෙකක් තුනක් ගුරු විද්‍යාලවලට ගිහින් නේවාසිකව සිටීම අපහසුයි. ආර්ථික වශයෙන් එහෙම නැත්නම් පවුල් ජීවිතය වශයෙන් ප්‍රශ්න හා ගැටළු පැන නගින්න පුළුවන්.

අපේ අධ්‍යාපන ඇමතිතුමා හඳුන්වා දුන් එක් ක්‍රමයක් තමයි මේ දූරස්ථ අධ්‍යාපන සේවය. ලෝකයේ නොයෙක් රටවල අත්හදා බලා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. දූරස්ථ අධ්‍යාපන ක්‍රමයෙන් ඒ ඒ විෂයයන් පිළිබඳව ලබාගන්නා දැනුම එදිනෙදා විද්‍යාලයේ පංති කාමරයේ දරුවන් සමග ප්‍රමාදයක් නැතිව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරගන්නත් පුළුවන්. මේ සඳහාත් දැනට ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් බඳවාගෙන තිබෙනවා.

මම කියාගෙන ආවේ පාසල් පර්ෂද ගැනයි. පුහුණුව ලත්, සුදුසුකම් ඇති ගුරුවරුන් ලබාදීමේ අඩුපාඩුව නිසා ගුරු හිඟයක් තිබුණා. නමුත් මෙම පාසල් පර්ෂද ක්‍රමය නිසා එම පර්ෂද මූලස්ථ පාසලේ හෝ ඒ පර්ෂදයට අයිති විද්‍යාලයක හෝ සිටින පුහුණුව ලබාගත් ගුරුවරුන්ගේ සේවය සතියේ දවස් දෙකක් හෝ තුනක් අනික් පාසල්වලට ලබාදීමෙන් ඒ දරුවන්ගේ අවශ්‍යතාව සපුරා දෙන්නත් පුළුවන්කම තිබෙනවා. පුස්තකාල පහසුකම් බෙද හද ගැනීමත්, ක්‍රීඩා පිට්ටනි පහසුකම් බෙද හද ගැනීමත් ආදී නොයෙක් අන්දමේ ක්‍රියා රාශියක් පාසල් පර්ෂද ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ දියුණු තත්ත්වයක අත්දැකීමක් අපට ලබාගන්නට පුළුවන් වී තිබෙනවා.

ලබන අවුරුද්ද නොහොත් 1986 වන විට අප බලාපොරොත්තු වෙනවා අද තිබෙන පාසල් තිස්හත පනස්හත දක්වා වැඩි කරන්න. ඒ පනස්හතට දරුවන් 2,45,869ක් ඇතුළත් වෙනවා. මේ ව්‍යාපෘතිය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කරගන්න අපට පුළුවන් වේවි කියා විශ්වාසයක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය අනුක්‍රමයෙන් තවත් පාසල් වෙත බෙද හරින්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ මොකද, මේ ක්‍රමයෙන් තමයි, පාසල් දරුවන්ට පොත්පත් ලබාදීමටත්, පුහුණු ගුරුවරුන් ලබාදීමටත් පුළුවන් වන්නේ. පුහුණු ගුරුවරුන් බඳවා ගැනීම සඳහා අපි දැන් අලුත් වැඩපිළිවෙළක් ඇතිකර තිබෙනවා. දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ අපි අධ්‍යාපන පීඨ ඇතිකර තිබෙනවා. ගුරු පුහුණුවෙන් පස්සෙයි, ඒ ගොල්ලන් ගුරුවරුන් හැටියට පාසල්වල සේවය කරන්න යන්නෙ. ඒකෙන් නිදහස් අධ්‍යාපනයේ සම අවස්ථාවක් ලබාදෙන්නට පුළුවන්කම තිබෙනවා. දක්ෂතාව හැකියාව උගත්කම සුදුසුකම තිබෙන ගුරුවරුන්ගේ සේවය දරුවන්ට ලබාදීමෙන්.

ඊළඟට පාසල් පර්ෂද ව්‍යාපෘතිය ක්‍රමානුකූලව සැලැස්මක් අනුව, කිසියම් විනයානුකූල පාලනයක් ඇතිව්ගෙන යනවා. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල දිස්ත්‍රික් මට්ටමේ පාසල් පර්ෂද ක්‍රමය කරා බෙද හැරීම කිසියම් සැලැස්මක් අනුව කරනවා. ඒ මුදලින් උපරිම ප්‍රයෝජනය ලබාදෙන්නට කිසියම් ක්‍රියා පිළිවෙළක් යොදනවා.

ඊළඟට ඉංග්‍රීසි අධ්‍යාපනය ගැන මතක් කළයුතුයි. විරුද්ධ පාර්ශවයේ කථා කීපයකින් කියවුණා, ඉංග්‍රීසි ගුරුවරුන් නැහැ කියා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලැජ්ජා වන්නට ඕනෑ, ඉංග්‍රීසි අධ්‍යාපනය එපාය කියා කෑ ගහපු පිරිසක් ඉන්නවා නම් ඒ ගොල්ලො පමණයි. 1956 අවුරුද්දේදී තමුන්නාන්සේලාට මතක ඇති පැය 24 න් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරනවාය කියා. ගමේ රටේ ඉන්න ඔක්කොම වෙද මහත්වරුන් ගුරුවරුන් එකට එක්කාසු කරගෙන සංස්කෘතික විප්ලවයක්ය කියා කෑ ගහලා නැගිටලා ඉවර වෙලා ඉදිරියට ආවා. "සමාජයේ තත්ත්වය නැතිවෙලා ඉන්නේ ඉංග්‍රීසි කතා කරන මිනිස්සු. කුරුඳුවත්තේ මිනිස්සු විතරයි ඉංග්‍රීසි කථා කරන්නේ. පර භාෂාවක් අපිට එපා " කියා ඉංග්‍රීසි භාෂාව සම්පූර්ණයෙන්ම තුච්ච කොට දැම්මා. " සිංහල පමණයි " කියා කෑ ගැහැව්වා. ඒකෙන් ඇති වෙච්ච වේදනාව නව කාලන්තරයක් තිස්සේ ඉදිරියටත් ඇදී ගෙන යන විධියට අපි දුක් විඳිනවා.

පාසැල්වල ඉංග්‍රීසි අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අඩාල වුණා. ඉංග්‍රීසි ගුරුවරුන් බඳවා ගත්තේ නැහැ. ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කළේ නැහැ. ගුරු විද්‍යාල ජරාවාස බවට පත්වෙලා ගියා. අධ්‍යාපනය අඩාල වුණා. ක්‍රමානුකූලව ටිකින් ටික අවුරුදු කීපයක් යනකොට පාසැල් වලින් ඉංග්‍රීසි ගුරුවරුන් නැත්තටම නැති වෙලා ගියා. අද පාසැල්වල හයදහක් හත්දහක් විතර ඉංග්‍රීසි ගුරු හිඟයක් පවතිනවා. මේ ගොල්ලො හිතුවේ මේ ලංකාව විතරක් වට කරගෙන ඉන්න පුළුවන්ය කියලයි. නමුත් තාක්ෂණික දියුණුව නිසා ලෝකයේ තිබෙන නොයෙක් නොයෙක් දියුණුවූ අපේ දරුවන්ටත් දැක බලා ගන්නට අවශ්‍යතාවය ලැබුණු නිසා, විවෘත ආර්ථික ක්‍රමය නිසා, රටේ නූතන ආර්ථික ප්‍රතිපත්තිය නිසා හැකියාව, දක්ෂතාව, උනන්දුව, අධ්‍යපන සුදුසුකම් තිබෙන දරුවන්ට මේ රටේ පමණක් නොවෙයි, ලෝකයේ ඕනෑම රටකට ගිහිල්ලා ජීවන වෘත්තිය සොයා ගන්නට, ආර්ථික ලාභ ලබා ගන්නට පුළුවන්කම තිබෙන බව දැන ගත් නිසා මුළු රටටම එකවරම පෙණුනා ජාත්‍යන්තර භාෂාවක් අවශ්‍යයි කියා. අපි කියන්නෙ ඉංග්‍රීසි භාෂාව නොවෙයි. ලෝකයේ වැඩි දෙනෙක් කථා කරන වෙන මොකක් හෝ ජාත්‍යන්තර භාෂාවක් පහසුවෙන් ලබා ගන්නට පුළුවන් නම් ඒක අත්‍යාවශ්‍ය දෙයක් වෙලා තබෙනවා, අද සමාජයට. නමුත් ඒ ගොල්ලෝ එසේ කළේ නැහැ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහ ලොකුවට පාසැල්වලට ඉංග්‍රීසි ගුරුවරුන් නැහැ, ඉංග්‍රීසි ගුරුවරුන් පත් කරන්නේ නැහැ, ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කරන්නේ නැහැ කියමින් වාසියක් ගන්න කථා කරනවා. විපක්ෂයේ නායකතුමා එයාගේ සහෝදරයින් ඔක්කොම එක්ක මේ රටේ සිංහල විතරය කියලා කෑ ගහලා, පියාඹා ගියා පිටරටවලට පරගැති භාෂාවක්ය කියලා කෑ ගහපු ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලබා ගන්නට. ඒ ගොල්ලො හොඳ විද්‍යාලවල කෑ ගැහුවා.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) කිව්වා, ලොකු විද්‍යාලවලට අවිස්සාවේල්ලේ ඉඳලා දරුවන් බස්වල එනවාය කියා. අපේ දරුවෝ කවුරුත් කැමතියි, ඒවාගේම ඕනෑම අම්මා කෙනෙක්, ඕනෑම පියෙක් කැමතියි, තමන් ආදරයෙන් කරුණාවෙන් හදා ගත්තු දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නට. එහෙම හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නට පුළුවන්කම තිබෙනවා නම් ඒක ලොකු දෙයක්. නමුත් මේ ගොල්ලො හිතන්නේ ලොකු අපරාධයක්ය කියල ලොකු විද්‍යාලයකට යන එක. විශාඛා විද්‍යාලයට යන එක ඒ තරම් ප්‍රශ්නයක් ලෙස කියනත් මේ රටේ දරුවන්ට පිටරට යන්නට බැරි අවස්ථාවකදී, විදේශ ගමන් තහනම් වී තිබුණු වෙලාවේදී, සුපිරි පන්තිය හැටියට වැජඹුණු හොරගොල්ලේ වලව්වේ – විපක්ෂ නායකතුමාගේ පවුලේ – දරුවන් පමණක් සෝර්බෝන් ආදී විශ්ව විද්‍යාලවලට ගිහිල්ලා අධාපනය ලබා ගෙන මෙහාට ආවා. අද ඉග්‍රීසි ගැන කථා කරනවා. එද තහනම් දෙයක් වෙලා තිබුණා. ශ්‍රීමත් ජනාධිපතිතුමන්ගේ බලවත් උනන්දුව හා අපේ ගරු ඇමතිතුමාගේ බලවත් පරිශ්‍රමය හේතුකොටගෙන විදේශීය ආයතනවල, විශේෂයෙන් එංගලන්තය ආදී රටවල ආධාර ලබා ගෙන ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා විශේෂ පාඨමාලා 18 ක් ලංකාවේ හැම තැනම ක්‍රියාත්මක වෙනවා. මේ අවුරුද්දේත් පත්වීම් රාශියක් ලබා දුන්නා, ගුරුවරුන්ට. උසස් පෙළ සමත් ඉංග්‍රීසි භාෂාවෙන් සම්මාන ලබාගෙන තිබෙන දරුවන්, දිස්ත්‍රික් මට්ටමෙන් ගම්බද දරුවන් තෝරා ගෙන තිබෙනවා. මගේ මැතිවරණ කොට්ඨාශයෙනුත් කීප දෙනෙකු තෝරා ගෙන තිබෙනවා. බණ්ඩාරවෙල අධ්‍යාපන දිස්ත්‍රික්කයේත් ඒ විධියේ පාඨමාලාවක් තිබෙනවා. ඒ දුෂ්කර පළාත්වල දරුවන් සියයක් විතර ලබන අවුරුද්දේ පාසල්වලට පත්වීම් ලබා ගෙන යනවා.මේක දිගමට ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙළක්.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා, අපි ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය විෂයක් බවට පත් කරන්නට සූදානම් වෙනවාය කියා. නැහැ. අනිවාර්ය විෂයක් කරනවා නොවෙයි, අපි දැඩි අවධානය යොමු කරනවා ; කෙසේ හෝ ජාත්‍යන්තර භාෂාවක් ඉගැන්වීමේ අවශ්‍යතාවය වගකීමක් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගන්නවා. සිංහල පමණක් මදි, ලෝකයේ ජනගහණයෙන් සිංහල භාෂාව කථා කරන සංඛ්‍යාවේ සියයට ප්‍රමාණය දෙස බැලූවාම, දියුණු වන ලෝකයේ, පුංචි වන ලෝකයේ තාක්ෂණික දියුණුවක් ලබන ලෝකයේ ආර්ථික වාසියක් බලාපොරොත්තු වෙනවා නම්, සිංහල භාෂාවෙන් පමණක් අපේ දරුවන් උගතුන් බවට පත් කරලා වෙනස් වන ලෝක ආර්ථිකයේ අපි ලබා ගන්නා තැන මොකක්ද කියන එක ගැන අපි විමසිලිමත් වන්නට ඕනෑ. විරුද්ධ පාර්ශ්වයේ උදවිය තර්ක කරන්නේ දේශපාලන වශයෙන් වාසි ගැනීමට පමණයි. අපි බලාපොරොත්තු වන්නේ ඉංග්‍රීසි විෂය ප්‍රායෝගිකව අනිවාර්ය විෂයක් කරන්න නොවෙයි. අනිවාර්යයෙන්ම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පුළුවන් තරම් දැඩි පරිශ්‍රමයක් දැරීමයි, අපේ බලවත් වැයම වී තිබෙන්නේ. ඒ සඳහායි, අපේ අවධානය යොමු වී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ එක්කම පිරිවෙන් අධ්‍යාපනය ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. පිරිවෙන් අධ්‍යාපනය දැඩි විධියට අඩාල වී තිබුණායයි අපේ පිරිවෙන් කරවන සියලුම ස්වාමීන් වහන්සේලාගෙන් කාලාන්තරයක් තිස්සේ තදබල දෝෂාරෝපණයක් එල්ල වී තිබුණා. ඒ නිසා ඒ සඳහා කිසියම් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑයයි කියැවුණා. අපේ හිටපු ගරු අධ්‍යාපන ඇමතිතුමා—වර්තමාන ගරු අධිකරණ ඇමතිතුමා—ඉදිරිපත් කළ කමිටු වාර්තාව අනුව අපේ වර්තමාන ගරු අධ්‍යාපන ඇමතිතුමා පිරිවෙන් අධ්‍යාපනය නව නැම්මකට යොමු කිරීම සඳහා අලුත් පනතක් ඇති කළා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද බෞද්ධ සංස්කෘතිය ගැන, සිංහලය ගැන, සංඝයා වහන්සේලා ගැන බොහොම තදින් ඝෝෂා කරනවා. නමුත් ඒ අයගේ පාලනය කාලයේදී පිරිවෙන් අධ්‍යාපනය ලැබූ ස්වාමීන් වහන්සේ නමකට මුළු අවුරුද්දකටම යැපෙන්න දුන්නේ රු. 150යි. ඒ කියන්නේ ඒ කාලයේදී පිරිවෙනක ඉගෙන ගත් ස්වාමීන් වහන්සේ නමක් මුළු අවුරුද්දක්ම රු. 150කින් තඩත්තු විය යුතුව තිබුණු බවයි. දැන් සංඝයා වහන්සේලා ගැන බොහොම කැක්කුමෙන් කථා කරන විරුද්ධ පාර්ශ්වයේ උදවිය ඒ කාලයේ කටයුතු කළේ ඒ විධියටයි. ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති කොට අවුරුද්දකට එක ස්වාමීන් වහන්සේ නමකට රු. 750 ගණනේ දීම දැන් ක්‍රියාත්මක වෙනවා. ඒ අතර ගිහි ශිෂ්‍යයෙකුට දැන් අවුරුද්දකට රු. 150ක් ලැබනවා. ඒ කොහොම වුණත් පිරිවෙන්වල ඉගෙන ගන්නා එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දැන් සාමාන්‍යයෙන් අවුරුද්දකට රු. 950—1,000කට කිට්ටු මුදලක් වැය කරනවා. මා හිතන්නේ 1986 අවුරුද්දේ පිරිවෙන් වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා, රු. 5,80,00,000ක්.

අපේ අලුත් පිරිවෙන් පනත පටන් ගන්නා විට හිටපු පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාව 9,400යි. අලුත් පිරිවෙන් පනත ක්‍රියාත්මක වුණාට පස්සේ අද ඉන්නවා. ස්වාමීන් වහන්සේලා 18,274ක්. ඒ ස්වාමීන් වහන්සේලා ක්‍රමානුකූලව සකස් කර ගන්න අපට ගරුතර මහා සංඝයා වහන්සේලාගෙන් ආධාර—අනුබල ලැබෙනවා නම් අනාගත භික්ෂු පරම්පරාව හරිගස්සා ගන්න එය ඉමහත් රුකුලක් වෙනවා. ඒ විධියට උන්වහන්සේලා විනයානුකූලව හැඩගස්වා ගන්න පුළුවන් වුණොත් සුළු ප්‍රශ්නවලට හන්දි ගානේ බෝක්කු උඩ වාඩි වෙන්න, වහලවල් උඩ නගින්න උන්වහන්සේලා යයි කියා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ කාලයේ විනයානුකූලව උන්වහන්සේලා හැඩගැස්වුයේ නැති නිසා, ඒ සඳහා ක්‍රමානුකූල පියවර නොගත් නිසා තමයි, මුළු බෞද්ධ ලෝකයාම කනගාටු වන විධියට ඇතැම් ස්වාමීන් වහන්සේලාත් ගිහි ශිෂ්‍යයන්ගේ ගණයට වැටී වහලවල් උඩ නැග්ගේ. එය බලවත් කනගාටුවට කරුණක්.

ඒ තත්ත්වය නැති කර ගන්න පිරිවෙන් පාඨමාලාවල විෂයය මාලාවෙන් සියයට 60කට වඩා දී තිබෙනවා, ප්‍රායෝගික වශයෙන් බෞද්ධ ධර්මයේ විනයානුකූලව හැඩගැස්ම ඇති කර ගන්න. දැන් අපි හැම දිස්ත්‍රික්කයක් පාසාම භාවනා පාඨමාලා පවත්වාගෙන යනවා. පිරිවෙන්වල අධ්‍යාපනය දෙන ගුරු ස්වාමීන් වහන්සේලා එක තැනකට ගෙන්වා ගෙන සති දෙකක භාවනා පාඨමාලාවක් තබා, දැන් ඒ විධියට ගුරු ස්වාමීන් වහන්සේලා 150 දෙනකුට පසුගිය කාලයේදී පුහුණු කර තිබෙනවා. ඒ විධියට භික්ෂූන් වහන්සේලා අවුරුද්දේ සිට අපේ පිරිවෙන්වල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ඒ පාඨමාලාව ලබා දෙන්න කටයුතු කරගෙන යනවා.

අ. භා. 3.30

පසුගිය කාලයේදී පිරිවෙන් ගුරුවරුන් හිටියේ තදබල අවාසිසහගත තත්ත්වයකයි. ඒ අයට කිසිම අයිතිවාසිකමක් තිබුණේ නැහැ. නමුත් අද ඒ පිරිවෙන් ගුරුවරුන්ට දහ අවුරුදු සේවා කාලයකින් පස්සේ රජයේ ගුරුවරුන්ට වගේ විශ්‍රාම වැටුපක් ලැබෙන තත්ත්වයක් තිබෙනවා. අද ඒ අයට අහිමි වී තිබෙන්නේ දුම්රිය බලපත්‍ර පමණයි. අපි අනෙක් හැම අයිතියක්ම ඒ පිරිවෙන් ගුරුවරුන්ට ලබා දී තිබෙනවා.

සෑම දිස්ත්‍රික්කයකම අපි පිරිවෙන් සංස්කරණ සම්මේලන පවත්වා තිබෙනවා. සියලුම පිරිවෙන් කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේලා, ගුරු ස්වාමීන් වහන්සේලා, ගුරුවරුන් ගෙන්වා ප්‍රායෝගිකව පිරිවෙන් පනතේ තිබෙන අඩුපාඩුකම් සාකච්ඡා කොට ඒවා සම්පූර්ණ කර දීමටත් අපි ක්‍රියා කර තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයෙන් මේ ආදී වශයෙන් විශාල වැඩ කොටසක් කෙරීගෙන යනවා.

ඊළඟට, තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. අද රටේ වැඩිහිටි හැම කෙනාම පාහේ කථා කරනවා, අපේ පාසල් දරුවන් මත් ද්‍රව්‍ය භාවිතයට යොමු වෙනවාය කියා. නමුත් 1983 දී ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සම්පූර්ණ අනුග්‍රහය ඇතිව මත් ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව දරුවන්ට අවබෝධයක් ලබා දෙන්න අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක මණ්ඩලයක් පිහිටුවා ගන්නා. මේ අවුරුද්ද අවසාන වන විට කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික් කීපයක වෛද්‍ය විශේෂඥවරුන්, අධ්‍යාපනඥයන් මත් ද්‍රව්‍ය නාශක මණ්ඩලය, කොළඹ පදනම ආදී වශයෙන් මේ පිළිබඳව දන්නා උදවිය ගෙන්වා අපි සම්මන්ත්‍රණ පවත්වා දරුවන් 50,000 කට පමණ මේ පණිවුඩය දී තිබෙනවා. ගුරුවරුන් 5,000 කට, දෙමව්පියන් 5,000 කට මේ පණිවුඩය — මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පණිවුඩය — ලබා දී තිබෙනවා. මේ සම්බන්ධයෙන් දරුවන්ට කිසියම් අවබෝධයක් ලබා දීම සඳහා කථික තරඟ, රචනා තරඟ ආදිය පවත්වා රුපියල් 35,000ක් පමණ වටිනා ත්‍යාග ඒ දරුවන් අතර ප්‍රදානය කර තිබෙනවා. මේ පිළිබඳව දක්වූ උනන්දුව, ප්‍රායෝගිකව ගත් ක්‍රියා මාර්ගය නිසා ගරු ඇමතිතුමා ලබන අවුරුද්දටත් ඒ වැඩ පිළිවෙළ සඳහා රුපියල් ලක්ෂ පහක් වෙන් කර දී තිබෙනවා. හුඟක් දෙනෙක් කිව්වා, සම්මන්ත්‍රණ මගින් දරුවන්ගේ මත් ද්‍රව්‍ය භාවිතය නැති කරන්න බැරිය කියා. නමුත් ප්‍රායෝගිකව පිළිගෙන තිබෙනවා, සත්‍යය අවබෝධ කර දුන්නොත්, කාරණය අවබෝධ කර දුන්නොත් අපේ දරුවන් කිසිම කෙනෙක් නොමඟ යන්නෙ නැති බව. අපට එය සහතිකවම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වඩා කාලයක් ගන්න මා බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ගරු ඇමතිතුමාට වෙලාව දීම අවශ්‍යයි. මෙම අවුරුද්දේ වැඩ කටයුතු කරගෙන යාමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයෙන්ද ප්‍රාදේශීය කාර්ය මණ්ඩලවලින්ද ලැබුණ සහයෝගය අපි ඉතාම සතුටින් මතක් කරනවා. අපේ අමාත්‍යාංශය ප්‍රශ්න ගණනාවක් තිබුණ අමාත්‍යාංශයක්. ඒ ප්‍රශ්න ලිහිල් කරගෙන සියලු දෙනාගේම හිත් දිනාගෙන, විපක්ෂයට ප්‍රබල පහරවල් එල්ල කරන්නට බැරි තත්ත්වයකට, ඔවුන් නිහඬ කරන්නට පුළුවන් තත්ත්වයකට, අපි ප්‍රායෝගිකව ප්‍රශ්නවලට මුහුණ දුන් බව මතක් කරන්න ඕනෑ. ඒ ප්‍රශ්නවලට ප්‍රායෝගිකව මුහුණ දෙන්නට තරම් ශක්තියක් ධෛර්යයක් අපේ ඇමතිතුමාට තිබුණා. ලබන අවුරුද්දේදීත් රටේ ලක්ෂ සංඛ්‍යාත දරුවන්ගේ අනාගතය සාර්ථක කරන්නට සුදුසු වැඩ පිළිවෙළක් ඇති කර ගන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**රනිල් වික්‍රමසිංහ මහතා**
**(திரு. ரணில் விக்ரமசிங்ஹ)**
**(Mr. Ranil Wickremasinghe)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් පනස් ගණනක් නම් දී තිබුණා. ඒ සියලු දෙනාටම අවස්ථාව නොලැබීම ගැන මා මේ අවස්ථාවේදී කණගාටු වෙනවා.

ඇත්තවශයෙන්ම අධ්‍යාපනය අදත් එදත් හැම මන්ත්‍රීවරයෙකුටම, හැම මැතිවරණ කොට්ඨාශයකටම, හැම ගමකටම බලපාන ප්‍රශ්නයක්. එදට වඩා විශේෂයෙන් අද එය බලපානවා. අද වැය ශීර්ෂය ගැන කථා කරන අවස්ථාවේදී එක් කරුණක් ගැන මා සතුටු වුණා. ඉස්සරට වඩා දේශපාලනයෙන් තොරව අධ්‍යාපනය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් කථා කිරීම ගැනයි, මා සතුටු වෙන්නෙ. අධ්‍යාපනය කියන්නෙ සටන් පාඨවලින් දරුවන් දියුණු කිරීම නොවෙයි. අපේ දැන් තිබෙන පාසල් ක්‍රම, උසස් අධ්‍යාපන ක්‍රම, සැලසුම් ආදිය දෙස බලා ඒවායේ තිබෙන අඩුපාඩුකම් මොනවාද, අපි දැනට ඇති කරගෙන තිබෙන ප්‍රගතිය කුමක්ද, ආදී කරුණු සංසන්දනය කර බලමින්, අනාගතය දෙස බලන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පක්ෂයෙනුත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. ඒ වගේම අඩුපාඩුකම් පෙන්නුවා. ඒ සම්බන්ධයෙන් මම පළමුවෙන්ම මේ සභාවේ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මා මේ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමාට ස්තුති කරන්න කැමතියි. ආරක්ෂක අංශයෙන් ඉතාමත් අමාරු තත්ත්වයකට අද අපි මුහුණ දී තිබෙන බව මේ ගරු සභාවත් රටත් පිළිගන්නා කාරණයක්. මීට පෙර රටේ ආරක්ෂාව සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයට වඩා විශාල මුදල් ප්‍රමාණයක් මේවර අපට වෙන් කරන්නට සිදුවී තිබෙනවා. ඒ සියල්ලත් සමගම අධ්‍යාපනයට ලබා දෙන මුදලත් අඩු නොකර වැඩි කිරීම ගැන මම ගරු මුදල් ඇමතිතුමාට පළමුවෙන්ම ස්තුති කරන්න කැමතියි. මේ රටේ මුළු අයවැය රුපියල් දස ලක්ෂ 67,000යි. එයින් දස ලක්ෂ 5,840ක් රටේ ආරක්ෂක කටයුතු සඳහා වෙන් කර තිබෙනවා. මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් බලන විට ඒ කටයුතු සඳහා අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. ඒ හැරෙන විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රනිල් වික්‍රමසිංහ මහතා]

කාර්මික අධ්‍යාපනය සඳහා තවත් අමාත්‍යාංශ කීපයක් සම්බන්ධ වෙනවා. යෞවන කටයුතු අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය ආදියත් සම්බන්ධ වෙනවා. ඒ සියල්ලම තිබියදී අධ්‍යාපන අමාත්‍යාංශයටත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටත් විශෙෂ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. අද අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් දස ලක්ෂ 4,117ක් වෙන් කර තිබෙන අතර උසස් අධ්‍යාපනය සඳහා රුපියල් දස ලක්ෂ 1020ක් වෙන් කර තිබෙනවා. ඒ දෙකේ එකතුව දස ලක්ෂ 5,137ක් වෙනවා. රටේ ආරක්ෂාව සඳහා දස ලක්ෂ 5,840යි. අධ්‍යාපනය සඳහා දස ලක්ෂ 5,137යි. ආර්ථික වශයෙන් අමාරු කාලයක අධ්‍යාපනය දියුණු කිරීමට මෙතරම් මුදල් ප්‍රමාණයක් වෙන්කිරීම ගැන මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අධ්‍යාපන අමාත්‍යාංශයේ සමහර වැඩ කටයුතු ගැන සඳහන් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මීට ඉස්සෙල්ලා කතා කළ අධ්‍යාපන සේවා ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අප කර තිබෙන වැඩ කටයුතු ගැන සඳහන් කළා. මේ අවුරුද්ද තුළදී නව පාසල් 50ක් විවෘත කරන්නත් දැනට තිබෙන පාසල් 118ක් ඊට වඩා උසස් මට්ටමට ගේන්නත් අමාත්‍යාංශය ක්‍රියා කර තිබෙනවා. '1—ඒ. බී.' පාසල් අළුතෙන් එකක් ආරම්භ කර තිබෙනවා. දැනට තිබෙන පාසල් විසි නවයක් '1—ඒ. බී.' තත්ත්වයට උසස් කර තිබෙනවා. අධ්‍යාපන අවස්ථා මේ රටේ හැම දිස්ත්‍රික්කයටම ලබා දෙන බලාපොරොත්තුවෙන් අපි පාසල් පනහක් වෙනකර තිබෙනවා. ඒ පාසල්වලට වුවමනා ගොඩනැගිලි හා උපකරණ ආදිය ලබා දී උසස් මට්ටමකින් ඒවා පවත්වාගෙන යෑමට කටයුතු කර තිබෙනවා.

මේ සභාවේ ඇතැම් සාමාජිකයන් සඳහන්කළ පරිදි අපේ අධ්‍යාපන ක්‍රමය බොහෝ දුරට සීමා වුණේ කොළඹ හා අනෙක් නගරවල පාසල් ස්වල්පයකටයි. විශේෂයෙන් කන්නන්ගර ඇමතිතුමාගේ කාලයේත් නුගවෙල ඇමතිතුමාගේ කාලයේත් මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීමට ක්‍රියා කළා. නමුත් අවාසනාවකට වාගේ 1970 කාලයේදී දියුණු වී තිබුණු මධ්‍යම මහා විද්‍යාල කීපයක් පරිහානියට පත් වුණා. අද අපි බලන්නේ පාඨශාලා දියුණු කිරීමටයි. නගරයෙන් පිටත තිබෙන පාසල් දියුණු කර උසස් මට්ටමකට ගේන්න කටයුතු කරනවා. නගරය තුළත් දියුණු පාසල් හා නොදියුණු පාසල් තිබෙනවා. අද විශේෂයෙන්ම කොළඹ නගරයත් ඒ අවට ප්‍රදේශත් දිහා බැලුවාම ජනගහනය වැඩි වන්නේ කොළඹ නගරයේ නොව ශ්‍රී ජයවර්ධනපුර, දෙහිවල, රත්මලාන, මොරටුව ආදී ප්‍රදේශවලත් වත්තල, කැලණිය, බියගම, ගම්පහ ආදී ප්‍රදේශවලත් බව පෙනෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශවලත් පාසල් දියුණු කරන්න ඕනෑ. කොළඹ නගරයේ දියුණු පාසල් ක්‍රමය සීමා වී තිබෙන්නේ බොරැල්ල, දකුණු කොළඹ ආදී ප්‍රදේශවලටයි. මැද කොළඹ ප්‍රදේශයේත් අපේ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා නියෝජනය කරන උතුරු කොළඹත් පාසල් දියුණු කරන්න වැඩ සටහන් සකස් කරගෙන යනවා. ඊට අමතරව ශ්‍රී ජයවර්ධනපුර, දෙහිවල, රත්මලාන, මොරටුව ආදී ප්‍රදේශවලත් කැලණිය, වත්තල ආදී ප්‍රදේශවලත්—

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

නැගෙනහිර කොළඹ පාසල් හොඳයි.

**රනිල් වික්‍රමසිංහ මහතා**
**(திரு. ரணில் விக்ரமசிங்ஹ)**
**(Mr. Ranil Wickremasinghe)**

මට අමතක වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නැගෙනහිර කොළඹ නව පාසල් කීපයක් ඇති කරන්න ගන්න උත්සාහය ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ළඟදී එකක් අසාර්ථක වුණා. ඔබතුමාගේ සහයෝගය ඇතිව ඩඩ්ලි සේනානායක විද්‍යාලයත් තවත් පාසල් කීපයකුත් දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ ආසනයේ තමයි, ඩඩ්ලි සේනානායක විද්‍යාලයත් සිරිමා බණ්ඩාරනායක විද්‍යාලයත් තිබෙන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
**(பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman)**

සිරිමා බණ්ඩාරණායක විද්‍යාලය ඒ කාලෙ වැටිල තිබුණා. දැන් හොඳයි. දැන් පළමුවැනි තැනට තියන්නෙ.

**රනිල් වික්‍රමසිංහ මහතා**
**(திரு. ரணில் விக்ரமசிங்ஹ)**
**(Mr. Ranil Wickremasinghe)**

ගිය ආණ්ඩුවට වඩා අපි පාසල් දියුණු කරන්න උත්සාහ ගත්තා. කොළඹින් පිට, නගරවලින් පිට පාසල් ගණනාවක් දියුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ පාසල් සඳහා අවශ්‍ය ගුරුවරුන් ලබා දෙන්නත් උපකරණ ලබා දෙන්නත් අනෙක් පහසුකම් ලබා දෙන්නත් අපි ක්‍රියා කරනවා.

ඒ සමගම දිස්ත්‍රික්ක මට්ටමෙන්, පාසල් මට්ටමෙන්, පරිපාලන දක්ෂතා දියුණු කරන්න අපි විශේෂයෙන් කටයුතු ආරම්භ කර තිබෙනවා. කළුතර තිබුණු අධ්‍යාපන පරිපාලන පුහුණු කිරීමේ ආයතනය මහරගම ගුරු විද්‍යාලයට ගෙනත් දැනට අළුත් වැඩ සටහනක් ආරම්භ කර තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් '1 ඒ.බී.' හා '1 සී' පාසල්වල විදුහල්පතිවරුන් හා ඊට අමතරව අධ්‍යාපන නිලධාරීන් පන්සියයකට මේ අවුරුද්දේ පුහුණු වීම් ලබා දී තිබෙනවා. ගුරු සේවයේ යෙදී සිටින අයට කෙටි කාලීන වශයෙන් පුහුණුවක් ලබා දීමේ වැඩ සටහන යටතේ, හතරවන අවුරුද්දේ ගුරුවරුන් 12,000කටත්, විශේෂයෙන් විද්‍යාව පිළිබඳව, පස්වන අවුරුද්දේ ගුරුවරුන් 25,000කටත් එම පුහුණුව ලබා දී තිබෙනවා. ඊට අමතරව ප්‍රාථමික අංශයේ ඉංග්‍රීසි ගුරුවරුන් 6,200කටත් කෙටි කාලීන ගුරු පුහුණුව ලබා දී තිබෙනවා. මෙම සංඛ්‍යාවට අමතරව මේ රටේ පාසල්වල ඉංග්‍රීසි විෂය උගන්වන්නට වුවමනා කරන ගුරුවරුන් ලබා දෙන්නට වැඩ සටහනක් අප ආරම්භ කර තිබෙනවා. මේ අනුව ඩෙලික් ආයතනය යටතේ පුහුණුව ලැබූ ගුරුවරුන් 504කට පත් වීම් ලබා දී තිබෙනවා. ඊට අමතරව අපි බලාපොරොත්තු වෙනවා, තවත් ගුරුවරුන් 1,340කට මේ අවුරුද්ද තුළදී පත්වීම් ලබා දෙන්නට. ඒ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණුව ඩෙලික් ආයතනයෙන් ලබා ගත් ගුරුවරුන්ටයි. එපමණක් නොවයි, අධ්‍යාපන විද්‍යායතන හයක් ආරම්භ කර එහි ආරම්භක පියවරක් හැටියට ශිෂ්‍යයින් 875 දෙනෙක් බඳවාගෙන තිබෙනවා. ඒ අය සඳහා නේවාසික පහසුකම් සියල්ලක්ම ලබා දීමටත්, ඊට අමතරව ඔවුන්ට කිසිම ආර්ථික ප්‍රශ්නයක් ඇති නොවන්නට ආහාර සඳහා දරන්නට වන වියහියදම් සම්බන්ධයෙන් මාසික දීමනාවක් ලබා දීමටත් කටයුතු යොද තිබෙනවා. කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ඒ අයගේ වියහියදම් ගැන සඳහන් කළා. අපි හැකි තරම් උත්සාහ කරනවා, වියහියදම් සම්බන්ධයෙන් මේ පිරිසට සහනයක් සලසා දෙන්නට. මේ අතර ශිෂ්‍ය කොමිටි දැන් පත් කරන්නට යනවා. අපි බලාපොරොත්තු වන මේ දීමනා ලබා දෙන්නේ ඒ අයට ආහාරය සඳහාත්, අධ්‍යාපන පීඨයට යාම-ඊම සඳහාත් දරන්නට වන වියදම් පියවා ගන්නටයි. මීට පෙර ඒ වාගේ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇතැයි මා කල්පනා කරන්නේ නැහැ. එම නිසා මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට අපට සහයෝගය දෙන ලෙස කලවානේ මන්ත්‍රීතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා. මෙම වැඩපිළිවෙළ අනුව අධ්‍යාපන විද්‍යායතනවලට ඇතුළුවන ශිෂ්‍යයන්ට, නවාතැන්, ආහාර පාන, ගමන් ගාස්තු ආදිය පිළිබඳව කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

මෙයට අමතරව ගුරු විද්‍යාල දානනට දුරස්ථ අධ්‍යාපන ක්‍රමය මගින් පුහුණුවක් ලබා දෙන්නට ගුරුවරුන් 2,000ක් ඇතුළත් කළා. ප්‍රාථමික ගුරු පුහුණුව සඳහා ගුරුවරුන් 5,625ක්ද, ද්විතීය පුහුණුව සඳහා—විශේෂයෙන්ම විද්‍යා, ගණිත ආදී විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා—ගුරුවරුන් 3,015ක්ද බඳවා ගෙන තිබෙනවා. ඒ අනුව, මේ දශකය අවසන් වෙන්නට පෙර, නොපුහුණු ගුරුවරුන් විසි පන් දහසකට පුහුණුව ලබා දීමෙන් පසුව අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නොපුහුණු ගුරුවරුන් නොසිටින බවට අපට බලාපොරොත්තු තබා ගන්නට පුළුවනි.

අ. භා. 3.45

ගුරු පුහුණුව ගැන සඳහන් කරන විට, මෙයට අමතරව මේ රටේ පැරණි වතු පාසල්වලට වුවමනා කරන ගුරුවරුන් පුහුණු කිරීමට අප ක්‍රියා කර ගෙන යන බව මතක් කරන්නට ඕනෑ. විශේෂ අධ්‍යාපනය සඳහා—මානසික ආබාධ ඇති දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා—උපාධිධාරී ගුරුවරුන් 20 දෙනෙකුට පුහුණුව ලබා දී තිබෙනවා. ඒ වාගේම තවත් ගුරුවරුන් 330කටත් ඒ අන්දමේ පුහුණුවක් ලබා දී තිබෙනවා.

ක්‍රීඩා අංශය ගැන සඳහන් කරන විට පසුගිය වර්ෂයේදී ක්‍රීඩා ගුරුවරුන් හැටියට 257 දෙනෙක් පාසල්වලට පත් කර තිබෙනවා. දැනට අපේ පාසල්වල ක්‍රීඩා මධ්‍යස්ථාන 105 ආරම්භ කර තිබෙනවා. ජපන් ආණ්ඩුවෙන්, වොලි බෝල්, ජිම්නාස්ටික් වැනි ක්‍රීඩා පිළිබඳ පුහුණුවක් අපේ ළමයින්ට ලබා දීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා. ස්වේච්ඡා ගුරුවරුන් අට දෙනෙකුගේ සහාය ලබා දී තිබෙනවා. මෙයට අමතරව ක්‍රීඩා සඳහා යොදු ගන්නට පුළුවන් ගුරුවරුන් කණ්ඩායම් කීපයක් දැනට අප සකස් කර ගෙන තිබෙනවා. විශේෂයෙන්ම දල් පන්දු හා අත් පන්දු යන ක්‍රීඩා දෙකෙන්ම ජාතික මට්ටමේ ජයග්‍රාහී කණ්ඩායම් බවට පත් වී සිටින්නේ මේ කණ්ඩායම්.

පිරිවෙන් අධ්‍යාපනය ගැන කථා කරන විට මා කියන්නට කැමතියි, දැනට ලියාපදිංචි වී ඇති පිරිවෙන් සංඛ්‍යාව 385ක් බව. මේවායේ ගිහි ශිෂ්‍යයන් 16,400 ක් සහ පැවිදි ශිෂ්‍යයන් 18,275 දෙනෙක් අධ්‍යාපනය ලබනවා. දසාරත්න වාර්තාව අනුව, මේ රටේ ගුරු සේවයේ යෙදී සිටින ගුරුවරුන්, විදුහල්පතිවරුන් වගේ අධ්‍යාපන සේවයේ සිටින විශාල පිරිසකට වැටුප් වැඩි කිරීමට අපට අවස්ථාවක් ලැබුණා. විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල ඇති පාසල්වල සේවය කරන්නන් සඳහා විශේෂ දීමනා ලබාදීමට කටයුතු කිරීමෙන් අනාගතයේදී එවැනි පාසල්වලට ගුරුවරුන් සොයා ගැනීමට නොමැතිකමේ ප්‍රශ්නය විසඳා ගැනීමට, එම අඩුපාඩුකම් සපුරා ගැනීමට එය ප්‍රබල ආයුධයක් හැටියට පාවිච්චි කිරීමට අපට අවස්ථාවක් ලැබෙනවා.

මේ කාලය තුළදී අධ්‍යාපන සේවා කමිටුවෙන් කලා උපාධිධාරී ගුරු පත්වීම් 1999ක් ලබා දී තිබෙනවා. විද්‍යා උපාධිධාරී ගුරු පත්වීම් 236 ක් ලබා දී තිබෙනවා. වතු පාසල් සඳහා ගුරුවරුන් 690කට දැන් පුහුණුවක් ලබා දෙන බව මම සන්තෝෂයෙන් මතක් කරන්නට කැමතියි. රුපියල් දස ලක්ෂ හැත්තෑ පහක් යොදවා තිබෙනවා, පාසල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට. පන්ති කාමර 100 ක් සඳහා රුපියල් දස ලක්ෂ හතක් වියදම් කර තිබෙනවා. වැසිකිළි කැසිකිළි සඳහා රුපියල් දස ලක්ෂ දහසයක් වියදම් කර තිබෙනවා. මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) හිටියා නම් එතු අවුරුද්දටත් මතුගමටත් වෙන් කර දෙන්න තිබුණා. ඊට අමතරව විද්‍යාගාර සඳහා රුපියල් දස ලක්ෂ දහයක් වියදම් කර තිබෙනවා. අමාත්‍යාංශයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවේ ප්‍රධාන අංශ පමණයි මෙහි සඳහන් කර තිබෙන්නේ.

මෙයට අමතරව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කථා කරන අවස්ථාවේදී කරුණු කීපයක් සඳහන් කළා. ඒ පිළිබඳව නියම තත්ත්වය පැහැදිලි කරන්නට මම බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය කිසි අවස්ථාවක ගුරුවරුන් පිළිබඳ විනය බලතල අධ්‍යාපන සේවා කමිටුවෙන් අරගෙන නැහැ. ගුරුවරයෙකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරන විට අන්තිම පියවර ගන්නේ අධ්‍යාපන සේවා කමිටුවෙනුයි. ඒ වාගේම ගුරුවරුන් බඳවා ගන්නා අවස්ථාවේ දී ඒ අය බඳවා ගන්නේ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරීන්ය කියා අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගෙන් නියෝගයක් ගිහින් නැහැ. මේ ඉල්ලුම් පත් සියල්ලක්ම දිස්ත්‍රික් තරුණ සේවා කාර්යාලයට යවන්නය කියා ඒ අවස්ථාවේදී අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් සඳහන් කළා. එයට හේතුවක් තිබෙනවා. දෙසැම්බර් මාසයේ දිස්ත්‍රික් අධ්‍යාපන කාර්යාලවල විභාග පවත්වන්නන් තිබෙනවා. ඒවාගේම පාසල් නොමැති දරුවන්ගේ දෙමවුපියන් ඒ කාර්යාලවලට එනවා. ඒවාගේම ගුරුවරුන් මාරු කිරීම් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා මේ ඉල්ලුම් පත්‍රත් දිස්ත්‍රික් අධ්‍යාපන කාර්යාලයට නොදී ඒ අයගේ වැඩ කටයුතු වැඩි නොකර තරුණ සේවා කාර්යාලයට භාර දෙන්නය කියා තීරණය කළා. දිස්ත්‍රික් මට්ටමේ සම්මුඛ පරීක්ෂණ පවත්වන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂත්, අධ්‍යාපන සේවා කමිටුවේ නියෝජිතයෙකුත්, තරුණ සේවා නිලධාරීන් යන තිදෙනා විසින්ය කියා මම හිතනවා. ඒ පත්වීම් දීම අධ්‍යාපන සේවා කමිටුව වෙන කාටවත් භාර දී නැහැ.

ඊළඟට කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමා — ආණ්ඩුවේ ඒජන්තතුමා — යවා තිබෙන චක්‍රලේඛයක් ගැන සඳහන් කළා. ඒ චක්‍රලේඛය මේ අමාත්‍යාංශයෙන් නොවෙයි යවා තිබෙන්නේ. ඒ චක්‍රලේඛය අනුව ක්‍රියා කිරීම දැන් අත්හිටුවා තිබෙනවා. මම හිතන විධියට එය ජාතික වීරවරයන් පිළිබඳව යවා තිබෙන චක්‍රලේඛයක්. එය මේ අමාත්‍යාංශයෙන් යවා නැහැ. ආණ්ඩුවේ ඒජන්ත තුමායි යවා තිබෙන්නේ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
උපදෙස් පරිදි.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. ரணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)
සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා එවා තිබෙන චක්‍රලේඛයක්. ජාතික වීරයන් පිළිබඳ අවසාන තීරණයකුත් අරගෙන නැති නිසා ඒ චක්‍රලේඛය අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ.

පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛය අනුව කොළඹ නගරයේ පාසල්වලට ළමයින් ඇතුළත් කර ගන්නේ පළමුවන වසර සඳහාත්, හය වන ශ්‍රේණිය සඳහාත් 10 වන ශ්‍රේණිය සමත් සිසුන් උසස් පෙළ පන්ති සඳහාත් පමණයි. 10 වන ශ්‍රේණිය සමත් වන සිසුන් මෙම විද්‍යාලවලට ඇතුළු කරන අවස්ථාවේදී උසස් පෙළ පන්ති නැති පාසල්වල ශිෂ්‍යයන්ට මේ පාසල්වලට ඇතුළු වීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනවා.

මේ රටේ උසස් පෙළ විද්‍යාව විෂයන් උගන්වන පාසල් තිබෙන්නේ 500ක් පමණයි. උසස් පෙළ කලා විෂයන් පමණක් උගන්වන පාසල් 1,500ක් තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය පෙළ විෂයන් පමණක් ඉගැන්වීමෙන් අවසන් වන පාසලුත් තිබෙනවා. කොළඹ නැත්නම් අනෙක් නගරවල ප්‍රධාන පාසල්වලට ශිෂ්‍යයින් තෝරන අවස්ථාවලදී ඒ පාසල්වල ශිෂ්‍යයින්ටත් ප්‍රමුඛත්වයක් දෙන්න කියල තිබෙන්නේ. මා හිතන්නේ ඒ පියවර ගත්තේ නැත්නම් එවැනි පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැම දෙනාවම කොන් වෙනවා. ඒ අයට අවස්ථාවක් දෙන්න ඕනෑ ඒ පාසල්වලට ඇතුළු වෙන්න.

මීගමුවේ තත්ත්වය මොකක්ද ? [බාධා කිරීම්] ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 1 වනද කුකුලාවේ, නයාරු කියන සිංහල ගම්මානවලට ත්‍රස්තවාදීන් පහර දුන්නා. කුකුලාවේ මියගියා එකොළොස් දෙනෙක්. නයාරුවල තුන් දෙනෙක් මියගියා. ඊට පස්සේ ඒ ඇත්තෝ ගෙනල්ලා මීගමුවේ, දූවේ, පිටිපන ජ්වාගේම වැල්ලවීදියේ කඳවුරු පිහිටෙව්වා. අපි මීගමුව ගැන දන්නේ මීගමුව අපේ ගමට බොහොම ළඟ නිසයි. මේ අනාථයින්ට ඒ පැත්තේ සෑහෙන ආධාර ගලාගෙන ආවා. හාල්, පොල්, රෙදි අරව මේවා ලැබුණා. ඒවා බෙදදීමේ අවස්ථාවට මම හිතන්නේ ඇමතිවරුත් ගියා. අගමැතිතුමාගේ මැතිනියත් ගියා. ඒ අවස්ථාව රූප වාහිණියෙනුත් පෙන්නුවා. නමුත් මේ බඩු ඒ අනාථ මිනිසුන් අතට ගියාද නැද්ද කියන එක ගැන ලොකු සැකයක් තිබෙනවා, ඒ මිනිසුන්ගේ. මම ඒ ස්ථානයට ගිය වෙලාවේදී, එතැන සිටි තුන් හතර දෙනෙක්ම මට කිව්වා " දුන්න තරමටම අපිට ලැබුණාද කියලා අපිට හිතන්නට බැරිය " කියලා. අපි දන්නවා ඒ බඩු බෙදා දුන් විත්තිය. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් කාට දුන්නාද කියන එක ගැන ලේඛනයක් තිබෙනවාද කියන එක කරුණාකර අපි දැනගන්නට කැමතියි. [බාධා කිරීමක්]

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**
ගංවතුර ආධාරද ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**
ගංවතුර ආධාර නොවෙයි.

There is 'something wrong with the Hon. Minister. The is thinking of floods because there was a little flutter at the top here !

අනාථ කඳවුරුවල කොටස් කීපයක් සිටිනවා. තම ගම් ප්‍රදේශවල පදිංචිය හැර ගොස් උතුරු නැගෙනහිර පලාත්වල ස්ථිර පදිංචිකරුවන් වී සිට අනාථ වූ පසු නැවත මුල් ගම්වලට පැමිණි. එහෙත් ගෙවල් දොරවල් නැති නිසා කඳවුරුවල හා තම නෑදෑ හිතවතුන්ගේ ඉඩම්වල තාවකාලිකව පැල්පත් සාද ගෙන සිටින අය එක කට්ටියක්. තමන් පරිහරණය කළ ධීවර ආම්පන්න, ධීවර වාඩි විනාශ වී හිස් අතින් පැමිණ සිටින අය දෙවැනි කණ්ඩායමයි.—මම කියන්නේ ධීවරයින් ගැන පමණයි. මොකද මම කිව්වා, අල්ලේ ජනපදයේ ගොවි පවුල් ගැන.—තුන් වැනි කණ්ඩායම, තමන් සතු ධීවර ආම්පන්න සෑහෙන ප්‍රමාණයක් රැගෙන ආවත් රැකියාව අහිමි වූ අයයි. හතරවැනි කණ්ඩායම දැල්වල සහායකයින් වශයෙන් කුලියට වැඩට ගොස් තමන් සතු පෞද්ගලික දේපොල, බඩුබාහිරාදිය නැති වූ අයයි. ඊළඟට මාදැල්වල රැකියා කළ, මාදැල් කම්කරුවන් සහ මා දැල් හිමියන්. ඔය විධියට මේ ධීවර කාර්මිකයින් විවිධ කොටස්වලට බෙද තිබෙනවා, මීගමුවේ. නමුත් මේ සළසන අනාථාධාර ගෙවා ඇත්තේ සැම දෙනාටම එකම ක්‍රමයටයි. සැම දෙනාටම එක හා සමානව සලාක බෙද දී තිබෙනවා.

1985 ඔක්තෝබර් මාසයේ 15 වැනිද රජය කිව්වා මේ ධීවරයින්ට කරුණාකර ආපසු යන්නය කියා. 102ක් කුකුලාවට ගියා, බස් පහකින්. මේ කාලේ නැගෙනහිර මුහුදේ වාරකන් තිබෙනවා. කවුරුත් දන්නවා මේ කාලේ නැගෙනහිර මුහුද පැත්තට යන්නේ නැති බව. ඉතින් මේ ගොල්ලෝ එහෙ යන්නේ නැතිව කලපුවට ගියා. මොකද වුණේ ? ත්‍රස්තවාදීන් ඉඩ දුන්නේ නැහැ, කලපුවට යන්න. දැන් කලපුවට යන්නත් බැහැ. මුහුදට යන්නත් බැහැ. ගෙදර ආවා. ගෙදර ඇවිල්ලා බැලුවාම ලැබුණු සලාකෙත් නැහැ. සලාකෙ කපලා. මොකද සලාකෙ කපා තිබෙන්නේ ? ආපහු ගිය නිසා. මේ ධීවරයින් යැවුවේ කවුද ? ඒ ප්‍රදේශයේ ආරක්ෂාව තිබෙනවා, ආරක්ෂාව සලසනවා කියායි යැව්වේ. නමුත් අවසානයේදී කලපුවට යන්නත් බැහැ. මුහුදට යන්න් බැහැ. ගෙදර ආවාම තමන්ට ලැබුණු සලාකෙත් නැතිව ගිහිල්ලා. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් සහ ජනාධිපති උතුමාණන්ගෙන් ඉල්ලා සිටිනවා.

අනික් ප්‍රශ්ණය පොල් අතු ගැනීම ගැන. මෙන්න මේවයි " හොරකම් " කියන්නේ. පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින් රුපියලකට ගැනීට කටයුතු කළ පොල් අත්තක් රුපියල් දෙක බැගින් මිලදී ගෙන තිබෙනවා. මේ සඳහා රුපියල් එක් ලක්ෂ පන්දහක් වැය වී ඇති බව අපට මීගමුවේදී දැනගන්න ලැබුණා. ඔන්න බලන්න, අනාථයින්ගෙනුත් හොරකම් කරන හැටි. අනාථ ව්‍යාපාරවලට දුපු අයගෙ හොරකම් කිරීමක්.

අනික් කරුණ අනාථ කඳවුරු හැර යාමේදී සිංහලයින්ට රුපියල් දහයි ගෙවන්නේ. ද්‍රවිඩයින්ට රුපියල් පහලොස් දහක් ගෙවනවා. මේක පුදුම ගෙවීමක්. මට තේරෙන්නෙ නැහැ මේ ගැන. අපි හැම වෙලාවෙම කියන්නේ, ද්‍රවිඩ අනාථයෝ හෝ වේවා, සිංහල අනාථයෝ හෝ වේවා, මුස්ලිම් අනාථයෝ හෝ වේවා ඔවුන්ට එක හා සමානව සළකන්නය කියා. ඒ අය අනාථයෝ. නමුත් සිංහල අනාථයින්ට ගෙවන්නේ රුපියල් දාහයි. ද්‍රවිඩ අනාථයින්ට රුපියල් පහලොස් දහක් ගෙවනවා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**
කොහේද ඒ ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**
මීගමුවේ. ඒ විධියටයි ගෙවන්නේ. මම ඔනෑ නම් මැරුණු අයගේ ලැයිස්තුවක් දෙන්නම්. මම ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්නේ නැහැ, කාලය ගතවන නිසා. නමුත් මේ විධියටයි ගෙවන්නේ. ඒ නිසා උතුරු නැගෙනහිර ප්‍රදේශවල නැවත ධීවර වෘත්තිය කිරීමට හැකි බවට ඊත්තු ගත්වා ඒ ප්‍රදේශවලට පිටත්කර හැරි අයගෙන් යම් කෙනෙකුට දුන් රජයේ ආධාර කපා දමා තිබෙනවා නම්, කරුණාකර ඒවා වහාම ගෙවන්න කටයුතු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේ දන්නවා ඇති, අගෝස්තු 10 වැනිද තිලාවැලි සිද්ධියෙන් පිටිපන ප්‍රදේශයේ 23 දෙනෙක් මියගිය බව. මම හිතන්නේ තවත් 37 දෙනෙක් විතර ආගිය අතක් නැහැ. මේ අයට මොකක්ද කර තිබෙන්නේ. තවම කිසිම වන්දියක් ගෙවලා නැහැ. ගරු සභාපතිතුමනි, මම ළඟ තිබෙනවා තිලාවැලිහිදී ත්‍රස්තවාදීන් විසින් මරා දමන ලද අයගේ නම් ලැයිස්තුවක්. මම ඒක ඔබ තුමාට ඉදිරිපත් කරන්නම්. මේ මියගිය අයගෙන් පැවත එන්නන්ට හෝ ඔවුන්ගේ දරු මුණුබුරන්ට මෙතෙක් කිසිම ගෙවීමක් කර නැහැ. ඒ අය සේරම සිංහල උදවිය. පී. ජෙරමියස් සිල්වා මහතාගේ පටන් පී. ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු මහතා දක්වා 23 දෙනෙක් විතර ඉන්නා. මම ඒ අයගේ නම් කියවන්න යන්නේ නැහැ. ඇයි ආණ්ඩුව ඒවා ගවෙන්නෙ නැත්තෙ ? ත්‍රස්තවාදීන් අතින් මැරුණු ඒ උදවිය වෙනුවෙන්, පිටිපන ධීවරයින් වෙනුවෙන්, මේ ඊයේ පෙරේද දේව මෙහෙයයක් පැවැත්වූවා දූව පල්ලියේ. ඒ දේව මෙහෙයේදී කී දේවල්, ප්‍රකාශ කළ දේවල්, මම සභාගත කරන්න කැමතියි, ඒ අය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමක් හැටියට.

අ. භා. 4.45

මේ පුනරුත්තාපන කඳවුරුවලට වෙන අසාධාරණකම්—දෙපාර්තමේන්තුවක් හැටියට පරිපාලනය නොකෙරෙන කටයුතු ආදීය—ගැන මම හිතන්නේ සෑහෙන සැලකිල්ලක් රජය දක්වන්නට ඕනෑ. මම කැමතිවුණේ නැහැ මීට පෙර තිබුණු සාකච්ඡාවේදී මේ කරුණු ඉදිරිපත් කරන්නට. ඉස්කෝලවල පදිංචිවෙලා සිටිනව සෑහෙන සංඛ්‍යාවක්. එසේ පදිංචිවී සිටීමෙන් ඒ ඉස්කෝල වහන්නට සිද්ධවෙලා තිබෙනවා. එසේ වසා තිබෙන සංඛ්‍යාව දැනුම් දෙන්නට මම කැමතියි. යාපනයේ 555ක් වහලා, මන්නාරමේ 105ක් වහලා, මුලතිව්හි 87ක් වහලා, වව්නියාවේ 124ක් වහලා, මඩකලපුවේ 255ක් වහලා, ත්‍රිකුණාමලයේ 208ක් වහලා, අම්පාරේ 107ක් වහලා, කල්මුණේ 17ක් වහලා. ඔය ආදී වශයෙන් මුළු ගණන ඉස්කෝල 1,611ක් වෙනවා.

Those are the schools that have been converted into refugee camps. So all the schools are closed. – (*Interruption*) – They are not functioning. All right, I would say it that way. If the hon. Members do not want to sort of gibe at me I would say that all these schools are closed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Police stations and Government offices are also closed ; attacked and closed. So what is the security there ? The courts are also closed. There is a system in the way that they do this sort of thing. For example, let us take a village where there is a police station. If two people go to that village and throw a bomb to explode, or a powerful cracker or something like that, what happens ? All the people would take their belongings and run to the next village. Then the police find that it is useless staying there as there are no people to look after. They will have look after trees or empty houses ! Therefore the police would also move to the next place where the people are. When the police leave that place the terrorists would come and occupy that area. Then the terrorists would go to the next place where the people are and throw a small bomb or something like that and the people would start fleeing from there and the police would also start going away from there. Then again the terrorists would take over at that point. This is their system and method.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Where has it happened ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

May I say ? It has started. How did they come up to Dehiwatta ? This is the system they adopted in order to come right up to Dehiwatta. Then what about the Namalwatta massacre ? How are they coming down to the sinhala areas ? They are not sticking only to the Northern and Eastern Provinces. No. They have attacked so many places in the Polonnaruwa District, and the Medawachchiya Electorate. There is system and a plan of quietly eating into other areas in order to have a superb buffer for them. There is no other reason, Sir. Therefore it is a massive scheme that they have adopted. I do not know what steps the Government has taken to stop this.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)**
**(Dr. Wimal Wickremasinghe)**

He is still convalescing and dreaming about it.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

There is nothing to dream about. I think he has dreamt enough ! We know what is going to happen now.

You must take a positive step and there must be positive thinking on this problem. Unless you are quite clear in what you want to give or what you want to take this problem cannot be solved. What you have decided is not yet known to the people. You and I do not know, but thanks to the "Island" newspaper at least they published what has been proposed in the Working Paper and then thanks again to some other newspapers that gave out what the Tamil demands are. There is a 32-paged document which gives the demands of the Tamils – which has already been given to the Indian government – pertaining not only to this problem, but also to the refugees.

They do not want a single sinhalese in those areas ? At a particular point of time they will turn round and say, "We do not want a single Muslim there ! We want only Tamils." This might spread to our areas as well. If that happens you will have a whole lot of Tamil refugees here. The only way to stop this is to have a clear-cut policy in regard to this matter and take positive action without waiting till the end of the year to solve this problem. There should be no delay in taking action. You must take immediate action. If you do not act immediatly you will get into a very serious situation and it will be a point of no return ! When that happens do not blame the SLFP or anybody else. It will be your own fault for not taking action at the proper time. You cannot ask what the viewpoint of the SLFP is. We have mentioned our view points. The whole trouble is that you do not have view points. You are just dragging this problem without solving it. We started off with 15,000 refugees and today the number of refugees has reached 147,000. In the next two months we will have treble this number. To put an end to this problem you must have not a Ministry of Rehabilitation but a separate Ministry of Refugees. I think it is high time that you establish such a Ministry and I say that it is a must.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා (සේරුවිල)**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன — சேருவில)**
**(Mr. H. D. L. Leelaratna – Seruwila)**

ගරු සභාපතිතුමනි, සේරුවිල ආසනයේත්, සේරුවිල ආසනය පිහිටි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අනෙක් ආසනවලත් පවුල් දහස් ගණනක් ඊළාම් ත්‍රස්තවාදී ප්‍රශ්නය නිසා අද අනාථ භාවයට පත් වී සිටිනවා. සේරුවිල ආසනයේ, සේරුවිල උප දිසාපති කොට්ඨාශයේ අනාථයන් දැනට මාස හයක පමණ කාලයක සිට කන්තලේ අනාථ කඳවුරු තුනක සිටිනවා. මේ ත්‍රස්තවාදී කටයුතු නතර වන ආකාරයට මේ ප්‍රශ්නය දේශපාලන විසඳුමක්, සාධාරණ විසඳුමක් සෙවීම සඳහා පසුගිය මාස කීපය තුළ රජය අවශ්‍ය පියවර ගෙන ත්‍රස්තවාදීන්ටත් ඒ බව දන්වා තිබෙනවා. නමුත් ත්‍රස්තවාදීන් එවැනි සාධාරණ විසඳුමකට එළඹීමට කැමති නැති බව පෙනී යනවා. පසුගිය කාල සීමාවේදී රජයේ ආරක්ෂක හමුදාවන් අවි බිම තැබීමෙන් අයුතු ප්‍රයෝජන අරගෙන ත්‍රස්තවාදීන් තව-තවත් සිංහල ගම්මානවලට ප්‍රහාර එල්ල කරමින් ඒ ගම්මානවලින් සිංහලයන් පැන්නීමට කටයුතු කළා. එයින්ම පැහැදිලිව පෙනෙනවා, ත්‍රස්තවාදීන් දේශපාලන විසඳුමකට එකඟ නොවන බව. ඒ අයගේ අධිෂ්ඨානය සටන් කර කොහොම හරි ඊළමක් දිනා ගැනීමයි.

නමුත් දැන් ත්‍රස්තවාදීන්ගේ ඒ ප්‍රහාර එල්ල කිරීම නතර කිරීමට, වැළැක්වීමට රජය පියවර ගෙන තිබීම ගැන, ආරක්ෂක හමුදාවන් කටයුතු කරගෙන යෑම ගැන අපි සතුටු වන්න ඕනෑ. මා නියෝජනය කරන සේරුවිල ආසනය තුළ ආරක්ෂක හමුදාවන් ඒ විධියට වැඩ කරගෙන යනවා. ඒ නිසා පසුගිය සති කීපය තුළ ත්‍රස්තවාදීන්ගෙන් අලුත් ගම්මානවලට ප්‍රහාර එල්ල කිරීමක් වුණේ නැහැ. එවැන්නකට ඉඩ තබන්නේ නැහැ, අපේ ආරක්ෂක හමුදාවන්.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. ඩී. එල්. ලීලාරත්න මහතා]

අපේ රටේ ආරක්ෂක හමුදාවන් සඳහා කිසිදක වෙන් නොකළ තරමේ විශාල මුදලක් — රුපියල් කෝටි 684ක් පමණ — ලබන වර්ෂය සඳහා වෙන්කර තිබෙනවා. එක්කෝ සාමකාමී සාකච්ඡා තුළින් එළඹෙන දේශපාලන විසඳුමක් මගින් හෝ ඒ විධියට දේශපාලන විසඳුමක් මගින් මේ ප්‍රශ්නය නිරාකරණය කරගැනීම බැරිනම් යුද්ධමය පියවර ගෙන ඒ මගින් හෝ ත්‍රස්තවාදය මැඩීමට කටයුතු කිරීම සඳහා රජය ඉදිරිපත් වී සිටීම ගැන අපි කවුරුත් සතුටුවන්න ඕනෑ.

දැනට අනාථ කඳවුරුවල සිටින අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වමින්, ඒ අය ආරක්ෂා කරගන්නා අතර ඔවුන්ට අවශ්‍ය අහාර - පාන ලබාදීමේ කටයුතුත් රජය විසින් කරගෙන යනවා. ඔවුන්ට ඒ විධියට ආහාර - පාන දුන්නත් යම් - යම් අඩුපාඩුකමුත් තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් මම සඳහන් කරන්න ඕනෑ. මාසයකට රු. 800ක හෙවත් සතියකට රු. 200ක උපරිමයකට යටත්ව අටදෙනකු හෝ ඊට වැඩියෙන් සිටින සැම පවුලකටම සතිපතා ආධාර මුදල් ලැබෙනවා. නමුත් දැන් රටේ තිබෙන බඩුවල මිල ගණන් බලනවිට ඒ ආධාර මුදල් ඒ පවුල්වලට ප්‍රමාණවත් වන්නේ යම්තම් බඩවියත රැක ගැනීමට පමණයි. ඒ මිස ඔවුන්ගේ අනෙකුත් අත්‍යවශ්‍යතාවන්වත් සපුරා ගැනීමට ඒ මුදල් සෑහෙන්නේ නැතිබව අපි කියන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

ත්‍රිකුණාමලයේ වෙළෙඳ ව්‍යාපාරිකයන්ට විතරක් රුපියල් දසලක්ෂ 88ක් දී තිබෙනවා. ඕනෑනම් ඒ ලැයිස්තුව සභාගත කරන්නම්, කාටද දුන්නේ කියා දැනගන්න.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

ඒ ගැන අපට නම් දැනගන්න ලැබී නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Rs.88 million has been given to the business people of Trincomalee –Mr. Cader, Mr. Musadeen and so on. Some have got Rs. 100,000, Rs. 50,000, Rs. 47,000. I will table* this list, Sir.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

That may be compensation.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

No, no.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

ඒ සහනාධාර නොවෙයි. ගොඩනැගිලි ආදිය සඳහා අලාභහානි වෙන්න පුළුවන්.

* පුස්තකාලයේ තබා ඇත.
நூனிலயத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

නැහැ, නැහැ, මන්නාරම සහ ත්‍රිකුණාමලේ විපතට පත් වෙළඳ ව්‍යාපාරිකයින්ට ගෙවන ලද සහනාධාර පිළිබඳ ලැයිස්තු දෙකක් මේ තිබෙන්නේ.

That is why I say I am very happy, Sir, that there is one institution which will never hide facts and that is the Rehabilitation of Properties and Industries Authority. I am greatful to that Authority for giving the correct facts to the people of this country.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

That is the compensation.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Not compensation. We will find out. What about compensation for the poor peasants ? What have they been given ? I want to table this list.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

ගරු සභාපතිතුමනි, සහනාධාර වශයෙන් දුන්නාය කියා නම් කරන මේ මුදල එදිනෙද ජීවත්වීමට දෙන ආධාර මුදලක් නොවෙයි. [බාධා කිරීමක්]

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

May I explain ? No compensation was paid to traders affected in the July 1983 distrubances. (*Interruption*)

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I have got the document.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

This is also from the same officer whom you praised a little while ago.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

This is what I got from the Ministry of National Security. It was submitted there.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

This is also from the same officer whom you referred to a little while ago.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I must say that that officer is a very honourable man.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

Only loans were arranged –

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Rs. 88 million has been given. You please read that letter and see.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I am also referring to the information I got from the gentleman whom you referred to a little while ago.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

What have you given to the peasants ? What have you given to the Dehiwatta people ? What have you given to the Namalwatta people ? What have you given to the Alle people ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

No compensation was paid. You can debate it later, but I am explaining it in reply.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

It is very unfair. Poor peasants of this country must get preference. People who are being penalised all these years.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

You said about Mr. Gnanam. No assistance was given to Mr. Gnanam at all.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

What Gnanam ? You need not give assistance to Mr. Gnanam. He can go to a bank and get money ten times the value of you. What are you talking ? He does not want money free. It is enough if he can get a loan. He will get it at a very low rate. Do you know that he has been given ADB loans also ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

Anyway, he cannot buy me with all that money.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

He got a loan from the ADB at 6 per cent. What are you talking ?

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

ගරු සභාපතිතුමනි, රජය විසින් ඒ විධියට ධනපතීන්ට නැත්නම් ව්‍යාපාරිකයින්ට ආධාරදීම ගැන අපට නම් ආරංචියක් නැහැ. අපි එහෙම එකක් ගැන දන්නෙ නැහැ. දැනට අනාථ කඳවුරුවල සිටින අයට සතිපතා ආධාර දෙනවා. එසේ ආධාර දුන්නත් – මා කලින් පැහැදිලි කෙළේ ඒ කාරණයයි – ඒ දෙන ආධාර මුදල ආහාර සපයා ගැනීමට පමණයි ප්‍රමාණවත් වෙන්නෙ. දැන් මේ අනාථ කඳවුරුවල ඉන්න අයට අඳින්න වස්ත්‍ර නැහැ. සමහර අය අනාථ කඳවුරුවලට පැමිණියේ තමන්ගේ ගෙවල් ත්‍රස්තවාදීන් විසින් ගිනි තැබීමේ හේතුව නිසයි. ඒ අවස්ථාවේදී ඔවුන් ඇඳිවත සමග පමණයි ආවෙ.

අ. භා. 5

කන්තලේ මෙම අනාථ කඳවුර පවත්වාගෙන යාමට වී දැන් 6 මාසයක් වෙනවා. සතිපතා ආහාර ලබාගැනීමට ආධාර දුන්නත් වස්ත්‍ර නැතිකම ඔවුන්ට තදින්ම බලපානවා. එම නිසා පුනරුත්ථාපන අමාත්‍යාංශය විසින් ඒ වස්ත්‍ර නැති දිළිඳු අයට වස්ත්‍ර ලබාදීමටත් යම් පියවරක් ගන්න ඕනෑ. ඒ වාගේම මම සඳහන් කරන්න සතුටු වෙනවා ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ සැම අනාථ කඳවුරකම – සිංහල දෙමළ මුස්ලිම් සැම කඳවුරකම – ළදරු කිරි පිටි බෙද දෙනවා. කෙසේ වෙතත් කන්තලේ අනාථ කඳවුරට මම නිතිපතා ගොස් ඒ අයගේ දුකසැප බලනවා. ඒ නිසා මට පෙනී යනවා සමහර දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙන බව. මේ දරුවන් මන්දපෝෂණයෙන් පෙළීම වැළැක්වීමට පුනරුත්ථාපන අමාත්‍යාංශය ක්‍රියාකළ යුතුයි. යම් යම් පෝෂ්‍යදායක ආහාර කුඩා දරුවන්ට ලබාදීමට කටයුතු කරන්න ඕනෑ. වස්ත්‍ර නැති අයට වස්ත්‍ර ලබාදීමටත් මන්දපෝෂණයෙන් පෙළෙන කුඩා දරුවන්ගේ මන්දපෝෂණය වැළැක්වීමටත් පියවර ගත යුතුයි.

ඒවාගේම මට දැනගන්න ලැබුණා අනාථ කඳවුරුවල සිටින අයගේ දරුවන් පාසල් යැවීමට ක්‍රමයක් නැහැ කියා. සමහර අය නම් තම දරුවන් ඥාතීන් ළඟ හෝ හිතවතුන් ළඟ නවත්වා ඒ ඒ ප්‍රදේශවල පාසල්වලට යවනවා. ඒ විධියට පාසල්වලට යැවීම සඳහා තමන්ගේ දරුවන් අනාථ කඳවුරුවලින් පිට කළ විට අනාථ කඳවුරුවලින් ඒ පවුල්වලට ලැබෙන ආධාර අඩු කරනවාලු. ඒ විධියට ආධාර අඩු කිරීම සාධාරණ නැති බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. අනාථ කඳවුරේ සිටියත් පිට සිටියත් අනාථ වුන පවුල්වල සියලුම සාමාජිකයින්ට අනාථ කඳවුරේදී දෙන ආධාර අඩු නැතිව දියයුතු වෙනවා.

ඒ වගේම සාමයෙන් නැත්නම් සාමකාමීව මේ ප්‍රශ්න විසඳන්නට බැරි නම් දේශපාලන විසඳුමක් මෙයට ලබා ගන්නට බැරි නම්, යුද්ධමය පියවරක් මගින් හෝ ත්‍රස්තවාදය මැඩලීමට රජය තීරණ කර මේ වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කරන ලද අතර ලබන වර්ෂය සඳහාත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව ත්‍රස්තවාදය මැඩලීමට ආරක්ෂක අමාත්‍යාංශය දැන් පියවර අරගෙන තිබෙනවා. අපේ රජයේ ප්‍රතිපත්ති වනුයේ ත්‍රස්තවාදය මැඩලීමෙන් පසුව සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ආදී වශයෙන් දැනට අනාථ වී සිටින සියලුම දෙනා කලින් පදිංචි වී සිටි ස්ථානවලම පදිංචි කරවීමයි. මේ අය පදිංචිව සිටි ස්ථානවල නැවත පදිංචි කරවීමට සමහර විට මාස ගණනක් ගත වෙන්න පුළුවන්. ඒ සඳහා කොපමණ කාලයක් ගතවෙයිද කියා අපට කියන්න බැහැ. ඒ සඳහා තව සැහෙන කාලයක් ගත වෙන්න පුළුවන්. එසේ නම් එතෙක් අනාථ කඳවුරුවල සිටින අයට සැප පහසුකම් සපයා දී ඔවුන් හොඳ හැටි බලාගැනීමට රජය පියවර ගන්න ඕනෑ. දෙවියන්ගේ පිහිටෙන් අපට මේ ත්‍රස්තවාදය ඉක්මණින් මැඩලීමට පුළුවන් වී දැනට අනාථ කඳවුරුවල සිටින අය කලින් සිටි තැන්වලම නැවත පදිංචි කරවීමට හැකි වේවායි කියා අපි ප්‍රාර්ථනා කරනවා. [බාධා කිරීමක්] අපි දෙවියන්ගේ පිහිට බලාපොරොත්තු වන්නෙ දෙවියන් ගැනත් විශ්වාසයක් අප තුළ තිබෙන නිසයි. හොඳයි., අපට ඉක්මණින්ම මේ අය හිටපු තැන්වලම නැවත පදංචි කරවීමට හැකි වෙනවා යයි සිතමු. ඒ විධියට පුළුවන් වුණොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. ඩී. එල්. ලීලාරත්න මහතා]

ඊළඟට තව ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ අනාථ වූ බොහෝ දෙනෙක් දැන් ඉතාම දිළිඳු තත්ත්වයකයි ඉන්නෙ. සමහර අයට පසුගිය යල් කන්නයේ කළ වගාවත් කපා ගන්නට, අස්වැන්න නෙලා ගන්නට පුළුවන්කමක් ඇති වුණේ නැහැ. ත්‍රස්තවාදී ප්‍රශ්නවලට ලක් වුණ මේ අය ඉතාම දිළිඳු තත්ත්වයකයි ඉන්නෙ. එවැනි අය මුල් පදිංචි ස්ථානවල නැවත පදිංචි කරවීමේදී දැනට ගන්නා ක්‍රියා මාර්ගය අනුව රුපියල් දහසක් මුදලින් ගෙවා සති තුනකට පමණ සෑහෙන්න සලාක ලබා දෙනවා. එය ප්‍රමාණවත් වන්නේ නැති බව මම කියන්න කැමතියි.

මේ අය නැවත හිටපු තැන්වලම පදිංචි කරවන අවස්ථාව වන විට මේ අයට ගොවිතැන් වැඩ කරගැනීමට පුළුවන් කමක් නැහැ. ඒ අය ළඟ ඒ සඳහා අත මිට මුදල් නැහැ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රස්තවාදයට ලක්වුණු අයගෙන් සියයට 95ක්ම ගොවීන්. මේ ගොවීන්ට ගොවිතැන් කර ගැනීමට අත මිට මුදල් නොමැති නිසා එක්කෝ ණය මුදල් දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ආධාර මුදලක් දෙන්න ඕනෑ. එක කන්නයක් ගොවිතැන් කර ගැනීම සඳහා ආධාර මුදලක් දෙන්න ඕනෑ. එක කන්නයක් ගොවිතැන් කරගෙන අස්වැන්න ලබා ගන්නා තෙක් මේ අය ජීවත් කරවන්න ඕනෑ. ඔවුන්ට තමන්ගේ නිවෙස් හද ගන්නට යම්කිසි මුදලක් දුන්නත්—

සභාපතිතුමා
(தவிசாளர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා දැන් මිනිත්තතු 15ක් කථා කර තිබෙනවා. තවත් මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කථා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**එච්. ඩී. එල්. ලීලාරත්න මහතා**
**(திரு. எச். டீ. எல். லீலாரத்ன)**
**(Mr. H. D. L. Leelaratna)**

මට සමාවෙන්න. ඉක්මනින් මගේ කථාව අවසන් කරනවා.

මේ අය නැවත හිටපු ස්ථානවල පදිංචි කරවීමේදී ඒ අයගේ නිවෙස් තනා ගැනීමට යම් මුදලක් දී ඊට පසුව ගොවිතැන් කර ගැනීමටත් ආධාර මුදලක් දෙන්න ඕනෑ. ගොවිතැනින් අස්වැන්න ලබා ගන්නා තෙක් ඔවුන්ට ජීවත් වීමට ජීවනාධාර මුදලක් නැත්නම් ආහාර ලබා ගැනීමට ආධාර මුදලක් දීමට පුනරුත්ථාපන අමාත්‍යාංශය කටයුතු කළ යුතු බව මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඒ සමගම මා තවත් කාරණයක් කියන්න කැමතියි. පුනරුත්ථාපන අමාත්‍යාංශයට නැත්නම් රජයට මේ සියලුම බර උසුලන්න පුළුවන් වෙන්නෙ නැහැ. එම නිසා ත්‍රස්තවාදී උවදුරුවලට ලක් නොවුණ, රටේ අනික් ප්‍රදේශවල ඉන්න සියලුම දෙනා කල්පනා කරන්න ඕනෑ, තමන්ගේ අවධානය යොමු කර ගන්න ඕනෑ, අපේ රටේ ත්‍රස්තවාදී උවදුරුවලට ලක් වුණු ප්‍රදේශවල අනාථයන්ට යම්කිසි ආධාරයක් කරන්න ඕනෑ කියා. එම නිසා රජයෙන්ම හැමදෙයක්ම කරන තුරු බලා නොසිට අනාථ කඳවුරු වල සිටින අයගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට, මෙම අනාථයන් නැවතත් ඒ ගම් ප්‍රදේශවල පදිංචි වෙන අවස්ථාව වෙන විට, ඔවුන්ට ආධාර උපකාර දීමට යම් යම් සමාජ සේවා ආයතන ඉදිරිපත් වෙනවා නම් ඒ සඳහා රටේ හැම දෙනෙක්ම ඉදිරිපත් වෙනවා නම් ඒක විශාල දෙයක් හැටියට මම සිතනවා.

ඒ වාගේම මම යෝජනාවක් කරනවා දැන් නිවාස තැනීමට අරමුදලක් පිහිටුවා තිබෙනවා වාගේ මේ සම්බන්ධවත් අරමුදලක් ඇති කරන්නය කියල. මේ සම්බන්ධවත් පුනරුත්ථාපන අරමුදල වැනි එකක් ඇති කරන්න ඕනෑ. එවැන්නක් ඇතිකර මෙම අනාථයින් නැවත පදිංචි කරවීමේදී ආධාර ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කරනවා නම් ඉතාම යෝග්‍යය කියන අදහස ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலை)
(Mr. Ananda Dassanayake – Kotmale)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය අපේ ගරු ජනාධිපතිතුමාට අයිති එකක් හැටියටයි මම සිතන්නෙ. නමුත් පාර්ලිමේන්තුවේ දී එය නියෝජනය කරන්න කිසි කෙනෙක් නැහැ. අපේ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා එහි අමාත්‍යවරයා වශයෙන් යමක් කියනවා නම් අපට ඕනෑ වෙලාවට එතුමාගෙන් ප්‍රශ්න අහන්න පුළුවන්. එතුමාට මේ අමාත්‍යාංශය භාර දී තිබෙනවාද නැද්ද කියන එක අපි දන්නෙ නැහැ. එතුමා මේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් වැඩ කරනවාද ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

මේ වෙලාවෙ මට භාර දී තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඒක හරි. ඒ අතිරේකව පාඨ කපන්න.

ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඇමතිවරයෙක් ඉන්න ඕනෑ මේ සම්බන්ධව. අද "රීහැබිලිටේෂන් මිනිස්ට්‍රි" කියන එක පොඩි දෙයක් නොවෙයි. දැන් බැලුවාම ලංකාවේ අනික් අමාත්‍යාංශයකට තිබෙන වැඩ කොටසට වැඩි වැඩ කොටසක් මේකට තිබෙනවා. මෙයින් ඒ ප්‍රදේවල ආරක්ෂාව ගැනත් අනාථවුණු මිනිසුන් බලාගැනීම ගැනත් කටයුතු කරන්නට ඕනෑ. ඊළඟට අනාථ වුණු මිනිසුන් බලා ගැනීමට කඳවුරු පිහිටුවීම පමණක් නොවෙයි ඕනෑ කරන්නේ. ඒ මිනිසුන් ආපසු ඒ ප්‍රදේශවලට ගෙන ගොස් පදිංචි කරන්න ඕනෑ. අවුරුදු එක හමාරකට උඩදී මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් යන විට රටේ ජනතාවගෙන් මේ ගැන ප්‍රශ්න එන විට ගරු ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ ? යාපන නගරයෙන් එළවනු ලැබූ සිංහල මුස්ලිම් ආදී සියලු ජනතාව පසළොස් දහක් පමණ ඉතාම සුළු කාලයකින් වහාම ආපහු ගෙන ගොස් පදිංචි කරනවාය කිව්වා. නමුත් අද දවස දක්වා එක් කෙනෙක්වත් පදිංචි කරවා නැහැ. ආණ්ඩුවක නායකයෙක් යමක් කිව්වොත් ඒක ඉෂ්ට වෙන්න ඕනෑ. මොන තරම් කරදර ඇති වුණත් යුද්ධ හමුදාව යොදලා හෝ ඒ කරදර මැඩ පවත්වාගෙන ඉදිරියට යන්න ඕනෑ. [බාධා කිරීම්] එතැන ඇති වුණු තත්ත්වය මේකයි. කරදර තිබෙනවාය කියා ත්‍රස්තවාදයට බයේ එය නොසලකා හැරියොත් ඔවුන් නවදුරටත් දිගින් දිගටම දකුණු ප්‍රදේශයට එනවා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

යන්නෙ නැත්නම් මොනව කරන්නද ? උස්සගෙන යන්නද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තවත් කරුණක් මම කියන්නම්. ජාතික ආරක්ෂක ඇමතිතුමා මේ ගරු සභාවේදී අපට පොරොන්දු වුණා ඒ මිනිසුන් ආපහු යවනවාය කියා. අපට කිව්ව පුළුවන් තරම් මිනිසුන් හොයා දෙන්නය කියා. අපි මිනිසුන් හොයා දුන්නා. නමුත් එක් කෙනෙක්වත් තවම පදිංචි කරවන්න බැරි වුණා. යම් කිසි කෙනෙක් විරුද්ධ වුණත් මොන එකා විරුද්ධ වුණත් මම මගේ අදහස් ඉෂ්ට කරලා තමයි අතහරින්නේ කියා එතුමා කිව්වා.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

යන්නෙ නැත්නම් මොකද කරන්නෙ ? [බාධා කිරීම්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

යන්නෙ නැතිලු. රාජ්‍ය නායකයා ගන්නවාය කියන පියවරක් තබන පියවරක් හරියට ගන්නත් හරියට තබන්නත් බැරි නම් නිශ්ශබ්ද වෙන්න ඕනෑ. කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් පමණක් කියන්න ඕනෑ. බැරිකමක් තිබෙනවා නම් නිශ්ශබ්ද වෙන්න නෑ. එසේ නැතිව මේ විධියට කීමෙන් ආණ්ඩුව දුර්වලය කියා මහජනයාට පෙන්නනවා. ඒකෙන් ආණ්ඩුවේ පාලනය තවත් දුර්වල වෙනවා. ආණ්ඩුවක් නම් කොන්ද පණ ඇතිව ඉන්න ඕනෑ. නමුත්තාන්සේලාට පුළුවන් නම් ස්ට්‍රයික් එකට සම්බන්ධ වුණු එක් ලක්ෂ ගණනකට කිට්ටු පිරිසක් එක පෑන් පහරින් එළියට දන්න . . .

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

මන්ත්‍රීතුමා මේකෙයි ස්ට්‍රයික් එකෙයි කොච්චර වෙනසක් තියෙනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
දෙකම එකයි.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
ඔහෙලට දෙකම එකයි, ඡන්ද ගරා ගන්න. නිකං පිස්සු කතා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මේකෙන් ඡන්ද විතරක් නොවෙයි රටම අල්ලා ගන්න යන්නෙ. ඊට වඩා භයානක දෙයක්.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
යුද්ධයක් මැද්දෙ අහිංසක මිනිසුන් ගිහින් දල මරන්නද කියන්නේ? එතකොට තමුන්නාන්සෙල ආයිත් ගිහින් තුන්මුල්ල හන්දියේ වාඩි වෙයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ආණ්ඩුවට ඒවා කරන්න බැරි නම් ඒකේ තේරුම මොකක්ද? ආණ්ඩුවෙ දුර්වලකම.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
කේන්ද්‍රය ලියල නැහැ අහවල් දවසෙ අහවල් තත්පරයට නවත්තනවයි කියලා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ආණ්ඩුව පියවර ගත්තේ නැහැ. ආණ්ඩුව ඒ අය ගෙනගොස් පදිංචි කරවන්නෙ නැතිනම් පදිංචි කරනවාය කියා කියන්න ඕන නැහැ. දූත් කිප වතාවක් කිව්වා. හැමදම ඔක කියනවා. ඒක බුරුලට ගන්නා ත්‍රස්තවාදීන් හිතන්නෙ අපේ ප්‍රදේශවලට ඒ ගොල්ලන්ට එන්න බැහැ කියයි. ආණ්ඩුව එන්නේ නැහැ. ආණ්ඩුවට මේක කරන්න බැහැයි කියා ත්‍රස්තවාදීන් හිතන නිසා ඔවුන් නවත් නටනවාය කියන එක ප්‍රශ්නයක් නොවෙයි.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
විපක්ෂ නායකතුමා කියල තියෙනවා නේද විසි හතර පැයෙන් ප්‍රශ්නය විසදනවයි කියල? විපක්ෂ නායකතුමා රැස්වීමක කියල තියෙනවා. ඒක ගැන මොකද කියන්නේ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
එතුමාට ඒක බාර දෙමු. එතුමා සමහර විට පුළුවන්කාරයෙක් වෙන්න පුළුවන්.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
ඔව්. එතුමාගේ තාත්තගේ භාෂා ප්‍රතිපත්තිය වාගෙ තමයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
භාෂා ප්‍රතිපත්තිය හරි. භාෂා ප්‍රශ්නය පැය විසි හතරෙන් විසඳුව පනත ගෙනත්.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
විසඳුව! ඒවායෙ පලවිපාක තමයි මේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඉඩම් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මම කියන්නෙ මේකයි. මේ මිනිස්සු එහාට ගිහින් කාලයක් තිස්සේ එහි පදිංචි වෙලා ජීවත් වන අය. අපේ ප්‍රදේශවලිනුත් ගිහින් තිබෙන නිසා මටත් මේ ගැන වේදනාවක් තිබෙනවා. කොත්මලෙන් ගිය අය නාවලපිටියෙන් ගිය අය ගම්පලින් ගිය අය උඩුනුවරින් ගිය අය කැගල්ලෙන් ගිය අය වැඩි දෙනෙක්. ත්‍රස්තවාදීන් මේ මිනිසුන් මරනවා. ඔවුන්ගේ ගෙවල් ගිනි තියෙනවා. ඉතුරු අය හැම දෙනාම ආපහු ඇවිත් දූත් ඉන්නේ තම තමන්ගේ නැගෙවල්වල.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
බොරුවක්යැ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
සේරුවිල (එච්. ඩී. එල්. ලීලාරත්න මහතා) මන්ත්‍රීතුමා කී දේ ඇත්ත. පොඩි කරදරයක් වෙන විට ඒ අය පනිනවා. එහෙම නම් එයින් පේන්නේ ඒ අයට ආණ්ඩුවේ ආරක්ෂාව නැති බවයි. ආණ්ඩුව ඒ ආරක්ෂාව යොදවන්න දූන ගන්න ඕනැ. ඒ ආරක්ෂාව යොදන්නේ නැතිව තමුන්නාන්සේලා සමහර වෙලාවට මොකක්ද කියන්නෙ? විරුද්ධ පක්ෂයට තමයි බණින්නෙ. විරුද්ධ පක්ෂය මේවා අදිනවාය කියා විරුද්ධ පක්ෂයට දෙස් කියනවා. විරුද්ධ පක්ෂය මේවා අදින්නේ නැත්නම් කවුරු අදින්නද? ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකු මේවා ගැන කථා කරන්නේ නැති නම්, ආණ්ඩු පක්ෂයයේ හැම දෙනාම සුදු හුණු ගා මෙය මකන්නට උත්සාහ කරනවා නම් මේ ප්‍රශ්නය කවදවත් විසඳන්නට පුළුවන් වෙනවාය කියා මම හිතන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ මේ රටේ ඉතිහාසය ගැන හොඳින් දන්නවා. ඒ අනුව තමුන්නාන්සේට පෙනී යනවා ඇති, මෙම ද්‍රවිඩ ත්‍රස්තවාදීන්ට අපේ ඉතිහාසය අනුව වෙනම රාජ්‍යයකට අයිතිවාසිකම් කියන්නට බැරි බව. මේ රටේ සම්පූරණ අයිතිය තිබෙන්නේ ලාංකිකයන්ටයි. ඒ බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති.

ඊලඟට, කිලිනොච්චිය, කංකසන්තුරේ ආදී පොලිස් ස්ථානවලට ත්‍රස්තවාදීන් පහර දෙන විට මා එද පෙන්නවා දුන්වා. ඒ ප්‍රහාරයන් මැඩ පවත්වා, එම පොලිස් ස්ථානවල ආරක්ෂාව සුරක්ෂිත කරගෙන, එම ස්ථාන පවත්වා ගෙන ගියේ නැති නම්, උතුරෙන් බැහැර ප්‍රදේශවලට, ක්‍රමයෙන් උතුරේ සිට දකුණේ ප්‍රදේශවලට එම තර්ජනය එල්ල වන්නට පුළුවන් බව. නමුත් ආණ්ඩුව ඒ අවස්ථාවේදී හරියාකාරව ක්‍රියා කළේ නැහැ. ක්‍රියා කිරීමේදී ලාමක වුණා; දුර්වල වුණා. වුවමනා අවස්ථාවේදී ආණ්ඩුව දැඩි ලෙස පියවර ගත්තේ නැහැ. එද පහරට පහර ගසා, පහරට දෙපාරක් හෝ ගසා ඒවායේ අයිතිවාසිකම තහවුරු කර ගන්නට ක්‍රියා කරන්නට තිබුණා. එම නිසා තමයි උතුරේ සිට ක්‍රම ක්‍රමයෙන් පහත ප්‍රදේශවලට එන්නට පටන් ගත්තේ. ඇත්තෙන්ම එකට එක කරන්නට තිබුණා. ආණ්ඩුවට ඒක කරන්නට බැරිකමට අහිංසකයන් හිරභාරයට ගන්ට, අහිංසකයන්ට දඬුවම් කරන්නට ක්‍රියා කරනවා.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
ජනාධිපති මැතිවරණයේදී කොබ්බෑකඩුව එහාට ගිහින් මොනවාද කිව්වේ? ත්‍රස්තවාදී ක්‍රියා මැඩලීමේ පනත් ආදිය ඉවත් කර ගන්නවා යයි කිව්වේ නැද්ද? එද මැතිවරණයේදී එහෙම කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

පසුගිය කාලයේ දේවල් ගැන තමුන්නාන්සේට කථා කරන්න ඕනෑ වුණත් මට වුවමනාවක් නැහැ. තමුන්නාන්සේ බලන්නේ මෙයින් දේශපාලන වාසියක් ලබා ගන්නටයි. මම කථා කරන්නේ දේශපාලන වාසි ලබා ගන්නට නොවෙයි.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

යාපනයේ ගිහින් කිව්වා නේද, හමුද කඳවුරු ඉවත් කරනවාය කියා ? ඒ අය එහේදී එකක් කථා කරනවා. මෙහෙ ඇවිත් වෙනත් විධියකට කථා කරනවා. රට ගිනි තියන්නේ ඔහෙලා තමයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ත්‍රස්තවාදය නිසා අනාථ වුණු මේ පිරිස රැක ගන්නේ කවුද ? සිංහලයකු හැටියට, ලාංකිකයකු හැටියට මම අහන ප්‍රශ්නය ඒකයි. සේරුවිල මන්ත්‍රීතුමා (එච්. ඩී. එල්. ලීලාරත්න මහතා) අන්තිමට කිව්වා, අනාථ වුණු ඒ පිරිසට දෙවියන්ගේම පිහිටයි කියා. ඒ කියන්නේ ඒ පිරිස කාගේවත් සරණයක් නැති තැනට ඇවිත් සිටින බවයි.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

ගරු මන්ත්‍රීතුමනි, පෙරේද ගම්පොල වේදිකාවකදී මොනවාද කිව්වේ ?

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

සිංහලයන් හැටියට අපට මේ රටේ අයිතිවාසිකමක් තිබෙනවා. එහෙම නම්, කාලයකට උඩදී ඇවිත් මේ ප්‍රදේශවල පදිංචි වුණු අය අවුස්සා ඒ මගින් මේ රට විනාශ කර දමන්නට ඉඩ දී බලා සිටිනවාද ? ඇත්තෙන්ම රජය ආයුධ බිම තැබීමට ක්‍රියා කිරීමෙන් පස්සේ තමයි, ත්‍රස්තවාදීන් මේ රටේ වැඩි තරමක් මිනිස් ඝාතන සිදු කළේ ; ගම් දනව් ගිනි තැබුවේ. එහෙමනම්, සාමය හා යුද්ධය එකට පැහෙන්නේ නැති බව අපට පැහැදිලියි. ඇත්තෙන්ම මේ ප්‍රශ්නය සාමයෙන් සමථයකට පත් වෙන්නේ නැහැ. අර සේරුවිල මන්ත්‍රීතුමා කිව්වා, සාමය නම් සාමය, යුද්ධය නම් යුද්ධය, සාමයෙන් විසඳන්නට බැරි නම් යුද්ධයෙන් හෝ විසඳා ගන්නට ඕනෑය කියා.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

ඔහෙලා දෙකෙන් එකකටවත් නැහැ. යුද්ධයටත් නැහැ ; සාමයටත් නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

අපිද ? අපට ආණ්ඩු බලය දෙනවා නම්, මේ ප්‍රශ්නය විසඳන්නට මොනවා කළ යුතුද කියා අපි දන්නවා.

**කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා (මාතලේ දිසා ඇමතිතුමා)**
**(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க — மாத்தளை மாவட்ட அமைச்சர்)**
**(Mr. K. W. R. M. Ekanayake – District Minister, Matale)**

අප්පා ! ඒක තමයි දූන් බලා ගෙන ඉන්නේ. ආණ්ඩු බලය නැති නිසා තමයි මේ විධියට කථා කරන්නේ.

අ. භා. 5.15

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ත්‍රස්තවාදි ව්‍යාපාරයක් මේ රටේ පටන් ගත්තේ 1971 දී බව තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඒ ප්‍රශ්නය මාස තුනකින් සම්පූර්ණයෙන්ම විසඳුවා. මේ ප්‍රශ්නයටත් ඔය තරම් දහලන්න වුවමනා කරන්නේ නැහැ. එද මාස තුනකින් ප්‍රශ්නය විසඳා එයට සම්බන්ධවූවන් අවුරුදු පහක් තුළදී සම්පූර්ණයෙන්ම පුනරුත්ථාපනය කළා. හැබැයි, ඒ ක්‍රියාවේදී ආණ්ඩුවට පාඩුවක් සිදු වුණා. ඒ කාලය තුළදී සංවර්ධන වැඩ කරන්න බැරි වුණා. නමුත් කරන්නට දෙයක් නැහැ. සංවර්ධන වැඩට වඩා වැදගත් වෙන්නේ රටේ සාමය සුරක්ෂිත කිරීමයි. ඒක කරන්නට බැරි නම් ආණ්ඩුව —

**කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා**
**(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க)**
**(Mr. K. W. R. M. Ekanayake)**

අපි ඒක කරනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

තමුන්නාන්සේ ඒක කරනවා. තමුන්නාන්සේ දඹුල්ලේ පදිංචි වී ඉන්න නිසා හයක් නැහැ. නමුත් සේරුවිල මන්ත්‍රීතුමාටත්, ඒ ප්‍රදේශවල සිටින අනිකුත් මන්ත්‍රීවරුන්ටත් වැඩි කල් යන්නට ඉස්සර වෙලා මොනවා වෙයිද කියා කවුරුන්වත් දන්නේ නැහැ. මොකද ? දැන් ත්‍රස්තවාදීන් ටිකෙන් ටික උතුරේ සිට පහතට ඇවිත් තිබෙනවා.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල ත්‍රස්තවාදීන් මෙල්ල කර ගෙන යන විට මේ උදවිය තමයි කිව්වේ, අහිංසක දෙමළ මිනිසුන් මරණවාය කියා. අද ඇවිත් මෙතන කථා කරන්නේ වෙනත් දෙයක්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

නැහැ. අපි එහෙම කිව්වේ නැහැ.

**වීරවන්නි සමරවීර මහතා**
**(திரு. வீரவன்னி சமரவீர)**
**(Mr. Weerawanni Samaraweera)**

කිව්වා ; කිව්වා ; අනන්ත වාරයක් කිව්වා. ඕනෑ නම් හැන්සාඩ් වාර්තාවලින් පෙන්වා දෙන්නම්. විරුද්ධ පාර්ශ්වයේ නායකයන් එහෙම කිව්වා.

**ආර්. පී. විජේසිරි මහතා (කුණ්ඩසාලේ)**
**(திரு. ஆர். பீ. விஜேசிறி — குண்டசாலை)**
**(Mr. R. P. Wijesiri – Kundasale)**

ගරු මන්ත්‍රීතුමා යුද්ධය නම් යුද්ධය, සාමය නම් සාමය කියනවා. අපි සංචාරයක ගිය වෙලාවේ, ඒ මන්ත්‍රීතුමා ත්‍රස්තවාදීන්ට භයේ හෝටලයෙන් එළියට බැස්සේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

මට මතක හැටියට තමුන්නාන්සේ හැංගිලා හිටියා. කඩයකට තේ බොන්නවත් ගියේ නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**

තමුන්නාන්සේ හෝටලයෙන් එළියට බැස්සේවත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

එංගලන්තයේ ත්‍රස්තවාදී කටයුතු සිදුවන විට ගරු කථානායකතුමාත් මමත් හැමතැනම නිදහසේ ඇවිද්ද, කිසිම භයක් නැතුව. [බාධා කිරීමක්] ඊට වැඩිය කෙනෙක් ඉන්නවාද සාක්ෂියට ? අපි දෙන්නාම ඇවිද්ද.

ගරු සභාපතිතුමනි, මෙහිදී වෙනත් ප්‍රශ්නයක් පැන නැගෙනවා. මේ විධියට මුදල් වෙන්කරන විට එසේ වෙන් කරන්නේ මොකටද කියන එක පැහැදිලි නැහැ. මේ මුදල් වියදම් කරන්නේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, කර්මාන්තශාලා අලුත්වැඩියා කිරීම වාගේ වැඩවලටයි. මිනිසුන් ආරක්ෂා කිරීමට හෝ අනාථයන් පුනරුත්ථාපනය කිරීමට හෝ අදාළ ශීර්ෂයක් මෙහි නැහැ. මට පෙනෙන විධියට මේකේ අඩුවක් තිබෙනවා. මම හිතන විධියට මීළඟ අවුරුද්දේ හෝ ඒක හරි ගස්සන්න වෙනවා. ඒක මම කියවන්නම්.

"Estimates 1986
Head 192 – Minister of Rehabilitation
Objectives, Functions and General Work Programme."

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

පාර්ලිමේන්තු පත්‍රිකාවෙන් අගමැතිතුමා දුන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

"The Ministry of Rehabilitation is responsible for the repair and restoration of affected properties and the rehabilitation of affected industries and businesses."

මේ විධියටයි තිබෙන්නේ. මේකටයි මේ මුදල් වෙන්කර තිබෙන්නේ. රුපියල් 7,56,000ක් වෙන්කර තිබෙනවා.

සභාපතිතුමා
(தலைவர்)
**(The Chairman)**

දැන් ගරු මන්ත්‍රීතුමාට දී තිබෙන කාලය අවසානයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

මම නැවතත් මේ කාරණය කෙළින්ම ආණ්ඩුවට කියනවා. මුළු රටේම ජනතාවගේ ඉල්ලීමත් ඒකයි.

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
**(Mr. R. P. Wijesiri)**

ඒ කොහොමද ? මුල්කිරිගල දුන් තීන්දුව මොකක්ද ? කුණ්ඩසාලේ දුන් තීන්දුව මොකක්ද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
**(Mr. Ananda Dassanayake)**

මුල්කිරිගල ගැන අවුස්සන්න ආවොත් ඉතින් අපටත් අවුස්සන්න තිබෙනවා.

මුල්කිරිගලට ඡන්ද පෙත්සමක් තිබෙන නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. මම නීතියට ගරු කරනවා.

මේ රටේ සාමය පවත්වාගෙන යන්න ඕනෑය කියා මම කියනවා. ඒ සාමය පවත්වාගෙන යාම භාර රජයටයි. එය මහජනතාව පිට තබා හෝ විරුද්ධ පාර්ශ්වය පිට තබා තමුන්නාන්සේලාට කවදාවත් ඒකෙන් ගැලවෙන්න ලැබෙන්නේ නැහැ. ආණ්ඩුව කෙළින් ඉදලා උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ආරක්ෂක වැඩකටයුතු ශක්තිමත් කළ යුතුයි.

දයාරත්න වලගම්බාහු මහතා (මිහින්තලේ)
(திரு. தயாரத்ன வலகம்பாகு — மிஹிந்தலை)
**(Mr. Dayaratne Walagambahu – Mihintale)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ අනාථ වූ විශාල පිරිසකගේ — ලක්ෂයකට ආසන්න හෝ ඊට මදක් වැඩි පිරිසකගේ — එදිනෙදා කටයුතු බලාකියා ගනිමින්, දුකසැප බලමින් ඒ අය ආරක්ෂා කරගන්නා අතර, පුනරුත්ථාපනය කරන අතර, මේ රටේ සංවර්ධන කටයුතු කිසිවක් අඩාල නොවන ආකාරයට කටයුතු කිරීමට තරම් මේ රජය ශක්තිමත්වීම ගැන අපි ආඩම්බර විය යුතුයි. යුද්ධයක් පවතින මේ අවස්ථාවේ අඩුපාඩුකම් ඇතිවෙන්න පුළුවන්. රජයක් වශයෙන් තවම කෙළින්ම යුද්ධයට බැස්සේ නැතිබව අපි ප්‍රකාශ කළ යුතුයි. අපි තවමත් බලන්නේ දේශපාලන විසඳුමක් මාර්ගයෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්නට බව විරුද්ධ පාර්ශ්වයටත් මේ රටේ ජනතාවටත් කියන්නට කැමතියි. අනාථයන් කඳවුරුවල දමාගෙන, ඒ අනාථයන්ගේ දුකසැප බලාගෙන සිටින ගමන් මේ රටේ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධව ක්‍රියා කරගෙන යන මේ රජය නිතරම කල්පනා කරන්නේ මේ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාගෙන ඉතාමත් සාමයෙන් සමාදානයෙන් මේ අනාථ වී සිටින පිරිස් තම තමන් සිටි ප්‍රදේශවලට නැවත යවා ඔවුන් සුරක්ෂිත කිරීමට බව අපි ප්‍රකාශ කරන්නට ඕනෑ.

මේ අතරතුර අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කළ ප්‍රකාශයක් නිසා මේ රජයේ මන්ත්‍රීවරයෙකු හැටියට ඒ පිළිබඳවත් පැහැදිලි කරන්න කැමතියි. මීට මාස හතකට පමණ ප්‍රථම වව්නියාව දිස්ත්‍රික්කයේ මාක්ස්වාදී ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද ගම්මාන කීපයක සිංහල ජනතාව වෙනුවෙන් වව්නියාව දිස්ත්‍රික්කයේ සිංහල ප්‍රදේශවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයෙකු වන කරුණාරත්න නමැති මහතා ඇවිදින් මාව හමු වුණා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

පාවක්කුලමේ.

දයාරත්න වලගම්බාහු මහතා
(திரு. தயாரத்ன வலகம்பாகு)
**(Mr. Dayaratne Walagambahu)**

මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගේ උපදෙස් පරිදි පාවක්කුලමේ කරුණාරත්න නමැති මහත්මයා ඇවිදින් මාව මුණගැසී, " මන්ත්‍රීතුමා ! අපි පවුල් 500 ක් පමණ අනාථ වී ඉන්නවා. මේ වෙලාවේ අපට උදව්වෙන්න ඕනෑ " යයි කිව්වා. මම කිව්වා, " බොහොම සන්තෝෂයි ; හැබැයි, මම උදව් වෙන්නේ මෙන්න මෙහෙමයි. මේ අය පාසලක අනාථ කඳවුරකට දමන්න මම කැමති නැහැ. පාසලකට දමා ඔක්කොම එකට රඳවන්න මම කැමති නැහැ. මගේ ප්‍රදේශයෙ ජනතාව සමග එකතු වී, තරුණ තරුණියන් සමග එකතු වී, හෙළි පෙහෙළි කර, අක්කර 1 1/2 කැලිවලට කඩා, පාරවල් හදා, වතුර සපයා මගේ ආසනයේ ජනතාව අතර බෙදා දී පදිංචි කරවීම සඳහා ලෑස්ති කළ මාරාකුලම නමැති, එක්තරා වලව්වක් යටත් කරගෙන සිටි අක්කර දාහක පමණ බිම් ප්‍රමාණයක් තිබෙනවා. තමුසෙලා ඔක්කොම එතැනට එනවා. රජයේ නියෝගයක් නැතිව වුණත් මම තනිවම මේක කරන්න කැමතියි. හැබැයි වෙන් වෙන්ව ඒ ඒ අක්කර 1 1/2 තවකාලිකව වගා කර ගැනීම සඳහා ගෙවල් තනා ගැනීමට මම බඩු සපයනවා, සැම සහායක්ම දෙනවා " කියා මම කිව්වා. ඒ සියලුම දෙනා ඊට කැමති වී දැනට පවුල් 460 ක් ඇවිදින් සිටිනවා. අනෙක් අනාථ කඳවුරුවල වගේ නොවෙයි පවුල් වශයෙන් වෙන් වෙන්ව දැන් සිටිනවා. මට අපේම අයගෙන් නොයෙක් විරෝධතා ආවත් අපේ රජයේ ප්‍රතිපත්තිය, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය අගය කරමින් මම ඒ කටයුතු කළා. එක්සත් ජාතික පක්ෂයට ඩී. එස්. සේනානායක මැතිතුමා අමතක වෙලාය කියා විරුද්ධ පාර්ශ්වයෙන් නිතරම කියනවා. නැහැ ! ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් මේ සිංහලයන් අක්කර 1 1/2 බැගින් ඉඩම් කැබලි කඩා, මගේ ආසනයේ ඇතුන්ගම නමැති මම නිර්මාණය කළ ගමේ පදිංචි කරවා, තාවකාලිකව ගෙවල් දොරවල් සාද ගන්න හැම දෙයක්ම සපයා දී, රජයෙන් ආධාර එන්න ප්‍රථම මාසයක පමණ කාලයක් මම මගේ වාහනයෙන් ගිහින් හාල් පොල් එකතු කර ගෙනැවිත් කන්න දී, මහා මාර්ග ඉදි කරවා, ලෙඩට දුකට සලකා, ජලය සපයා ගැනීම සඳහා මම තනා තිබුණු නළ ළිංවලට පොම්ප දමාදී, ආහාර සපයා, ගමන් පහසුව සඳහා බස් රථයක් දමා, සෞඛ්‍ය පහසුකම් සඳහා සෞඛ්‍ය නිලධාරීන් යවා, තාවකාලික සෞඛ්‍ය සේවක සේවිකාවන් පුහුණු කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ දයාරත්න වලගම්බාහු මහතා ]

බෙහෙත් බෙද දී තිබෙනවා. එපමණක් නොව සර්වෝදය අල්ලාගෙන එහි ළදරුවන්ට තාවකාලික පාසලක් තනාදී තිබෙනවා. එපමණක්ද නොවෙයි, ඒ පවුල්වල අධ්‍යාපනය ලැබූ දරුවන් හාරසීය ගණනක් අනාථ වී සිටිනවා. ගම්වාසීන් එකතු කරගෙන ඒ අය සඳහා 80×20 පාසලක් හැදුවා. බලන්න අපි රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යන හැටි.

මෙහෙම කටයුතු කරගෙන යන විට මට පොල් අතු මඩි වුණා. " දිවයින " පත්‍රයෙන් මම අධාර ඉල්ලුවා. මට පත්තරවලින් සැහෙන්න ආධාර ලැබුණා. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට මෙය ආරංචි වී මට ටෙලිෆෝන් එකෙන් කථා කර, " දයා, මොකක්ද මම කරන්න ඕනෑ ? " කියා මගෙන් ඇහැව්වා. " මේ අය සඳහා මම තනිවමයි කැමබීම දෙන්නේ. සර් ! කරුණාකර මට පොඩ්ඩක් උදව් කරන්න " කිව්වා. " කොහොමද මම උදව් කරන්න ඕනෑ ? " කියා එතුමා මට කථා කර ඇහැව්වා. " කරාණාකර ඒ ආධාර උපදිසාපතිට ගෙනැවිත් භාර දෙන්න " කියා මම කිව්වා. එහෙම නැතිව අනාථාධාර ගෙන ගියොත් එතැන සිටින පිරිස ගසා කනවා. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා එහෙම කියා දවස් කීපයක් ඇතුළත එතුමා ආහාර විශාල තොගයක් උපදිසාපතිගේ මාර්ගයෙන් මට ගෙනැවිත් භාර දුන්නා. හඳිසියේ පවුල් 50 ක් ආවත් ඒ අයට කෑම බීම දීම සඳහා රජයෙන් දෙන ආහාරවලට අමතරව ඒ එකතු කළ ආහාර මම තබාගෙන ඉන්නවා.

ඒ අතරතුර හිටපු අගමැතිනි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 9 වැනිද එනවාය කියා මට ආරංචියක් ආවා. තිරප්පනේ උපදිසාපතිතුමාගේ මාර්ගයෙනුයි මට ඒ ආරංචිය ආවේ. ඕනෑ නම් උපදිසාපති කැඳවා අහන්න. කීප වතාවක් මේ රටේ අගමැති වූ කෙනෙක්, පක්ෂයක නායිකාවක් මගේ ආසනයට එන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන් දෙදෙනෙක් ඉන්නවා. අවුරුදු 20ක් මන්ත්‍රීවරයා හැටියට සිටි පතිරාජ තෙන්නකෝන් මහත්මයා ඉන්නවා. අලුතෙන් පත් වුණු නව කෙනෙක් ඉන්නවා. නමවත් කියන්න මම කැමති නැහැ. එයා අපේ ආසනයේ කෙනෙකුත් නොවෙයි. මම උපදිසාපතිට උපදෙස් දෙන විට වැරදිලා හරි මේ දෙදෙනා අතරේ ප්‍රශ්නයක් ඇති වුණොත් මොකද වෙන්නේ ? මේ ගමට පැමිණි අයගෙන් සියයට 98ක් මෛත්‍රීපාල සේනානායක මහත්මයාගේ කීමට වව්නියාවේ එක්සත් ජාතික පක්ෂයේ පුලේන්ද්‍රම් මහතාට විරුද්ධව ඡන්දය දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය. මම ඒ එක්කෙනෙකුගෙවත්වත් ඇහුවේ නැහැ, " උඹ මොන පක්ෂයේද " කියලා. මම, " වරෙන් කරුණාරත්න. ඔක්කොමලා වරෙන්, වරෙන් " කියල ඔක්කොමටම කන්න දීල, හැම දුක සැපක්ම බලා ගත්තා. උපදිසාපති, එක්සත් ජාතික පක්ෂයේ ජයවර්ධන නමැති පුද්ගලයා මගේ සංවිධායක, කරුණාරත්න නැමැති පුද්ගලයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක යන තුන් දෙනාටම කථා කරලා මම කිව්වා, " අනාථාධාර බෙදන්න එන්නේ. ඒ නිසා එතුමියට සම්පූර්ණ ආරක්ෂාව සංවිධානය අපි දෙන්න ඕනෑ, පොලීසියෙන් නාවත් " කියල. අපි ඒ කටයුතු ලැස්ති කළා. එයට උපදිසාපති සාක්ෂි දෙයි. මම කිව්වා, " මමත් ඒ වෙලාවට එනව " කියලා. ඒ මොකද, සෑම ඉරිදවකම උදේ 9ට, 9.30ට මම එතැනට ගිහින් ඒ අයගේ දුක සැප බලල 11ට විතර තමයි කන්තෝරුවට යන්නේ.

මේ දවසේ උදේ පාන්දර මට ආරංචි වුණා, සැතපුම් 5ක 6ක දුර ප්‍රමාණය සිට තිල් කොඩි දමල තිබෙනවාය කියල. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකටත්, උපදිසාපතිටත් මම පාන්දර පණිවුඩයක් එව්වා, " කරුණාකර මෙතන දේශපාලන රැස්වීමක් තියන්න එපා " කියලා. ඇයි ? අපි උදළු කැති පවා මේ අයට ගිහින් දුන්නා. තමුන්නාන්සේ කල්පනා කර බලන්න ගරු සභාපතිතුමනි, ඒ ඉඩකඩම් තිබුණු මිනිස්සු, ගොවිතැන් කළ මිනිස්සු, ඇඳිවත පිටින් ආවේ. අප කැති උදළු ගිහින් දුන්නා ඇමතිවරුන් මාර්ගයෙන්, නියෝජ්‍ය ඇමති ඒ. එම්. එස්. අධිකාරි මහතා මාර්ගයෙන්. අපි ඒවා බෙදීමේ උත්සවයක් තිබ්බේ නැහැ ; කොළ කොඩි ඉස්සුවේ නැහැ. රුපියල් ලක්ෂ 15ක් පමණ ආධාර දුන්නා. අපි ග්‍රාමීය සංවර්ධන බැංකුවට ගිහින් කථා කරල අපි සෑම කෙනෙකුටම සෝයා බෝංචි, උඳු ඇට, කව්පි ඇට අරගෙන දුන්නා. ඒ සඳහා රුපියල් ලක්ෂ 5ක් පමණ ගියා. ඒ වාගේම ඒ අයට දෙන්න බෙහෙත් වර්ග, කෘමිනාශක ද්‍රව්‍ය, පොහොර ආදිය ලැස්ති කර තිබෙනවා. රුපියල් ලක්ෂ 15ක් ගත්තා, මේ සෑම පවුලකටම ආධාර දෙන්නට. මෙපමණ ඇමතිවරු ආවා ; මෙපමණ දෙයක් කළා. නමුත් මේ ඇතුන්ගමේ අපි එක කොළ කොඩියක් ඉස්සුවේ නැහැ ; රැස්වීමක් තිබ්බේ නැහැ. ඒ නිසා මම ඒ අයට කිව්වා, " කරුණාකරල මේ කොඩි ටික ගලවන්න කියා, මම එනවා එතුමිය ආහාර බෙදන විට " කියලා. නමුත් ඊට ඉඩ දෙන්නේ නැතිව, ඉතාමත්ම කැත විධියට ඒ ප්‍රදේශය සංවිධානය කළ පුද්ගලයෙක් මට කථා කළා. මම ගියා එතැනට. මම එය පිළිගන්නවා.

අපේ රටේ ජනමාධ්‍ය මේ කරන දේවල් කියන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. නිකම් ඔය සේවා වනිතාවක් ගිහින් සල්පිලක් තිබ්බොත් දන තරම්, මම කියූ ඒවා එකක් වත් දමනවද එක පත්‍රයකවත් ? නමුත් මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ ප්‍රථමයෙන්ම " දිවයින " පත්‍රයට. 1985.11.28 වැනි බ්‍රහස්පතින්ද " දිවයින " පත්‍රයේ තිබෙනවා, " අනාථ ගොවි පවුල්වලට මිහින්තලෙන් ඉඩම් " කියන ශීර්ෂය යටතේ පළ වූ කොටසක්.

**සභාපතිතුමා**
**(தலைவர்)**
**(The Chairman)**

තමුන්නාන්සේ " සේවා වනිතා " එක ගැන මොකක්ද කිව්වේ ?

**දයාරත්න වලගම්බාහු මහතා**
**(திரு. தயாரத்ன வலகம்பாகு)**
**(Mr. Dayaratne Walagambahu)**

සේවා වනිතාවකින් සල්පිලක් තියන විට ටී වී එකයි, පත්‍රයයි දෙක ප්‍රචාරයවත් මේ තරම් කළ අපට නැහැ කියන එකයි මේ කිව්වේ. ආණ්ඩුවේ උදව් ඇතිව නොවෙයි, මේවා කළේ. පෞද්ගලිකවයි කළේ. මගේ නායකයින්ගේ ආදර්ශ අරගෙන මගේ පක්ෂයේ ආදර්ශ අරගෙන මා තනිවම මේවා කරන්නේ. ප්‍රසිද්ද කරලා නොවෙයි කරන්නේ. ඒ වුණාට මට එක් අවස්ථාවකදී " දිවයින් " පත්‍රය උදව්වක් කර තිබෙනවා. 1985. 11. 28 වැනි බ්‍රහස්පතින්ද " දිවයින " පත්‍රයේ මේ විධියට සඳහන් වෙනවා.

" අනාථ ගොවිපවුල්වලට මිහින්තලෙන් ඉඩම්

(ඉන්දුපාල නානායක්කාර

මිහින්තලේ අනාථ කඳවුරුවල සිටින සියලුම ගොවි පවුල්වලට තාවකාලිකව ඉඩම් ලබා දී ඔවුන් කෘෂිකාර්මික කටයුතු වල යෙදවීමට මිහින්තලේ මන්ත්‍රී දයා වලගම්බාහු මහතා තීරණය කර ඇත.

දැනටමත් ත්‍රස්තවාදී ක්‍රියා නිසා ත්‍රිකුණාමලය හා වවුනියා දිස්ත්‍රික්කවල සිට මිහින්තලේට පැමිණි අනාථ කඳවුරුවල සිටින ගොවි පවුල් 450 කට අධික පිරිසකට මිහින්තලේ ඇතුන්ගමේ ගොවිතැන් කටයුතු කර ඔවුන්ගේ ජීවන වෘත්තිය කරගෙන යෑම සඳහා කටයුතු සළසා ඇත.

ගොවිතැන් කිරීම සඳහා සෑම අනාථ ගොවි පවුලකටම ඉඩම් අක්කර එකහමාරක් සහ වගාවෙන් අස්වැන්න ලබා ගන්නා තෙක්, තොම්ලේ කෑම බීම හා රෙදිපිළි සැපයීමට ද කටයුතු කර තිබේ.

මේ අතර මෙම අනාථ පවුල් වල සිටින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මිහින්තලේ ඇතුන්ගම ප්‍රදේශයේ තාවකාලික පාසලක් ඉදිකර අධ්‍යාපන පහසුකම් සැලසීමට ද තීරණය කර ඇත.

සමාජ සේවා හා සුභසාදක සංවිධාන ගණනාවක සහයෝගය ඇතිව මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කෙරේ. "

ආ හා. 5.30

මේ විධියට " දිවයින " පත්‍රයෙන් වර්ණනා කර තිබෙනවා. ඒ එක්කම මා ගිහින් ඒ සංවිධායකවරුන් දෙදෙනාටම කිව්වා අනුරාධපුර බටහිර එක්කෙනාටත්, මිහින්තලේ ඉන්න අළුත් සංවිධායකටත් — " මේවා කරන්න එපා මහත්මයා " කියලා. " නැහැ, නැහැ අපි මේවා තිල්කොඩිවලින් නාවනවා " කියලා ඒ අය කිව්වා. මම කිව්වා, " එහෙම නම් මමත් කොළ කොඩිවලින් නාවනවා " කියා. මා මේ සත්‍යයක් ගරු සභාවේදී කියන්නේ. " අපි මෙච්චර කළා. කොඩි දම්මේ නැහැ, මෙච්චර ඇමතිවරු ආවා, කොළ කොඩි දම්මේ නැහැ. ඒ නිසා මේවා කරන්න එපා. මෙතන ඉන්න සියයට 98 ක්ම තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයයි. ඒ එක්කෙනෙකුගෙන් හරි ගිහින් අහන්න, " උඹ ශ්‍රී ලංකා නිසා මම උඹව එලවනවා, කන්න දෙන්නේ නැහැ ; කියල කිව්වද කියා " එතැන සියයට 2 යි මගේ අය සිටියේ. හොඳට අහගන්න. මා ඒ අයට කිව්වා ඒවා ගලවන්නය කියා. එවිට මා සමග ගිය අපේ පක්ෂයේ අය කොඩි ටික ගැලෙව්වා, ආහාර බෙදන්නය කියා කිව්වා. මේ අවස්ථාව වන විට හොඳට තිල් ඇඳගෙන සිටි එක්තරා කාන්තාවක් ඇවිත්, " මොකද කියන්නේ, බෙදන්න එපාද, කියල ඇහුවා. මම කිව්වා, " බෙදන එක බෙදනවා, නමුත් මෙතන රැස්වීම් තියන්න බැහැ " කියලා. මෙය මගේ ගම. මම හදපු ගමක්. එවිට සංවිධායක වරයෙක් ඇවිත් කිව්වා, " නැහැ, නැහැ. අපි මෙය තීලෙන් නාවනවා " කියල. එවිට මම කිව්වා "එහෙම නම් නාවපියව් බලන්න " කියල. කොහොමද ඊලඟට " දිවයින " පත්‍රය ප්‍රචාරය දෙන්නේ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර කී "දිවයින" පත්‍රයම වමාරා කමින් 1985 නොවැම්බර් මස 27 වැනි බදාදා "අනාථ ආධාර එපාද?" කියා කතු වැකියක් පළ කර තිබෙනවා. එය දීර්ඝයි. ඒ නිසා කියවන්නට ඕනෑ නැහැ. මෙහි කියා තිබෙන්නේ ත්‍රස්තවාදියෙක් හැටියටයි. මේ රජයේ ත්‍රස්තවාදියෙක් හැටියටයි. ඉතාම කැත නින්දිත පාහර වචන පාවිච්චි කරමින් කටයුතු කර තිබෙනවා. මේ අය දැනගන්න ඕනෑ ලේඛන කලාව කොහොමද පාවිච්චි කරන්නේ කියා. මෙපමණ කලා, වර්ණනා කරන්න බැරි වුණා. යම් ප්‍රචාරයක් කරන විට ලේඛකයෙක් දැනගන්නට ඕනෑ. මේ කථාව කරන්න ඇතිවූ පසුතලය මොකක්ද, මේ ක්‍රියාව කරන්නට ඇතිවූ පසුතලය මොකක්ද කියා. එහෙම කිසි දෙයක් නැතිව විචාරාත්මක භාවයෙන් තොරව අවිචාරවත් ලේඛකයින් අල්ලාගෙන අනාගත ආණ්ඩුවක් හදන බලාපොරොත්තුවක් ගෙන යන ත්‍රස්තවාදීන් කණ්ඩායමක්. මම ඉතාමත්ම අගය කරන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට නිතරම අපිත් සමග තරග කරන්නට පුළුවන් අපිත් සමඟ හැප්පෙන්නට පුළුවන් ඡන්දය ලබා ගන්නට හැප්පෙන්නට පුළුවන් එකම පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ වෙනවාට මම හරිම අකමැතියි. මට හරිම කණගාටුයි. කරුණාකර මේ ත්‍රස්තවාදී මාර්ක්ස්වාදීන්—මාර්ක්ස්වාදී ත්‍රස්තවාදීන් නොවෙයි—එක් එක් පුවත්පත්වල ඉන්නේ ත්‍රස්තවාදී මාර්ක්ස්වාදීන්. මේ "දිවයින" පත්‍රයට මම කියන්නේ 'ගරහන' කියලයි. එහෙම නොවුණත් අකුරු වෙනස් වෙනවා. මාත්‍රා වෙනස් වුණාම තරක් වෙනවානේ. කාටහරි ගරහන්නට [බාධා කිරීමක්] 'ගරහන' ඒ පත්‍රය. 'ගරහන' ඒ පත්‍රයේ නමයි. කාට හරි ගරහනවා. විශේෂයෙන් එක්තරා පන්තියකට පමණයි. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසකට. ගහන්න පුළුවන් නම් ගරහන්න පුළුවන් නම් බලබලා ඉන්නේ මෙහාට වෙලා ඉඳගෙන. මේ 'දිවයින' කතා. 'අයිලන්ඩ්' පත්‍රයෙන් ඒකම ගහලා තිබෙනවා. කියවන්නට මට වෙලාවක් නැහැ. හරියට ත්‍රස්තවාදියෙක් හැටියට. මම අහන්න කැමතියි, මම මතක් කරන්න කැමතියි, මේ ත්‍රස්තවාදී මාර්ක්ස්වාදීන්ට මේ වගේ ලියන්නට ප්‍රථම බලන්නය කියා ජාතික රාජ්‍ය සභා විවාද 27 වැනි කාණ්ඩයේ 18 වැනි කලාපයේ—1978 ජූනි 7 වැනි ද—ජාතික රාජ්‍ය සභාව අනුරාධපුරයේ පිහිටුවීම නමින් දයාරත්න වලගම්බාහු, මිහින්තලේ මන්ත්‍රී ගෙනා යෝජනාව මොකක්ද කියා. මොකාද ත්‍රස්තවාදියා ? එතකොට 'දිවයින' පත්‍රයේ ඔය ත්‍රස්තවාදී මාර්ක්ස්වාදීන් මේ ගැන හිතලත් නැහැ. අතික මෙවැනි දෙයක් ගහලා. ආණ්ඩුවට තර්ජනයක් එල්ල කරලා. මෙයින් අගමැතිතුමා කී දෙයක් කලාය කියා අගමැතිතුමාත් පටලවලා. එතුමාටත් ගහලා. පක්ෂයක් වශයෙන් මෙතන ජනාධිපතිතුමාටත් ගහලා. 'අයිලන්ඩ්' පත්‍රයේ කී එක්කෙනා කියනවා මන්ත්‍රීවරුන්ට චර්යාධර්ම උගන්වන්නය කියා. මෙයට හොඳම දේ මෙයයි, සභාපතිතුමනි. මේ චර්යාධර්ම උගන්වන්නට ඕනෑ ත්‍රස්තවාදී මාක්ස්වාදී ලේඛකයින්ටයි, කොහොමද ලියන්න ඕනෑ කියන එක ගැන. සොයා බලා ලියන්නට ඕනෑ. ඒ නිසා ඒ ගැන මම බොහොම කණගාටු වෙනවා. ලේඛන කලාව මේ තරම් දුර්දාන්ත විධියට අවල විධියට කැත විධියට කරුණු සොයා නොබලා මෙවැනි වැරදි වචන පාවිච්චි කිරීම ඉතාමත්ම හොඳ නැහැ කියන එක මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, ත්‍රස්තවාදීන්ගෙන් හිරිහැර ලබන සියළුම අනාථ පවුල්වලට රජයට හැකි හැම දෙයක්ම කරනවා. [බාධාකිරීමක්] මම කරන දේවල් මම කියන්නම්. තමුන්නාන්සේ එන්න මාත් එක්ක. මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන මහතාට මම දූත් කී වරක් කිව්වාද ආධාර ටිකක් ගෙනෙන්නය කියා ? එතුමා මට දූත් සංවිධාන කීපයකින්ම ආධාර එවා තිබෙනවා. මම ඊයේ පෙරේද සිට කියන්නේ අර ස්කෝලේ හද ගන්නට පොල් අතු 5000ක් එවන්න කියලයි. ළමයින් හාරසිය ගණනක් අනාථයි. මේ ත්‍රස්තවාදී මාර්ක්ස්වාදී ලේඛකයින් හුනු බිංදුවක්වත් දීලා නැහැ, එකෙකුටවත්. ගිහින් බලා නැහැ. බැලුවා නම් පෙනෙනවා මොකක්ද මේ කරන එක කියා. රජය වෙනුවෙන් පුංචි මිනිසුන් එකතුවී කැලෑවේ ඉඳගෙන මේ අනාථයින් වෙනුවෙන් කරන්නේ මොනවාද කියා නොදැනයි මේ. අනාගතයේදී ලොකු තනතුරක් බලාපොරොත්තුවෙන් වෙන්නට ඇති. කවදද මම දන්නේ නැහැ. අපි හැම දෙයක්ම කරනවා. අපි බලාපොරොත්තු වන්නේ මේ අයට තාවකාලික වගාවන් කරන්නට කටයුතු පිළියෙළ කරන්නයි. ඇයි ? අපි නැවත යනවා, උතුරට. අපි නැවත මේ අය අරගෙන යනවා. අත්තනගල්ලේ මන්ත්‍රීතුමනි, එකවරටම මේවා කරන්නට බැහැ. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ඔබතුමා කටයුතු කළ නිසා දන්නවා ඇති. මෙය පුංචි රටක්. පුංචි ජාතියක්. යුද්ධයක් කරන්නට අපට හමුදාවක් හිටියේ නැහැ. නිදහස් දවසට තුවක්කු පොලිෂ් කර යන්ත්‍ර සූත්‍ර පොලිෂ් කර පෙළපාලි යන්න පමණයි, අපේ හමුදාව හිටියේ. දූත් අළුතින් පුහුණු කරගෙන යනවා. පුංචි රටක් නිසා අපි තවමත් බලන්නේ මහ රටවල් සමඟ එක්වී මෙය සමාදානයෙන් විසඳ ගන්නයි. එතෙක් මේ පුනරුත්ථාපන අමාත්‍යාංශයට තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්න.

මම නැවතත් ඉල්ලනවා, තමුන්නාන්සේලා ඕනෑම ආධාරයක් අරගෙන එන්නය කියා. මම එනවා සහයෝගය දෙන්නට. ඉස්සරවෙලාම පොල්අතු ටිකක් අරගෙන තමුන්නාන්සේ එන්න. අපි දෙදෙනා එක්වී ඒ කටයුත්ත කරමු. හැබැයි කොළ කොඩිත් බෑ ; නිල් කොඩිත් බෑ. බොහෙම ස්තුතියි.

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
**(Mr. Richard Pathirana – Akmeemana)**

ගරු සභාපතිතුමනි, මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙන්නට කැමතියි " දිවයින " සහ " අයිලන්ඩ් " පුවත්පත්වලට, මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාට කලින් ප්‍රසංශා කළ යුතු අවස්ථාවේ ප්‍රසංශා කිරීම ගැනත් පසුව එතුමා කරන ලද වැරැද්ද ගැන කතු වැකියක් මගින් එහි නියම තත්ත්වය පැහැදිලි කිරීම ගැනත්.

ඒ නිසා මේ රටේ පත්‍ර කලාවේදීන්ගේ යුතුකමක් තමයි—

**දයාරත්න වලගම්බාහු මහතා**
**(திரு. தயாரத்ன வலகம்பாகு)**
**(Mr. Dayaratne Walagambahu)**

බොරු කීම. ගැරහීම.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

හරි දේ කළ විට එය නිවැරදි බව ප්‍රකාශ කිරීමත් වැරදි දේ කළවිට එය වැරදි හැටියට ප්‍රකාශ කිරීමත්. උදාහරණයක් වශයෙන් කියතොත් මටත් සමහර වෙලාවට ඔය පත්තරවලින් " ඇත්ත " පත්‍රයෙන් එහෙම – පහර ගහලා තිබෙනවා. නමුත් මම කවදාවත් ඒ පත්තරයට විරුද්ධව පහර ගහන්නේ නැහැ. ඒක තමයි, පත්‍ර කලාවේ යුතුකම. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (දයාරත්න වලගම්භාහු මහතා) සම්බන්ධයෙන් කරපු කතාව ගැන මම දන්නේ නැහැ. නමුත් පත්‍ර කලාවේ සිරිතක් තමයි, වැරැද්දක් කළොත් ඒ වරද පෙන්වා දීමත්, යහපත් දෙයක් කළොත් එය අගය කිරීමත්.

**දයාරත්න වලගම්බාහු මහතා**
**(திரு. தயாரத்ன வலகம்பாகு)**
**(Mr. Dayaratne Walagambahu)**

ගරු මන්ත්‍රීතුමා, විවේචනය නෙමෙයි, පාවිච්චි කළ වචන.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

අපි විවේචනය අගය කරනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

ගරු සභාපතිතුමනි, මම කතා කරන්නට බලාපොරොත්තු වන්නේ උතුරු, නැගෙනහිර පළාත්වල සිට පැමිණ දැනට දකුණු පළාතේ සිටින අනාථයින් ගැන. ඒ කාරණය ගැන පමණයි, මම කතා කරන්නට බලාපොරොත්තු වන්නේ.

දකුණු පළාතේ විශාල ජනතාවක් උතුරු, නැගෙනහිර පළාත්වල ජීවත් වුනා, මේ කලබලවලට කලින්. වෙළඳ ව්‍යාපාරිකයෝ රාශියක් සිටියා. ධීවර කාර්මිකයෝ රාශියක් සිටියා. විශේෂයෙන් සිංහල බේකරි හිමියන් විශාල ප්‍රමාණයක් සිටියා. උතුරු නැගෙනහිර පළාත්වල. මේ සියලු දෙනාම දූත් අනාථයින් බවට පත්වෙලා දකුණු පළාතට පැමිණ සිටිනවා. අද මේ මොහොතට පමණක් පුනරුත්ථාපන අමාත්‍යාංශය භාරව සිටින පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමතියි. කරුණාකර ඔබතුමාගේ පිළිතුරු කතාවේදී පැහැදිලි කරන්න, මොකක්ද මේ අය වෙනුවෙන් තමුන්නාන්සේලා ගත් ක්‍රියා මාර්ගය කියා. තමුන්තනාන්සේලා කවර ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද උතුරු, නැගෙනහිර පළාත්වල සිට දකුණට අනාථයින් හැටියට පැමිණ සිටින අය වනුවෙන්. [බාධා කිරීම] කිසිම ක්‍රියා මාර්ගයක් තමුන්නාන්සේලාට ගන්න පුළුවන්කම ලැබිලා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**
බම්බුව

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
සමහර පලාත්වල ඉන්නවා, ආහාර මුද්දරයක්වත් ගන්න බැරුව නොයෙක් ආකාරයේ ප්‍රශ්ණවලට මුහුණ දී සිටින අය. ඉස්කෝලවලට ළමයින් දාගන්න ක්‍රමයක් නැහැ. රක්ෂාවක් නැහැ. ගෙවල් නැහැ. දිසාපති කාර්යාලය වෙනස් වෙලා හින්දා ආහාර මුද්දරයවත් ලබාගන්න පුළුවන්කමක් නැහැ. [බාධා කිරීම්] මම තමුන්නාන්සේලාට ඉඩ දෙන්නේ නැහැ. මට විනාඩි 10 යයි දීලා තිබෙන්නේ කතා කරන්න. එමනිසා ගරු සභාපතිතුමනි, මේ අය අද කිසිම සරණක් නැතිව ඉන්නවා.

**මන්ත්‍රීවරු**
**(அங்கத்தினர்)**
**(Members)**
අපි විරුද්ධ වෙනවා ඒ කතාවට .

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**
I rise to a point of Order. [බාධාකිරීම්]

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**
උතුරු නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාපාරිකයින් වශයෙන් සිට දැන් අනාථයින් හැටියට මගේ ආසනයට පැමිණ සිටින අයට ඉන්න තිවාස නැහැ. ඒ අයගෙ වාහන පුච්චලා. කාර් පුච්චලා බේකරි පුච්චලා තිවාස පුච්චල. ඔවුන් අද අනාථ වෙලා මගේ මැතිවරණ කොට්ඨාශයට ඇවිල්ලා ඉන්නවා [බාධා කිරීම්]

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**
බොරු කියන්න එපා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
දැන් මේ මොර ගහන මන්ත්‍රීතුමන්ලාගෙන්, උප ඇමතිතුමන්ලාගෙන් මම අහන්න කැමතියි, මේ ප්‍රශ්ණයට සාධාරණ විසඳුමක් දෙනවාද කියා. මෙතන ඇවිල්ලා බොරුවට පිස්සො වගෙ කථා කරන්නෙ නැතිව—

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**
" පිස්සෝ " කියන වචනය ඉල්ලා අස්කර ගන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**
මම ඉල්ලා අස්කර ගන්නවා සභාපතිතුමනි. [බාධා කිරීමක්] එමනිසා බුද්ධියෙන් යුතුව කතා කරන හැටියට මම කරුණාවෙන් ඉල්ලන්න කැමතියි. [බාධා කිරීම්] අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) වෙත විනාශ වූ දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ සභාපතිතුමා විසින් එවන ලද ලිපියක් මම සභාගත කරනවා. මේක එවා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ ඇසූ ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙනුයි. එහි සඳහන් කර තිබෙනවා, පිළිතුර පසුව එවනවාය කියා. මේ ඒ වෙනුවට එවා තිබෙන ලිපියක්. මේ ලිපියේ තිබෙනවා ගරු සභාපතිතුමනි, ආධාර දුන් විධිය. කොහොමද ආධාර දී තිබෙන්නේ ? එම ලිපියේ තිබෙනවා, " ත්‍රිකුණාමලය සහ මන්නාරමේ විපතට පත් අය වෙනුවෙන් ගෙවන ලද සහනාධාර පිළිබඳ ලැයිස්තු දෙකක් මේ සමග එවමි " කියා. එහි මාතෘකාව " 1984 අගෝස්තු 12 සහ 13 දිනයන්හි යුද්ධ හමුද ක්‍රියා නිසාවෙන් මන්නාරමේ විපතට පත් අය වෙත ගෙවන ලද සහනාධාර පිළිබඳ ලැයිස්තුව " යනුවෙනුයි.

පළමුවැනි ලැයිස්තුවේ නම් තිබෙනවා 275ක්. ගෙවූ මුළු මුදල රුපියල් අසූහය ලක්ෂ අනූහය දහස් දෙසිය අනූ අටයි. ඒ 275 දෙනාට ගෙවූ මුළු මුදලයි. මේ ලිපිය එවා තිබෙන්නේ විනාශ වූ දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ සභාපතුමා අත්සන් කරලයි. ඊළඟට තිබෙනවා තවත් ලැයිස්තුවක්. 1983 ජුලි මාසයේ 26 වැනිද රාත්‍රි නාවුක හමුද ක්‍රියා හේතුවෙන් ත්‍රිකුණාමලේදී විපතට පත් වෙළඳ ව්‍යාපාරිකයින්ට සහ ගේ දෙරවලට වූ හානි සඳහා ගෙවන ලද සහනාධාර මුදල් පිළිබඳ ලැයිස්තුවක් ඒක. එම ලැයිස්තුවේ සඳහන් වෙනවා රුපියල් හැත්තෑ අට ලක්ෂ දහන් දහස් පන්සිය හැත්තෑ අටක් ගෙවපු බව. ගෙවා තිබෙන්නේ රුපියල් ලක්ෂය. දෙලක්ෂ විසිදහ, තුන් ලක්ෂය ආදී වශයෙන්. මේ සියල්ල සහනාධාර. මේ ලැයිස්තුව මම * **සභාගත කරනවා**. ඒ සමගම විනාශ වූ දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ සභාපතිතුමා රාජකාරී වශයෙන් එවූ ලිපියත් * **සභාගත** කරනවා.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**
I will give the explanation in my report.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**
ගරු සභාපතිතුමනි, ඒක තමයි මම අහන ප්‍රශ්නය. මේවා සියල්ලම සහනාධාර හැටියට, වන්දි මුදල් හැටියට ගෙව්වා නම්, ඒ ගෙව්වා වුණත්, මම අහන ප්‍රශ්නය මේකයි : යුද්ධ හමුදවේ, නාවුක හමුදවේ කටයුතු නිසා විපතට පත් අයට කියා මේවා ගෙව්වා. [බාධා කිරීම්]

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**
මටත් පුළුවන් කෑ ගහන්න. මම කතා කරනවිට පිළිතුරු දෙන්නම්. අසත්‍ය කතා නැවත නැවත කියන්න එපා. [බාධා කිරීම්]

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**
ගරු සභාපතිතුමනි, ගරු විරඹුවේ විමලභාරතී හිමියන් විසින් බෞද්ධ මධ්‍යස්ථානයක් ගැන යැවූ ලිපියකට පිළිතුරක් වශයෙන් යවා තිබෙන එම ලිපියක් මම දැන් කියවනවා :

" විනාශ වූ දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

(විදේක)

තැ. පෙ. 2210,
සෝක් ස්ට්‍රීට්,
කොළඹ 1.
28. 8. 1984

ගරු විරඹුවේ විමලභාරතී නායක ස්වාමීන් වහන්සේ
ධර්මකීර්ති පිරිවෙන,
පොල්වත්ත, කොල්ලුපිටිය,
කොළඹ 3.

ගරු කටයුතු ස්වාමීන්දුයාණන් වහන්ස,

රායාවිත් තෝට්ටන් පාරෙ බෞද්ධ මධ්‍යස්ථානය

අග්‍රාමාත්‍ය ලේකම්තුමා විසින් මා වෙත එවන ලද අප්‍රියෙල් මස 10 වැනි දින දී බෞද්ධ මධ්‍යස්ථානයට කරන ලද අලාභහානි පිළිබඳව 84.06.18 වැනි දින දරන ඔබ වහන්සේගේ ලිපිය පිළිබඳවයි.

2. ඉහත සඳහන් දින දී ඇතිවූ අලාභ, හදිසි අවස්ථා නියෝගය යටතේ ස්ථාපිත මෙම අධිකාරියේ විෂය පථයට ඇතුළත් නොවන හෙයින්, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි බව ඉතා කනගාටුවෙන් ගෞරවපූර්වකව දන්වා සිටිමි. "

* *පුස්තකාලයේ තබා ඇත.*
*நூனிலயத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවාට සහනාධාර ගෙවන්න බැහැ. වන්දි ගෙවන්නත් බැහැ. බෞද්ධ මධ්‍යස්ථාන විනාශ වුණාම. නමුත් මේ ලැයිස්තුවේ තිබෙන්නේ සේරම ව්‍යාපාරිකයන්ගෙ නම්. එම නිසා මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන අතර ඒ පළාත්වලට ඇවිල්ලා සිටින. දකුණු පළාතට ඇවිල්ලා සිටින. අනාථයින් ගැන අනුකම්පාවෙන් කටයුතු කරන හැටියට ඉල්ලමින් මගේ වචන කිහිපය අවසාන කරනවා.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

The hon. Member for Potuvil wants three minutes to explain certain difficulties, shall I give him time.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

Yes.

අ. භා. 5.45

**එම්. අයි. උදුමාලෙබ්බේ මහතා (පොතුවිල්)**
**(ஜனாப் எம். ஐ. உதுமாலெப்பை — பொத்துவில்)**
**(Mr. M. I. Uthumalebe – Pottuvil)**

தலைவர் அவர்களே, எனக்கு இச்சந்தர்ப்பத்திற் பேசுவதற்கு மூன்று நிமிடங்களாவது கிடைத்ததையிட்டுச் சந்தோஷப்படுகின்றேன். அதற்காக என் நன்றி. இந்த அமைச்சு உருவாக்கப்பட்டதன் பின்னர் இதற்கென ஓர் அமைச்சர் இல்லை என்ற ஒரு பாரிய குற்றச்சாட்டைக் கௌரவ அத்தனகல்ல அங்கத்தவர் (திரு. லக்ஷ்மன் ஜயக்கொடி) சுமத்தினார். இந்த அமைச்சு மிகவும் முக்கியமான ஓர் அமைச்சு. இந் நாட்டிலேற்பட்ட ஜூலை வன்செயலின்போது பாதிக்கப்பட்ட மக்களைக் காப்பாற்றுவதற்காகவும் அவர்களுக்கு உதவி செய்வதற்காகவும் நிறுவப்பட்டதே இந்த அமைச்சு என்ற காரணத்தினால் மேன்மைதங்கிய சனாதிபதி அவர்களே இதனைப் பாரமெடுத்துச் செயற்படுத்துகின்றார் என்பதை நான் இச் சந்தர்ப்பத்தில் அத்தனகல்லப் பிரதிநி அவர்களுக்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். இதனைத் தம்முடைய மேற்பார்வையின் கீழே கொண்டு வந்து, இந் நாட்டில் ஏற்பட்ட வன்செயல்களின் காரணமாகப் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் அளிக்க சனாதிபதி அவர்கள் முயன்று வந்திருக்கிறார்கள் என்பதையிட்டு அவர்களுக்கு நன்றி தெரிவிப்பதற்குப் பதிலாக, இந்த அமைச்சுப் பற்றிப் பாராதுரமான கண்டனங்கள் தெரிவிக்கப்படுவதையிட்டு நான் மிகவும் துக்கப்படுகின்றேன் ; விசனப்படுகின்றேன்.

இந்த அமைச்சுக்குப் பொறுப்பாக இருக்கின்ற செயலாளர் றியர் அட்மிரல் பெரேரா அவர்கள் தமது முழு நேரத்தையும் மிகவும் பொறுப்பாகவும் கண்ணியமாகவும் செலவிடுவதையிட்டு நாடு முழுவதும் அவருக்கு நன்றி தெரிவிக்கின்றது. அவ்வளவு பொறுப்பு வாய்ந்த சிறப்பான ஓர் அதிகாரியை நியமித்ததிலிருந்து மேன்மைதங்கிய சனாதிபதி அவர்களின் நுட்பமான புத்திக்கூர்மையை அறிந்துகொள்ள முடியும்.

ஜூலை வன்செயல்களினால் பாதிக்கப்பட்ட மக்களிற் பலருக்கு இதுவரை நிவாரணம் வழங்கப்பட்டிருப்பினும் சில காரணங்களின் நிமித்தம் — என்ன காரணமோ தெரியாது — இதுவரை சிலருக்கு நிவாரணம் அளிக்கப்படவில்லை என்பதைத் துக்கத்துடன் கூற வேண்டும். இது அமைச்சின் குற்றமாக இருக்க முடியாது. சில சந்தர்ப்பங்களில் வங்கிகளிலிருந்து பணத்தை ' றிலீஸ் ' செய்வதில், பொலிஸ் முகாமைத் தகவல்களைப் பெறுவதில் அல்லது வேறு தகவல்களைப் பெறுவதில் சில கஷ்டங்கள் ஏற்படுகின்றன. சமீபத்தில் ஏப்றில் மாதத்தில் ஏற்பட்ட கலவரத்தின் போதும் அதன் பின்னர் ஏற்பட்ட வன்செயல்களின்போதும் சில சந்தர்ப்பங்களில் மக்கள் பொலிஸ் நிலையத்துக்குச் சென்று அறிக்கை கொடுக்க முடியாதுபோன காரணத்தால் எனது தொகுதியிற்கூட அவ்வாறான நிவாரணங்களைப் பெறுவதில் கஷ்டங்கள் இருக்கின்றன. இப்போது நிவாரணதுக்கான உரிய பத்திரங்களை REPIA வழங்கியிருக்கின்றது. வங்கிகளிலேற்படும் தாமதத்தின் காரணமாக நிவாரணம் வழங்குவது சுணங்கிவிடக் கூடாது என்று கூற விரும்புகின்றேன்.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I am grateful to the Ministry because when I asked Question No. 80/85 from the Hon. Prime Minister they took pains to furnish all the data and whatever I mentioned here is from the answer tabled in this House. Therefore, I am grateful to the people who are working there with that small cadre of 30 people. So when they give all that information it gives an impression of how well organized they are. I never criticized that Ministry, Sir.

**එම්. අයි. උදුමාලෙබ්බේ මහතා**
**(ஜனாப் எம். ஐ. உதுமாலெப்பை)**
**(Mr. M. I. Uthumalebe)**

I am glad that at last you have appreciated the good work done by that Ministry.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I always said that. I started off by saying that.

**සභාපතිතුමා**
**(தவிசாளர்)**
**(The Chairman)**

You have asked me three minutes but I have given you four minutes. Please wind up. The Minister has to reply.

**එම්. අයි. උදුමාලෙබ්බේ මහතා**
**(ஜனாப் எம். ஐ. உதுமாலெப்பை)**
**(Mr. M. I. Uthumalebe)**

Sir, please give me one more minute, Sir.

I request the banks to be more liberal in giving loans. There are some difficulties experienced by former defaulters in obtaining loans. Therefore, special exemption should be given to those victims. I request that REPIA looks into this matter.

**වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)**
**(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)**
**(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)**

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය ඇතිව මම වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචර්ඩ් පතිරණ මහතා) කිව්වා උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් පැමිණි අනාථයින්ට දකුණේ කිසිම සැලකිල්ලක් කෙළේ නැහැ කියා. එය සම්පූර්ණ අසත්‍ය කථාවක්. එහෙත් පැමිණි සෑම ධීවර කාර්මිකයෙකුටම ඒ ධීවර කර්මාන්තය කරගෙන යන්නට අවශ්‍ය හැම පහසුකමක්ම අපි සපයා දී තිබෙනවා. ආහාරපාන සපයා දී තිබෙනවා. ඇඳුම් පැළඳුම් සපයාදී තිබෙනවා. ඒ වාගේම කෘෂිකර්මයෙන් ජීවත්වුණු ජනතාවටත් ඒ විධියටම අවශ්‍ය පහසුකම් සලසා දී තිබෙනවා. ඉඩ කඩම් ලබා දී තිබෙනවා. ඇඳුම් පැළඳුම් ලබා දී තිබෙනවා. දරුවන්ට පාසල් යාමේ අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ නිසා එය සම්පූර්ණයෙන්ම අසත්‍ය කථාවක්. දකුණේ කිසිම සැලකිල්ලක් කළේ නැහැ කිව්වාම ඒක අපටත් බලපානවා. මීගමුවේ සිට පැමිණි සියලු ධීවර කාර්මිකයින්ට අලුත් ගොඩනැගිලි සාද දී ඒ කර්මාන්තය කිරීමේ සෑම පහසුකමක්ම සලසා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මීගමුවේ ඉදලා දකුණට ගියේ නැහැ. කෝකිලායි සහ නයාරුවල ඉදලයි ආවෙ.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

මීගමුවේ උදවිය දුන් ඉන්නේ දකුණේ. හම්බන්තොට ඉදගෙනයිප් කර්මාන්තයේ යෙදී සිටින්නෙ. ඒ උදවිය හුගාක් සාර්ථකව ඒ කර්මාන්තය කරනවා. වේදිකාවේ කියන බොරු මෙහෙදි නොකියන ලෙස මම නමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I am happy that at least the Opposition has accepted the fact that the Secretary to the Ministry is doing a good job. At the very start I gave a progress report on what they have been doing from the time the Ministry was started.

Sir, I would only reply to certain queries that have been raised especially by the hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody). He wanted to know under what items these monies had been paid. I have already answered that. He also raised the question about the fishermen in Pitipana. Sir, those fishermen will be taken back to rebuild their houses on rehabilitation. Action is also being taken to provide relief by replacement of their equipment. This facility is not provided to any other category. Then the question was also raised whether compensation had been paid to certain types of people from Trincomalee and Mannar. I would reiterate the fact that no compensation has been authorized or paid in respect of losses sustained by private citizens in the recent ethnic confrontation. – (*Interruption*) It has been paid only in cases where it was established that the damage caused to private property was as a result of excessive zeal by the servants of the State.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That means this has been paid because the servants of the State have gone and created trouble.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Because of the excessive zeal of the armed forces and otherwise.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

So Rs. 88 million was paid for that ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Yes.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Then, what about the poor Sinhalese people who have been attacked by the terrorists ? Why are you not paying them ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

We do not take into consideration whether they were Tamils or Sinhalese.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Then Ebenezer Gospel Hall, Main Street, Puvakpitiya was paid Rs. 14,000 ; The Assembly of God of Ceylon, Kollupitiya was paid Rs. 14,350 ; St. Bernardettes Devastana, Avissawella was paid Rs.92,286 ; Mariamma Kovil, 412, Main Street, Puvakpitiya was paid Rs. 22,750. Do you think all that has been the result of excess zeal of the servants of the State ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Yes, that is the position of the Government.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Attacks on the Mariamma Kovil, Dehiwala, then the Hindu Kovil at Colombo 10 etc. !

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Hon. Member, you will have to accept the statement of the Hon. Minister.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, the reply that was given to me by the Hon. Prime Minister is contrary to what the Hon. Minister is now saying.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

This reply is provided to me by the person who is directly in charge of it. I think he is the best person to say all these things. Then, Sir, he said that in Trincomalee we have paid Rs. 88 million.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Rs. 88 million.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Wait please. It is Rs. 8 million not 88 million.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No. Please table that.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

We have paid Rs. 8 million for Trincomalee, Rs. 6 million for Mannar both totalling Rs. 14 million. That is the correct position about compensation.

Then the hon. Member for Akmeemana (Mr. Richard Pathirana) stated that no relief has been given to the businessmen from the South. That is totally incorrect. He is speaking without knowing what has happened. You know, those bakers who were displaced persons in Jaffna were given loans up to the extent of Rs. 758,000. So how can he say that the people of Southern Province were not given any loans.

I do not want to say anything more. Sir, except finally to thank all the officers of this Ministry and Members of Parliament who contributed their share to carry out the programme of this Ministry.

"192 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 7,56,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

192 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 192, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 7,56,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 192, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Questin, "That the sum of Rs. 756,000, for Head 192, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 192, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

*එකල්හි වේලාව අ. භා. 6 වුයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි ; නැවත රැස්වීම 1985 දෙසැම්බර් 4 වන බදාදා.*

*நேரம் பி. ப. 6 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினர்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது, 1985 டிசெம்பர் 4 புதன்கிழமை.*

*It being 6 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress ; to sit again on Wednesday 4th December 1985*

## පරිපූරක මුදල : ගුරු වැටුප්
## குறைநிரப்புத் தொகை : ஆசிரியர் சம்பளம்
## SUPPLEMENTARY SUPPLY : TEACHERS' SALARIES

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Youth Affairs and Employment and Minister of Education, I move,

"That a supplementary sum not exceeding Rupees Two Hundred and twenty five million (Rs. 225,000,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or moneys of or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka for the service of the Financial Year beginning on 1st January, 1985 and ending on 31st December, 1985 and that the said sum may be expended as specified in the Schedule hereto :-

Schedule

| | Rs. |
|---|---|
| Head : 70 – Minister of Education | |
| Programme : 1 – General Administration and Staff Services | |
| Recurrent Expendiuture . . | 2,000,000 |
| Programme : 2 – General Education | |
| Recurrent Expenditure . . | 213,000,000 |
| Programme : 3 – Teacher Education | |
| Recurrent Expenditure . . | 10,000,000 |
| | 225,000,000 |

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
***Question proposed.***

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

There are two Adjournment Questions to be raised with the Hon. Minister of Health, both on the same subject ; one by the hon. Member for Attanagalla and the other by the Hon. District Minister for Hambantota.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

Sir, I wish to bring to the notice of the Hon. Minister of Health the very offensive smell emanating in the area causing severe inconvenience to Parliamentarians and as well as to the people of the area in and around Sri Jayawardenepura and Pitta Kotte.

I wish to ask the Hon. Minister of Health what action he proposes to take and would like to know whether it is injurious to the health of the people.

This morning when I was entering Parliament there were a lot of complaints from the staff of Parliament as well as school children that their eyes are tearing, and they are having nausea and vomitting. We must take this matter a little seriously and try to put an end to this. I hope the Hon. Minister will put an end to this.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I want to raise two matters which have come from the "Davasa" today. One is about the Malathion problem and the other is about the headline which says : "මහා ගල් වලකින් විෂ දුමක් නගී."

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. මෙ පරිසර දූෂණය කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි බොහොම ප්‍රවේශම් වෙන්න ඕනෑ. මොකද, මම හිතන්නේ ඊයේ තමුන්නාන්සේත් අහගෙන ඉන්නත ඇති ගුවන් විදුලියෙන් කියනවා මේ මැලතියන් ප්‍රශ්නය නිසා අවට ඉඩම්වල තිබෙන පලතුරු වර්ග, කිර කොටුවල තිබෙන කිර වර්ග, එළවළු වර්ග අනුභව කිරීම සම්බන්ධයෙන් ටිකක් පරෙස්සම් වෙන්නය කියා. මේ ප්‍රශ්නය බොහොම බැරෑරුම් ප්‍රශ්නයක් හැටියට මම හිතන්නේ, ගරු ඇමතිතුමාත් පිළිගෙන තිබෙනවා. අපි දන්නවා එතුමාටත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගින්න වතුරෙන් නිවන්න බැහැ. එහෙම නම් ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා. ඊයේ රාත්‍රී වැස්සෙන් පස්සෙ ප්‍රශ්නය තවත් උග්‍ර වුණා. සමහර විට දෙහිවල ප්‍රදේශයේ දක්වා මේ ගඳ ගිහින් තිබෙනවා. මෙය නතර කිරීම සඳහා ලංකාවේ තිබෙන එකම ප්‍රතිකර්මය වැලි ගැහීම පමණයි. වෙන කිසි ප්‍රතිකර්මයක් කරන්න බැරි බව අපි කවුරුත් දන්නවා. ප්‍රශ්නය තිබෙන්නේ පාර්ලිමේන්තුවට දුගඳ එනවාට වඩා ලොකු උග්‍ර ප්‍රශ්නයක් වී තිබෙන්නේ මෙය හටගත්තේ කෙසේද, ගිනි තිබ්බද නැද්ද කියන ප්‍රශ්නයයි. මම හිතන්නේ ඒ ගැන පත්‍රවල සඳහන් කර තිබුණා. ඊළඟ ප්‍රශ්නය මෙසේ ගිනි ඇල්ලුවාට පස්සෙත් මැලතියන් එතෙන්ට ගෙනිච්චද ?

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

වෙන්න බැහැ. ගෙනා බව නම් ප්‍රශ්නයක් වශයෙන් තිබෙනවා. අන්න ඒ ගැන කරුණාකර පරීක්ෂා කර බලන්න. මොකද, හුඟාක් උදවිය ඒ ගැන කථා කරනවා. මේ බය නැති කරන්න ඕනෑ කියන එකත් අපි පිළිගත යුතු දෙයක්. තවත් ප්‍රශ්නයක් කොළඹ දිසා ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. එතුමාත් කිච්චාය කියා තිබෙනවා—පත්‍රවලත් තිබුණා—මේ වැඩේ කරන්න එපාය කියා. ඒ කියමන අහක දැම්මේ කුමන හේතුවක් නිසාද ?

මැලතියන් මෙහෙ තියෙන කොට විතරක් නොවෙයි මේ ප්‍රශ්නය ආවේ. මට මතකයි අර ඇල්විටිගල මාවත පැත්තේ ඒ හරියෙ මේවා ගොඩ ගහලා තිබෙන කාලයේදීත් ඔය දුගඳ හැමීම තිබුණා. මේ නිසා මේ පරිසර දූෂණය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගන්නා පියවර කුමක්දැයි මම අහන්නට කැමතියි.

තව ප්‍රශ්නයක් තිබෙනවා, රත්මලානේ ගැඹුරු ගල් වලකින් මතුවන විෂ දුමක් සම්බන්ධව.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ඒකට මම මොනවා කරන්නද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඒ අවට පවුල් දහස් සංඛ්‍යාවකට මෙය මහත් තර්ජනයක් බවට පත් වී ඇති බැවි—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

No. That does not come under your question.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මම අහන්නේ මේකයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Let him answer the question that he is asked.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මම අහන්නේ මේකයි. රජයේ වගකීමක් ඇති සෞඛ්‍ය ඇමතිවරයා හැටියට තමුන්නාන්සේ මේ ප්‍රශ්නය ගැන ගත්තාවූ පියවර කුමක්ද ? ඇති වී තිබෙන සිද්ධිය ගැන ක්ෂණිකව ගෙන තිබෙන පියවර කුමක්ද ? ඒ අතරම මම ස්තුතිවන්ත වෙනවා, "දවස" පත්‍රයටත්, ඒවාගේම "සන්" පත්‍රයටත්, "වීක් එන්ඩ්" පත්‍රයටත් මේ අන්දමට පරිසර දූෂණය ගැන විශේෂයෙන් කටයුතු කිරීම ගැන. ඒවගේම "දිවයින" පත්‍රය ඇතුළු අනෙකුත් පත්තරත් බොහොම කල්පනාකාරීව මේ කටයුත්ත කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think the Hon. Minister can now reply.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

Mr. Speaker, I wish to thank the Hon. District Minister for Hambantota and the Hon. Member for Attanagalla for raising this all important question. The Hon. District Minister being a medical man himself is obviously worried about the medical repercussions of the inhalation of malathion. I would like to reassure the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Hon. District Minister, this House and the people, through this House, that any after-effects are purely temporary and there will be no serious or even minor long-standing after-effects due to the inhalation of malathion.

As you are aware, malathion is used for spraying our rural houses, of course, in diluted form, and those who have suffered the inconvenience of the smell during the last few days will realise what our villagers have been undergoing for several decades. Therefore, there is no danger of any serious effects on the health of anybody who has inhaled this gas and if they have any doubts they should take immediate steps to take medical treatment.

We are going to carry out immediately a survey in the area affected, a random sampling of blood tests for certain enzymes which tend to go down. But unfortunately I think by the time we do the tests it would have returned to normal in most cases. Anybody who has any doubts will be able to go to the IDH where the centre will be placed for reviewing these patients.

The Hon. Member wanted to know what the gas is. I do not want to get too technical. There is possibility of sulphur and some other gases plus the malathion itself in a different form which is the one that causes this problem.

Regarding combating of this problem we are using large cranes and equipment to throw sand from above. I hope we will be able to put a layer of about six inches to one foot above this pile of malathion which is above 40 feet high. I hope that the rain will not wash it off.

I am very thankful to the Managing Director of Navaloka Industries for having given us the equipment necessary to get on top of this and throw all this stuff because unfortunately even the Fire Brigade was unable to cope with the task. I am also thankful to the District Minister for Colombo who took a great interest and has helped us in this matter. Naturally his people must be worrying him considerably on this issue.

There were various statements in the newspapers, Mr. Speaker, saying that this smell has been there for one week. A name was quoted of a hospital attendant who had said that he could not sleep for one week. I am not surprised that he could not sleep for one week because he has been interdicted. I wish that fact also had been mentioned in the newspaper item. I would like to ask such people what they were doing for one week. There are police stations, Grama Sevakas, Members of Parliament, heads of institutions and newspaper reporters to whom they could have said that this place was smelling. When I went there yesterday and while I was walking around trying to see what could be done, I heard one person there saying – " දැන් නම් කවුරුත් එනවා මේ පැත්තේ. සුමානයක් ගඳ ගැහැවා කවුරුත් ආවේ නැහැ. "

I Turned round and asked him"

තමුන්නාන්සේ සුමානයක් තිස්සේ මොනවාද කළේ ? ගඳ ගහන තහය අල්ලාගෙන හිටියද ? "

We have not got to the bottom of this mystery as to how this happened. The store is a new store. There was no possibility of water leaking unlike what happened in Norris Canal Road. So we are not quite sure. The Government Analyst and the police are investigating to find out how this has happened. I might mention –

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

What were your officials doing ? Did they not get the smell ?

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)**
**(Dr. Ranjith Atapattu)**

There were two watchers.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

They also should have got the smell.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)**
**(Dr. Ranjith Atapattu)**

I was just coming to that. If you do not interrupt me I can get on with my story.

Everyday this store is opened. Everyday supplies are sent out to various parts of the island. Every morning a lorry goes there with a storekeeper and two labourers. Every day a couple of lorry-loads of malathion go out to various parts of the country. If there was something unusual the people there, the watchers – there are no high officials at the malathion store – should have spotted it. It may be that they are so used to the smell of malathion that they did not notice that little extra smell on the previous day. But if it was there for one week I am sure that someday would have got this smell earlier. The moment the Acting Director of the Anti-Malaria Campaign got information of this he acted. He immediately contacted the Fire Brigade. He went to the spot. I am very thankful to him. As a matter of fact he was to leave on some International Seminar somewhere. He immediately cancelled that and saw to it that he did what he could do. What we did was to collect sand because we knew that sand was necessary. This is the situation.

As for the question raised as to why this was sited in this place, I would like to say that this was done in 1981 after much thought on these various issues. In the storing of malathion the WHO standards have been followed. The recent team of US Aid experts who came and inspected the stores have told us that they found the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා]

construction of the store and the methods used in storing up to international standards. Therefore as to how this has happened when the store was quarterful, we are still unable to say.

I might also mention that there would have been no malathion actually at the end of this year, but there are certain areas where we cannot spray malathion these days. This is how this whole unfortunate incident occurred. Every step will be taken to contain this and remove the malathion that is burnt to uninhabited places, as far away from human habitation as possible.

There was a news item saying that something was dumped in Narahenpita. There is absolutely no truth in that statement. All the remnants will be taken as far away as possible and dumped and buried so that nobody else will suffer consequences.

As for the environment, we are forming a group together with the Environtmental Authority, with many officers, to monitor not only malathion but all insecticides, pesticides and other gases which can be of danger to the environment.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Does the Hon. District Minister agree with this Statement ? තමුන්නාන්සේ පිළිගන්නවාද ඒ කියපු කථාව ?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ඔව්.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.10ට 1985 නොවැම්බර් 28 වන දින සභා සම්මතිය අනුව 1985 දෙසැම්බර් 4 වන බදාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේ ය.*

அதன்படி, பி. ப. 6.10 மணிக்கு பாராளுமன்றம், 1985 நொவம்பர் 28 ஆம் தேதிய அதனது தீர்மானத்துக்கிணங்க 1985 டிசெம்பர் 4, புதன்கிழமை மு. ப. 9 மணிவரை ஒத்திவைக்கப் பட்டது.

*Parliament adjourned accordingly at 6.10 p.m. until 9 a.m. on Wednesday, 4th December, 1985, pursuant to the Resolution of the Parliament of 28th November, 1985.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1985 දෙසැම්බර් 17 වන අඟහරුවාද**

**නොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.**

குறிப்பு

**அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு**

1985 டிசம்பர் 17, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

**இடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

**Tuesday, 17th December 1985**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 9.00 a.m. to 6.10 p.m. on 03.12.1985** |
| **Final set of manuscripts received from Parliament** | : | **6.50 p.m. on 04.12.1985** |
| **Printed copies despatched** | : | **05.12.1985 afternoon** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org